# ද්විමය කේතය කඩාබිඳ දැමීම

LGBT ශ්‍රී ලාංකිකයින්ගේ අන්තර්ජාල අත්දැකීම්



# ද්විමය කේතය කඩාබිඳ දැමීම:

## LGBT ශ්‍රී ලාංකිකයින්ගේ අන්තර්ජාල අත්දැකීම්

# ද්විමය කේතය කඩාබිඳ දැමීම:

## LGBT ශ්‍රී ලාංකිකයින්ගේ අන්තර්ජාල අත්දැකීම්


කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය
ප්‍රගතිශීලි සන්නිවේදනයන් සඳහා වන සම්මේලනය
Association for Progressive Communication
AmplifyChange
සහ
ඉරෝටික්ස් දකුණු ආසියාව: ලිංගිකත්වය හා තොරතුරු සහ
සන්නිවේදන තාක්ෂණය පිළිබඳ විමර්ශනාත්මක පර්යේෂණය

# ද්විමය කේතය කඩාබිඳ දැමීම:
LGBT ශ්‍රී ලාංකිකයින්ගේ අන්තර්ජාල අත්දැකීම්


ප්‍රථම මුද්‍රණය: 2017 දෙසැම්බර්



(c) කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය



ISBN 978-955-1770-34-1

| | |
|---|---|
| **නිෂ්පාදන කණ්ඩායම පර්යේෂණය සහ වාර්තාකරණය** | පබා දේශප්‍රිය, මයිකල් මෙන්ඩිස්<br>ආචාර්ය ශර්මාල් විජේවර්ධන, සුහා විජේසිරිවර්ධන<br>ආචාර්ය සේපාලි කෝට්ටේගොඩ සහ සැන්ඩියා බ්‍රවුන් |
| **සමාලෝචනය** | ජයන්ති කුරු-උතුම්පාල සහ සෙයිනබ් ඉබ්‍රහීම් |
| **පිටපත් සංස්කරණය** | ප්‍රගතිශීලි සන්නිවේදනයන් සඳහා වන සම්මේලනය (APC) |
| **ප්‍රකාශන සැලසුම සහ නිර්මාණය** | වේලායුදන් ජයචිත්‍රා |
| **මුද්‍රණය** | ග්ලෝබ් ප්‍රින්ටිං වර්ක්ස් |

මෙම පර්යේෂණය සහ ප්‍රකාශනය ඇම්ප්ලිෆයිචේන්ජ් (AmplifyChange) ආයතනයේ සහයෝගයෙන් නිම කරන ලදී.



Women and Media Collective
Established 1984
ප්‍රකාශනය
**කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය**
56/1, සරසවි මාවත, කාසල් වීදිය, කොළඹ 08, ශ්‍රී ලංකාව
දුරකථන අංකය: + 9411 2690201, ෆැක්ස්: + 94 112690192
විද්‍යුත් ලිපිනය: wmcsrilanka@gmail.com
වෙබ් අඩවිය: www.womenandmedia.org
ෆේස්බුක්: Women and Media Collective
ට්විටර්: @womenandmedia
යූටියුබ්:Women and Media Collective

APC
ASSOCIATION FOR PROGRESSIVE COMMUNICATIONS

**ප්‍රගතිශීලි සන්නිවේදනයන් සඳහා වන සම්මේලනය** (Association for Progressive Communication)
තැ.පෙ. 29755, මෙල්විල්, 2109, ජොහැන්නස්බර්ග්, දකුණු අප්‍රිකාව.
ෆැක්ස්:+27 11 726 1692
විද්‍යුත් ලිපිනය: info@apc.org
වෙබ් අඩවිය: www.apc.org
ෆේස්බුක්: APCnews
ට්විටර්: APC_news

# ඇතුළු පිටු

ස්තුතිය ........ 7
පෙරවදන ........ 9

**පළමු කාණ්ඩය**

'අසම්මතයේ සයිබරයඃ අන්තර්ජාල අවකාශය තුළ විවිධ සමාජභාවයන් සහ ලිංගික දිශානතීන් සහිත ශ්‍රී ලාංකිකයින්ගේ මානව අයිතිවාසිකම්

පළමු කොටසඃ හැඳින්වීම ........ 13
දෙවන කොටසඃ පසුබිම ........ 22
තෙවන කොටසඃ ලිංගිකත්වය සහ ශ්‍රී ලංකාවේ අන්තර්ජාල අවකාශය ........ 35
හතරවන කොටසඃ නීතිය සහ ප්‍රතිපත්තිය ........ 87

**දෙවන කාණ්ඩය**

සාම්ප්‍රදායික නොවන තාක්ෂණිකත්වයඃ සමලිංගික ස්ත්‍රීන් හා ඔවුනගේ අන්තර්ජාල අවකාශ භාවිතය

හැඳින්වීම ........ 111
ක්‍රමවේදය ........ 113
පවුලේ මුරකිරීම සහ මහජන මුරකිරීම ........ 115
නිගමනය ........ 136

නිර්දේශ ........ 140
ආශ්‍රිත ග්‍රන්ථ ........ 145
උප ග්‍රන්ථ ........ 149
ඇමිණුම අඃ පාරිභාෂික වදන්පෙළ ........ 149
ඇමිණුම ආඃ ප්‍රශ්නාවලිය ........ 153

## රූපසටහන් ලැයිස්තුව


රූප සටහන 1: සමීක්ෂණ ප්‍රතිචාරකයින්ගේ සමාජභාවී අනන්‍යතාවය.... 19
රූප සටහන 2: සමීක්ෂණ ප්‍රතිචාරකයින්ගේ ලිංගික දිශානතිය ..............20
රූප සටහන 3: සමීක්ෂණ ප්‍රතිචාරකයින්ගේ වයස ................................20
රූප සටහන 4: සමීක්ෂණ ප්‍රතිචාරකයින්ගේ අධ්‍යාපන පසුබිම ...............21
රූප සටහන 5: සමීක්ෂණ ප්‍රතිචාරකයින් භාවිතා කරන උපාංග .............35
රූප සටහන 6: සමීක්ෂණයෙහි ප්‍රතිචාරකයින්ට පැය ගණන් අනුව අන්තර්ජාලයට ඇති ප්‍රවේශය .....................................................36
රූප සටහන 7: සමාජ මාධ්‍යය තුළ පෞද්ගලික තොරතුරු ප්‍රසිද්ධියේ බෙදා ගැනීම ..........................................................................51


## වගු ලයිස්තුව


වගුව 1: අන්තර්ජාලයේ තොරතුරු ප්‍රවේශ කිරීම ................................39
වගුව 2: සමාජ මාධ්‍ය තුළ තොරතුරු බෙදා ගැනීම ............................48
වගුව 3: අන්තර්ජාලය තුළ ලිංගික දිශානතිය සහ සමාජභාවී අනන්‍යතාවය සඳහන් කිරීම ..................................................50
වගුව 4: අන්තර්ජාලය තුළ සැබෑ නම/පින්තූරය අන්තර්ගත කිරීම........ 52
වගුව 5: පුද්ගලයකුට අන්තර්ජාලය තුළ ඇති පැතිකඩ ගණන ..............53
වගුව 6: තම නම හෝ පින්තූරය නොමැති පැතිකඩවල භාවිතය..........55
වගුව 7: අන්තර්ජාල පෙම්හමු වේදිකා ...............................................64
වගුව 8: අහිතකර අන්තර්ජාල අත්දැකීම් ...........................................74
වගුව 9: හඳුනාගත් අත්දැකීම් සමග සම්බන්ධවන අන්තර්ජාල වේදිකා.. 75
වගුව 10: අත්දැකීම් ලත් පුද්ගලයින්ට ඔවුන්ගේ ඇති සම්බන්ධතාවය .....76
වගුව 11: අත්දැකීම්වලට ඇති ප්‍රතිචාර................................................. 77
වගුව 12: අත්දැකීම්වලට ඇති විසඳුම් .................................................78
වගුව 13: අන්තර්ජාල අවකාශය තුළ ඇති ආරක්ෂණය වැඩි කිරීම සඳහා භාවිතා කළ හැකි ක්‍රම .........................................................80
වගුව 14: "පෙම්-හමු" සහ "ක්ෂණික ලිංගික හමු" වේදිකා පිළිබඳ ක්‍රියාකාරකම ....................................................................80
වගුව 15: "පෙම්-හමු" සහ "ක්ෂණික ලිංගික හමු" වේදිකා පිළිබඳ ක්‍රියාකාරකම ..................................................................... 81
වගුව 16: "පෙම්-හමු" වේදිකාවක් හරහා කෙනෙකු මුණ ගැසීම .............82

# ස්තූතිය

කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය වශයෙන් අපි තමන්ගේ ආඛ්‍යාන සහ අත්දැකීම් බෙදාහදා ගත් සියලුම ප්‍රතිචාරකයින්ට ස්තූති කරන්නෙමු. ඔවුන්ගේ එම දායකත්වය නොමැතිව මෙම පර්යේෂණය සාර්ථක කර ගත නොහැකිවීමට ඉඩ තිබුණි. ඒවාගේම අපි මෙම අධ්‍යයනයට අවශ්‍ය තොරතුරු සැපයීමට තමන්ගේ කාලය වැය කළ සියලුම පාර්ශවකරුවන් අගය කරන්නෙමු. මෙම අධ්‍යයනය කිරීම සඳහා අවස්ථාව ලබාදුන් සහ පර්යේෂණය පුරාවටම මාර්ගෝපදේශනය මෙන්ම සහාය පල කිරීම සම්බන්ධව ප්‍රගතිශීලි සන්නිවේදනයන් සඳහා වන සම්මේලනය (Association for Progressive Communications – APC) ට කාන්තාව සහ මාධ්‍ය සාමූහිකයේ හෘදයාංගම ස්තූතිය පල කරන්නෙමු. අපගේ විශේෂ ස්තූතිය ප්‍රගතිශීලි සන්නිවේදනයන් සඳහා වන සම්මේලනයේ ජැක් ස්එම්කී, කැතරිනා ෆඅලෝවා, සහ වැලන්ටිනා ෆෙලිස්සර් වෙත ඔවුනගේ අමිල සහාය වෙනුවෙන් පල කරන්නෙමු.

එමෙන්ම, ප්‍රධාන පර්යේෂකයින් සහ කතුවරයින් වන පබා දේශප්‍රිය හා මයිකල් මෙන්ඩිස් (පළමු කාණ්ඩය - ‘අසම්මතයේ සයිබරය’: අන්තර්ජාල අවකාශය තුළ LGBTQ ශ්‍රී ලාංකිකයින්ගේ මානව අයිතිවාසිකම්’), ආචාර්ය ශර්මාල් විජේවර්ධන සහ සුභා විජේසිරිවර්ධනටත් (දෙවන කාණ්ඩය-‘සමලිංගික ස්ත්‍රීන් හා ඔවුනගේ අන්තර්ජාල අවකාශ භාවිතය’) අපි ස්තූතිවන්ත වන අතර පර්යේෂණය සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් ජයන්ති කුරුඋතුම්පාල සහ සෙයිනාබ් ඉබ්‍රහීම්ට ද කෘතඥ වන්නෙමු.

මෙම අධ්‍යයනය සිදු කිරීම සඳහා ඇම්ප්ලිෆයිචේන්ජ් (Amplify Change) ආයතනය විසින් ලබාදුන් මූල්‍යමය දායකත්වය ද කෘතඥතා පූර්වකව සඳහන් කරන්නෙමු. 'EROTICS South Asia Network' හි අපගේ හවුල්කාර ආයතන වන ඉන්දියාවේ මුම්බායි හි පිහිටා තිබෙන Point of View ආයතනයට සහ නේපාලයේ ලූම් (LOOM) ආයතනයට ද ඔවුන් අප වෙත ලබාදුන් සහායට වෙනුවෙන් ස්තූති වන්නෙමු. කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය එහි ව්‍යාපෘති කණ්ඩායමේ ආචාර්ය සේපාලි කෝට්ටේගොඩ, වේලායුදන් ජයචිත්‍රා සහ සැන්ඩ්‍යා බ්‍රවුන්; මූල්‍ය කණ්ඩායමේ නෙලිකා රාජපක්ෂ සහ වනමලී ගලප්පත්ති ටද ස්තූතිවන්ත වන්නෙමු.

අපගේ පරිවර්ථකයින් වන ගෝපිනාත් පොන්නුදුරෙ සහ ඉනෝකා ප්‍රියදර්ශණී ට ද සෝදුපත් කියවන ලද සුමිකා පෙරේරා හා කුහනිධි කුහනේශන් ට ද අපගේ ස්තුතිය පල කරන්නෙමු. Globe Printing Works හි කෝසල තිලකරත්න ට මෙම අධ්‍යයනය මුද්‍රණය කිරීම සම්බන්ධයෙන් අපගේ හෘදයාංගම ස්තුතිය පල කරන්නෙමු.

# පෙරවදන

මෙම ග්‍රන්ථය අන්තර්ජාල අයිතිවාසිකම් සහ ශ්‍රී ලංකාවේ ලිංගිකත්වය ගවේෂණය කරයි. ඉන්දියාව, නේපාලය සහ ශ්‍රී ලංකාව අන්තර්ගත වන පරිද්දෙන්වූ පුළුල් විමර්ශනයක කොටසක් වශයෙන් ප්‍රගතිශීලී සන්නිවේදනයන් සඳහා වන සම්මේලනය (Association for Progressive Communications – APC) විසින් මේ පොත සඳහා පදනම් වූ පර්යේෂණයට සහාය දෙන ලදී. පර්යේෂණයේ කේන්ද්‍රීයමය ක්ෂේත්‍රය වශයෙන් ලිංගිකත්වයට හා ලිංගික අයිතිවාසිකම්වලට බලපෑමක් වන ශ්‍රී ලංකාවේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ ප්‍රතිපත්ති හෝ පුරුදු දෙස විමසා බලයි. පර්යේෂණය ප්‍රධාන ක්ෂේත්‍ර දෙකක් මත නාභිගත කෙරේ: අන්තර්ජාලයට ඇති ප්‍රවේශය (මිලදී ගැනීමේ හැකියාව හා භූගෝලීය ව්‍යාප්තිය) සහ එය ක්‍රියාකාරී වීම සඳහා (කාරකත්වය) සඳහා සමලිංගික ස්ත්‍රීන්, සමලිංගික පුරුෂයින්, ද්විලිංගික, සංක්‍රාන්ති සමාජභාවී සහ ලිංගික අනන්‍යතාවය ප්‍රශ්න කරන (LGBTQ) ශ්‍රී ලාංකිකයින් අන්තර්ජාලය භාවිතා කරන ආකාරය සහ ලිංගිකත්වය පිළිබඳව තීරණාත්මක තොරතුරු අතුළත් ලිංගිකත්වයට අදාල අන්තර්ගතය වාරණය (රජය විසින් හෝ අනතර්ජාල සේවා සපයන්නන් හෝ ආයතන විසින්) සඳහා බලපාන ආකාරය යි.

ශ්‍රී ලාංකික අධ්‍යයනය සුවිශේෂී ආකාරයට LGBTQ ප්‍රජාවන් අන්තර්ජාලයට ප්‍රවේශ කරන්නේ අනෙක් අය සමග සන්නිවේදනය කිරීමේ මාධ්‍යයක් වශයෙන් ද එසේ නැතහොත් ක්‍රියාකාරීත්වයේ අඩවියක් වශයෙන් ද යන්න විමසා බලයි. විවිධ සමාජ සහ ලිංගික අනන්‍යතාවයන් සහිත පුද්ගලයන් ලෙස හඳුනා ගන්නා විෂමලිංගික නොවන සහ උපතේ දී උරුම කරගත් ලිංගික අවයවවලට අනුගාමී සමාජභාවයට වඩා වෙනස් සමාජභාවයන් ආරෝපණය කරගන්නා පුද්ගලයින් වාසය කරන, සමලිංගිකත්වය සාපරාධී අපරාධයක් කොට සලකන සන්දර්භයක, අන්තර්ජාලය LGBTQ ශ්‍රී ලාංකිකයින්ට ප්‍රධාන සන්නිවේදන මූලාශ්‍රයක් සපය යි. අධ්‍යයනය, රටෙහි තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියාමන රාමුවේ සහ සමාජ මාධ්‍ය වේදිකාවන් හරහා විවිධ සමාජ සහ ලිංගික අනන්‍යතාවයන් සහිත ශ්‍රී ලාංකිකයින් විසින් විෂමලිංගිකත්වය නිවේදනය කරන මෙන්ම විෂමලිංගික නොවන

පුද්ගලයින් ගර්භාවට භාජනය කරන සමාජ ධර්මතාවයන්ගෙන් මගසොයා ගනු ලබන ආකරයෙහි විග්‍රහයක් ලබා දේ.

අධ්‍යයනය කොටස් දෙකකින් සමන්විත වේ. 'අසම්මතයේ සයිබරයඃ අන්තර්ජාල අවකාශය තුළ විවිධ සමාජ සහ ලිංගික අනන්‍යතාවයන් සහිත ශ්‍රී ලාංකිකයින්ගේ මානව අයිතිවාසිකම්'නම් වූ පී.එම්. දේශප්‍රිය සහ ජේ.එම්. මෙන්ඩිස් විසින් සම්පාදනය කරන ලද පළමුවන කොටස ශ්‍රී ලංකාව තුළ ලිංගික අයිතීන් සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණ ප්‍රතිපත්තියේ හැඩතලය විමර්ශනයට භාජනය කරයි. මෙම අධ්‍යයනය, විවිධ සමාජ සහ ලිංගික අනන්‍යතාවයන් සහිත ශ්‍රී ලාංකිකයින් වාසය කරන සමාජ-දේශපාලනික පරිසරය පිළිබඳව පුළුල් විග්‍රහයක් ද, සමීක්ෂණ ප්‍රශ්නාවලියේ, ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා සහ තනි පුද්ගල සම්මුඛ සාකච්ඡාවල සොයාගැනීම් ඉදිරිපත් කරයි.

සම්ප්‍රදායික නොවන තාක්ෂණිකත්වයඃ 'සමලිංගික ස්ත්‍රීන් සහ ඔවුන්ගේ අන්තර්ජාල අවකාශ භාවිතය' නම් වූ ශර්මාල් විජේවර්ධන හා සුභා විජේසිරිවර්ධන විසින් සම්පාදනය කරන ලද දෙවන කොටස සමලිංගික ස්ත්‍රීන් අන්තර්ජාල අවකාශය සමග කටයුතු කරන ආකාරය දෙස බලන එයටම සුවිශේෂී වූ විශ්ලේෂණයකි. එක්වතාවක දී එක් පුද්ගලයකු සමග පමණක් පවත්වන සම්මුඛ සාකච්ඡා සහ ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාවක් හරහා රැස්කර ගන්නා ලද තොරතුරු පදනම් කරගෙන මෙම අංශය මගින් සමලිංගික ස්ත්‍රීන්ගේ අන්තර්ජාල නිමග්නවීම්වල සමාජභාවී සහ ලිංගිකකරණයට භාජනය කරන ලද අත්දැකීම් හෙළිදරව් කරනු ලැබේ.

අන්තර්ජාලය තුළ ලිංගික ප්‍රකාශනයේ නිදහස මගින් තහංචි බිඳහෙළීම සඳහා දායක වන මෙන්ම ශ්‍රී ලංකාවේ ලිංගික සුළුතරයින්ගේ හඬ විස්තීර්ණ කරන ක්‍රම පිළිබඳව උද්දේශනය කිරීමට මෙම පුරෝගාමී අධ්‍යයනය තීරණාත්මක උපක්‍රමයක් වේ.

**ආචාර්ය සේපාලි කෝට්ටෙගොඩ**
කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය
2017 දෙසැම්බර්

# පළමු කාණ්ඩය

## අසම්මතයේ සයිබරය:
## අන්තර්ජාල අවකාශය තුළ LGBTQ
## ශ්‍රී ලාංකිකයින්ගේ මානව අයිතිවාසිකම්

**පී.එම්. දේශප්‍රිය සහ ජේ.එම්. මෙන්ඩිස්**

## පළමුවන කොටස

# හැඳින්වීම

අන්තර්ජාලය, එය භාවිතා කරන්නන්ට "සියලුම ආකාරයේ තොරතුරු හා අදහස් සෙවීමට, ලබා ගැනීමට සහ බෙදා ගැනීමට"[1] මග හසර සලසන "ඉතා වැදගත් සන්නිවේදන මාධ්‍යයක්"[2] වශයෙන් ප්‍රකාශ කරනු ලැබේ. පෙර කිසිදින නොවූවිරූ ආකාරයේ මහජන කතිකාවන් වඩවඩාත් සියලු දෙනාම අන්තර්ග්‍රහණය වන පරිද්දෙන් සිදුවීම එහි ඇති අපූර්ව දායකත්වය වේ. අන්තර්ජාලය, අතීතයේ පැවති වෙනත් සන්නිවේදන මාධ්‍යයන්ට වඩා කඩිනමින්, ඉතාමත් දුර අවකාශයකට තොරතුරු වඩාත් ලාභදායී ලෙස ගලාගෙන යාමට ඉඩ සලසයි. එමගින් සන්නිවේදනයේ ප්‍රතිලාභ වැඩි ජනකොටසකට භුක්ති විඳීම, තොරතුරුවලට ප්‍රවේශය, ස්වයං-ප්‍රකාශනය හා සමාජ ජාලකරණයටද අවකාශය සලසයි. තවද, අන්තර්ජාලය, "විවිධ අනන්‍යතා සහිත සමූහයන්ට තොරතුරු ලබා ගැනීමේ, හුවමාරුවෙහි නිරත වී සිටීමේ, දේශපාලනිකව සජීවීව සිටීමේ සහ ජන සමාජයේ පවත්නා වූ ගතිකයන් පිළිබඳව ආචීර්ණ කල්පිත තර්කනයන් විද්‍යාමාන කරන උදාසීන පිළිගැනීම මැඩපවත්වා ගැනීමට හැකියාව බහුවිධ ආකාරයෙන් වර්ධනය කරනු ලැබේ".[3]

1 ***La Rue, F. (2011).*** *Report of the Special Rapporteur on the promotion and protection of the right to freedom of opinion and expression.* ***www.ohchr.org/Documents/Issues/Opinion/A.66.290.pdf***

2 එම

3 Corrêa, S. et al. (2011).Internet regulation and sexual politics in Brazil.In JacsmKee (Ed.), Erotics: Sex, Rights and the Internet. Johannesburg: APC, 27. www.apc.org/en/pubs/erotics-research

සැබැවින්ම, ප්‍රකාශනයේ නිදහස පිළිබඳව වූ එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරු "ප්‍රකාශනයේ නිදහස පිළිබඳ මානව අයිතිවාසිකම් සඳහා වන ප්‍රතිපාදන සුවිශේෂී කර පෙන්වා දෙමින්, අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතිමය රාමුව, අන්තර්ජාලය සම්බන්ධයෙන් තවදුටත් අදාල හා යෝග්‍ය වන බව" පුනර්වාචනය කළේ ය. මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ 19 වන වගන්තිය සහ සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය සෑම පුද්ගලයකුටම ඕනෑම මාධ්‍යයක් තෝරාගැනීම තුළින් ප්‍රකාශනයේ නිදහසට පැහැදිලි ලෙස ප්‍රතිපාදන සම්පාදනය කරමින්, සීමා මායිම් නොතකා, පුද්ගලයින්ට මෙම අයිතිය භාවිතයේ යෙදවිය හැකි වන ලෙස අනාගතයේ සිදුවිය හැකි තාක්ෂණික සංවර්ධනයන්ට ඉඩ සලසන සහ ඒවා අන්තර්ග්‍රහණය කරගන්නා ආකාරයේ පෙර දැක්මක් සහිතව, කෙටුම්පත් කර ඇත."[4]

අන්තර්ජාලය සියලුම ජනතාවගේ ජීවිත සංවර්ධනය කිරීම සඳහා ඉතා වැදගත් කාර්යයභාරයක් ඉටු කරනු ලබන බව ප්‍රත්‍යක්ෂ ය. එහෙත්, LGBTQ ශ්‍රී ලාංකිකයින්ට, අන්තර්ජාලය විශේෂයෙන්ම වැදගත් වේ. ඔවුන්ට, අන්තර්ජාලය පරිගණක පද්ධතීන් හරහා සම්බන්ධ නොවන පියවිලෝකය තුළ විඩිමත් ව එල්ලවන බාධා අවහිරතාවයන්ට භාජනය වන සබඳතාවයන් හා මිතුරුදම් පවත්වා ගැනීම සඳහා තෝතැන්නක් වේ. පරිගණක පද්ධති හරහා සම්බන්ධ නොවූ පියවිලොවට හාත්පසින් ම ප්‍රතිවිරුද්ධ ආකාරයට අන්තර්ජාලය, LGBTQ ජනතාවට, පුද්ගලිකව හා සාමූහිකව ඔවුන්ගේ අනන්‍යතාවය ගොඩනගා ගැනීමටත් ඔවුන්ගේ අදහස් ප්‍රකාශනයටත් අපූර්ව වූ වේදිකාවක් සපයනු ලබයි. තොරතුරු මූලාශ්‍රයක් වශයෙන් ගත්විට, අන්තර්ජාලය මහජන කථිකාවන්ගෙන් විවිධ සමාජ හා ලිංගික අනන්‍යතාවයන් සහිත ශ්‍රී ලාංකිකයින් අත්තනෝමතික ලෙස බැහැර කිරීමට බාධා කර යටපත් කර හරිනු ලැබේ. ඒ හැර, ශ්‍රී ලංකාව තුළ විෂම ලිංගික නොවන (non heterosexual) හා උපතේ දී උරුම කරගත් ලිංගික අවයවවලට අනුගාමී සමාජභාවයට වඩා වෙනස් සමාජභාවයන් ආරෝපණය කරගන්නා (non cis-gender) ජනකොටස් ශ්‍රී ලංකාවේ ප්‍රධාන මාධ්‍ය ධාරව තුළ අනර්ථකාරී ලෙස ඒකාකෘතික වන අන්දමින් සහ ආකර්ෂණීය නොවන ආකාරයෙන් අඛණ්ඩව නියෝජනය කරන අතරතුර, අන්තර්ජාල අවකාශය තුළ සිටින ශ්‍රී ලාංකික LGBTQ ජනතාවට සමස්ත ලොවපුරා පැතිර තිබෙන අසම්මත ජනසමූහය (queer) විසින් නිර්මිත ශාස්ත්‍රීය

4 ඉහත සඳහන් කරන ලද ***La Rue, F. (2011)*** කෘතියෙහි පිටුව 14.

නිර්මාණ සම්භාරයට ප්‍රවේශවීමට හැකියාව ඇති කර තිබේ. ශ්‍රී ලංකාව තුළ LGBTQ අයිතිවාසිකම් දිනාගැනීම සඳහා "ව්‍යාපාරයක" යෙදී සිටින බොහොමයක් දෙනෙක් අන්තර්ජාලය මගින් ජනිත කරන ලද පුද්ගලත්වවාදය පිළිබඳව හා ප්‍රජාව සජීවීකරණය කිරීමේ දී මෙන්ම ප්‍රජාව සංවිධානය කිරීම සඳහා එහි ඇති හානිකර බලපෑම පිළිබඳව මැසිවිලි නගති. සත්‍ය වශයෙන්ම, "සමාජ ක්‍රියාවෙන් වෙන්ව පවත්නා ක්ෂේත්‍රයක් වශයෙන් අන්තර්ජාලය තුළ පවතින අතථ්‍ය බව හා තථ්‍ය බව වියෝජනය කළ නොහැකි බවද"[5] [...] "අන්තර්ජාලය මෙන්ම පරිගණක පද්ධතීන් හරහා සම්බන්ධ නොවී කෙරෙන අන්තර්ක්‍රියා හා අත්දැකීම් මටසිලිටි නොවන බවත් බාධා රහිත නොවන බවත්"[6] පුළුල් ලෙස ප්‍රකාශ කළද අන්තර්ජාලය LGBTQ ශ්‍රී ලාංකිකයින්ගේ ජීවිතවලට වැදගත් වන ආකාරය පිළිබඳව වන වර්තමාන අධ්‍යයනයේ සොයාගැනීම් උක්ත ප්‍රකාශය යම් සැක සංකා ගොඩකට තල්ලු කරනු ලැබේ.

මෙම අධ්‍යයනයේ පළමු කාණ්ඩය, ස්වාධීන කාණ්ඩයන් තුනක් යටතේ ඉදිරිපත් කරනු ලැබේ. *පසුබිම* යනුවෙන් නම් කර ඇති පළමුවන ස්වාධීන කොටස, LGBTQ ශ්‍රී ලාංකිකයින් වාසය කරන සමාජ ආර්ථික පරිසරයේ සමග්‍රහ කරන ලද දළ විශ්ලේෂණයක් සපයනු ලැබේ. *ලිංගිකත්වය සහ ශ්‍රී ලංකාවේ අන්තර්ජාල අවකාශය* යනුවෙන් නම්කර ඇති දෙවන කොටස, සමීක්ෂණ ප්‍රශ්නාවලියේ, ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා හා තනි පුද්ගල සම්මුඛ සාකච්ඡාවල ප්‍රධාන මෙන්ම ප්‍රබල සොයාගැනීම් සාකච්ඡාවට බඳුන් කරනු ලැබේ. *නීතිය සහ ප්‍රතිපත්තිය* යනුවෙන් නම්කර ඇති තෙවන කාණ්ඩය, ඉදිරි කාණ්ඩයකදී සාකච්ඡාවට බඳුන් කරනු ලබන ගැටලු සංයුක්ත කිරීමට සහ සාකච්ඡාවට දායක වන නීතිමය රාමුව තුළ පවත්නා කාරණා සමග සම්බන්ධ වේ.

මෙම අධ්‍යයනයේ දෙවන කාණ්ඩය, සමලිංගික ස්ත්‍රීන් අන්තර්ජාල අවකාශයෙහි නිමග්න වන ආකාරය පිළිබඳව වන එයටම සුවිශේෂී වූ විශ්ලේෂණයකි. එක්වතාවකදී එක් පුද්ගලයකු සමග පමණක් පවත් වන සම්මුඛ සාකච්ඡා සහ ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාවක් හරහා රැස් කර ගන්නා ලද තොරතුරු අවධාරණය කරන ආකාරයට, පංති සහ වාර්ගික වැනි ස්වරූපයන් පැවතිය ද සමලිංගික ස්ත්‍රීන්ගේ අන්තර්ජාල නිමග්නවීම සුවිශේෂී ආකාරයට සමාජභාවී සහ ලිංගිකකරණයට භාජනය කරන ලද අත්දැකීම් වශයෙන් සලකනු

5 ඉහත සඳහන් කරන ලද Corrêa, S. et al. (2011) කෘතියෙහි පිටුව.
6 එම.

ලැබීමේ අවශ්‍යතාවය පෙන්වනු ලැබේ. අන්තර්ජාල අවකාශය සඳහා ඔවුන්ගේ ප්‍රවේශය විෂමලිංගික සහ පුරුෂාධිපත්‍යයික සමාජ පද්ධතියකින් ශබ්ද නඟා ආමන්ත්‍රණය කර සාකච්ඡා කරනු ලැබීමට තිබෙන අවබෝධය හරහා අනාවරණය කරගනු ලැබීය.

මෙහි පහත කොටස්හි, අපගේ පර්යේෂණ අරමුණු, පර්යේෂණ ක්‍රමවේදය සහ ප්‍රධාන සීමාවන් සංක්ෂේපයෙන් දක්වා ඇත්තෙමු.

## අරමුණු

1. LGBTQ ශ්‍රී ලාංකිකයින් ඔවුනගේ මානව අයිතීන් භුක්ති විඳීම සඳහා අන්තර්ජාල අවකාශය සහ සේවාවන් භාවිතා කරන ආකාරය ගවේෂණය කිරීම.

2. LGBTQ ශ්‍රී ලාංකිකයින්, ඔවුනගේ මානව අයිතිවාසිකම්වල අභිවෘද්ධිය උදෙසා අන්තර්ජාල අවකාශය භුක්ති විඳීමේදී හා භාවිතයේදී මුහුණ දෙන සීමාවන් සහ සීමා කිරීම් සෝදිසි කිරීම

3. LGBTQශ්‍රී ලාංකිකයින් විසින් අන්තර්ජාල අවකාශය භුක්ති විඳින සහ භාවිතා කරන තත්ත්වයන් වර්ධනය කළහැකි ප්‍රධාන ප්‍රතිපත්ති සංශෝධන හඳුනා ගැනීම.

## ක්‍රමවේදය

මෙම අධ්‍යයනය, ගුණාත්මක සහ ප්‍රමාණාත්මක ක්‍රමවේදයන් අන්තර්ගත වන මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදයක් භාවිතා කරන ලදී. ඒ සඳහා පහත සඳහන් ක්‍රමවේද අන්තර්ගත විය.

1. ශ්‍රී ලංකාවේ වෙසෙන LGBTQ ජනතාවට සම්බන්ධ වන නීතිමය රාමුව සමාලෝචනය කිරීම සහ අන්තර්ජාල ප්‍රවේශය පිළිබඳව පවතින ආකල්ප අවබෝධ කර ගැනීම පිණිස අදාළ නීති ආඥාපනත් සහ අන්තර්ජාල සේවා සපයන්නන්ගේ බලපත්‍ර මෙන්ම අන්තර්ජාලය හා සම්බන්ධ ප්‍රතිපත්තීන් සමාලෝචනය කිරීම.

2 සිවිල් සමාජයේ හරස් කැපුමක් පෙන්නුම් කරන පරාසයකින් යුත් රාජ්‍ය අංශය (නීතිය බලාත්මක කිරීම, ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය, ශ්‍රී ලංකා පරිගණක හදිසි ආපදා ප්‍රතිචාර දැක්වීමේ කණ්ඩායම), පෞද්ගලික අංශය (ISPs), LGBTQ සමාජභාවී සංවිධාන, කණ්ඩායම් හා පුද්ගලයින් සහ මානව අයිතීන්

ක්‍රියාකාරිකයින් වැනි පාර්ශවකරුවන් 10 දෙනෙක් සමග අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා පැවැත්වීම.

3 ශ්‍රී ලංකාවේ LGBTQ සංවිධාන හා එම ප්‍රජාවේ සමාජිකයින් සමග යොමුගත කණ්ඩායම් සාකච්ඡාවක් පැවැත්වීම. යොමුගත කණ්ඩායම් සාකච්ඡා සඳහා වෙනස සංක්‍රාන්තික සමාජභාවී ජාලය, DAST කණ්ඩායම, Heart to Heart හා Young Out Here වැනි සංවිධාන සහභාගී විය. මෙම කණ්ඩායම්වලට අමතරව ශාස්ත්‍රීය ලෝකය, වෛළඳ දැන්වීම්, නිරූපණය යන අංශ නියෝජනය කරන සාමාජිකයින් මෙන්ම LGBTQ ක්‍රියාකාරකයින් සාකච්ඡාවලට සහභාගී විය. සියලුදෙනාම එකතුව, සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයින් 4ක්, සමලිංගික පුරුෂයින් 6ක්, සමලිංගික ස්ත්‍රීන් 2ක් හා ද්විලිංගික පුරුෂයින් 2ක් ද ඇතුලත්ව 14ක් සහභාගී විය.

4 LGBTQ ජනතාව අන්තර්ජාලය භාවිතා කරන ආකාරය හා ඒ සඳහා ඇති ප්‍රවේශය මෙන්ම ඔවුන් අතර අන්තර්ජාලය හා සම්බන්ධ ආරක්ෂාව පිළිබඳ දැනුම අවබෝධ කර ගැනීමට පවත්වන ලද අන්තර්ජාල සමීක්ෂණයට ප්‍රතිචාර 85 ක් ලැබීම. සමීක්ෂණය, LGBTQ සංවිධාන හා ප්‍රජා සාමාජිකයින් සමග පවත්වන ලද උපදෙස් ලබා ගැනීම් පදනම් කරගෙන නිර්මාණය කරන ලදී. සමීක්ෂණය සඳහා ස්ත්‍රීන් 32 ක්, පුරුෂයින් 46 ක්, සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයින් 3ක් හා සමාජභාවී අනන්‍යතාවය හඳුන්වා නොදුන් පුද්ගලයින් 2ක් ප්‍රතිචාර දැක්විය. ප්‍රතිචාරකයින් LGBTQ සංවිධාන හා කණ්ඩායම් හරහා හඳුනා ගැනුණි. සහභාගිවන්නන්ගේ නිර්නාමිකත්වය ආරක්ෂා කිරීම සඳහා සමීක්ෂණය අන්තර්ජාලය හරහා පැවැත් වීය.

5 පර්යේෂණය, පර්යේෂකයින් දෙදෙනෙක් (ස්ත්‍රියක සහ පුරුෂයකු) විසින් කරන ලදී. මෙම පර්යේෂකයින් දෙදෙනාටම ලංකාවේ LGBTQ ප්‍රජාව සමග ධනාත්මක අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් පවතින අතර ඔවුන්ට සමලිංගිකත්වය සාපරාධී ක්‍රියාවක් යන සමාජ මතවාදය අහෝසි කිරීමට කටයුතු කරන්නන් වශයෙන් මෙන්ම ලිංගික සුළුතර කණ්ඩායම්වල මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට පෙනී සිටින්නන් වශයෙන් පිළිගැනීමක් පවතී. පර්යේෂකයින් දෙදෙනා සෑම සම්මුඛ සාකච්ඡාවකට ම සහභාගී වූවත් එක් අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡාවකට පමණක්

ප්‍රතිචාර දක්වන්නාගේ ඉල්ලීම පරිදි පර්යේෂකවරිය පමණක් සහභාගී විය.

කොළඹ දී පවත්වන ලද සමාජ මාධ්‍ය වේදිකා සහ අතථ්‍ය නොවන සංසඳ - එනම්, ශ්‍රී ලංකාව සහ එක්සත් ජාතීන් විසින් පවත්වන ලද සයිබර් සූරාකෑමේ ප්‍රතිපත්ති පෙරනිවේදනය, ළමා ආරක්ෂණ අධිකාරිය විසින් පවත්වන ලද අන්තර්ජාල ක්‍රියාකාරී සමූහය වැනි අංශද අධ්‍යයනයට භාජනය කරන ලදී. පොත්පත් සමාලෝචනයේ සොයා ගැනීම් යොමුගත කණ්ඩායම් සාකච්ඡා සහ අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා අතරතුරදී හරස්-පරීක්ෂණයකට භාජනය කරන ලද අතර එම කාරණා සමීක්ෂණය ක්‍රමානුකූලව සහ විධිමත්ව සිදුකිරීමට භාවිතා කරන ලදී.

මෙම අධ්‍යයනයේ අරමුණ වෙනුවෙන් විවිධ මූලාශ්‍ර වෙතින් ලබාගන්නා ලද දත්ත එකිනෙකට ගලපා ගන්නා ලද අතර ඒහෙයින්ම පර්යේෂණ වාර්තාව තුළ භාවිතා කරන ලද විවිධ ක්‍රමවේද හුදකලාව නොපැවත ඒවායේ එකතුවක් ලෙස පවතී.

## *අධ්‍යයනයේ බාධක සහ සීමාවන්*

1. රාජ්‍යයේ මුරකිරීම පිළිබඳ තොරතුරු නීතිමය සීමාවන් නිසාවෙන් ලබා ගත නොහැකි වූ අතර සංඛ්‍යාංක (ඩිජිටල්) යටිතල පහසුකම් සහ ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම් දරන ඇතැම් රජයේ නියෝජිතයින්ගේ හමුව සිදු නොවුනි. LGBTQ ප්‍රජාවගේ අවශ්‍යතා සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට ඉල්ලීම් කිරීම අගය කිරීමට ලක් නොවූ අතර රජයේ නියෝජිතයින් අතින් බොහෝවිට අතපසු වීමට ද ලක් විය.

2. සමීක්ෂණය තුළ අසමාන ලෙස නියෝජනය වීම නිසාවෙන් හරස්-ප්‍රජා සංසන්දනය ශක්‍යතාවයෙන් තොරවිය. සංක්‍රාන්තික සමාජභාවී ප්‍රජාවට අන්තර්ජාලයට ප්‍රවේශවීමට පහසුකම් අවමවීම නිසාවෙන් ඔවුන් හා සම්බන්ධවීම දුෂ්කර කාර්යයක් බව ප්‍රත්‍යක්ෂ විය. අදාල ජනසංඛ්‍යාන තොරතුරු ලබාගැනීමට තිබූ සමහර දුෂ්කරතාවයන් බොහොමයක්, විෂම ලිංගික නොවන සහ උපතේ දී උරුම කරගත් ලිංගික අවයවවලට අනුගාමී සමාජභාවයට වඩා වෙනස් සමාජභාවයන් ආරෝපණය කරගන්නා ශ්‍රී ලාංකිකයින්ට රහසේ, නිහඬව බාහිර ලෝකයේ අවමන් පරිභව මැද්දේ ජීවත්වීමට පොළඹවා තිබෙන ශ්‍රී ලංකාව

තුළ සමලිංගිකත්වය සංජානිත සාපරාධී වරදක් වීම නිසාවෙන් පැන නැගුණ ඒවාය.


3. කෙතරම් ප්‍රයත්න දැරූව ද අවාසනාවන්ත ලෙස පර්යේෂණ කණ්ඩායමට ශ්‍රී ලංකාවේ තිබෙන ප්‍රධාන පෙළේ LGBTQ සංවිධානයක් වන Equal Ground සමග සම්මුඛ සාකච්ඡාවක් කිරීමට නොහැකි විය. නිසැකයෙන් ම මෙය පර්යේෂණ වාර්තාව තුළ, විශේෂයෙන්ම මෙම ආයතනය විසින් ලේඛනගත කරනු ලබන සයිබර් ප්‍රචණ්ඩත්වය පිළිබඳ සිද්ධීන් සම්බන්ධයෙන් එක්තරා ආකාරයකට හිඩැසක් නිර්මාණය කළේය.

4. කාලය හා සම්බන්ධයෙන් පැවති සීමාවන් නිසාවෙන් 2017 වර්ෂයේ ජනවාරි මාසයේ දී පැවත් වූ සමලිංගිකත්වය සාපරාධී ක්‍රියාවක් යන්න අහෝසි කිරීම අරමුණු කරගත් සාකච්ඡා හා ක්‍රියාකාරකම් වාර්තාවට අන්තර්ගත කිරීමටද පර්යේෂණ කණ්ඩායමට නොහැකි විය.

## ප්‍රධාන සොයාගැනීම්


සමීක්ෂණය විසින් ප්‍රතිචාර දක්වන්නන් 85 ක් ආවරණය කරන ලදී.

### *ප්‍රජා විද්‍යාත්මක තොරතුරු*





රූප සටහන 1: සමීක්ෂණ ප්‍රතිචාරකයින්ගේ සමාජභාවී අනන්‍යතාවය

සමීක්ෂණය 59.5% වූ පුරුෂයින් විසින් ආධිපත්‍යය ගනු ලැබූ අතර ස්ත්‍රී සහභාගිත්වය 34.5% ක් විය. සමීක්ෂණයට සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින් 3 දෙනෙක් පමණක් සහභාගි විය.





රූප සටහන 2: සමීක්ෂණ ප්‍රතිචාරකයින්ගේ ලිංගික දිශානතිය

ලිංගික දිශානතිය සම්බන්ධයෙන් වූ පැනයට ප්‍රතිචාර දක්වමින්, ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 59.5% ක් තමන් සමාන ලිංගික අවයව සහිත පුද්ගලයින්ට පමණක් ඔවුහු ආකර්ෂණය වන බව ප්‍රකාශ කළෝය. 28.6% ක් තමන් ද්විලිංගික වන බව ප්‍රකාශ කළ අතර 9.5% පුද්ගලයකුගේ ලිංගික අවයව අදාල නොවන බව ප්‍රකාශ කළහ. සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයින් දෙදෙනෙක් විසින් ඔවුන් විෂම ලිංගික වන බව ප්‍රකාශ කරන ලදී.




රූප සටහන 3: සමීක්ෂණ ප්‍රතිචාරකයින්ගේ වයස

ප්‍රතිචාරකයින්ගෙන් අඩකටත් වඩා අවුරුදු 25-34 වයස් කාණ්ඩයට අයත් වේ.




රූප සටහන 4: සමීක්ෂණ ප්‍රතිචාරකයින්ගේ අධ්‍යාපන පසුබිම

15.5% ශාස්ත්‍රපති උපාධිය ද 47.8% ප්‍රථම උපාධියද සහිතව ප්‍රතිචාරකයින්ගෙන් බහුතරයකට උසස් අධ්‍යාපන සුදුසුකම් තිබුණි. 11.9% ක් පමණක් ඔවුන්ට අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ සාමාර්ථයක් ඇති බව ඔවුන් විසින් ප්‍රකාශ කරන ලදී.

දෙවන **කොටස**

# පසුබිම

## *ශ්‍රී ලංකාවේ ලිංගිකත්වය*

මෙම පර්යේෂණ පත්‍රිකාව තුළදී LGBTQ ශ්‍රී ලාංකිකයින් ලෙස හඳුන්වනු ලබන, විෂම ලිංගික නොවන සහ උපතේ දී උරුම කරගත් ලිංගික අවයවවලට අනුගාමී සමාජභාවයට වඩා වෙනස් සමාජභාවයන් ආරෝපණය කරගන්නා ජනතාව, විධිමත් ආකාරයට නොපෙනෙන ආවරණයකට යටත්ව ජීවත් වේ. අනූව දශකයේ මුල් භාගයේ සිට නීතිමය හඳුනාගැනීමක් ලබා ගැනීමට සහ ප්‍රතිසංස්කරණ සඳහා කරනු ලබන අඛණ්ඩ අරගල තිබියදීත් මෙම විකල්ප අනන්‍යතාවයන් සහිත බොහොමයක් ජනතාව එකිනෙකාගෙන් ඈත්ව, ප්‍රජා සංවිධානවලට සමීපවිය නොහැකි ලෙස, රජය සමග සබඳතාවයන්ගෙන් තොරව, රහසේ ජීවත් වේ.

මෙම නොපෙනෙන ලෙස ජීවත්වීමේ තත්ත්වය සහ හුදකලාවීම, ලිංගිකත්වය සහ ලිංගික සබඳතා පිළිබඳව වන කතිකාවන් මෙන්ම ආකල්ප, ලිංගික සහ සමාජභාවී විවිධත්වයට එරෙහි වන සමාජගත සහ සංස්කෘතික බලවේගයන් විසින් දැඩිලෙස පාලනය කරනු ලබන, පුළුල් වශයෙන්ම ශ්‍රී ලාංකීය "ගතානුගතිකත්වයේ" ප්‍රතිඵලයකි.

ශ්‍රී ලංකාවේ ලිංගික ගතානුගතිකත්වය දැඩි ස්ත්‍රී/පුරුෂ ද්විත්ව ඉදිකිරීම මත පදනම් වූ සමාජභාවී භූමිකා හරහා පුද්ගලයින් විධිමත් සහ ක්‍රමවත් බවට පමුණුවනු ලැබේ; ලිංගභාවය "ප්‍රජනන තර්කනය"[7] මගින් සීමා කිරීමට ලක්කර ඇත. ලිංගිකත්වය විවාහයට සීමාකර ඇති අතර වෛවාහික සීමාවන්ගෙන් පිටත ලිංගික ජීවිත ගත කරන පුද්ගලයින්, විශේෂයෙන්ම ඔවුන් ස්ත්‍රීන්නම් සමාජ අපකීර්තියට ලක් කෙරේ. ප්‍රසිද්ධියේ සාකච්ඡාවකට එළැඹීම අධෛර්යයට පත් කරන ආකාරයට ලිංගිකත්වය හා සම්බන්ධ ගැටලු "පෞද්ගලීකකරණය කර" ඇත. රජයේ පාසල්වල සවිස්තරාත්මක ලිංගිකත්ව අධ්‍යාපනය සැබවින්ම නොපවතින අතර තිබුණත් ඒ පෞද්ගලික පාසල් කිහිපයක පමණි.[8]

මෙම ගතානුගතිකත්වය ප්‍රසිද්ධ ජීවිතයේ බොහොමයක් පැතිවලට, විශේෂයෙන්ම නීතිමය සහ ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණවලට සැලකිය යුතු බලපෑමක් ඇති කරයි. ඒ කෙසේවෙතත් මෙම ගතානුගතිකත්වයෙන් ඔපවැටී සැබැවින්ම ඉන් ඔබ්බෙහි පවතින්නේ එවැනි වටිනාකම්වලට අනුකූලතාවය නොදක්වන සේ පෙනෙන, බොහොමයක් ශ්‍රී ලාංකිකයින්ගේ පෞද්ගලික ජීවිත වේ. පවුල් සෞඛ්‍ය කාර්යාංශයට අනුව මහජන සෞඛ්‍ය සේවා නිලධාරිනිය යටතේ ලියාපදිංචිය ලත් යෝග්‍ය පවුල්[9] අතර ප්‍රතිසන්ධිරෝධක (ඕනෑම ක්‍රමයක්) ව්‍යාප්ති අනුපාතය 64.9% ක් වන ශ්‍රී ලංකාව, කලාපයේ ප්‍රශස්ත පවුල් සංවිධාන කාර්යසාධනයක් වාර්තා කරයි.[10] ඉහල ප්‍රතිසන්ධිරෝධක ව්‍යාප්ති අනුපාතයක් පැවතීමෙන් පෙන්නුම් කරන්නේ ප්‍රජනන ධර්මතාවයන්ගේ අපේක්ෂාවන්ට පරිබාහිරව ලිංගික ක්‍රියාකාරකම අඹු සැමියන් අතර (නීත්‍යානුකූලව විවාහ වූ හෝ එකට වාසය කරන) පැහැදිලිවම සිදුවන බව ය.

2011 වසරේදී, ප්‍රවාහන අමාත්‍යාංශය, පොදු ප්‍රවාහන සේවාවන් භාවිතා කරන අතරතුරදී සෑම ස්ත්‍රීන් 4 දෙනෙක් ගෙන් එක් අයෙක් ලිංගික හිංසනයට භාජනය වන බව වාර්තා කළේය. එම වසරේ

7 Groundviews. (2016, 25 August). Submission on LGBTIQ Persons and Transitional Justice Mechanisms. *Groundviews.*groundviews.org/2016/08/25/submission-on-lgbtiq-persons-and-transitional-justice-mechanisms/

8 Women and Media Collective. (2015, 6 March). Country Profile on Universal Access to Sexual and Reproductive Health: Sri Lanka. *Women and Media Collective.*womenandmedia.org/country-profile-on-univeĺal-access-to-sexual-and-reproductive-health-sri-lanka/

9 ස්ත්‍රියට වයස අවුරුදු 15 - 49 සහ / හෝ වයස අවුරුදු 5ට වඩා අඩු දරුවෙක් සිටින නීත්‍යානූලව විවාහ වූ හෝ විවාහ නොවී එකට වාසය කරන පවුල යෝග්‍ය පවුලක් වශයෙන් නිර්වචනය කරනු ලැබේ. විවාහකබව සහ වයස සහ තනිකඩ ස්ත්‍රීන් (වැන්දඹු, නීත්‍යානූකූලව වෙන්වූ, වෙන්වූ) යන කාරණා නොතකා ගර්භණී හෝ විවාහ නොවී එකට වාසය කරන පවුල් ද යෝග්‍ය පවුල් වශයෙන් සලකනු ලැබේ.

10 Family Health Bureau, Ministry of Health Sri Lanka. (2013). *Annual Report on Family Health 2013*. Colombo. http://medicine.kln.ac.lk/depts/publichealth/Fixed_Learning/annual_report_2013.pdf

පශ්චිම භාගයේදී නීති ආධාර කොමිෂන් සභාව පොදු ප්‍රවාහන සේවාවන් තුළදී 70% කටත් වඩා ස්ත්‍රීන් (වයස අවුරුදු 15-45 අතර) ලිංගික හිංසනයට භාජනය වන බවට අදහස් දැක්වීය. 2015 දී, එක්සත් ජාතීන්ගේ ජනගහණ අරමුදලේ ශ්‍රී ලංකා කාර්යාලය මෙම සංඛ්‍යාව 90%ටත් වඩා ඉහල ගොස් තිබෙන බව ප්‍රකාශ කළේය. අනාරක්ෂිත ලිංගික ක්‍රියාවන් නිසාවෙන් 2015 වසරේ දී පාසල් සිසුන් 23 කට සහ 2014 දී සිසුන් 22කට එච්.අයි.වී. වෛරසය සම්ප්‍රේෂණය වී ඇති බව ජාතික එච්.අයි.වී. වැඩසටහනේ අධ්‍යක්ෂක වන වෛද්‍ය සිසිර ලියනගේ ප්‍රකාශ කළේ ය.[11] සිතියම්ගත කිරීමේ අධ්‍යයනයන් ශ්‍රී ලංකාව තුළ ආසන්න වශයෙන් 35,000-47,000 ස්ත්‍රී ලිංගික ශ්‍රමිකයින් ද 24,000-37,000 වන පුරුෂයින් සමග ලිංගික සබඳතා පවත්වන පුරුෂයින් ද සිටින බව තක්සේරු කරනු ලැබේ.

මෙම සන්දර්භය තුළ, සියලුම මිනිසුන් එක්කෝ පුරුෂ නැතහොත් ස්ත්‍රීන් යන්න, ඔවුන්ගේ ලිංගේන්ද්‍රිය පමණක්ම මත තීරණය වන බව ද විරුද්ධ ලිංගිකයින්ට ආකර්ෂණයවීම සියලු ජනතාවගේ "ස්වාභාවික" ලිංගික නැම්ම බව ද යන අසත්‍ය උපකල්පන පදනම් කරගෙන ශ්‍රී ලංකාවේ ලිංගිකත්වය සහ සමාජභාවය පිළිබඳව පිළිගත් ආඛ්‍යාන ගොඩනැගී තිබේ.

මෙම උපකල්පනයන් විෂමලිංගික නොවන සහ උපතේ දී උරුම කරගත් ලිංගික අවයවවලට අනුගාමී සමාජභාවයට වඩා වෙනස් සමාජභාවයන් ආරෝපණය කරගන්නා ජනතාවට එරෙහිව සමාජ අපවාද හා වෙනස්කොට සැලකීම් පුළුල් ලෙස සමාජයේ පැතිරීම, බොහෝ දෙනෙකුට රහස් ජීවිත ගතකිරීමට බලපෑම් කිරීම, ඔවුන්ගේ ලිංගික ප්‍රකාශනයන් සහ සබඳතා බලෙන් යටපත් කිරීම, සෞඛ්‍ය සත්කාරක සේවා, අධිකරණ ක්‍රියාවලියට ප්‍රවේශය, අධ්‍යාපනය වැනි අත්‍යවශ්‍ය සේවාවන් ලබා ගැනීමෙන් කොන් කිරීම සහ වඩාත් අවදානම් සහගත ජීවිත ගත කරන්නන් සමාජ-ආර්ථික සහ පුද්ගල අනාරක්ෂිතභාවයෙන් යුත් ජීවිත ගත කිරීමට දණ්ඩනය කිරීම කර තිබේ.

11 Bakamoono. How does accurate and comprehensive sexuality and relationship education help prevent HIV? *bakamoono.*www.bakamoono.lk/en/hiv/30/how-does-accurate-and-comprehensive-sexuality-education-help-prevent-hiv

## සමලිංගිකත්වය සහ නීතිය

මෙම සමාජ අපකීර්තියේ හා වෙනස්කොට සැලකීමේ ප්‍රධාන දර්ශකය දණ්ඩ නීති සංග්‍රහයේ 365 සහ 365A වගන්ති යටතේ පිහිටා තිබේ.

පළමු වගන්තියෙන් "ස්වභාව ධර්මයේ අනුපිළිවෙලට එරෙහිව සිදුකරන කායික සංසර්ගය" ද දෙවන වගන්තියෙන් පුද්ගලයින් අතර "දැඩි අශිෂ්ට ක්‍රියාවන්" සාපරාධී වරදක් සේ සලකනු ලැබේ. මෙම නීති දශක ගණනාවක් තිස්සේ විවේචනවල වස්තු විෂය බවට පත්වී තිබෙන අතර ඒවා අවලංගු කිරීමට අඩුම තරමින් අනුව දශකයේ මැද භාගයේ සිට පුනපුනා ඉල්ලා සිටියේ ය.[12] මෙම නීති ප්‍රතිපාදන අඩුම තරමින් 1948දී ස්වාධීනත්වය ලැබූ දා සිට විධිමත්ව බලාත්මක නොවී පැවතිය ද[13] "මහජන සාමය සහ සදාචාරය" ආරක්ෂා කිරීම සඳහා ඒවායේ අවශ්‍යතාවය 2014 වැනි ඉතා මෑතකදී ජිනීවාහි පැවති මානව හිමිකම් කමිටුව ඉදිරිපිට දී රජය විසින් ප්‍රසිද්ධ ප්‍රචාරණය සඳහා යොදාගෙන ඇත.[14] 2016 අවසානයේ දී පවා, පොලීසිය අඛණ්ඩව ප්‍රශ්න කිරීම් කළ අතර ඒවා රටෙහි "වලංගු" නීති ලෙස සලකා එම නීති ප්‍රතිපාදන යටතේ පුද්ගලයින් සිරබාරයට ගෙන ඇත.[15]

ඊක්වල් ග්‍රවුන්ඩ් (Equal Ground) ආයතනය විසින් කරන ලද තත්ත්ව විග්‍රහයක් දණ්ඩ නීති සංග්‍රහයේ 365 හා 365A වගන්ති "LGBTQ ප්‍රජාව ඉලක්ක කරගැනීමට හා හිංසනයට භාජනය කරන මෙවලමක්"වශයෙන් ඉස්මතු කර පෙන්වයි.[16] ඒ කෙසේවුවත්, ඒ අතරම "දෙමාපිය, ප්‍රජා හා සංස්කෘතික මුරකිරීම... විකල්ප ලිංගිකත්ව ප්‍රකාශන මර්දනය කර සමාජභාවී ඒකාකෘති පවත්වා

---

12 Baudh, S. (2013). Decriminalisation of consensual same-sex sexual acts in the South Asian Commonwealth: Struggles in Context. In C. Lennox & M. Waites (Eds.), Human Rights, Sexual Orientation and Gender Identity in The Commonwealth: Struggles for Decriminalisation and Change. London: Institute of Commonwealth Studies, Human Rights Consortium.

13 Equal Ground et al. (2013, December). "There have been no convictions under 365 and 365A since Sri Lanka gained independence in 1948." Human Rights Violations Against Lesbian, Gay, Bisexual, and Transgender (LGBT) People in Sri Lanka.tbInternet.ohchr.org/Treaties/CCPR/Shared Documents/LKA/INT_CCPR_ICO_LKA_15986_E.pdf

14 Reporter. (2014, 20 October). Sri Lanka Government says LGBT Rights are Constitutionally Protected. OutRight Action International.www.outrightinternational.org/content/sri-lanka-government-says-lgbt-rights-are-constitutionally-protected

15 නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ 'High-level Dialogue on Human Rights and Constitutional Reform' යනුවෙන් ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමය සහ වෙනත් අය විසින් සංවිධානය කරන ලද පවත්වන ලද සම්මන්ත්‍රණයකදී කරන ලද කතාව. කොළඹ, 2016 දෙසැම්බර් 16

16 Thangarajah, P. (2013). *Strengthening of Legal Protection for LGBT in Sri Lanka: Road to Decriminalization*. Equal Ground GROUND.issuu.com/equalground/docs/situation_analysis

ගෙනයාමට නීතිය හා *සමග පටලැවෙන*"[17] බව මෙම විග්‍රහය තවදුරටත් අවධාරණය කර පෙන්වයි. ශ්‍රී ලංකාවේ සිදුවූ එවැනි මුරකිරීම් සම්බන්ධයෙන් වාර්තාව ගෙන හැර පාන ප්‍රබල උදාහරණයක් වන්නේ, ඔවුන්ගේ ලිංගික සහ සමාජභාවී ප්‍රකාශනයන්ගේ විෂමතාවයන් නිසා 365 වගන්තියට අනුව "ස්වභාව ධර්මයේ අනුපිළිවෙලට එරෙහිව සිදුකරන කායික සංසර්ගයේ"[18] හා 365A වගන්තිය යටතේ "දැඩි අශිෂ්ට ක්‍රියාවන්" හි යෙදීමේ භව්‍යතාවය හඟවන හෙයින් සමාජභාවයට අනුකූලතාවය නොදක්වන ජනතාව පොලීසියට අභිමත ආකාරයට අත්අඩංගුවට ගැනීමට බලතල හිමි වේ. කෙසේ නමුත් වැරදි කිරීමට සැක කරනු ලබන ජනතාවට විධිමත් නොවන ලෙස චෝදනා ඉදිරිපත් කිරීමේ පුරුද්ද නිසාවෙන්, 365 හා 365A වගන්ති "බලාත්මක කිරීම" මගින් සැකකාර පුද්ගලයින් අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීමට, අසාධාරණ අයකිරීම් කිරීමට, බලහත්කාරයෙන් ලිංගික අනුග්‍රහයන් ලබාගැනීමට හා සමහරක් අවස්ථාවන්වලදී ලිංගික බලහත්කාරකමේ යෙදීමට පවා පොලීසියට හැකියාව ලබා දී තිබේ.[19] තවද, මෙම නීතීවල පැවැත්ම මගින් එවැනි ප්‍රචණ්ඩත්වයේ ප්‍රතිඵල සමග ජීවත්ව සිටින්නන්, පොලීසියට එවන් අපරාධ වාර්තා කිරීමට හෝ අනෙකුත් ප්‍රතිකාර්මික යාන්ත්‍රණයන්ට ප්‍රවේශ කිරීම වලක්වාලනු ලබයි.

නීතිය, නීතිය බලාත්මක කිරීමෙන් ඔබ්බට ගොස්, අනාගත ගෙවල් හිමියන් විසින් නවාතැන් ලබාදීම ප්‍රතික්ෂේප කිරීම,[20] රැකියා අවස්ථාවන් ප්‍රතික්ෂේප කිරීම,[21] එමෙන්ම එක් ලේඛකයෙක් වාර්තා කළ අන්දමට ප්‍රධාන ධාරාවේ පුවත්පත් විසින් සමසෙනෙහස් වැඩසටහනක් සඳහා ප්‍රචාරණ අවකාශය ලබාදීම ප්‍රතික්ෂේප කිරීම[22] වැනි බොහොමයක් වෙනස්කොට සලකන ක්‍රියාවන් සිදුවීමට අවකාශය ඇතිකර දේ. මෙලෙස, නීතිය මගින් පැහැදිලි ලෙස තහනමට ලක්කර ඇති ක්‍රියාවන් ඉක්මවා එහි බලපෑම කථනය සහ චර්යාව වෙත සමීපවේ. ඇත්ත වශයෙන් කියතොත්, බොහොමයක් ලිංගික ක්‍රියා සාමාන්‍ය පෞද්ගලික සන්දර්භයක් තුළ සිදුවන

17 වගන්තිවලට අනුගාමී සටහන් 41. අවධාරණය එක් කරන ලදී.
18 එම.
19 ඉහත සඳහන් කරන ලද Equal Ground et al. (2013, December) කෘතියෙහි පිටු 4-6.
20 Equal Ground.(2012). *Towards a Lesbians, Gays, Bisexuals, Transexuals and Transgendered (LGBT) Stigma and Discrimination Index for Sri Lanka*. Equal Ground.issuu.com/equalground/docs/the_lgbt_stigma_and_discrimination_
21 එම.
22 ඉහත සඳහන් කරන ලද Baudh, S. (2013) කෘතියෙහි පිටුව 292..

හෙයින්, 365 සහ 365A වගන්ති සාපරාධී ක්‍රියා බවට පත්වනවාට වඩා ආසන්න වශයෙන් බෙලහීන තත්ත්වයට පත්වේ. එසේ වුවත් බලාත්මක කිරීමකින් තොරව පවා, නීතිය සමාජයේ විකල්ප ලිංගික දිශානතියකින් සහ සමාජභාවී අනන්‍යතා සහිත ජනතාවගේ සබඳතාවයන් සහ අනන්‍යතාවයන් මර්දනය කිරීමට ක්‍රියාත්මක වේ.

දණ්ඩ නීති සංග්‍රහයේ 399 වන වගන්තිය අනෙකකු ලෙස පෙනී සිටිමින් වංචා කිරීම වරදක් බවට පත් කරයි. වෙන කෙනෙක් වශයෙන් ව්‍යාජ ලෙස පෙනී සිටිමින් වංචාවේ නියැලේ නම් හෝ දැනදැනම වෙනත් අයෙක් වෙනුවට තව තැනැත්තෙක් ආදේශ කිරීමෙන්, හෝ ඔහු හෝ අනෙක් තැනැත්තා, සත්‍ය වශයෙන්ම ඔහු හෝ අනෙක් තැනැත්තා නොව වෙනත් තැනැත්තෙක් යයි නිරූපනය කරමින් යම් පුද්ගලයෙක් අනෙකකු ලෙස පෙනී සිටිමින් වංචාකිරීමේ යෙදී ඇති බව කියනු ලැබේ. පොලීසිය සංක්‍රාන්තික සමාජභාවී ජනතාව මෙම නීතිය යටතේ අත්අඩංගුවට ගන්නා බව කියනු ලැබේ.[23] "සමහර සිද්ධීන්වලදී පොලිස් නිලධාරීන් විසින් [සංක්‍රාන්තික සමාජභාවී ස්ත්‍රීන් සහ හරස් විලාසිතාකරුවන් (විරුද්ධ ලිංගිකයින්ගේ ඇඳුම් අඳින ජනතාව)] ලිංගික බලහත්කාරකමේ යෙදීම සමහරවිට අවිධිමත් ලෙස ආයතනගතවී ඇති බව පෙනේ.[24] 1841 අයාලේ යාම පනත එම ආකාරයෙන් ම අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීමට හෝ පොදු ස්ථානවල විවිධ සමාජ සහ ලිංගික අනන්‍යතාවයන් සහිත ශ්‍රී ලාංකිකයින් අතර කලහ ඇති කිරීමට භාවිතා කරනු ලැබේ.

## කොන්කිරීම සහ වෙනස්කොට සැලකීම

LGBTQ ශ්‍රී ලාංකිකයින් අත්දකිනු ලබන කොන්කිරීම හා වෙනස්කොට සැලකීම බලාත්මක නොකරන ලද, දණ්ඩ නීති සංග්‍රහයේ ඉතා දරුණු ප්‍රතිපාදනවලට පමණක් සීමා නොවේ. ඒවායින් සම්පූර්ණයෙන්ම වෙනස්ව, බොහොමයක් LGBTQ ශ්‍රී ලාංකිකයෝ නිවාස, රැකියා, අධ්‍යාපනය සහ පොදු සේවාවන්වලට ප්‍රවේශය වැනි ක්ෂේත්‍රවල අඛණ්ඩව සිදුවන වෙනස්කොට සැලකීමට

23 Human Rights Watch. (2016). *All Five Fingers are Not the Same: Discrimination on Grounds of Gender Identity and Sexual Orientation in Sri Lanka*. Human Rights Watch. www.hrw.org/report/2016/08/15/all-five-fingers-are-not-same/discrimination-grounds-gender-identity-and-sexual

24 Nichols, A. (2010). Dance Ponnaya, Dance! Police Abuses Against Transgender Sex Workers in Sri Lanka. *Sage*, 5(2), 195, 214. grassrooted.net/wp-content/uploads/2010/08/Nichols-Dance-Ponnaya-Dance.pdf qual Ground. (2012). *Towards aLesbians, Gays, Bisexuals, Transexuals and Transgendered (LGBT) Stigma and Discrimination Index for Sri Lanka*. ඉහත සඳහන් කරන ලද.

මුහුණ දෙති. වඩාත් වැදගත් ලෙස, ඔවුහු ඔවුන්ගේ පෞද්ගලික ජීවිත තුළ ද වෙනස් කොට සැලකීම අත්දකිති.

ඊක්වල් ග්‍රවුන්ඩ් ප්‍රකාශයට පත්කරන ලද කොන්කිරීමේ දර්ශකය[25] LGBTQ ප්‍රතිචාරකයින් 119 දෙනෙකුගෙන් සමීක්ෂණයකට රැස් කරගන්නා ලද දත්ත වාර්තා කරයි. එම වාර්තාවෙන් උපුටා ගන්නා ලද සමහරක් සොයා ගැනීම් පහත සඳහන් වේ. (මෙම සංඛ්‍යා ප්‍රතිචාරකයින් 119 දෙනෙකුගේ ප්‍රතිශතය මෙන්ම සමීක්ෂණය සිදු වූ දින දක්වා වසර දෙකක කාලයක් තුළ සිදුවූ සිදුවීම් ගෙන හැර දක්වයි)෴

- අඩුම තරමින් එක් වතාවක්වත් 11.76%ක් ආගමික ස්ථාන/ක්‍රියාකාරකම්වලින් ඉවත් කර තිබීම.
- අඩුම තරමින් එක් වතාවක්වත් 21.85% ක් පවුලේ එකමුතු අවස්ථාවලින් ඉවත් කර තිබීම.
- අඩුම තරමින් එක් වතාවක්වත් 24.37% දෙනෙකුට වාසස්ථාන වෙනස් කිරීමට හෝ නවාතැන්පලක් කුලියට ගැනීමට නොහැකි වීම.
- 25.21% කට ඔවුන්ගේ රැකියා අහිමිවීම.
- අඩුම තරමින් එක් වතාවක්වත් 28.57%ක් සමාජ එකමුතු/ ක්‍රියාකාරකම්වලින් ඉවත් කර තිබීම.
- 36.97%ක් කායික අපයෝජනයේ, හිංසනයේ, බියගැන්වීම්වල, පහරදීම්වල, ලිංගික බලහත්කාරකමෙහි සහ/හෝ අඩන්තේට්ටම්වල ගොදුරු බවට පත් විය.
- 62.18% දෙනෙකුට වාචිකව අපහාස, හිංසනය සහ/හෝ බියගැන්වීම කර තිබේ.
- 62.18%ක් යම් ආකාරයක මානසික හෝ භාවාත්මකව ඇති වන කම්පනය හෝ අපයෝජනයට මුහුණ දී ඇත.
- අඩුම තරමින් එක් වතාවක්වත් 74.79% ක් තමන් ඕපාදූපවලට භාජනය වූ බව දැනගෙන සිටීම.

කොන්කරනු ලැබීම හෝ වෙනස්කොට සැලකීම අත්දුටු ආකාරය සම්බන්ධයෙන් අසන ලද පැනයට "කවදාවත්ම නැත" යනුවෙන් බහුතරයක් ප්‍රතිචාරකයින් පිළිතුරු ලබාදුනි. එහෙත් ඔවුන්ගේ ඊළඟ ප්‍රතිචාර බොහොමයක්, ප්‍රතිචාරකයින් සමීප-නිරපේක්ෂ රහස්‍යභාවයෙන් යුතුව ඔවුන්ගේ ලිංගික දිශානතිය හෝ සමාජභාවී අනන්‍යනතාවය පවුලේ සාමාජිකයින්ට, සේව්‍යයාට හෝ සෞඛ්‍ය

25 Equal Ground.(2012). *Towards a Lesbians, Gays, Bisexuals, Transexuals and Transgendered (LGBT) Stigma and Discrimination Index for Sri Lanka*. ඉහත සඳහන් කරන ලද.

සත්කාරක වෘත්තිකයින්ට එළි නොකර තම ජීවිත ගත කරන ආකාරය පෙන්නුම් කරනු ලබයි. මේ අනුව, පුද්ගලයකුගේ ලිංගික දිශානතිය සහ/හෝ සමාජභාවී අනන්‍යතාවයේ (ස්වේච්ඡා හෝ නොවන) දෘශ්‍යතාවය හා සමාජයේ කොන්කිරීමට මෙන්ම වෙනස්කොට සැලකීමට භාජනය වීමට ඇති ඔවුන්ගේ අවදානම් සහගතභාවය අතර සම්බන්ධතාවයක් තිබිය හැකි වේ.

ඒ අතරම, මෙම අධ්‍යයනය තුළ සාකච්ඡාවට භාජනය කරනු ලබන කොන්කිරීමේ දර්ශකය වැනි පර්යේෂණ බොහෝමයක් "සංඛ්‍යාත්මක" දත්ත වශයෙන් සොයා ගැනීම් ඉදිරිපත් කිරීමෙන් වැළකී ඇති බව ප්‍රකාශ කළ යුතු වේ. ශ්‍රී ලංකාවේ LGBTQ පුද්ගලයින් මුහුණ දෙන ගැටලු සම්බන්ධයෙන් කරන ලද බොහෝ අධ්‍යයනයන් ඔවුන්ගේ පර්යේෂණයට භාජනය වන පුද්ගලයින්ට සේන්දුවීමේ ව්‍යුහාත්මක දුෂ්කරතාවයන්ට මුහුණ දේ. ගුණාත්මක තත්ත්වය පාලනය කිරීමෙන් අනතුරුව, ඊක්වල් ග්‍රවුන්ඩ් විසින් ප්‍රකාශයට පත් කරන ලද කොන්කිරීමේ දර්ශකය පිළිබඳව වූ සමීක්ෂණයට ප්‍රතිචාරකයින් 119 ක් විය. කාන්තා සහායක කණ්ඩායම විසින් කරන ලද Not gonna take it lying down' නම් වූ අධ්‍යයනයට විවිධ සමාජ සහ ලිංගික අනන්‍යතාවයන් සහිත ජනතාවගෙන් 33 ක් සමග සම්මුඛ සාකච්ඡා පවත්වා තිබුණි. Human Rights Watch ආයතනයේ ප්‍රකාශනයක් වන "All Five Fingers Are Not the Same" සඳහා සහභාගිවන්නන් 61 දෙනෙකු සම්බන්ධවී තිබුණි. මෙම වර්තමාන අධ්‍යයනයේ ප්‍රමාණාත්මක සමීක්ෂණය 85 දෙනෙකුගේ සහභාගිත්වය ලැබුණි.

**"මෙම පර්යේෂණය මුහුණදුන් ප්‍රධානතම අභියෝගයක් වූයේ නියැදිකරණයයි. විවිධ සමාජ සහ ලිංගික අනන්‍යතාවය හා සම්බන්ධ කොන්කිරීම කොතරම් පවතින්නේ ද පවසතොත් ඔවුන්ගේ පුළුල් ප්‍රජා සමූහයන් තුළ ඔවුහු විවිධ සමාජ සහ ලිංගික අනන්‍යතාවයන් සහිත ජනතාව ලෙස හඳුනා ගැනීමට කැමැත්තක් නොදක්වති. වෙනස්කොට සලකනු ලැබීමට ඔවුහු බිය වන අතර අවම ජන සංඛ්‍යාවක් ඔවුන්ගේ ලිංගික අනන්‍යතාවය සහ/හෝ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව දැනුවත් වන විට ඕනෑම ආකාරයේ වෙනස්කොට සැලකීම්වලට මුහුණදීමේ අවම අවස්ථාවන් ඇති බව ඒත්තු කර ගෙන සිටිති."[26]**

26 Equal Ground.(2012). *Towards a Lesbians, Gays, Bisexuals, Transexuals and Transgendered (LGBT) Stigma and Discrimination Index for Sri Lanka.*

සමාජ විද්‍යාත්මක පර්යාලෝකයකින් ස්වාධීන පර්යේෂකයින්ට LGBTQ පුද්ගලයින්ගේ ගැටලු අධ්‍යයනය කිරීම දුෂ්කර වන අතරම LGBTQ ශ්‍රී ලාංකිකයින් ශ්‍රී ලංකා රජයේ දැසට හසුනොවී අදෘශ්‍යමාන ලෙස වාසය කිරීම අඛණ්ඩව සිදුවේ. LGBTQ ශ්‍රී ලාංකිකයින් පිළිබඳව රජයේ හෝ නිලමය වශයෙන් ප්‍රසිද්ධියේ ඇති එකම නිල දත්ත වන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් UNAID වෙත සපයන ලද වාර්තාවේ "සමලිංගිකත්වය" සහ "පුරුෂයින් සමග ලිංගික සබඳතාවයන් පවත්වන පුරුෂයින්"යන සඳහනයි. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව ප්‍රථම වතාවට 2014 වසරේදී "ස්වයං-වාර්තාගත සෞඛ්‍ය පිළිබඳ ජාතික සමීක්ෂණය" පැවැත් වූවද එයට ප්‍රජනන සෞඛ්‍යය සහ ලිංගිකත්වයට අදාල කිසිම ගැටලුවක් අන්තර්ගත කර නොතිබුණි. එම දෙපාර්තමේන්තුව කාර්තුමය වශයෙන් ශ්‍රී ලාංකික ශ්‍රම බලකාය සම්බන්ධයෙන් (1990 සිට) සමීක්ෂණ පැවැත් වූවද විෂම ලිංගික නොවන හා උපතේ දී උරුම කරගත් ලිංගික අවයවවලට අනුගාමී සමාජභාවයට වඩා වෙනස් සමාජභාවයන් ආරෝපණය කරගන්නා ජනතාව අත්දකින සේවා ස්ථානයේ වෙනස්කොට සැලකීම පිළිබඳව වන ගැටලු ඉස්මතුකර පෙන්වන වාර්තා නොසලකා හැර එම සමීක්ෂණය ද ලිංගික අනන්‍යතාවය සහ සමාජභාවී අනන්‍යතාවයට අදාල ගැටලු ඔවුන්ගේ ප්‍රශ්නාවලියට ඇතුලත් කිරීමෙන් වැළකී ඇත.

## ***මාධ්‍ය***

LGBTQ ශ්‍රී ලාංකිකයින්ට එරෙහිව කොන්කිරීම හා වෙනස්කොට සැලකීම අඛණ්ඩව සිදු කිරීම සඳහා මාධ්‍ය වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලැබේ.

1999දී, ප්‍රධාන ධාරාවේ ඉංග්‍රීසි භාෂා දිනපතා සහ සතිඅන්ත පුවත්පතක් වූ, දි අයිලන්ඩ්, කොළඹදී පැවැත්වීමට නියමිතව තිබූ සමලිංගික ස්ත්‍රී සම්මන්ත්‍රණයකට එරෙහිව කතුවරයාගේ මතවාදය දක්වන ලිපියක් පල කරන ලදී.[27] ලිපිය අවසානයේදී කතුවරයා "නොමග ගියවුන්ට සත්‍ය දෙයෙහි රසය විඳගැනීමට හැකි වන පිණිස, ඔවුන්ගේ සම්මේලනයේ උච්ච අවස්ථාව උද්ගතවූ විට ප්‍රීතියෙන් කුල්මත් වූ නමුත් තෙහෙට්ටුවටපත් අලජ්ජ

27 එම.

ස්ත්‍රීන් අතරට ලිංගික බලහත්කාරකමේ යෙදී වරදකරුවන් බවට පත්වූවන් මුදාහරින ලෙසට"[28] පොලීසියට නියම කරයි. මෙම පුවත්පතට එරෙහිව ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයෙහි එම ලිපිය පලකිරීමේ ප්‍රතිඵලයක් ලෙස "පරපීඩාකාමීත්වය, ප්‍රචණ්ඩත්වය හෝ සල්ලාලකම"[29] ප්‍රවර්ධනය කළ බවට සහතික කරමින් පැමිණිල්ලක් ගොනු කරන ලදී. මෙය පුවත්පත් මණ්ඩලය විසින් බලාත්මක කර තිබෙන ජනමාධ්‍යවේදීන් සඳහා වන ආචාර ධර්මයන්හි 9 වන නීතිය ප්‍රකාරව පැහැදිලි ලෙස තහනම් කර තිබෙන ක්‍රියාවක් වේ. කෙසේවෙතත්, ජාත්‍යන්තර ක්ෂමා සංවිධානය වාර්තා කරන ආකාරයට පුවත්පත් මණ්ඩලය කතුවරයාට ඔහුගේ මතය ඉදිරිපත් කිරීමට අයිතියක් තිබෙන බවට නියම කරමින් පුවත්පතට දඬුවම් නියම කිරීම ප්‍රතික්ෂේප කරන ලද අතර ඔහුගේ මතය ස්ත්‍රී සමලිංගිකත්වය "පරපීඩාකාමී ක්‍රියාවක්" සහ දිවයිනේ දණ්ඩ නීති සංග්‍රහය යටතේ වරදක් වන හෙයින් සාධාරණීකරණය ද කරන ලදී. පුවත්පත් මණ්ඩලය තවදුරටත් ස්ත්‍රී සමලිංගිකත්වය "අවම වශයෙන් දැඩි අශිෂ්ට ක්‍රියාවක්" හා "අස්වාභාවික" දෙයක් බවත් එමෙන්ම, 'නොමග ගිය හා අස්ථාවර ස්ත්‍රීන් නිවැරදි කර ජීවිතයේ සත්‍ය අගය සහ යථාර්ථය වටහා ගැනීමට ඉඩ ලබාදිය යුතු[30] බව ප්‍රකාශ කළේය. පුවත්පත් මණ්ඩලය පැමිණිල්ල නිෂ්ප්‍රභා කර වගඋත්තරකරු වෙනුවෙන් පැමිණිලිකරුට බරපැන දරණ ලෙස ද අණ කළේය. ඒ කාලයේදී, ප්‍රමුඛ පෙළේ පුරුෂ සමලිංගික අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටි සංවිධානයක් වූ, Companions on a Journey (ගමන් මගේ සහකරුවෝ) පැමිණිලිකරු වශයෙන් පෙනී සිට ඇත.

2010දී, ශ්‍රී ලංකාව තුළ පුළුල් පාඨක සංඛ්‍යාවක් සිටින ඉංග්‍රීසි භාෂාවෙන් පලවන දිනපතා පුවත්පතක් වන ඩේලි මිරර් "මානව අයිතීන් පිළිබඳ දේශපාලන සංවාදය කරළිය තබාගෙන යන" "අප්‍රසන්න මූලධර්ම" විසින් කරගෙන යන කුමන්ත්‍රණයක් විස්තර කරමින් "A tide against the natural..."[31] යන මාතෘකාව යටතේ ගැරහුම් සහගත කතුවැකියක් පල කළේය. කතුවැකිය විසින්

28 එම

29 Planet Out. (2000, 5 June). Sri Lankan's Media Complaint Backfires. Glapn.www.glapn.org/sodomylaws/world/sri_lanka/slnews006.htm

30 Amnesty International. (2008). Love, Hate and the Law: Decriminalizing Homosexuality. London: Amnesty International Publications, 17.d21zrvtkxtd6ae.cloudfront.net/public/uploads/2016/11/12125724/Love-hate-and-the-low.-Decriminalizing-homosexuality.pdf

31 Liyanaarachchi, C. (2010, 29 July).A tide against the natural.... Daily Mirror. https://thesakhicollaboration.wordpress.com/2010/08/11/bent-reasoning/

"විෂම ලිංගිකත්වය යනු යල් පැනගිය අභාවයට ගිය ස්වභාවයක් යන මතය නිර්මාණය කිරීම සඳහා, රාජ්‍යත්‍රාන්ත්‍රිකයින් සහ ප්‍රධාන පෙළේ සිවිල් සමාජයේ පුද්ගලයින් කිහිපදෙනෙකු සමග කොළඹ සමාජ කවයන් තුළ සිටින කණ්ඩායම් මතභේදාත්මක පියවරයන් ගනුලබමින් සිටින බව අවධාරණය කරනු ලැබීය. මෙම පුද්ගලයින්ගෙන් බොහොම දෙනෙක් එක්තරා කාලයක විෂම ලිංගිකයින්ව සිට පසුව පුරුෂ සමලිංගිකයින් බවට පත් වී ඇත.[sic] 2011 දී රිවිර පුවත්පත (සිංහල භාෂාවෙන් පලවන දිනපතා පුවත්පතක්) උපත් පාලන කොපු සහ ලිංගික කාර්යයයේ යෙදීම සඳහා භාවිතා කරන ජෙලි වැනි ලිහිසි ද්‍රාවණයක් සහිත පැකට් "ලිංගික සහකරුවන් සොයාගන්නා ස්ථාන" ලෙස පෙර හඳුනාගත් සුවිශේෂී පොදු ස්ථානවල බෙදාහැරීම හා සම්බන්ධ වූ Companions on a Journey (COJ) ආයතනය විසින් කරගෙන යනු ලැබූ එච්.අයි.වී. වැළැක්වීමේ වැඩසටහන පිළිබඳව "රුදුරු"[32] අනාවරණ මාලාවක් කරන ලදී. COJ ආයතනය, සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ලද GFATM අරමුදල් යොදවන ලද[33] ව්‍යාපෘතියේ අනුග්‍රහය යටතේ කටයුතු කර තිබුණ ද රිවිර පුවත්පත් ලිපි විසින් ජනනය කරන ලද ප්‍රතිවිරෝධයට ප්‍රතිචාර දැක්වීමක් ලෙස "භීතිය හා වෛනස්කොට සැලකීම..." හා ලබාදුන් සියලුම තොරතුරුවලට අනුව COJ ආයතනය ද ඇතුලත්ව "රාජ්‍ය නොවන සංවිධාන කිහිපයක් වසා දැමීම සහ/හෝ අත්හිටුවීම යන දෙකටම බලකරමින්"[34] ජනාධිපති කාර්යාලය පරීක්ෂණයක් ඉල්ලා සිටියේ ය.

සිංහල භාෂාවෙන් පලවන පුවත්පතක් වශයෙන් ලක්බිම පුවත්පත, එම ලිපි මාලාව ලියූ රිවිර පුවත්පතේ මාධ්‍යවේදියා "උපදේශන නිලධාරියකු, ප්‍රබන්ධිත පෞද්ගලික කතන්දරයකින් රවටා තිබෙන බවත් ඔහු, උපදේශන නිලධාරියා සමග මිත්‍රත්වයක් ගොඩනගාගෙන, ඔහුගේ ඡායාරූප ලබාගෙන, අනතුරුව ඔහුගේ අනුමැතිය නොමැතිව එම පිංතූර පලකිරීම මගින් ඔහුගේ විශ්වාසය අනිසි භාවිතයේ යොදවා ඇති බවත්"[35] වාර්තා කළේය. ඒවාගේම, රිවිර කතාංගයේ ඍජු ප්‍රතිඵලයක් ලෙස එම ක්‍රියාවේ ගොදුරක් බවට

32 Sarma, N., & Billimoria, H.(2013). Strengthening the Role of Media Advocacy in Sri Lanka through a Critical Analysis of News Media Coverage. Bangkok:UNDP, 13. www.asia-pacific.undp.org/content/rbap/en/home/library/democratic_governance/hiv_aids/stigma--discrimination-and-key-affected-populations--strengtheni.html

33 ඒඩ්ස්, මැලේරියා හා ක්ෂය රෝගයට එරෙහිව කටයුතු කිරීම සඳහා ඇති ගෝලීය අරමුදල මගින් අරමුදල් සපයනු ලබන.

34 එම.

35 Jayasuriya, R. (2011, 6 November). Disgraceful media bigots hound a gay man.Lakbima News.

පත්වූ නිලධාරියා ඔහුගේ නවාතැන් පහසුකම අහිමි වී ගිය බව ද එම ලිපිය වාර්තා කළේය: "මගේ නවාතැන්පලෙන් මාව පන්නා දැම්මා. මගේ ගෙවල් හිමියා පුවත්පතේ පුවතත් සමග තිබූ මගේ පිංතූර දුටුවා. ඔහු මට පුවත්පත පෙන්වා, මගේ කාමරයෙන් ඉවත්වන ලෙස පැවසුවා."[36]

## පශ්චාත්-යුද සන්දර්භය

විෂම ලිංගික නොවන සහ උපතේ දී උරුම කරගත් ලිංගික අවයවවලට අනුගාමී සමාජභාවයට වඩා වෙනස් සමාජභාවයන් ආරෝපණය කරගන්නා ජනතාව මුහුණ දෙන කොන්කිරීම සහ වෙනස්කොට සැලකීම 2009 දී අවසන් වූ දශක 3ක් පුරාවට ශ්‍රී ලාංකික සමාජය අත් දුටු මිලිටරිකරණයේ බලපෑමටද ලක්වේ.

2016 දී පුද්ගල කණ්ඩායමක් ඔවුන් සමලිංගික ස්ත්‍රී, සමලිංගික පුරුෂ, ද්විලිංගික, සංක්‍රාන්තික සමාජභාවී, අන්තර්ලිංගික සහ සමසෙනෙහස් (LGBTQ) වශයෙන් හඳුනා ගනිමින්, ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය යාන්ත්‍රණ සහ ආයතනගත ව්‍යුහයන් හරහා අයිතීන් අහිමි කර තිබෙන ජනතාවක් වටා තිබෙන නිශ්ශබ්දතාවය බිඳීමටත් කෘතඥතාවය පලකිරීමටත් කැමැත්තක් දක්වන ශ්‍රී ලාංකිකයින්ට සහායදීමට ඉදිරියට ඒමක් වශයෙන් LGBTQ ජනතාවගේ පවුලේ සාමාජිකයින් සහ මිතුරන් සහ පුද්ගලයන්/ප්‍රජාවන් වශයෙන්," කලාපීය කාර්යසාධක බලකායට සහ සංහිඳියා යාන්ත්‍රණය සඳහා වූ කාර්යය සාධක බලකායට ඉදිරිපත් කිරීමක් කළේය.[37] එහි ඔවුන් විසින් මෙසේ කියා සිටින ලදී.

*"යුද්ධය දශක ගණනාවක මිලිටරීකරණයට ආරූඪ කළ හැකි ප්‍රජාතන්ත්‍රවාදී ධර්මතාවයන් හා නීතියේ ආධිපත්‍යය බිඳ වැටීමේ ප්‍රතිඵලයක් වන අනාරක්ෂිත වාතාවරණයක් නිර්මාණය කළේය. මිලිටරීකරණය, ස්ත්‍රීත්වයේ හා පුරුෂත්වයේ සම්පූර්ණ නිරූපකයන් නිර්මාණය කර ප්‍රසිද්ධියට පත් කරන අතර සීමාන්තික මෙන්ම ද්විත්ව සමාජභාවයට අනුකූල වන භූමිකා අනුගමනය කිරීමට ජනතාවට බලකරයි. එවැනි සමාජභාවී භූමිකා නිරූපණයට අනුකූල නොවන පුද්ගලයින් සඳහා මෙය විශේෂයෙන්ම සීමාකාරී වේ. මෙයට අමතරව, මිලිටරීකරණය මෙම අනම්‍ය සමාජභාවී*

36 එම.

37 (2016, 25 August). Submission on LGBTIQ persons and transitional justice mechanisms. Groundviews.

*ධර්මතාවයන් ප්‍රජනන ලිංගිකත්වයට (ලිංගිකත්වය ප්‍රතිනිෂ්පාදන තර්කනයට සීමා කරන - විවාහය තුළ, ඒක වෛවාහික සහ විෂම ලිංගික සම්මතය පදනම් කරගත් පවුල් ඒකකය) සහ ජනවාර්ගික ජාතිකවාදී වාගාලංකාර තුළ එහි භූමිකාවට සම්බන්ධ කරවීම සඳහා මග පාදනු ලැබේ. යුද්ධය පැවති කාලය තුළදී මෙන්ම වර්තමානයේදී ද නිර්දේශිත ධර්මතාවයන්ගෙන් වෙනස්වන ලිංගික හා සමාජභාවී විවිධත්වය සහ එහි ප්‍රකාශනය අවධාරණය කිරීමේ දුෂ්කරතාවය අඛණ්ඩව පවතී."*[38]

යුද්ධය පැවති කාලයේදී (සහ ඊට පසු වකවානුවේදී), පොදු ස්ථානවල ආරක්ෂාව බලවත් කිරීමත් සමග LGBTQ ශ්‍රී ලාංකිකයෝ විශේෂයෙන්ම අවදානම් සහිත පුද්ගල කොටසක් බවට පත්වූහ. සමාජභාවී අනන්‍යනතාවයන්ට අනුකූල නොවන ජනතාව, උදාහරණයක් වශයෙන් ඔවුන් තෝරාගත් ඇඳුම් පැළඳුම් හෝ වෙනත් සමාජභාවී ප්‍රකාශනයන් ඔවුන්ගේ අනන්‍යතාවය තහවුරු කරන ලියවිලිවල සඳහන් නොවුන විටදී, ආරක්ෂක අංශවල පරීක්ෂක ස්ථානවලදී ඔවුහු අවදානමට ලක්වූහ. එවැනි සිදුවීම් නොයෙක්විට හිරිහැර හා බියගැන්වීම් වලින් අවසන් විය.[39] "රජයට වැඩ සැලසුම්"[40] ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය මගින් විවිධ සමාජ හා ලිංගික අනන්‍යතාවයන් සහිත කණ්ඩායම් හා සංවිධාන රජයේ සියුම් පරීක්ෂාවට භාජනය කිරීම LGBTQ ජනතාව ශ්‍රී ලංකාවේ රාජ්‍යයේ ආරක්ෂාවේ මුරකිරීම යටතේ තබන ලද තවත් ආකාරයක් විය.

38 එම.
39 එම.
40 එම.

තුන්වන කොටස

# ලිංගිකත්වය සහ ශ්‍රී ලංකාවේ අන්තර්ජාල අවකාශය


මෙම කාණ්ඩයේදී අධ්‍යයනයේ සොයාගැනීම් භාවිතය, ප්‍රවේශය හා ආරක්ෂාව යන ප්‍රධාන රාමුගතකිරීම් තුනක් ඔස්සේ සංවිධානය කරනු ලැබේ. කතුවරයන් විසින් දත්ත විශ්ලේෂණය කරන අදියරේදී උප-තේමාවන් කිහිපයක් මතුවුන අතර එම උප තේමාවන් එකිනෙක රාමුගතකිරීමට සම්බන්ධ කරමින් සාකච්ඡා කරනු ලැබේ. අධ්‍යයනයේ සොයාගැනීම්, ශ්‍රී ලංකාවේ නීතිමය හා ප්‍රතිපත්තිමය රාමුව (මානව හිමිකම් විශ්ලේෂණය ද ඇතුළුව) හා සම්බන්ධ වන ආකාරය ඊළඟ අංශයෙහි දී සාකච්ඡා කරනු ලැබේ. සාකච්ඡාව භාවිතය, ප්‍රවේශය හා ආරක්ෂාව යන රාමුගතකිරීමට යෙදවූවත් එම රාමුගතකිරීම් හා අවධාරණය කරනු ලැබූ ගැටලු අතර කැපී පෙනෙන සම්බන්ධතාවයක් තිබෙන බව සටහන් කළ යුතුවේ.




රූප සටහන 5: සමීක්ෂණ ප්‍රතිචාරකයින් භාවිතා කරන උපාංග

සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූවන්ගෙන් බහුතරයක් අන්තර්ජාලය වෙත ප්‍රවේශවීම සඳහා උපකරණ රැසක එකතුවක් භාවිතා කරන බව පැවසීය. සමීක්ෂණයට තෝරාගන්නා ලද ප්‍රතිචාරකයන් 50% කට වඩා වැඩි ප්‍රමාණයක් 'මගේම ටැබ්ලටය/ස්මාර්ට් දුරකථනය, සේවා ස්ථානයේ ලැප්ටොප් පරිඝනකය/ඩෙස්ක්ටොප් පරිඝනකය', හෝ'මගේම ටැබ්ලටය/ස්මාර්ට් දුරකතනය, මගේම ලැප්ටොප් පරිඝනකය/ඩෙස්ක්ටොප් පරිඝනකය' යන්න තෝරාගෙන තිබුණි. මෙය සමීක්ෂණයට සහභාගි වූවන්ගේ සමාජ-ආර්ථික පසුබිම ගම්‍යමාන කිරීමක් නොව අන්තර්ජාලයට ඇති වර්ධිත ප්‍රවේශයේ හැඟවීමක් වේ.

## ***භාවිතය: තොරතුරුවලට ඇති ප්‍රවේශය***




රූප සටහන 6: සමීක්ෂණයෙහි ප්‍රතිචාරකයින්ට පැය ගණන් අනුව අන්තර්ජාලයට ඇති ප්‍රවේශය

LGBTQ ශ්‍රී ලාංකිකයින්ට වැදගත් තොරතුරු වෙත පිවිසීමේ හැකියාව අන්තර්ජාලය විසින් සැලකිය යුතු ලෙස වර්ධනය කර ඇත. මුල්කාලීනව, ශ්‍රී ලංකාවේ ලිංගිකත්වය පිළිබඳ මාතෘකා වටා ලජ්ජාශීලී නිහඬතාවයක් පැවතීමෙන් අදහස් කරන්නේ LGBTQ ජනතාවට ඔවුන්ගේ ලිංගික දිශානතිය හෝ සමාජභාවී අනන්‍යතාවය සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීම සඳහා අවම මූලාශ්‍ර ප්‍රමාණයක් පැවති බව ය. ඔවුහු, සියලුදෙනාම විෂම ලිංගික හා උපතේ දී උරුම කරගත් ලිංගික අවයවවලට අනුගාමී සමාජභාවයට වඩා වෙනස් සමාජභාවයන් ආරෝපණය කරගන්නා අනන්‍යතාවයකින් යුක්තවිය යුතු බව පිළිගන්නා සමාජ කතිකාවතක ඔවුන්ගේ ස්ථානය වටහා ගැනීමට වෙහෙසෙති. එවැනි සන්දර්භයක,

නිවැරදි තොරතුරු සඳහා ප්‍රවේශය ඔවුන්ගේ ලිංගිකත්වය සහ සමාජභාවී අනන්‍යතාවය සමග එකඟත්වයකට පැමිණීමට මහත් රුකුලක් විය හැකිය.

LGBTQ පුද්ගලයින් සමග කරන ලද සම්මුඛ සාකච්ඡාවලදී සමලිංගිකත්වය පිළිබඳව "ප්‍රපංචයක්" හෝ "සංකල්පයක්" ලෙස සම්පූර්ණයෙන්ම නොදැනුවත්ව අන්තර්ජාලයට පෙර යුගයක ඔවුන් හෝ ඔවුන් දැන සිටි වෙනත් අය, හැඳිවැඩීම පිළිබඳව මතකයට නංවනු ලැබීය. තනිපුද්ගල සම්මුඛ සාකච්ඡාවකට සහභාගීවූ සමලිංගික පුරුෂයෙක් වන මහේල[41] ඔහුගේ සමාන ලිංග ලිංගික ආකර්ෂණය සුවිශේෂී වූවක් බව දීර්ඝ කාලයක් තිස්සේ ඔහු විශ්වාස කළ ආකාරයත් එවැනි අත්දැකීමක් ලබමින් සිටි "ලොව එකම පුද්ගලයා" ඔහු බවත් යන්න මතකයට නැංවීය.[42] 1990 වසරේදී ඔහුට වයස අවුරුදු 20 වන විටදී නිවසේ තිබී අහම්බෙන් හමුවූ විශ්වකෝෂයේ "සමලිංගිකත්වය" පිළිබඳ සටහන කියවීමෙන් අනතුරුව තවදුරටත් එම විෂය සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම පිණිස කොළඹ පිහිටි බ්‍රිතාන්‍ය මණ්ඩලයේ පුස්තකාලය වෙත පිවිසියේය. එයින් පසු ඔහු ඔහුගේ "පොදු" ස්වභාවය අගය කිරීමට පටන්ගත් බව පැවසීය. මෙම තොරතුර අනාවරණය කරගැනීම ඔහුගේ ස්වයං-පිළිගැනීමේ ක්‍රියාවලියේ ආරම්භක පියවර බව ඔහු පැවසුවේ ය. තමන්ගේ ලිංගික දිශානතිය හෝ සමාජභාවී අනන්‍යතාවය අවබෝධ කර ගැනීමට වෙහෙසෙන පුද්ගලයින්ට විශ්වාස කටයුතු තොරතුරු ලැබීමේ වැදගත්කම මේ මගින් අවධාරණය කරනු ලබයි. මහේල, ඒවාගේම ඔහුගේ සමලිංගිකත්වය පිළිබඳව වැඩිදුර තොරතුරු සොයාගැනීම සඳහා ඔහුගිය සුවිශේෂී පුස්තකාලයේ සූචිකරණ ක්‍රියාවලිය මහඟු කාර්යයක් ඉටුකළ ආකරයත් "පුරුෂ සමලිංගිකත්වය", "සමලිංගික පුරුෂයින් විසින් රචිත චරිතාපදාන" යන වර්ගකිරීම් යටතේ ඉතා විශිෂ්ට ලෙස පොත් සෙවූ ආකාරයත් මතකයට නැගුවේය.

මීට ප්‍රතිවිරුද්ධ ලෙස, මහේල, අන්තර්ජාලයට ප්‍රවේශවීමට යම් අවස්ථාවන් ද සහිතව වැඩිවියට පත් යොවුන්වියේ පසුවන LGBTQ ශ්‍රී ලාංකිකයින් සමලිංගිකත්වය හෝ සංක්‍රාන්තික සමාජභාවීබව පිළිබඳව නොදැනුවත්ව සිටීමේ හැකියාව ඉතා අඩු බව සඳහන් කළේය. මෙය සත්‍යවිය හැකි වුවද, සංසිද්ධිය සම්බන්ධයෙන් දැනුම ඇතිවීම ම ස්වයංක්‍රීය ස්වයං-පිළිගැනීමක් නොවන බව අවධාරණය

41 සන්දර්භය මගින් සපයනු ලබන්නේ නැතිනම්, සියලුම නම් වෙනස් කර ඇත.

42 මහේල සමග පැවැත් වූ සම්මුඛ සාකච්ඡාව.

කළ යුතුවේ; කෙසේවෙතත්, සමලිංගිකත්වය හෝ සංක්‍රාන්තික සමාජභාවීබව ලොවපුරා පොදු ය යන දැනුමට ඇති පුළුල් ප්‍රවේශයෙන් යොවුන් විවිධ සමාජ සහ ලිංගික අනන්‍යතාවයන් සහිත ශ්‍රී ලාංකිකයින්, ඔවුන් හුදකලා වී ඇත ය යන විශ්වාසය සමග වැඩිවියට පත් වීමේ අඩු හැකියාවක් ඇත. අන්තර්ජාලය ශ්‍රී ලංකාවේ විෂමලිංගික සම්මතයේ (heteronormativity) සහ උපතේ දී උරුම කරගත් ලිංගික අවයවවලට අනුගාමී සමාජභාවයට වඩා වෙනස් සමාජභාවයන් ආරෝපණය කරගන්නා අනන්‍යතාවය සම්මතයක්වීමේ (cisnormativity) බලවත් ප්‍රකාශනයන් විනිවිදී. ඒ අතරම මානව ලිංගිකත්වය අවබෝධ කරගැනීමේදී විද්‍යාත්මක ප්‍රවර්ධනය, වෙනත් සත්ව කොටස් අතර ලිංගික විවිධත්වය නිරීක්ෂණය කිරීම මෙන්ම ලිංගික දිශානතිය හා සමාජභාවී අනන්‍යතාවය සම්බන්ධයෙන් ලොව අනෙක් ප්‍රදේශවල සිදුවන සමාජ විපරිවර්ථනයන් වැනි විවිධ ආකාරයේ වැදගත් තොරතුරු LGBTQ ශ්‍රී ලාංකිකයින්ට ලබාදේ. එපමණක් නොව, අන්තර්ජාලය තුළ තොරතුරුවලට ප්‍රවේශ කිරීම වෙබ් අන්තර්ගතය සුචිගත කර සෙවුම් විමසුමකට යෝජනා නිපදවන හා අදාලතාවය අනුව ශ්‍රේණිගත කරන සෙවුම් යන්ත්‍රයේ ක්‍රියාකාරීත්වය තුළින් විශාල වශයෙන් සරල කර ඇත. මේ අර්ථයෙන් ගත්කල සෙවුම් යන්ත්‍රය පුස්තකාලයේ පොත් නාමාවලි පද්ධතිය හා සම්බන්ධ මහේලගේ අත්දැකීමට සමාන්තර වේ; සෙවුම් යන්ත්‍රය හරහා පහසුවෙන් ප්‍රවේශවිය හැකි ලිංගික දිශානතිය සහ සමාජභාවී අනන්‍යතාවය හා සම්බන්ධ තොරතුරු වලින් යොවුන් LGBTQ ජනතාව ප්‍රතිලාභ ලබති.

කෙසේවෙතත්, ශ්‍රී ලංකාවට අන්තර්ජාලය පැමිණීම නිසාම රට තුළ විකල්ප ලිංගික දිශානතීන් සහ සමාජභාවී අනන්‍යතාවයන් සාමාන්‍යකරණය වී නොමැත. මාධ්‍ය වාර්තා සහ ස්වාධීන පර්යේෂණ මෙය මෙසේ නොවන බව පෙන්වයි.[43] අන්තර්ජාලය, තොරතුරු සොයන අය සඳහා සාමාන්‍යයෙන් තොරතුරු ලබාදෙන මූලාශ්‍රයක් වන නමුත් විකල්ප ලිංගික දිශානතීන් සහ සමාජභාවී අනන්‍යතාවය අපචාරමය හෝ පිළිගත නොහැකි චර්යාවක් ලෙස සංජානනය කරන බොහෝ දෙනෙක්, එම මතවාදයන්ට පරස්පර වන තොරතුරු සාමාන්‍යයෙන් සෙවීමේ නියුතු නොවේ.

43 මෙම වාර්තාවේ පූර්වයෙහි ඇති මාධ්‍ය කොටස බලන්න.

විකල්ප ලිංගික දිශානතිය සහ සමාජභාවී අනන්‍යතාවය හඳුනා නොගැනීම LGBTQ ශ්‍රී ලාංකිකයින්ගේ තොරතුරුවලට ප්‍රවේශ කිරීමේ හැකියාවට බාධාවන් නිර්මාණය කර තිබේ. උදාහරණයක් වශයෙන්, පුස්තකාලයක් මෙම මාතෘකා හා සම්බන්ධ කාරණා පදනම් කරගෙන පොත් නාමාවලි පද්ධතිය සකස් කර නොමැති අවස්ථාවන්වලදී එම මාතෘකා පිළිබඳ තොරතුරු සොයන පුද්ගලයින්ට එම පුස්තකාලය පහසුවෙන් භාවිතා කළ නොහැක. එවැනි සන්දර්භයන් තුළ, අන්තර්ජාලය LGBTQ ශ්‍රී ලාංකිකයින්ට ප්‍රයෝජනයට ගතහැකි තොරතුරු ආකෘතිය පරිණාමනය කර ඇත. සමීක්ෂණයේ පැහැදිලි බහුතරයක් ඔවුන්ගේ අන්තර්ජාල භාවිතය ආශ්‍රයෙන් "ලොව පුරා විවිධ සමාජ සහ ලිංගික අනන්‍යතාවයන් සහිත පුද්ගලයින් හා සම්බන්ධ ප්‍රවෘත්ති", "LGBTQ අනන්‍යතාවය තේමා කරගත් කලාව (චිත්‍රපට, රූපවාහිනී වැඩසටහන්, කතාන්දර වැනි)", "ශ්‍රී ලංකාවේ LGBTQ පුද්ගලයින් මුහුණ දෙන ගැටලු හා සම්බන්ධ වන නීතිය හා ප්‍රතිපත්ති තොරතුරු" LGBTQ සංවිධාන", "ලිංගිකව සම්ප්‍රේෂණය වන ආසාදන"මෙන්ම "ආරක්ෂිතව ලිංගිකව හැසිරෙන ක්‍රම" වැනි තොරතුරුවලට ප්‍රවේශ වෙති.

| "ඔබ පහත සඳහන් ඕනෑම තේමාවකට අදාලව කවදාහෝ අන්තර්ජාලයට පිවිසී තිබේද? අදාල සියල්ල තෝරන්න." | | |
|---|---|---|
| ලොව පුරා LGBT පුද්ගලයින් හා සම්බන්ධ ප්‍රවෘත්ති | 79 | 93% |
| LGBT තේමා කරගත් කලාව (චිත්‍රපට, රූපවාහිනී වැඩසටහන්, කතාන්දර වැනි) | 67 | 79% |
| ශ්‍රී ලංකාවේ LGBT පුද්ගලයින් මුහුණ දෙන ගැටලු හා සම්බන්ධ වන නීතිය හා ප්‍රතිපත්ති තොරතුරු | 68 | 80% |
| LGBT සහිත සංවිධාන | 62 | 73% |
| ලිංගිකව සම්ප්‍රේෂණය වන ආසාදන | 57 | 67% |
| ආරක්ෂිතව ලිංගිකව හැසිරෙන ක්‍රම | 55 | 65% |

වගුව 1: අන්තර්ජාලයේ තොරතුරු ප්‍රවේශ කිරීම

කෙසේවෙතත්, "තොරතුරු විප්ලවයක්" සිදුවී තිබියදීත් විශ්වාස කළ නොහැකි, තහවුරු නොකළ හෝ පැහැදිලි ලෙස ව්‍යාජ බවට පරිවර්තනය කරන ලද තොරතුරු විශාල සංඛ්‍යාවක් මාර්ගයෙන් අන්තර්ජාලය බරපතල ලෙස අවුල් කර තිබේ. මෙය මෙම අධ්‍යයනය

සඳහා සමීක්ෂණය කරන ලද නියැදි සමූහයේ පවා නිරීක්ෂණය වූ මාධ්‍ය සාක්ෂරතාවය හා තොරතුරුවල නිරවද්‍යතාවය පිළිබඳව ගැටලු මතු කරයි. උදාහරණයක් වශයෙන්, "අන්තර්ජාලය තුළින් (ඔවුන්) ලබා ගන්නා තොරතුරුවල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට" ඔවුන් ගන්නා පියවර විස්තර කිරීමට පැවසූ විට, ප්‍රතිචාරකයින්ගෙන් බහුතරයක් තොරතුරු සංසන්දනය කිරීම සඳහා බහු මූලාශ්‍ර කියවීමට හෝ "පිළිගත් මූලාශ්‍රවලින්" පමණක් හෝ මේ දෙකෙහිම එකතුවක තොරතුරු පිළිගන්නා බව ඇඟවීය. කනස්සලුසහගත ලෙස, ප්‍රතිචාරකයින්ගෙන් අවම වශයෙන් 17% කිසිම පියවරක් නොගත් බව ඇඟවීය. සමහර ප්‍රතිචාරකයෝ මිතුරන් සමග පරීක්ෂා කිරීම සහ අදාල පුද්ගලයින් සමග සෘජුවම සම්බන්ධවී නිරවද්‍යතාවය තහවුරු කර ගන්නා බව පැවසුවෝය. සමහරෙක් "නිල" මූලාශ්‍රවලට කැමැත්තත් දැක්වූවෝ වූ අතර අවම වශයෙන් එක් ප්‍රතිචාරකයෙක් රජයේ සම්පත් නිරවද්‍ය තොරතුරු මූලාශ්‍රය වශයෙන් පිළිගැනීමට කැමති බව ප්‍රකාශ කළේය.

අන්තර්ජාලයේ බොහොමයක් වේදිකා ප්‍රමුඛ ලෙස ඉංග්‍රීසි භාෂා ප්‍රේක්ෂක ජනයාට සේවා සපයන අතර බොහොමයක් LGBTQ හා සම්බන්ධ තොරතුරු සහිත මූලාශ්‍ර ශ්‍රී ලංකාවට ආගන්තුක වේ. සිංහල හා දමිළ භාෂාවෙන් (ශ්‍රී ලංකාවේ ප්‍රධාන දේශීය භාෂාවන්) වඩවඩාත් සම්පත් පැවතීමේ පැහැදිලි අවශ්‍යතාවයක් පවතිනවා මෙන්ම ශ්‍රී ලාංකික ප්‍රේක්ෂක ජනයාට සුවිශේෂී ලෙස සේවා සපයන සම්පත් - අඩුම තරමින් සෞඛ්‍ය සත්කාරක සේවා වැනි ක්ෂේත්‍රවල අවශ්‍යතා පවතී.

"නිල" තොරතුරු මූලාශ්‍ර සඳහා ඉහල මනාපයක් තිබියදීත් විශේෂයෙන්ම ශ්‍රී ලාංකික LGBTQ ප්‍රජාවට සේවා සපයන එවැනි ප්‍රභවයන් කිහිපයක් පමණක් පවතින බව පෙනේ. ජාතික ලිංගාශ්‍රිත රෝග හා ඒඩ්ස් මර්දන වැඩසටහන (NSACP), ශ්‍රී ලංකාවේ ජාතික මට්ටමේ ආයතනයක් වශයෙන්, "ලිංගාශ්‍රිතව සම්ප්‍රේෂණය වන රෝග සහ එච්.අයි.වී. නිවාරණය හා පාලනය කිරීමේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීමට වගකීම් දරන"[44] LGBTQ ගැටලු ප්‍රසිද්ධියේ හඳුනා ගන්නා රජයේ මූලාශ්‍රයක් වශයෙන් මෙම අධ්‍යයනයට හඳුනා ගත හැකි වූ එකම අන්තර්ජාල මූලාශ්‍රය විය; කෙසේවෙතත්, වෙබ් අඩවියේ සිදුවන සාකච්ඡාව හා ඉදිරිපත් කිරීමෙහි ගුණාත්මකභාවය තෘප්තිමත් නොවන මට්ටමක පවතී.

44 http://www.aidscontrol.gov.lk/web/index.php/en/about-us/overview-history

# ජාතික ලිංගාශ්‍රිත රෝග හා ඒඩ්ස් මර්දන වැඩසටහනේ වෙබ් අඩවියේ සමාලෝචනයක්

ජාතික ලිංගාශ්‍රිත රෝග හා ඒඩ්ස් මර්දන වැඩසටහනේ වෙබ් අඩවියේ ඇති ප්‍රකාශන පිළිබඳව පූර්ණ විමර්ශනයක් ඉදිරිපත් කිරීම මෙම අධ්‍යයනයේ විෂය සීමාවෙන් ඔබ්බට ගිය කාරණයක් වේ. කෙසේවෙතත් තොරතුරුවලට ප්‍රවේශය යන පර්යාලෝකයෙන් මූලික ගැටලු කිහිපයක් මෙහි සටහන් කර ඇත.

ජාතික ලිංගාශ්‍රිත රෝග හා ඒඩ්ස් මර්දන වැඩසටහනේ වෙබ් අඩවිය-එහි පරිපාලනමය සිට තොරතුරුමය දක්වා ප්‍රේක්ෂාවලියක් පුරා දිවෙන-සියල්ලම ප්‍රථම වර්ගීකරණය වන "සම්පත්" යටතේ සම්පත් වර්ග රාශියක් සපයයි. විශේෂාංග ලිපියේ ආකෘතිය මත පදනම්ව, "ප්‍රකාශන", "චක්‍රලේඛ", "ඉදිරිපත් කිරීම්", "මහජන පැන විසඳුම්" ආදී වශයෙන් සම්පත් තවදුරටත් දෙවන මට්ටමේ වර්ගීකරණයක් යටතේ සංවිධානය කර ඇත. "ප්‍රකාශන" යන උප-වර්ගය යටතේ, වාර්ෂික වාර්තා, පරිපාලනමය වාර්තා, පර්යේෂණ ප්‍රකාශන ආදිය පුරුෂ උපත්පාලන කොපු ආදර්ශනය සඳහා වන මාර්ගෝපදේශනයන් ද "රෝහල් ආසාදන පාලන අත්පොත"ද එකිනෙකට සමීපව ඉදිරිපත් කෙරේ. LGBTQ ප්‍රජාවට අදාල වන ප්‍රධාන ලියවිල්ලක් මෙම කොටසේ දැකිය හැකිය. එය "No One Left Behind"[45] ලෙස නම් කර ඇති, විකල්ප ලිංගික දිශානතීන් හා සමාජභාවී අනන්‍යතාවයන් සම්බන්ධව ප්‍රයෝජනවත් මෙන්ම ප්‍රවේශවිය හැකි සංකල්පවල දළ විශ්ලේෂණයක් ලබා දේ. කෙසේවුවත් ලේඛනයේ ලේබලය බැලූ බැල්මට එහි සන්දර්භයේ අඩුපාඩුවක්

45 Vidanapathirana, J. et al. (2016). *No One Left Behind – Undeĺtanding Key populations: Achieving Triple Zeros by 2030.* Nugegoda:National STD/AIDS Control Programme & United Nations Population Fund. www.aidsdatahub.org/no-one-left-behind-undeĺtanding-key-populations-achieving-triple-zeros-2030-vidanapathirana-jh

පෙන්නුම් කරන අතර එම අංශයේ ඇති වෙනත් විශේෂාංග අතරින් වෙනස්කොට වෙන්කර ගත නොහැකි වේ.

"ඉදිරිපත් කිරීම්" උප-වර්ගය යටතේ, පවර් පොයින්ට් (PowerPoint) ඉදිරිපත් කිරීම් ගණනාවක් හා පීඩීඑෆ් (PDF) වර්ගයේ ලේඛන ඇත. බන්ධකයට (links) පෙර සටහන් කර ඇති කෙටි සටහන "ඔබගේ ඉලක්කගත ප්‍රේක්ෂක ජනතාව අනුව ඉදිරිපත් කිරීම් වෙනස් කිරීම (customize [sic][46] ලෙස ඉංග්‍රීසි පිටපතේ දක්වා ඇත) ඉතා වැදගත් වේ. ඔබට ගැලපෙන ආකාරයේ ඉදිරිපත් කිරීම් නිර්මාණය කිරීමට මෙම ස්ලයිඩයන් (slides) භාවිතා කළ හැකිය." මෙමගින් සම්පත් අංශයේ ඉලක්කගත ප්‍රේක්ෂක ජනයා සාමාන්‍ය ජනතාව නොවන බවට දැඩි හැඟීමක් ඇති කරනු ලැබේ. එහි ඇති ලේඛනවල ලේබල්කිරීම අනුව විකල්ප ලිංගික දිශානතියට හා සමාජභාවී අනන්‍යතාවයට අදාල මාතෘකාවලට ඉතාම කිට්ටුවෙන් පවතින එකිනෙකට අනන්‍ය වන ලේබල් දෙක වන්නේ "Men Sex with Men [sic]"[47] මාතෘකාව සහිත දේශීය භාෂා දෙකින්ම පවතින ලේඛන වේ. "මහජන පැනවිසඳුම්" නමින් පවතින උප-වර්ගය, ලිංගික සෞඛ්‍ය සේවාවන්ට ප්‍රවේශවීම වැළැක්වීමට බොහෝ සමාජීය සාධක තිබියදීත් ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග පිළිබඳව සම්පූර්ණයෙන්ම අවධානය යොමු කර ඇති අතර විකල්ප ලිංගික දිශානතීන් හා සමාජභාවී අනන්‍යතාවයන් සහිත ජනතාවට සුවිශේෂි පිළිගැනීමක් හෝ පුනර්ආරක්ෂණයන් පිරිනමන්නේ නැත.

කෙනෙකුට "සම්පත්" නම් අංශයේ සමස්ත ව්‍යුහය හා ඉදිරිපත් කිරීම නිරීක්ෂණය කරනවිට එහි LGBTQ ශ්‍රී ලාංකිකයින්ට රජය විසින් අනුමැතිය නොදුන් සමහර තොරතුරු පවා තිබෙන ආකාරයත් එම තොරතුරු සිතාමතාම එම ප්‍රජාවේ සාමාජිකයින්

46 www.aidscontrol.gov.lk/web/index.php/en/resources/slides

47 එම.

අතර (හෝ මහජනතාව අතර) පතළ කර හැර නොමැති ආකාරයත් නිරීක්ෂණය කළ හැකි වේ. විකල්ප ලිංගික දිශානතීන් සහ සමාජභාවී අනන්‍යතාවයන්ට අදාල වන ලේඛන එසේ නොවන ලේඛනවලින් වෙනස්කොට හඳුනාගත නොහැකි යඃ කිසිම ලේඛනයකට අන්තර්ගතය පැහැදුම් සටහන්, සංක්ෂේප, පූර්වාදර්ශන අනුරූප හෝ මූලිකපද එක්කර නොමැත. LGBTQ පුද්ගලයින්ගේ ගැටලු පිළිබඳව සමහරක් ලිපිලේඛන වෙබ් අඩවිය තුළ තිබුණද වෙබ් අඩවියේම සෙවුම් යන්ත්‍රය හරහා සොයාගැනීමට නොහැකි ය. සියලුම ලිපිලේඛන සෙවීම පිණිස සෙවුම් යන්ත්‍රය ඉහළම එලය සඳහා භාවිතා කළ යුතු වේ. එපමණක් නොව, වෙබ් අඩවිය තුළ සෙවීම් කෘත්‍යය හරහා භාෂා ත්‍රිත්වයෙන්ම පවතින ලේඛනවලට ප්‍රවේශවිය හැකිබවත් දේශීය භාෂාවන්ගෙන් මුද්‍රණය කිරීමේ දුෂ්කරතා පවතින බවටද එවැනි ප්‍රශස්තීකරණයක් තහවුරු කළ යුතුවේ. සම්පත් වර්ගීකරණය කිරීම ආකෘතිය මත කේන්ද්‍ර වීම අත්හැර දමා වඩාත් සැලකිය යුතු අන්දමට තේමාවන් මූලික කරගත්, සංවිධිත ආකාරයට තොරතුරු අවශ්‍ය අයට අවම උත්සාහයකින් ප්‍රවේශවීමට හැකි ආකාරයට ඉදිරිපත් කිරීම වඩාත් හොඳය. තොරතුරු ඉදිරිපත් කිරීම මගින් කොන්කිරීම හෝ වෙනස්කොට සැලකීම සදාකල්හිම පවත්වාගෙන නොයෑම තහවුරු කිරීම ද වඩාත් සුදුසු ය. (උදාඃ ලිංගික දිශානතිය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාවය වෙත පුළුල් අවධානය යොමු කිරීම වෙනුවට "Men Sex with Men" යන ලේඛනය තුළ ලිංගික ක්‍රියාව අවධාරණය කර තිබීම).

ශ්‍රී ලංකාවේ LGBTQ පුද්ගලයින්ගේ ගැටලු රජය විසින් හඳුනාගෙන සාකච්ඡාවට බඳුන් කරන එකම නිල ස්ථානය ජාතික ලිංගාශ්‍රිත රෝග හා ඒඩ්ස් මර්දන වැඩසටහන වීම සහසිද්ධියක් නොවේ. රජය, LGBTQ පුද්ගලයින් දීර්ඝ කාලයක් තිස්සේ, විශේෂයෙන්ම, LGBTQ ශ්‍රී ලාංකිකයින් එච්.අයි.වී සහ වෙනත් ලිංගිකව සම්ප්‍රේෂණය වන ආසාදනයන් සමග ඉතා සමීපව සම්බන්ධ කිරීම හරහා කොන්කිරීම හා වෙනස්කොට සැලකීම බදාම ස්ථර සේ ශක්තිමත් කර ඇති, රාජ්‍ය සෞඛ්‍ය රාමුවේ සීමාසහිත දෘෂ්ටිකෝණයෙන් දැක ඇත.

ජාතික ලිංගාශ්‍රිත රෝග හා ඒඩ්ස් මර්දන වැඩසටහනට අමතරව, Sakhi Collaboration. Accept - Sri Lanka, සහ ඊක්වල් ග්‍රවුන්ඩ් (Equal Ground) වැනි නිලනොවන නමුත් ශ්‍රී ලංකාවටම සුවිශේෂී වන තොරතුරු මූලාශ්‍ර කිහිපයක් අන්තර්ජාලගත වී ඇත. Sakhi Collaboration සහ Accept - Sri Lanka මුහුණුපොතෙහි (Facebook) ක්‍රියාත්මක වන අතර ඊක්වල් ග්‍රවුන්ඩ් ඔවුන්ගේ සමාජ ජාලා නියෝජනයට අමතරව ඔවුන්ගේම වෙබ් අඩවියක් නඩත්තු කරයි. Sakhi Collaboration මුහුණුපොතෙහි පුද්ගලික පැතිකඩ හරහා ක්‍රියාත්මක වෙමින් විවිධ සමාජ හා ලිංගික අනන්‍යතාවයන් සම්බන්ධ ගැටලු පිළිබඳව විස්තරාත්මක පෝස්ටර් පලකිරීම, අදාල මාතෘකාව පිළිබඳව දේශීය හා විදේශීය පුවත් සංසරණය කිරීම, ප්‍රධාන ධාරාවේ මාධ්‍ය LGBTQ පුවත් හසුරුවන ආකාරය විවේචනය කිරීම, මෙන්ම භාෂා ත්‍රිත්වයෙන්ම ඡායාරූප භාවිතය තුළින් කොන්ඩම් භාවිතා කරන ආකාරය පිළිබඳ අනුරූපනයන් වැනි විස්තරාත්මක අන්තර්ගතය නිර්මාණය කිරීම වැනි කාර්යයන්ගේ නිරත වී සිටී.[48] Sakhi Collaboration ක්‍රියාත්මක වන ආකාරයෙන්ම නොව, "Accept - Sri Lanka පිටුව" හරහා ඕනෑම මුහුණුපොත් පරිශීලකයෙකුට තම පැතිකඩේ අන්තර්ගතය වේදිකාව සමග බෙදානොගෙන එහි අන්තර්ගතය බැලීමට ඉඩ සැලසෙන ආකාරයෙන් ක්‍රියාත්මක වේ. නළු නිළියන්, නවකතාකරුවන් සහ මානව අයිතිවාසිකම් ක්‍රියාකාරිකයින් වැනි ප්‍රසිද්ධ මෙන්ම සුවිශේෂ චරිත ලක්ෂණ හිමි ශ්‍රී ලාංකිකයින්ගේ LGBTQ ප්‍රජාවට සහාය දක්වන උපුටන ඉදිරිපත් කරමින් කරනු ලබන විහිදුම් ප්‍රමාණය වැඩි කරන ව්‍යාපාරය එහි ප්‍රධානතම ව්‍යාපෘතිය බව පෙනේ. එම පිටුව LGBTQ පුද්ගලයින්ගේ අයිතීන් ප්‍රවර්ධනයට සහ දිවයිනේ "සංස්කෘතික" වටිනාකම් පිළිබඳව ස්ථාපිත මතයට අභියෝග කරන නිර්මාණය කරන ලද, ශ්‍රී ලංකාවේ වර්තමාන තොරතුරු රැගත්

48 එනම් ඉංග්‍රීසි, සිංහල සහ දමිළ

"මීම්"(meme)[49] රූප ඉදිරිපත් කරයි. මෙම පිටුව ඒවාගේම දේශීය හා විදේශීය පුවත් රැගත් නව රචනා බෙදා හරිනු ලබයි. ස්වේච්ඡාවෙන් හා තම තමන්ගේ පෞද්ගලික ධාරිතාවයෙන් යුත් "පරිපාලකයන්" හරහා ක්‍රියාත්මක වන සඛී හා Accept - Sri Lanka යන මුහුණුපොත් පිටුවලට වෙනස් ආකාරයට, ඊක්වල් ග්‍රවුන්ඩ් යන එම නමින් ඇති රාජ්‍ය නොවන සංවිධානයේ වේදිකාවක් වේ. එහි පර්යේෂණ ප්‍රකාශන, වාර ප්‍රකාශන උද්දේශනය සඳහා භාවිතා කරන ද්‍රව්‍ය ඇති අතර ඒවායින් බොහොමයක් භාෂා තුනෙන්ම ලබා ගත හැකිය. මෙහි ඇති ප්‍රධානතම සීමාව වන්නේ එහි ඇති බොහොමයක් ලේඛන තෙවන පාර්ශවයේ වේදිකාවක් (www.issuu.com) හරහා පමණක් විවෘත කරනු ලැබීමයි. ඒ තුළ යාන්ත්‍රණය හා බාගත කිරීම යන කාර්යයන් දෙකම සැලකිය යුතු ලෙස සීමා කර ඇත.

## *භාවිතයඃ ස්වයං-ප්‍රකාශනය සහ අනන්‍යතාවය ගොඩනැගීම*

අන්තර්ජාලය ස්වයං-ප්‍රකාශනය හා අනන්‍යතාවය ගොඩනගා ගැනීම සඳහා අපූර්ව වේදිකාවකින් යුක්තවේ. පෙර නොවූ විරූ ආකාරයට, ජනතාව තම අදහස්, මතවාද, ආඛ්‍යානයන් අන්අය සමග බෙදාහදා ගැනීමට මෙන්ම ඒවා වදන්, ශබ්ද, පින්තූර වැනි දේවල් අන්තර්ගතව මාධ්‍යයන්ගේ සම්මිශ්‍රණයක් ලෙස ඉදිරිපත් කිරීමට ද හැකියාව ලබා දී තිබේ. පෙර පැවති රූපවාහිනිය වැනි සන්නිවේදන මාධ්‍යයන් "සිරස්" මාධ්‍ය ලෙස සලකනු ලැබේ. එනම් එක් පුද්ගලයකු විසින් පුද්ගලයන් ගණනාවකට පණිවිඩයක් සම්ප්‍රේෂණය කිරීම වේ. එයට ප්‍රතිවිරුද්ධ ආකාරයට, "අන්තර්ජාල භාවිතය... බොහොමයක් දෙනෙක්ගෙන් බොහොමයක් දෙනෙකුට... තිරස් වේ."[50] පැරණි සන්නිවේදන ක්‍රමවේදයන් "නිෂ්ක්‍රීය අන්දමේ ප්‍රතිග්‍රහණයක්"[51] හා සම්බන්ධ "ප්‍රතිවිරුද්ධවාදී" වන නමුත් අන්තර්ජාල සන්නිවේදනයන් සංවාදයේ නියැලී සිටින ඒ ඒ පුද්ගලයාගේ කැමැත්ත මත සිදුවේ.

අන්තර්ජාලයේ උක්ත සඳහන් කරන ලද ගුණාංගයන්ගෙන් සියලුම ජනතාව ප්‍රතිලාභ ලබයි. විශේෂයෙන්ම LGBTQ ශ්‍රී ලාංකිකයෝ සවිබලගන්වති. LGBTQ ශ්‍රී ලාංකිකයින් පොදු වේදිකාවලින්

49 අන්තර්ජාලය තුළ සංසරණය වන පණිවිඩයක් රැගත් රූප

50 Tubella, I. (2005). Television and Internet in the construction of Identity. In M. Castells and G. Cardoso, G (Eds.), The Network Society From Knowledge to Policy. Washington DC: Johns Hopkins Centre for Transatlantic Relations, ඉහත සඳහන් කරන ලද La Rue, F. (2011) කෘතියෙහි පිටුව 13ඃ "අන්තර්ජාලය... තොරතුරු ඒක මාර්ගික සම්ප්‍රේෂණයක් මත පදනම් වී තිබෙන ජනමාධ්‍යයට ඌනපූරක මාධ්‍යයක් වශයෙන් දැකිය යුතු ය."

51 ඉහත වගන්තිවලට අනුගාමී සටහන් 3.

බැහැර කර තිබෙන හා නිශ්ශබ්ද කර තිබෙන, මෙන්ම නිදහසේ සංසරණය වන හිංසාකාරී ඒකාකෘතීන්, දුර්මත සහ මිථ්‍යාවන් හරහා ඔවුන්ට එරෙහිව කොන්කිරීම සහ වෙනස්කොට සැලකීම අඛණ්ඩව පැවතගෙන යන සන්දර්භයකදී පවත්නා ආඛ්‍යානයන් ප්‍රශ්න කිරීමට හා ඒවාට එරෙහිව ක්‍රියා කිරීමට සහ මහජනතාව තුළ ශ්‍රී ලංකාවේ ලිංගික හා සමාජභාවී විවිධත්වය පිළිබඳව ඇති අවබෝධය පුළුල් කිරීම වෙනුවෙන් කටයුතු කිරීමට හැකියාව ලබා දී තිබේ.

LGBTQ ශ්‍රී ලාංකිකයින්ගෙන් සමන්විත කණ්ඩායමක් හා ඔවුනට සහයෝගය දක්වන්නන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පිළිබඳ මහජන අදහස් විමසීමේ කමිටුවට ලිඛිතව අදහස් දැක් වූ විට, එම ඉදිරිපත් කිරීමේ සම්පූර්ණ වාර්තාව පසුව, අන්තර්ජාලයේ ක්‍රියාත්මක වන සම්මානලාභී මහජන ජනමාධ්‍යකරණ වේදිකාවක් වන Groundviews හි පළ කරන ලදී. එම ඉදිරිපත් කිරීමෙහි අත්සන්කරුවෝ වශයෙන් ඔවුහු "ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක ආයතනික ව්‍යුහයන් සහ යාන්ත්‍රණ හරහා අයිතිවාසිකම් අහිමි කර තිබෙන ජනතාවක් වටා ඇති නිහඬතාවය පිළිගැනීම හා බිඳීම ආධ්‍යශය කරගත් ශ්‍රී ලාංකික ප්‍රජාවක්"[52] ලෙසින් හඳුන්වා ගන්නා ලද්දාහ.

මෙම ආරෝපිත නිහඬබව කඩාබිඳ දැමීමට අමතරව LGBTQ ශ්‍රී ලාංකිකයින්ගේ අන්තර්ජාල ස්වයං-ප්‍රකාශන පැවතීමෙන් පවා පමණක් ම, පොදු වේදිකාවන්වලදී LGBTQ පුද්ගලයින්ගේ හඬ වෙනුවෙන් අවකාශය (සහ සහභාගිත්වය) පුළුල් කිරීමට හැකියාව ඇති කර තිබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පිළිබඳ මහජන අදහස් විමසීමේ කමිටුවට සමාන වන වෙනත් ඉදිරිපත් කිරීමක අත්සන්කරුවෝ වශයෙන් "LGBTQ පුද්ගලයන් වශයෙන් අප මෙහි සිටිනුයේ අපගේ ජීවත් කරවන ලද ජීවිතවල යථාර්ථයන්ගේ බලධාරීත්වයද අප ප්‍රකාශ කරන දේ ගැඹුරින් විශ්වාස කිරීමෙන් ද හා ඒ වෙනුවෙන් සටන් කිරීමෙන් ද අප වැනි අනෙක් අයට අපව අනුගමනය කළ හැකි අවකාශයක් නිර්මාණය කිරීමට ඉඩ සලසාවි ය යන බලාපොරොත්තුවද සහිතව",[53] යි තරයේ ප්‍රකාශ කළහ.

52 Groundviews. (2016, 28 March). A Meaningful Right to Equality and Non-Discrimination: Recognising Sexual and Gender Identities.*Groundviews.*groundviews.org/2016/03/28/a-meaningful-right-to-equality-and-non-discrimination-recognising-sexual-and-gender-identities/ අවධාරණය එක් කරන ලදී.

53 Queerrightslka. (2016, 14 March). On the Constitutional Rights of LGBTQIA Individuals. Queerightslka.queerightslka.wordpress.com/2016/03/14/on-the-constitutional-rights-of-lgbtiqa-individuals/

අන්තර්ජාලයේ මෙම කාර්යයයේදී සමාජ මාධ්‍ය වැදගත් තීරණාත්මක සංවර්ධනයකි. යොමුගත කණ්ඩායම් සාකච්ඡාවට සහභාගී වූ සංක්‍රාන්තික ස්ත්‍රියක් වන මිත්‍යා, ඇය ඇයගේ ඉන්ස්ටර්ග්‍රෑම් "Instagram" ගිණුම සංක්‍රාන්තික ස්ත්‍රියක් වීම ඇයට හැඟෙන ආකාරය ප්‍රකාශ කිරීමට භාවිතා කරන ආකාරය විස්තර කළා ය. ඇය, ඇයගේ රූපය "#transisbeautiful" (සංක්‍රාන්තික නම් ලස්සනයි) යන අදහස වැපිරීම සඳහා භාවිතා කරන්නීය. ඇයගේ සංක්‍රාන්තික අනන්‍යතාවය ප්‍රකාශනය වන පින්තූර වැඩි වැඩියෙන් ජනතාව අතරට යන විට විශාල වශයෙන් සංක්‍රාන්තික ජනතාව සාමාන්‍ය බවට පත්වීමට වැඩි බලපෑමක් ඇති කළ හැකි බව ද ඇය විශ්වාස කරන්නීය. මෙයට අමතරව, එම පින්තූර මගින් ඔවුන් කෙතරම් නෙත පිනවන්නේද යන්න ප්‍රර්ශනය කරයි. ඇයට අනුව, නිරුවත් ඡායාරූප හා ඇඳුම් පැළඳුම්වලින් සම්පූර්ණයෙන්ම ආවරණය වූ ඒවා අන්තර්ජාලයට මුදා හැරීම අතර සමබරතාවයක් තිබිය යුතු වේ. ඇයගේ ශරීරය "නිරාවරණය කිරීම" හා ඇයගේ නග්න බව ප්‍රදර්ශනය කිරීම සංක්‍රාන්තික ශරීර කොන්කිරීම ඉවත් කරන ඇයගේ පණිවිඩයේ වැදගත් කොටසක් බව ඇය විශ්වාස කරයි. එමෙන්ම ඇය එසේ කිරීමෙන් ඈත් ව සිටීමට උත්සාහ නොකරයි. ලොව පුරා සිටින ආසන්න වශයෙන් පන්දහසක් පමණ වන ඇයගේ Instagram ගිණුමේ අනුගාමිකයින් ද ඇතුලත්ව, ඇයගේ පණිවිඩය ශ්‍රී ලාංකික ආකල්ප පමණක් නොව ලොව පුරා සිටින්නන්ගේ ආකල්ප වෙනස් කිරීමටම දායක වේ. අනෙක් අතට, යොමුගත කණ්ඩායම් සාකච්ඡාවට සහභාගී වූ සමලිංගික පුරුෂයෙක් වන සචින්ත මුහුණුපොත ද ඇතුලත් ව අනෙකුත් සමාජ මාධ්‍ය ප්‍රසිද්ධියේ LGBTQ හා සම්බන්ධ අන්තර්ගතය බෙදා ගැනීමටත් ශ්‍රී ලංකාවේ LGBTQ අයිතිවාසිකම් පිළිබඳව සම්භාෂණයේ යෙදීම සඳහා යොදා ගනී. කෙසේ වුව ඔහු, ඔහුගේ අපේක්ෂාව අතිශයෝක්තියෙන් ප්‍රකාශ නොකිරීමට ප්‍රවේශම් සහගත විය: "මෙවැනි අන්තර්ගතයක් බෙදා ගැනීමෙන් මම මහ විශාල විප්ලවයක් සිදු වේ යැයි බලාපොරොත්තු නොවන්නෙමි; මට ප්‍රසිද්ධයේ බෙදාගැනීම පිටුපස උදාර, සවිඥාණික අරමුණක් හෝ අභිප්‍රේරණයක් නොමැත; නමුත් මම එය කරමි, සමහරවිට වෙන කෙනෙක් එම පලකිරීම දැකීමෙන් හෝ ඒ සම්බන්ධව සංවාදයේ නිරතවීමෙන් යම් ප්‍රතිලාභයක් ලැබිය හැකියි."

කෙසේ වුවත් LGBTQ ප්‍රකාශනය හා සමාජ යෙදීම සවිබලගැන්වීමට බලවත් විභව්‍යතාවයක් අන්තර්ජාලයට තිබුණ ද විවිධ ආකාරයෙන් සමාජ මාධ්‍ය හා අන්තර්ජාලය තුළ LGBTQ ශ්‍රී ලාංකිකයින් තමතමන් වාරණය කර ගන්නා ආකාරය විසින් එම විභව්‍යතාවයට සීමාවන් පනවා ගෙන ඇත. ආසන්න වශයෙන් සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 46%ක් ඔවුන්ගේ සමාජ මාධ්‍ය පැතිකඩ තුළ LGBTQ හා සම්බන්ධ අන්තර්ගතය "ප්‍රසිද්ධියේ" බෙදා හරින බව පැවසීය. සෑම ප්‍රතිචාරකයෙක් ම සමාජ මාධ්‍ය තුළ ඔවුනගේ ලිංගික හෝ සමාජභාවී ප්‍රකාශනය නොවලහා ප්‍රකාශ කරන්නේ නැත: 18% ක් LGBTQ හා සම්බන්ධ අන්තර්ගතය සීමිත දෘශ්‍යතාවය සැකසුම් යටතේ දෘශ්‍යතාවය එක්කෝ "මිතුරන්" හෝ සුවිශේෂී මිතුරු "කව" හෝ "ලැයිස්තු" වශයෙන් දෘශ්‍යතාවය සීමාකර බෙදාගන්නා බව ඇඟවීය; තවත් ප්‍රතිචාරකයින්ගෙන් 13% ක් ඔවුන් ඉතාමත් කලාතුරකින් එවැනි අන්තර්ගතයන් ඔවුන්ගේම පැතිකඩ පෝෂකයන් මත බෙදාගත්තද එවැනි දේ සුවිශේෂී කණ්ඩායම් තුළ එසේ කරන බව පැවසීය; 22% තම පැතිකඩ (profile) මත "LGBTQ හා සම්බන්ධ අන්තර්ගතය කවමදාවත් බෙදා නොගන්නා" බව පැවසීය.

| | | |
|---|---|---|
| මගේ පැතිකඩ පෝෂකය (profile feed) මත LGBTQ හා සම්බන්ධ අන්තර්ගතය ප්‍රසිද්ධයේ බෙදාගනිමි (උදා: බිත්තිය, කාලරේඛය). | 39 | 46% |
| මගේ පැතිකඩ පෝෂකය මත LGBTQ හා සම්බන්ධ අන්තර්ගතය ප්‍රසිද්ධයේ බෙදාගනිමි, නමුත් මම දෘශ්‍යතාවය මගේ "මිතුරන්ට", හෝ සුවිශේෂී "මිතුරු" කව/ලයිස්තුවලට සීමා කරමි. | 15 | 18% |
| මම LGBTQ හා සම්බන්ධ අන්තර්ගතය කවමදාවත් මගේ පැතිකඩ පෝෂකය මත බෙදා නොගනිමි | 19 | 22% |
| මම LGBTQ හා සම්බන්ධ අන්තර්ගතය සුවිශේෂී කණ්ඩායම් තුළ බෙදා ගනිමි, නමුත් ඉතාමත් කලාතුරකින් මගේම පැතිකඩ පෝෂකය තුළ | 11 | 13% |

වගුව 2: සමාජ මාධ්‍ය තුළ තොරතුරු බෙදා ගැනීම

සමාජ මාධ්‍ය තුළ ලිංගික දිශානතිය හා සමාජභාවී අනන්‍යතාවය හා සම්බන්ධ ගැටලු කතා කළ හැකි එකම ක්‍රමය තමාගේම පැතිකඩ මත හෝ කණ්ඩායම් මත පලකිරීම් දැමීමම නොවේ. සමාජ මාධ්‍ය

හා යෙදීමේ අනෙක් වැදගත් ස්ථානය වන්නේ එක් එක් පලකිරීම් යටතේ අදහස් දැක්වීම වේ. එහිදී පරිශීලනය කරන්නාට තමන් බෙදාගන්නා දෙය දකින්නේ කවුද හා එයට ප්‍රතිචාර දක්වන්නේ කවුරුන්ද යන්න පිළිබඳව ඇත්තේ අඩු පාලනයකි.

මුහුණුපොත, උදාහරණයක් වශයෙන් තම තමන්ගේ පලකිරීම්වල රහස්‍යභාවය පාලනය කිරීමට ඉඩදේ. නමුත්, ඒ ආකාරයේම පාලනයක් වෙන කෙනෙකුගේ පලකිරීමක් යටතේ වන යම් කෙනෙකුගේ අදහස් දැක්වීමට හා ප්‍රතික්‍රියාවන් සඳහා නොමැත. ඒ වෙනුවට, මුහුණු පොත අදහස් දැක්වීම් හො ප්‍රතික්‍රියා එහි මුල් සන්දර්භයෙන් එළියට ගෙන අනෙක් අයගේ පුවත් පෝෂකවල ඇබිත්තක් ලෙස ඉදිරිපත් කරමින් සංවාදයේ යෙදීසිටින අයට වඩා පුළුල් ප්‍රේක්ෂක ජනතාවක් අතරට ක්‍රියාකාරීව අදහස් දැක්වීම් හා ප්‍රතිචාර විකාශය කරයි. වඩාත් විශාල සංවාදයක සුවිශේෂී අදහස් දැක්වීම හෝ ප්‍රතික්‍රියාව එවැනි ආකාරයෙන් ඉදිරිපත් කරන නිසා, ඔවුන්ගේ පුවත් පෝෂක මත හමුවන පරිශීලකයින්ට එම සමස්ත සංවාදයේ සන්දර්භය අවබෝධ කර ගැනීම සඳහා එය මත එබීමෙන් (ක්ලික් කිරීමෙන්) විස්තාරණය කරගැනීම අවශ්‍ය වේ. ට්විටර් (Twitter), අනෙක් අතට, අදහස් දැක්වීමේ කොටසට සම්බන්ධ වන්නේ නැත; ඒ වෙනුවට, තනි පලකිරීමකට ප්‍රතිචාර දැක්වීමට අපේක්ෂා කරන පුද්ගලයින් (ට්වීට් කිරීමට යනුවෙන් හඳුන්වන) පිළිතුරු දීමක් ලෙස තමාගේම පලකිරීමක් නිර්මාණය කළ යුතුය. මෙමගින් මුල්ම/ප්‍රථම පෝස්ටුවට ස්වයංක්‍රීය සම්බන්ධකයක් නිර්මාණය වන අතර එය තනිපුද්ගල පලකිරීම් ගණනාවක් අඩංගු කිරීමෙන් "සංවාදයක්" ගොඩනගනු ලැබේ. නොයෙක්විට, "ප්‍රවනතාවයේ" පවතින පලකිරීමකට පරිශීලකයෙක් පිළිතුරක් සැපයූ විට ඔවුන්ගේ අනුගාමිකයින්ට ප්‍රවනතාවයේ පවතින ක්‍රියාකාරකමේ සාරාංශ සංග්‍රහයක් ලෙස මෙම ක්‍රියාව පිළිබඳව දැනුම්දෙනු ලැබේ. ඉන්ස්ටග්‍රෑම් එම ආකාරයට, සාරාංශ සංග්‍රහය වැනි පිටුවකින් සමන්විත වේ; කෙසේ වුව පරිශීලකයෙකුට අනෙක් පරිශීලකයින්ගේ ක්‍රියාකාරකම් දැකීමට අවශ්‍ය නම් ක්‍රියාකාරී ලෙස එම පිටුව තුළට ගමන් කළ යුතුයි. මෙයට ප්‍රතිවිරුද්ධ ලෙස, මුහුණු පොතෙහි, එවැනි යාවත්කාලීනවීම් වේදිකාවේ ප්‍රධාන පිටුවෙහි දර්ශනය වන අතර ට්විටර්හි එවන් යාවත්කාලීනවීම් තනි පරිශීලකයින් සඳහා විශේෂයෙන් "සකස් කර" සාමාන්‍ය නිවේදනයක් ලෙස බෙදාහරිනු ලැබේ.


මේ අනුව, අපේක්ෂා කරන ප්‍රමාණයට වඩා වැඩි ජන කොටසක් අතර ඔවුනගේ වදන් විකාශනය වේ යැයි හැඟුණහොත්, LGBTQ ශ්‍රී ලාංකිකයෝ අදහස් දැක්වීම් මෙන්ම අනෙක් අයගේ පලකිරීම් වලට ම්බන්ධවීම අවම වීමේ හැකියාවක් ඇත. ඇත්ත වශයෙන්ම, ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 31%ක්, ඔවුන්ට හැඟෙන ඕනෑම අවස්ථාවකදී ඔවුන්ගේ ලිංගික දිශානතිය හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාවය පලකිරීම්වල හෝ අදහස් දැක්වීම්වල සඳහන් කරන බව ප්‍රකාශ කරන ලදී. එයට සමාන සංඛ්‍යාවක් විසින් ඔවුන්ගේ ලිංගික දිශානතිය හෝ සමාජභාවී අනන්‍යතාවය පලකිරීම්වල හෝ අදහස් දැක්වීම්වල "කවදාවත්" සඳහන් නොකරන බව ප්‍රකාශ කරන ලදී. ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 38%ක් ඔවුන්ගේ ලිංගික දිශානතිය හෝ සමාජභාවී අනන්‍යතාවය "සීමිත අවස්ථාවන්වලදී" පමණක් සඳහන් කරන බව ප්‍රකාශ කළ නමුත් 4% ක් දෙනා ඔවුන්ගේ ලිංගික දිශානතිය හෝ සමාජභාවී අනන්‍යතාවය "ඔවුන් පෞද්ගලිකව හඳුනාගන්නා දෙයට වෙනස් දෙයක්" ලෙස සඳහන් කරන බව පැවසීය. මෙම සියලුම ප්‍රතිචාර "යථාර්ථ" පැතිකඩයන් මත කරනු ලබන පලකිරීම් හා අදහස් දැක්වීම් හා සම්බන්ධ වේ. (වෙනත් වදන්වලින් පවසන්නේ නම් : "යථාර්ථ"[54] ලෙස පැතිකඩ ඉදිරිපත් කරන ප්‍රතිචාරකයින් එම පැතිකඩයන් හා තම නියම නම සහ/හෝ ඔවුන්ගේම පින්තූර ඇතුලත් කර ඇත).

| මම මගේ සමාජ මාධ්‍ය පලකිරීම්වල හා අදහස් දැක්වීම්වල මගේ ලිංගික දිශානතිය හෝ සමාජභාවී අනන්‍යතාවය සඳහන් කරාවි | | |
|---|---|---|
| ...මට ඒ ගැන සඳහන් කළ හැකි ඕනෑම අවස්ථාවකදී | 26 | 31% |
| ...සීමිත අවස්ථාවන්වලදී | 32 | 38% |
| මම, මගේ සමාජ මාධ්‍ය පලකිරීම්වල හා අදහස් දැක්වීම්වල මගේ ලිංගික දිශානතිය හෝ සමාජභාවී අනන්‍යතාවය කවදාක හෝ සඳහන් කරාවි | 24 | 28% |
| මම, මගේ සමාජ මාධ්‍ය පලකිරීම්වල හා අදහස් දැක්වීම්වල මගේ ලිංගික දිශානතිය හෝ සමාජභාවී අනන්‍යතාවය මම පෞද්ගලිකව හඳුනාගන්නා දෙයට වෙනස් දෙයක් ලෙස සඳහන් කරාවි | 3 | 4% |

වගුව 3: අන්තර්ජාලය තුළ ලිංගික දිශානතිය සහ සමාජභාවී අනන්‍යතාවය සඳහන් කිරීම

54 මෙම අධ්‍යයනයේදී, "යථාර්ථ නම" යන්න "ඔබ බොහොමයක් ජනතාවට ඔබව හඳුන්වා දෙන්නේ කෙසේද" යන ආකාරයෙන් නිර්වචනය කළ අතර නිත්‍යානුකූල නමින් වෙනස්ලෙස හඳුනා ගැනීම. "උප්පැන්න සහතිකයේ හා වෙනත් ලියවිලිවල ඔබට දෙනලද නම" වශයෙන් නිර්වචනය කරන ලදී.

ඒ හා සමානව, තමන්ගේ ප්‍රසිද්ධ පැතිකඩෙහි ඔවුන්ගේ ලිංගික දිශානතිය සඳහන් කළ සංඛ්‍යාව සාපේක්ෂ වශයෙන් අඩුය. ලිංගික අනන්‍යතාවය බෙදාගන්න අයට වඩා සැලකිය යුතු ප්‍රතිචාරකයින් ප්‍රමාණයක් ඔවුන්ගේ දුරකථන අංකය බෙදා ගනී. සැලකිය යුතු ප්‍රතිචාරකයින් ප්‍රමාණයක් ඔවුනගේ සමාජභාවී අනන්‍යතාවය බෙදා ගන්නා අතර සමීක්ෂණයෙහි, සංක්‍රාන්තික ශ්‍රී ලාංකිකයින්ගේ සහභාගිත්වය ප්‍රමාණවත් නොවන හෙයින් දත්ත පදනම් කරගෙන සමාජභාවී ප්‍රකාශනය සම්බන්ධයෙන් නිගමනයන්ට එළඹීම අපහසු වේ.




රූප සටහන 7: සමාජ මාධ්‍ය තුළ පෞද්ගලික තොරතුරු ප්‍රසිද්ධියේ බෙදා ගැනීම

නිශ්චිත සාධක ගණනාවකට භීතියෙන් ඔවුන් ඔවුන්ගේ සමාජ මාධ්‍ය සහභාගිත්වය (පලකිරීම් හා අදහස් දැක්වීම්) සීමාකර තිබේදැයි ඇසූ විට ප්‍රතිචාරකයෝ පහත සඳහන් පරිදි වාර්තා කළෝය:

| ඔබගේ සැබෑ නම සහ/හෝ ඔබගේම පින්තූර ඇතුළත් සමාජ මාධ්‍ය පැතිකඩ සම්බන්ධව, පහත සඳහන් සාධකවලට භීතියෙන් (පලකිරීම් සහ අදහස් දැක්වීම්), සමාජ මාධ්‍යවල ඔබගේ සහභාගීත්වය සීමා කරන්නේද? කරුණාකර වඩාත් යෝග්‍ය තේරීම් තුනක් කරන්න. | | |
|---|---|---|
| මම, මගේ ලිංගික දිශානතිය හෝ සමාජභාවී අනන්‍යතාවය අනෙක් පුද්ගලයින් හඳුනා ගනීවියැයි බියවන්නෙමි | 22 | 26% |
| අනෙක් පුද්ගලයින්ගේ අදහස් කුමක් වේ දැයි යන්න ගැන මම බිය වන්නෙමි | 16 | 19% |
| මම, මගේ ලිංගික දිශානතිය හෝ සමාජභාවී අනන්‍යතාවය පෙන්වීමට කැමැත්තක් නොදක්වමි | 29 | 34% |
| එවැනි මාතෘකා පිළිබඳව පලකිරීම් දැමීම නීත්‍යානුකූල ද නැත්ද යන්න මම නොදන්නෙමි | 5 | 6% |
| භෞතික ලෝකයේදී මට එරෙහිව ප්‍රචණ්ඩත්වය ඇතිවීමට එය හේතුවක් වේ යයි මම බිය වන්නෙමි. | 15 | 18% |
| මගේ ලිංගික දිශානතිය හෝ සමාජභාවී අනන්‍යතාවය ගැන රජය දැන ගනීවි යයි මම බිය වන්නෙමි. | 5 | 64% |
| මගේ රැකියාවට එය බලපෑමක් වේ යයි මම බිය වන්නෙමි. | 15 | 18% |
| සමාජ මාධ්‍ය වේදිකාවල ඕනෑම කෙනෙක් ඔවුන්ගේ ලිංගිකත්වය හා සමාජභාවී ගැටලු සාකච්ඡා කළ යුතුයැයි මම නොසිතන්නෙමි | 5 | 6% |

වගුව 4: අන්තර්ජාලය තුළ සැබෑ නම/පින්තූරය අන්තර්ගත කිරීම

කෙසේවුවද ප්‍රතිචාරකයින්ගෙන් අටදෙනෙක්, මෙම ප්‍රශ්නය ඔවුන්ට අදාල නොවන බව පැවසීය. වෙනත් දෙදෙනෙක් තමන්ගේම පිළිතුරු සඳහන් කිරීමට තීරණය කර තිබුණ අතර ඔවුහු "මම මගේ ලිංගිකත්වය විවෘතව සඳහන් කළහොත් මගේ පවුල මුහුණ දෙන සමාජ අපවාදය ගැන මම කරදර වන්නෙමි" හා "මම මගේ සහායකයන්ගේ, මිතුරන්ගේ, සහ ඥාතීන්ගේ අදහස් කුමක්වේ දැයි කරදර වන්නෙමි" වශයෙන් ප්‍රකාශ කළෝය. එක ප්‍රතිචාරකයෙක් "මම එම සාකච්ඡාවල සහභාගීවීමට සුදුසු යැයි හැඟෙන තැන්වලදී සහභාගි වන්නෙමි" ප්‍රකාශ කර තිබුණි.

ස්වයං-වාරණය නිර්ණාමික පැතිකඩ නිර්මාණයට හා භාවිතයට හේතු වේ. LGBTQ ශ්‍රී ලාංකිකයින් අතර වැදගත් සංසිද්ධියක්

වන්නේ නිර්ණාමික හා ආරූඪනාමික පැතිකඩ සමාජ මාධ්‍ය තුළ කොන්කිරීම හා වෙනස්කොට සැලකීමට එරෙහි මාර්ගය සොයා ගැනීම සඳහා භාවිතා කිරීමයි.

| ප්‍රශ්න - 85 | එකම අන්තර්ජාල වේදිකාවේ පවතින සියලුම මගේ පැතිකඩයන් මගේ සැබෑ නම සහ/හෝ මගේ මුහුණේ පින්තූරය ඉදිරිපත් කරයි | මට පැතිකඩයන් බොහොමයක් තිබේ; මගේ සැබෑ නම සහ/හෝ මගේ මුහුණේ පින්තූරය ඉදිරිපත් කර ඇත්තේ. එකක හෝ කිහිපයක පමණි | මට එක වේදිකාවකට එක පැතිකඩ බැගින් තිබේ. එහි මගේ සැබෑ නම සහ/හෝ මගේ මුහුණේ පින්තූරය ඉදිරිපත් කරයි | මට එක වේදිකාවකට එක පැතිකඩ බැගින් තිබේ. එහි මගේ සැබෑ නම සහ/හෝ මගේ මුහුණේ පින්තූරය ඉදිරිපත් කර නොමැත. | මට කිසිම සමාජ මාධ්‍ය ජාලයක කිසිඳු පැතිකඩක් නොමැත. |
|---|---|---|---|---|---|
| මට එක පැතිකඩකට වඩා තිබේ. නමුත් ඒවා මගේ ලිංගික දිශානතිය හෝ සමාජභාවී අනන්‍යතාවයට කිසිඳු සබඳතාවයක් නොමැත. | 7 | 6 | 0 | 0 | 0 |
| මගේ ලිංගික දිශානතිය හෝ සමාජභාවී අනන්‍යතාවය හා සම්බන්ධ හේතු නිසාවෙන් මට එක පැතිකඩකට වඩා තිබේ. | 7 | 11 | 0 | 0 | 0 |
| මට කිසිම සමාජ මාධ්‍ය කථිකා ස්ථානයක එක පැතිකඩකට වඩා නොමැත. | 0 | 0 | 54 | 0 | 0 |

වගුව 5: පුද්ගලයකුට අන්තර්ජාලය තුළ ඇති පැතිකඩ ගණන

සමීක්ෂණ දත්ත විශ්ලේෂණයෙන් සියලුම ප්‍රතිචාරකයින්ට අඩුම තරමින් ඔවුන්ගේ "සැබෑ" නම හා ඔවුන්ගේ පින්තූර සහිත එක පැතිකඩක් තිබූ බව පැහැදිලි විය. ඔවුන්ගෙන් යම් කෙනෙකුට ඔවුන්ගේ සැබෑ නම හෝ මුහුණේ පින්තූරයක් නොමැතිව පැතිකඩක් තිබුණේ නම්, එම පැතිකඩයන් සෑමවිමට ඔවුන්ගේ "සැබෑ" පැතිකඩට අමතරව පැවති ඒවා වේ. ප්‍රතිචාරකයන්ගෙන් හතරෙන් එකකට ආසන්න සංඛ්‍යාවකට ඔවුන්ගේ ලිංගික දිශානතිය හෝ සමාජභාවී අනන්‍යතාවය හා සම්බන්ධ හේතු නිසාවෙන් ඔවුන් කැමති සමාජ මාධ්‍ය වේදිකාවන්හි එක පැතිකඩකට වඩා තිබෙන බව ඇඟවීය. මෙයට ප්‍රතිචාර 85න් 18 ක් විය. එම සංඛ්‍යාවෙන් ප්‍රතිචාරකයින් 7ක්, එකම සමාජ මාධ්‍ය වේදිකාවක පවතින සියලුම පැතිකඩයන්හි එක්කෝ ඔවුන්ගේ සැබෑ නම හෝ මුහුණේ පින්තූරය හෝ දෙවර්ගයම ඉදිරිපත් කර ඇති බව පැවසීය. අනෙක් 11 දෙනා "පැතිකඩ එකක හෝ යම් ගණනකි. මගේ සැබෑ නම සහ/හෝ මගේ මුහුණේ පින්තූරය ඉදිරිපත් කර ඇති" බව හැඟවීය. තවත් ප්‍රතිචාරකයින්ගෙන් 15% ක්, ඔවුනට එක පැතිකඩකට වඩා ඇති බවත්, එය ඔවුනගේ ලිංගික දිශානතිය හෝ සමාජභාවී අනන්‍යතාවය හා කිසිම සම්බන්ධතාවයක් නොමැති බවත් පැවසීය.  බහුතරයක් වන 64% (54) වන ප්‍රතිචාරකයෝ ඔවුන් මනාප සමාජ මාධ්‍ය වේදිකාවෙහි ඔවුන්ගේ සැබෑ නම සහ/හෝ ඔවුන්ගේ මුහුණේ පින්තූරයද සහිත එක පැතිකඩක් පැවති බව පැවසුවෝය.

ප්‍රතිචාරකයින්ට අනුව, ඔවුන්ගේ සැබෑ නම හෝ මුහුණේ පින්තූරය නොමැති පැතිකඩයන් භාවිතය සඳහා වන සමහර හේතු පහත සඳහන් වේ.

| | | |
|---|---|---|
| මගේ ලිංගික දිශානතිය නීති විරෝධී යයි සලකනු ලබන නිසා. | 16 | 19% |
| මගේ ලිංගික දිශානතිය හෝ සමාජභාවී අනන්‍යතාවය මගේ පවුලේ අය හඳුනා ගනීවී යයි බියක් මා තුළ ඇති නිසා. | 14 | 16% |
| මගේ ලිංගික දිශානතිය හෝ සමාජභාවී අනන්‍යතාවය මගේ මිතුරන් හඳුනා ගනීවී යයි බියක් මා තුළ ඇති නිසා. | 14 | 16% |
| මගේ ලිංගික දිශානතිය හෝ සමාජභාවී අනන්‍යතාවය මගේ සේවා යෝජකයා හෝ සේවා ස්ථානයේ සගයන් හඳුනා ගනීවී යයි බියක් මා තුළ ඇති නිසා. | 13 | 15% |
| මගේ සැබෑ නම හා මගේම පින්තූර අන්තර්ගත නොවන කිසිම පැතිකඩක් මා සතුව නොමැත. | 47 | 55% |

වගුව 6: තම නම හෝ පින්තූරය නොමැති පැතිකඩවල භාවිතය

ප්‍රතිචාරකයින්ට එක් සම්මත ප්‍රතිචාරයකට වඩා වැඩි ප්‍රමාණයක් තෝරාගත හැකි අතර ඔවුනට ඔවුන්ගේම සුවිශේෂී පිළිතුරු සැපයීමට ද හැකි විය. එවැනි එකි සුවිශේෂී ප්‍රතිචාරයක් අවධාරණය කළේ, "ලිංගික සබඳතාවයන් සඳහා පුද්ගලයින් සැබෑ පැතිකඩ භාවිතා කර සොයා ගැනීම ඉතාමත් අසීරු" බවය. වෙනත් පරිශීලකයෙකු සටහන් කරන ලද පිළිතුරක "දේවල් සම්බන්ධයෙන් ඍජුව කතාකරන (උදා: ආපනශාලාවක් පිළිබඳව හෝ සේවා සපයන්නා පිළිබඳව ඉතා නරක සාමාලෝචනයක අන්තර්ගතයක් සහිත පලකිරීම් කිරීම)" පිළිතුරක් විය. ප්‍රතිචාරදැක්වූවන් දෙදෙනෙකු සඳහන් කර තිබුණේ "රහසින් ලුහුබැඳීමේ අරමුණු වෙනුවෙන්" බවත් ඒ අතර ඔවුන්ගෙන් එක් අයෙක්, "ඔත්තු බැලීම" එක් කර තිබුණි.

LGBTQ ක්‍රියාකාරිකයින්ගේ සිට නීතිය බලාත්මක කරන නිලධාරීන් දක්වා වන ප්‍රේක්ෂාවලියක් පුරා "ව්‍යාජ" සහ "සැබෑ" පැතිකඩ යන ලේබල පර්යේෂණ සම්මුඛ සාකච්ඡා තුළදී අසන්නට ලැබුණත් ඒ සම්බන්ධයෙන් ප්‍රශ්න ආකෘතිගත කිරීමේ දුෂ්කරතාවයන් ගණනාවක් ම පැවැතුණි. ප්‍රධානතම දුෂ්කරතාවය වූයේ "ව්‍යාජ පැතිකඩක්" යන්න තීරණය කිරීම සඳහා විවිධ පුද්ගලයන් විවිධ නිර්ණායක දී තිබීම යි. වඩාත්ම පොදු නිර්ණායකය වූයේ එම පැතිකඩ පුද්ගලයාගේ සැබෑ නම යටතේ ද නොවේ ද යන්නයි. නමුත්, ශ්‍රී ලංකාවේ

LGBTQ හා සම්බන්ධ ගැටලු දෘෂ්ටිකෝණයෙන් බලන විට මෙය පැහැදිලිවම ප්‍රමාණවත් නොවේ. ඒ මන්ද යත්, සමහර LGBTQ ජනතාව ඔවුනට උපතේදී ලබාදෙන ලද නාමයට වඩා වෙනස්වන නම් භාවිතයට ගෙන ඇති හෙයිනි. එවන් පුද්ගලයින්ට, නව නාමය පැරණි නාමයට වඩා, වඩාත් "සැබෑ" ලෙස දැනෙනු ඇත. මෙය විශේෂයෙන්ම සංක්‍රාන්තික ශ්‍රී ලාංකිකයින් සම්බන්ධයෙන් සත්‍ය වේ. අනෙක් අතට, යොමුගත කණ්ඩායම් සාකච්ඡාවලට සහභාගි වූ සමහරෙක් හා තනි පුද්ගල සම්මුඛ සාකච්ඡාවලට සහභාගීවූවෝ (සියලු දෙනාම වාගේ නමුත්, අහම්බයෙන් මෙන් සමලිංගික පුරුෂයින්) ඔවුන්ට දෙනලද නාමය යටතේ ඔවුන්ගේ මුහුණේ පින්තූර ද සමග බහුවිධ පැතිකඩ පවතින බව පැවසුවෝය. මෙම පැතිකඩ අතරින් එක් පැතිකඩක් එම පුද්ගලයාගේ සත්‍ය ලිංගික දිශානතිය පිළිබඳව නොදන්නා මිතුරන් හා ඥාතීන් සඳහා විෂම ලිංගික කාර්යය සාධනයක් පවත්වා ගැනීමට භාවිතා කරන අතර අනෙක් පැතිකඩ පවත්නා මිතුරු සබඳතා මෙන්ම LGBTQ ප්‍රජාව තුළ නව මිතුරුදම් ඇති කර ගැනීමටත් පවත්වා ගැනීමටත් භාවිතා කරනු ලැබේ. මෙවැනි පුද්ගලයන් සඳහා "ව්‍යාජ" පැතිකඩ විෂම ලිංගික එකක් වේ. කෙසේවෙතත්, තමන්ගේ මුහුණේ පින්තූරයක් නොමැතිව නිර්ණාමික හෝ ව්‍යාජනාමයක් සහිත පැතිකඩ පවත්වන පුද්ගලයින්ට, ඔවුන්ගේ නම, ඔවුන්ගේ මුහුණේ පින්තූරය සහ භෞතික ලෝකයේ සිටින ඔවුන්ගේ මිතුරන් හා ඥාතීන් හා සම්බන්ධ වන ඔවුන්ගේ "විරුද්ධ ලිංගික" පැතිකඩ සැබෑ පැතිකඩ විය.

මෙවැනි හේතූන් නිසාවෙන්, සමීක්ෂණයේ "සැබෑ" පැතිකඩ, "ව්‍යාජ" පැතිකඩ සමග සංසන්දනය කරන අංශයෙහි, ප්‍රථම ප්‍රශ්නය එකඟතාවය වීම හෝ නොවීම පෙන්වන ප්‍රකාශයක් විය: "මගේ සැබෑ නම (මම මාව බොහොමයක් පුද්ගලයින්ට හඳුන්වා දෙන ආකාරය) මගේ නීත්‍යානුකූල නමම(උප්පැන්න සහතිකය වැනි ලේඛනවල දෙන ලද නම) වේ." "සැබෑ" නමට යොමුවන අනෙක් සෑම ප්‍රශ්නයක්ම මෙම නිර්වචනය මත පදනම් විය(කෙනෙක් ඔවුන් බොහොමයක් පුද්ගලයන්ට හඳුන්වාදෙන ආකාරය). ප්‍රතිචාර දැක්වූවන්ගෙන් පස් දෙනෙක් හැර අනෙක් සියලුදෙනාගේම සැබෑ නම ඔවුන්ගේ නීත්‍යාකූල නමම විය. "සැබෑ නම" සහ "නීත්‍යානුකූල නාමය" යන සංකල්ප සංක්‍රාන්තික ප්‍රජාවට වඩාත් අදාළ වන බැවින් ප්‍රතිචාරකයින්ගේ සමාජභාවී හඳුනාගැනීම් සමග ප්‍රතිචාර හරස්-වගුගත කරන ලදී: ප්‍රතිචාර දැක්වූ

පස්දෙනාගෙන් හතර දෙනෙක් ඔවුන්ගේ සැබෑ නම, පුරුෂ නමක් වන නීත්‍යානුකූල නමෙන් වෙනස් බව ඇඟවීය. මේ අතර එක් ප්‍රතිචාරකයෙක් "සංක්‍රාන්ති පුරුෂ-ස්ත්‍රී" (Trans MTF) වේ. අනෙක් සියලුම ප්‍රතිචාරකයින්ගේ ස්ත්‍රී පුරුෂ හඳුනාගැනීම් (එනම් සැබෑ නම හා නීත්‍යානුකූල නම සමාන බව පැවසූ අය) කොටස්කර වෙන්කොට පහත සඳහන් පරිදි දක්වා ඇත: ස්ත්‍රී (30), පුරුෂ (45), සමාජභාවය හඳුනා නොගත් (2), සංක්‍රාන්ති පුරුෂ-ස්ත්‍රී (1), සහ සංක්‍රාන්ති ස්ත්‍රී-පුරුෂ (1).

රාජේෂ් යනු යොමුගත කණ්ඩායම් සාකච්ඡාවට සහභාගී වූ සමලිංගික පුරුෂයෙකි. දමිළ ජාතිකයෙක් වශයෙන්, ඔහුට සාපේක්ෂකව දීර්ඝ හා වඩා විධිමත් ලෙස දෙන ලද නමක් තිබේ. එය ඔහු සාමාන්‍ය ජීවිතයේ දී භාවිතා කරන්නේ නැත. "මුහුණු පොතෙහිදී මට පැතිකඩ දෙකක් තිබේ. එකක් මගේ දෙනලද නාමය යටතේ, ඒකට තමයි මම මගේ පවුලේ සාමාජිකයින් හා පවුලේ මිතුරන් එක් කර තිබෙන්නේ; නමුත්, ප්‍රජාව තුළ සිටින මගේ සියලුම යහළුවන් මා සමග සම්බන්ධ වන්නේ කෙටි නමකින් යුත් සෑම කෙනෙක් ම දන්නා මගේ දෙවන පැතිකඩෙන්. මගේ පවුලේ යම් කෙනෙක් මට දෙවන පැතිකඩ හරහා ඉල්ලීමක් එව්වොත්, මම ඉක්මනින්ම මගේ පවුලේ සාමාජිකයින් හා පවුලේ හිතමිතුරන් එක්කර තිබෙන අනෙක් පැතිකඩෙන් ඔවුන්ව එකතු කරගන්නවා."

ඒ හා සමානවම, යොමුගත කණ්ඩායම් සාකච්ඡාවට සහභාගී වූ සංක්‍රාන්ති පුරුෂයෙක් වන මන්ජු, විශේෂ අරමුණු සඳහා නිර්මාණය කර ඇති, තුන් ආකාර වූ පැතිකඩවල් ගැන මතකය අවදි කළේය. මෙම සෑම පැතිකඩකම ඔහුගේ මුහුණ සහිත පින්තූර හා ඔහුගේ කායික සංක්‍රාන්තියෙන් අනතුරුව ඔහු තෝරාගත් නාමය ඉදිරිපත් කර ඇත. ඔහු පැහැදිලි කළ පරිදි පැතිකඩ තුනෙහි අරමුණු පහත පරිදි වේ: "එක පැතිකඩක් ප්‍රජාවේ සාමාජිකයින් සමග සම්බන්ධ වීමට හා එම ප්‍රජාවත් සමග කටයුතුවල නියැලීමටයි; අනෙක් පැතිකකඩ LGBTQ සමග සම්බන්ධ ගැටලු සම්බන්ධයෙන් අන්තර්ජාතික සම්මන්ත්‍රණවලට සහභාගී වීම හරහා මුණ ගැසුන විවිධ ක්‍රියාකාරකයින් හා සංවිධායකවරු සමග සබඳතාවයන් පැවැත්වීමට හා ජාලගතවීමටයි; මෙම අරමුණු දෙක වෙනස්ව තබාගැනීමට හේතුව වන්නේ මට මගේ අන්තර්ජාතික සගයන් සමග ඉංග්‍රීසි භාෂාව භාවිතා කිරීමට අවශ්‍යයි, නමුත් මට මගේ ප්‍රජාව සමග සිංහල භාෂාවෙන් සම්බන්ධ වීමට අවශ්‍යයි. මගේ තෙවන පැතිකඩ වන්නේ සම්පූර්ණයෙන්ම වෙනස් හේතුවක් සඳහාය:

මම පෞද්ගලිකව සත්ව සුබසාධක වැඩක නිරත වන්නෙමි. මම එහි සත්ව සුබ සාධක ගැටලු ප්‍රවර්ධනය කරන්නෙමි. එම කාර්යය සඳහා එම පැතිකඩ ඉමහත් ලෙස ප්‍රයෝජනවත් වේ. සත්ව සුබ සාධක කණ්ඩායම, LGBTQ ප්‍රජාවගෙන් වෙනස් වන නිසා, LGBTQ පිළිබඳ ගැටලු සම්බන්ධයෙන් මම කරන පලකිරීම් නිසාවෙන්, මගේ සත්ව සුබ සාධක ගැටලු කතා කිරීමේ හෝ මම කියන දේ ශ්‍රාවක ජනයා විසින් ලබා ගන්නා ආකාරය මගේ හැකියාවට බලපෑමක් ඇති වනවාට මම කැමති නැහැ".

යොමුගත කණ්ඩායම් සාකච්ඡා හා සම්මුඛ සාකච්ඡා අතරතුරදී බොහොමයක් පුද්ගලයින් "ව්‍යාජ පැතිකඩ" යන සංකල්පය එක්කෝ අනුමත නොකරන හෝ අඩුම තරමින් පිළිකුලෙන් යුතුව සලකන බව නිරීක්ෂණය කරන ලදී. සයිබර් අපරාධ ඒකකයේ නිලධාරියෙකු සමග කරන ලද සම්මුඛ සාකච්ඡාවේදී සමාජ මාධ්‍ය පැතිකඩ සම්බන්ධයෙන් දැඩි නිරීක්ෂණයක් පොලීසිය විසින් කරනු ලබන අවස්ථාවන් සම්බන්ධයෙන් පැනයක් නැගූ විට, ක්ෂණිකව ලැබූ පිළිතුර වූයේ "ව්‍යාජ පැතිකඩ" යන්නයි. මෙය පැහැදිලි ලෙස පෙනෙන්නට තිබුණද පොලීසිය සාමාන්‍යයෙන් ව්‍යාජ පැතිකඩ සම්බන්ධයෙන් දැඩි ලෙස ක්‍රියාත්මක නොවේ, නමුත් "හිංසනය", "කප්පම් ගැනීම", වැනි දේ පිළිබඳව අදාල පැතිකඩ සම්බන්ධයෙන් පැමිණිලි ලැබූවිට පමණක් එසේ ක්‍රියාත්මක වේ. යොමුගත කණ්ඩායම් සාකච්ඡාවට සහභාගී වූ සංක්‍රාන්ති පුරුෂයෙක් වන ක්‍රිෂ්ණා "ව්‍යාජ පැතිකඩ ප්‍රගතිශීලී නොවන" බවට දීර්ඝ වශයෙන් තර්ක කළේය. ඒ හා සමානවම, සමලිංගික පුරුෂයෙක් වන ඩේවිඩ්, තනි පුද්ගල සම්මුඛ සාකච්ඡාවකදී ව්‍යාජ පැතිකඩ දෙපැත්ත කැපෙන කඩුවක් ලෙස හැඳින්වීය. ඔහුට අනුව, කිසිඳු වගවීමකින් තොරව පුද්ගලයින්ට අදහස් දැක්වීමට නිර්ණාමික පැතිකඩ ඉඩදෙන බවත්, සමහරක් විට මෙය ශ්‍රී ලංකාවේ LGBTQ අයිතීන් පිළිබඳ "ව්‍යාපාරයට" ඍණාත්මක පිළිබිඹුවක් විය හැකි වේ. ඒවාගේම, ඔහු සම්බන්ධ වූ අන්තර්ජාල LGBTQ ප්‍රජා කටයුත්තක්, නග්න අන්තර්ගතයන් ප්‍රසිද්ධියේ මුහුණු පොතෙහි පලකළ "ව්‍යාජ පැතිකඩ" ක්‍රියාකාරී ආකාරයෙන් ක්‍රියාකර අවලංගු කළ ආකාරය ඔහු සඳහන් කළේය. විශේෂයෙන් ම මෙවැනි පැතිකඩ ඔවුන්ගේ ප්‍රජා ක්‍රියාකාරකමේ කැපවුණු පැතිකඩ සමග ද අන්තර්ක්‍රියා කර ඇති අවස්ථාවේදී මෙම අවලංගු කිරීම සිදු කර ඇත. එවැනි පැතිකඩවලට එරෙහිව ගත් වැඩපිළිවෙලට, ප්‍රථමයෙන්ම, මුහුණු පොතේ පැතිකඩ හරහා මුහුණට මුහුණලා එවැනි අන්තර්ගතය පලකිරීම නතර

කිරීමට උනන්දු කිරීමත් දෙවනුව, ඔවුන්ගේ අන්තර්ගතය සහ/හෝ පැතිකඩ මුහුණු පොතෙහි ප්‍රජා ප්‍රමිති යාන්ත්‍රණයට වාර්තා කිරීම අන්තර්ගත විය.

## භාවිතයඃ සම්බන්ධතාවයන් ආරම්භ කිරීම හා පවත්වාගෙන යාම

ශ්‍රී ලාංකික LGBTQ ජනතාවට එකිනෙකා මුණ ගැසීම නිරන්තරයෙන් ම දුෂ්කර වී තිබෙන අතර වර්තමානයේදී ද එය එසේම පවතී. බහුලව පැතිරුණු කොන්කිරීම හා වෙනස්කොට සැලකීම සහ අනාවරණය, බැහැර කිරීම මෙන්ම හානි කිරීම සමග සම්බන්ධ වන භීතිය විසින්, බොහොමයක් LGBTQ ශ්‍රී ලාංකිකයින් ඔවුන් සිතන පතන ආකාරයේ වෙනත් අයගේ මිතුරු සමාගම ප්‍රසිද්ධියේ සෙවීම වළක්වනු ලැබේ. එකිනෙකා මුණ ගැසී සමාජගතවීමට ආරක්ෂාකාරී, සාධාරණ අවකාශයන්ගේ හිඟකම මෙම ගැටලුව වඩාත් උග්‍ර කරවයි; ශ්‍රී ලංකාවේ පොදු අවකාශයන් විෂම ලිංගික ජෝඩුවලට පවා බෙහෙවින් ම "ශිෂ්ටත්වය" උදෙසා මුරකාවල් යොදා තිබේ[55]. විෂම ලිංගිකයින්ට වාගේ නොව, "සමලිංගික" වශයෙන් හඳුනාගනු ලබන ජනතාව අත්අඩංගුවට ගැනීම්, හෝ අත්අඩංගුවට ගන්නා බවට තර්ජනය කිරීම යටතේ කප්පම් ගැනීම වැනි තත්ත්වයන්ට මුහුණ දේ. එවැනි බාධාකාරී යථාර්ථයන් යටතේ, LGBTQ ප්‍රජාවේ වෙනත් සාමාජිකයින් සමග මිත්‍රත්වයන් හා සබඳතාවයන් සොයා යාමේ හැකියාව මෙන්ම ඔවුන්ගේ කැමැත්ත මත පීඩාකාරී බලපෑමක් යොදවමින් LGBTQ ප්‍රජාව අතර සිටින බොහොමයක් දෙනෙකුට ප්‍රසිද්ධ ස්ථානවල සැරිසැරීම උපරිම සැලකිල්ලෙන් කිරීමට බලකරනු ලැබේ.

1995 දී අන්තර්ජාලය සාමාන්‍ය පරිහරණය සඳහා ලබාගත හැකි තත්ත්වයට පත්වීමට පෙර, LGBTQ ශ්‍රී ලාංකිකයින් විසින් මෙම බාධාවන්ට ඔවුන් වර්තමානයේ අත්දකින ආකාරයට වඩා වඩාත් දැඩිව අත්දකින ලදී.[56] දෛවයට ඔබ්බෙන්-විෂම ලිංගික ශ්‍රී ලාංකිකයින් එකිනෙකා මුණ ගැසීමට තිබුණ ක්‍රමවේදයන්ට වෙනස්ව, LGBTQ ජනතාවට එකිනෙකා මුණගැසීමට අවස්ථාවන් බහුලව තිබුණේ නැති බව යොමුගත කණ්ඩායම් සාකච්ඡාව මෙන්ම තනි පුද්ගල සම්මුඛ සාකච්ඡාවලින් ද හඳුනා ගත හැකි විය.

55 නිදසුනක් ලෙස බලන්න, Piyumi Fonseka, P. (2016, 06 March). Occupy the Square against removal of couple. Daily Mirror. www.dailymirror.lk/106449/-Occupy-the-Square-against-removal-of-couple iy (2010, 10 June). Sri Lanka arrests kissing couples. The Courier Mail.www.couriermail.com.au/news/breaking-news/sri-lanka-arrests-kissing-couples/news-story/c6aec24aed22e6924834b02833d4469e

56 මහේල සමග පැවැත් වූ සම්මුඛ සාකච්ඡාව.

ලිංගික සහකරුවෙක් සොයමින් වීදියේ ඔබ මොබ සංචාරය කිරීම (Cruising) යනු සමලිංගික පුරුෂයින් හා ද්විලිංගික පුරුෂයින් එකිනෙකා මුණ ගැසෙන එක් ක්‍රමයකි,[57] නමුත් එවැනි හමුවීම් සාමාන්‍යයෙන් ඉක්මන්, නිරායාස, නිර්ණාමික වීමට යොමු වේ. ඒවාගේම එවැනි හමුවක ප්‍රධානතම (නැතහොත් එකම) පරමාර්ථය වන්නේ ලිංගික ක්‍රියාවන් ඉෂ්ට සිද්ධ කරගැනීම වේ.[58] LGBTQ අධිවාචන කණ්ඩායම්, ස්ත්‍රී සමලිංගික සහාය සමූහයන්ද ඇතුලත්ව සංවිධානය කරනු ලබන සමාජ එකමුතු සහ හදිසියේ හමුවන මධ්‍යස්ථාන (Drop-in centres), LGBTQ ශ්‍රී ලාංකිකයින් එකිනෙකා මුණ ගැසීමට තිබෙන අනෙක් ක්‍රමය වේ.[59] වර්තමානයේ අක්‍රීයව පවතින Companions on a Journey හි දීර්ඝකාලීන සාමාජිකයෙක් වන ලූක්, යොමුගත කණ්ඩායම් සාකච්ඡාව අවස්ථාවේදී අදහස් දක්වමින්, විශේෂයෙන්ම නවසාමාජිකයින් වෙනුවෙන් පෝය දිනයන්හිදී (පුරහඳ දිනය ශ්‍රී ලංකාවේ නිවාඩු දිනයක් වේ) මාසික ප්‍රජා රැස්වීම් පැවැත් වූ ආකාරය සිහිපත් කළේය. රැස්වීම නව සාමාජිකයින් වෙනුවෙන් පැවැත්වූවද පැරණි සාමාජිකයින් ඔවුන් මුණ ගැසීමට "ඉතා උනන්දුවෙන්" පසු වූ අතර එහෙයින් රැස්වීමට සහභාගි විය. මෙය සමහරක් අවස්ථාවන්හිදී වැඩසටහනට ආගන්තුක සත්කාර දැක්වීමේ සංවිධානයේ ධාරිතාවයට අධික පීඩනයක් එල්ල කළේය. දෙගොල්ලන්ම තමන්ට ආරාධනා කරන ලෙසට ආයාචනා කළ අතර ආරධනා පත්‍රය සාමාන්‍ය තැපැල් මාර්ගයෙන් යවන ලදී. ලූක් මෙම ක්‍රියාවලිය විස්තරාත්මක ව දැක්වීය: "ඒ දවස්වල, අදවාගේ නොවේ. වෙනත් සමලිංගික පුරුෂයෙක් මුණ ගැසීම ලේසි කාරණාවක් නොවේ. ඒ නිසා එක්තරා ආකාරයක බලාපොරොත්තු රහිත බවක් පැවතුණි. අපි අපගේ ආයතනය ප්‍රවර්ධනය කිරීමට කටයුතු කළෙමු. විවිධ සාමාජිකයෝ රූපවාහිනියේ සහ ගුවන් විදුලි වැඩසටහන්වල පෙනී සිටියහ. මෙහි ප්‍රතිඵලයක් ලෙස අපට රහසේ අප වෙත පැමිණ ජනතාවට සහභාගී විය හැකි වැඩසටහන් පිළිබඳව විමසන විශාල ලිපි සංඛ්‍යාවක් ලැබුණි. අපි ඔවුන්ගේ ලිපිනයන්වල ලැයිස්තුවක් තබාගෙන ඊළඟ සමාජ එකතුවන ස්ථානය හා දිනය

57 ඩේවිඩ් සමග සම්මුඛ සාකච්ඡාව. ලිංගික සහකරුවෙක් සොයමින් වීදියේ ඔබ මොබ සංචාරය කිරීම යනු මහජන උද්‍යාන, සාප්පු සංකීර්ණ හෝ මහජන වැසිකිළි වැනි පොදු ස්ථානවල සැරිසැරීමේ පුරුද්ද වේ. මෙහි අරමුණ වන්නේ එසේ කටයුතු කරන, ලිංගික සම්බන්ධතාවයකට අභිරුචියක් පෙන්වන තවත් අයෙකු හෝ මහ මග ගමන් කරන එවැනි අයෙකු මුණ ගැසීම වේ.

58 ක්ෂණික, නිර්ණාමික ලිංගික සම්බන්ධතාවයන්ගෙන් සෘණාත්මක වටිනාකම් විනිශ්චයන් අදහස් කරනු නොලැබේ; අදහස් කරනු ලබන ඇඟවීම වන්නේ එවැනි හමුවීම් දීර්ඝකාලීන සහ වෙනත් සම්බන්ධතාවයන් ගොඩනැගීම සඳහා උපකාරී නොවේ.

59 මාරියාන් සමග සම්මුඛ සාකච්ඡාව.

ඔවුනට ලිපි මගින් දැනුම් දුන්නෙමු. අපි ලිපි ශීර්ෂ හෝ නිල ලියුම් කවර භාවිතා නොකළෙමු. ලියුම් සැමවෙලේම පැහැදිලි හා සරල වූ වේලාව හා කාලය පමණක් සඳහන් කරන මිතුරෙක් යවන ලිපියකට සමාන විය. එවැනි සමාජ එකමුතු සඳහා සහභාගී වූ බොහෝ දෙනෙක් විය. සමහර අවස්ථාවන්වලදී එය සියයකටත් වඩා වැඩිවිය. අපට එකමුතුව පැවැත් වූ ස්ථානයේ ඉඩකඩ පවා කළමනාකරණය කිරීමට නොහැකි විය."

අන්තර්ජාලයේ ආගමනය, එතෙක් පැවති ආකාරයට වඩා සම්බන්ධතාවයන් ගොඩනගා ගන්නටත් පවත්වා ගන්නටත් මෙම ප්‍රජාවේ සාමාජිකයින්හට ඉඩ සැලසීය. යොමුගත කණ්ඩායම් සාකච්ඡාවට අනුව, සාමාන්‍ය සංවාද කුටි (chat room), අනූව දශකයේ මැද භාගය වැනි ඈත කාලයේදී පවා සමලිංගික හා ද්විලිංගික පුරුෂයින් එකිනෙකා මුණ ගැසීම සඳහා භාවිතා විය. යාහූ (Yahoo) වැනි අන්තර්ජාතික වෙළඳ නාමයන් කපුටා ඩොට් කොම් (kaputa.com) වැනි දේශීය වෙළඳ නාමයන්ගේ පැතිරීම මගින් මෙම සංවාද කුටි, පුද්ගලයින්ට නිර්ණාමිකව පුද්ගලික පරිශීලක නාමයක් සමග අත්සන් කිරීමටත් කුටියේ සිටින සියලුම සාමාජිකයින් විසින් කරන සංවාදයේ නියැලීමටත් හෝ තනි පුද්ගල පරිශීලකයින් සමග සංවාදයක් ආරම්භ කිරීමට ද ඉඩහසර සලසන ලදී. කපුටාහි, පරිශීලකයන්හට නිර්ණාමිකත්වය උපරිම ලෙස තහවුරු කරන තාවකාලික, එක්වරක් පමණක් භාවිතා කරන පරිශීලක නාමයන් නිර්මාණය කිරීමට විකල්පය දී තිබුණි. මේ කාල වකවානුව වනවිට, ශ්‍රී කනෙක්ට් (Sri Connect) යනුවෙන් හඳුන්වන ලද සුවිශේෂී ලෙස ශ්‍රී ලාංකික LGBTQ ප්‍රජාව වෙනුවෙන්ම නිර්මාණය කරන ලද සංවාද කුටි සේවාවක් ද දියත්කොට තිබුණි. මෙම සේවය සාර්ථක යයි සලකනු ලැබූවද ප්‍රජාවේ සාමාජිකයින් විසින් ඉහළින්ම පිළිගනු ලැබූවද මෙම වේදිකාව පසුව නීතිමය ගැටලුවලට මුහුණ දී අවසානයේදී අත්හිටුවන ලදී. යොමුගත කණ්ඩායම් සාකච්ඡාවට සහභාගී වූ සංක්‍රාන්ති පුරුෂයෙක් වන දේශාන්ට අනුව, ඉතා මෑතකාලීන ව එකිනෙකා මුණ ගැසීම සඳහා භාවිතා කරන ලද ක්‍රමයක් වන්නේ "කෙටි පණිවිඩ හමුවීම් දාමය" (chain SMS meetups) යි. මෙහිදී, එක් පුද්ගලයෙක් කෙටි පණිවිඩයක් සාමාන්‍යයෙන් පොදු අවකාශයක් වන ස්ථානයක් මුණ ගැසෙන වෙලාවද සමග ආරම්භ කරන අතර ප්‍රතිග්‍රාහකයා විසින් අනෙකුත් ප්‍රතිග්‍රාහකයන්ට මෙම කෙටි පණිවිඩය යවනු ලැබේ.

මිතුරුදම් හා සබඳතාවයන් පවත්වා ගැනීමේ හැකියාව ඒවා ගොඩනැගීම හා සමානවම වැදගත්වේ. "සම්බන්ධවී සිටීම" (keeping in touch)[60] එම ක්‍රියාවලියේදී වැදගත් අංගයක් වේ. අන්තර්ජාලයට පෙර, ශ්‍රී ලංකාවේ සමකාලීන සන්නිවේදන ක්‍රමයන් තුළ LGBTQ පුද්ගලයින් දෙදෙනෙක් හෝ ඊට වැඩි ගණනක් අතර නව සම්බන්ධතාවයක් පවත්වා ගැනීමට බාධාවන් රාශියක් තිබුණි. සාම්ප්‍රදායික තැපැල් සේවය, ස්ථාවර දුරකථන, ජංගම දුරකථන හා දුර්ලභ විද්‍යුත් තැපැල් ගිණුම වැනි ක්‍රම, LGBTQ ජනතාවට ඒවා මත රඳාපැවතීම අධෛර්යය කරන එමෙන්ම කොන්කිරීමේ සහ වෙනස්කොට සැලකීමේ යථාර්ථය හා බැඳී පවතින ආර්ථික හා තාක්ෂණික සීමාවන්ද සමග ආගමනය කළේය. ජංගම දුරකථන අතිශය මිල අධික විය;[61] ස්ථාවර දුරකථන සඳහා මාස ගණන් බලා සිටීමට වන පොරොත්තු ලේඛන තිබුණි. විද්‍යුත් තැපැල් ගිණුම් සාමාන්‍යයෙන් කෙනෙකුගේ සේවා ස්ථාන හරහා විය. ඉතා බහුලව භාවිතා කරන ලද සන්නිවේදන ක්‍රම, එනම් තැපැල් කරන ලද ලිපි හා ස්ථාවර දුරකථනයට කරනු ලබන ඇමතුම් පවුලේ සාමාජිකයින් විසින් හෝ නිවසේ වෙසෙන අනෙකුත් සාමාජිකයින් සමග නිතරම බෙදා ගැණුනි. එම සේවාවන් ගෘහස්ථ මට්ටමේ මිස පුද්ගලික මට්ටමේ නොවීය. විශේෂයෙන්ම පවුලේ සාමාජිකයින්ට නිරාවරණය වේ යැයි නිරන්තර බියෙන් පසුවන LGBTQ ජනතාවගේ රහස්‍යභාවය හා සම්බන්ධ කාරණා නිසාවෙන් වෙනත් LGBTQ ජනතාව සමග සබඳතා හා මිතුරුදම් පවත්වා ගැනීමට එවැනි ක්‍රම මත රඳා පැවතීම අධෛර්යය කරන ලදී.

අද වනවිට, සබඳතා ගොඩනැගීම හා පෝෂණය කිරීම පහසුකරණය කරන අන්තර්ජාල වේදිකාවෝ විවිධාකාර වූ හැඩතලයන්ගෙන් යුක්ත වන්නාහ. බොහොමයක් ජනතාව විශේෂයෙන්ම කායික හා භාවාත්මක සබඳතා මෙන්ම ජනතාව මුණගැසීම සඳහා සමාජ මාධ්‍ය ගිණුම්වල සිට අන්තර්ජාල පෞද්ගලික වෙළඳ දැන්වීම් දක්වා වන ක්‍රමවේදයන් හරහා අන්තර්ජාලය භාවිතා කරයි. ශ්‍රී ලංකාවේ මෙන්ම LGBTQ ප්‍රජාව තුළ ද, මුහුණුපොත වැනි සමාජ මාධ්‍ය වේදිකාවන් අතිශය වැදගත් අංගයන් සේ පෙනේ. බෙදා

60 සමහරවිට වඩාත් අදාළ ලෙස "keep in touch" (KIT) යනු 2000 ගණන්වල මුල්භාගයේ සීඝ්‍රයෙන් වර්ධනය වූ පෙරගෙවුම් ජංගම දුරකථන සේවාවක සන්නාම සටන් පාඨය විය.

61 Gunawardane, N., & Wattegama, C. (2001). Internet in Sri Lanka: The First Five Years. in S. Ramanathan & J. Becker (Eds.), Internet in Asia. Singapore: Asian Media Information and Communication Centre

ගැනීමට හා සමාජගතවීමට තිබෙන හැකියාව, පුළුල් අන්තර්ජාල ප්‍රජාවකින් ඈත්ව පෞද්ගලික සංවාදයක නියැලී සිටීමට තිබෙන හැකියාව, නව සම්බන්ධතා සාදාගැනීමට හැකි පහසුව, මෙන්ම මුහුණුපොත මත පවතින සැලකිය යුතු හා විශාල නිර්ණාමික LGBTQ පැතිකඩ ජාලය, යන්නෙන් අදහස් කරන්නේ එවැනි සමාජ මාධ්‍ය වේදිකාවන් ලිංගිකත්වයට හා සමජභාවී සුලුතරයන්ට අපූර්ව ලෙස සතුරු වන භෞතික ලෝකයේදී සහකරුවන් සෙවීමේ හා සමාජගතවීමේ අවදානම්වලට මුහුණ දීම සඳහා පහසු හා (බොහෝ විට) ආරක්ෂාකාරී විකල්පයක් සපයන බවයි.

සමාජ මාධ්‍ය වේදිකාවන්ට අමතරව, "පෙම්-හමු" (dating) සහ "hooking up" ලෙස හඳුන්වන "ක්ෂණික ලිංගික හමු" සැපයීමට නිර්මාණය කරන ලද ඡායාරූප බෙදාගැනීම හා ක්ෂණික පණිවිඩකරණ තාක්ෂණයන් සමග භූ-ස්ථානගත කිරීමේ තාක්ෂණය සමග ඒකාබද්ධ වන හා තම තමන්ගේ මනාපයන් හා එකිනෙකා අතර තිබෙන භෞතික සමීපත්වය මත පදනම්ව පුද්ගලයින්ට හමුවීමට ඉඩසලසන සුවිශේෂ කාර්යය මෘදුකාංග මතු වී ඇත. බොහොමයක් මෙවැනි වේදිකාවන් සියලුම ආකාරයේ ලිංගික දිශානතීන් හා සමාජභාවී අනන්‍යතාවයන් සහිත පුද්ගලයින් වෙනුවෙන් පැවතියද LGBTQ ජනතාව ඉලක්ක කරගත් වේදිකාවන්ද පවතී. LGBTQ ශ්‍රී ලාංකිකයින්ට සමාජ හා ලිංගික ජීවින් වශයෙන් භෞතික ලෝකයේ පවතින පොදු අවකාශයට ප්‍රවේශය නොමැති සන්දර්භයකදී මෙම වේදිකා බහුවිධ ආකාරයෙන් ප්‍රයෝජනවත් බව සනාථ කර ඇත.

| "පෙම්-හමු" සහ "ක්ෂණික ලිංගික හමු" (Tinder වැනි), අවධානය යොමු කරමින්, කරුණාකර ඔබට අදාල සියලුම ප්‍රකාශයන් තෝරන්න. | පුරුෂ | ස්ත්‍රී | සංක්‍රාන්ති පුරුෂ-ස්ත්‍රී | සංක්‍රාන්ති ස්ත්‍රී--පුරුෂ | හඳුනා නොගත්තා | මුළු ගණන |
|---|---|---|---|---|---|---|
| එවැනි වේදිකාවන්වලදී මට මිතුරන් හමුවී තිබේ | 38 | 5 | 2 | 0 | 1 | 46 |
| එවැනි වේදිකාවන්වලදී මට ලිංගික සබඳතාවයන් සඳහා සහකරුවන් හමු වී තිබේ. | 36 | 4 | 0 | 0 | 1 | 40 |
| එවැනි වේදිකාවක් හරහා හමුවූ කෙනෙක් සමග මම දැනට ශෘංගාරත්මක සබඳතාවයක සිටින්නෙමි/සිටියෙමි. | 18 | 4 | 1 | 0 | 1 | 21 |
| එවැනි වේදිකාවක් හරහා හමුවූ කෙනෙක් සමග මම දැනට ශෘංගාරත්මක සබඳතාවයක සිටින්නෙමි/සිටියෙමි. | 9 | 7 | 0 | 0 | 0 | 13 |
| මම එවැනි වේදිකාවන්ට කවදාවත්ම සම්බන්ධ වී නොමැත. | 4 | 11 | 0 | 1 | 1 | 13 |
| මම එවැනි වේදිකාවන් මත සන්නිවේදනය කරන ලද/ප්‍රවර්ධනය කරන ලද වැඩසටහන්වලට සහභාගී වී ඇත. | 8 | 1 | 0 | 0 | 1 | 9 |
| මම එවැනි වේදිකාවන් හරහා මම හෝ මම දන්නා වෙනත් අයෙක් සංවිධානය කරන වැඩසටහන් ප්‍රවර්ධනය කරන්නෙමි. | 5 | 1 | 1 | 0 | 0 | 6 |
| මම එවැනි වේදිකාවන් හරහා වාණිජ ලිංගික සේවය සඳහා සේවාලාභීන් හඳුනා ගන්නෙමි. | 1 | 1 | 0 | 0 | 0 | 2 |

වගුව 7: අන්තර්ජාල පෙම්හමු වේදිකා

## භාවිතයඃ ප්‍රජා සංවිධානය වීම

විශේෂයෙන්ම පීඩාකාරී නීති හා වෙනත් ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ව්‍යාපාරයක් පවතින සන්දර්භයක් තුළ, අන්තර්ජාලයට, ප්‍රජාව සංවිධානය කිරීමේ ප්‍රයත්නයන්ට දායකවීමේ ප්‍රබල හැකියාවක් පවතී. LGBTQ ක්‍රියාකාරිකයින් විසින් කරනු ලබන ප්‍රජා ක්‍රියාකාරීත්ව ප්‍රයත්නයන්හිදී සමාජ මාධ්‍ය වේදිකාවන් සහ ක්ෂණික පණිවිඩ සේවාවන් ප්‍රයෝජනවත් බව සනාථකර ඇත. යොමුගත කණ්ඩායම් සාකච්ඡාවට සහභාගීවූ ක්‍රියාකාරිකයින් බොහෝදෙනෙක් විසින් විවිධ කරුණු පිළිබඳව අවබෝධය පැතිරීමට මෙන්ම ප්‍රජාවේ සිටින සාමාජිකයින්ට වැදගත් තොරතුරු ලබාදීමට එවැනි වේදිකාවන්ගෙන් ලද හැකි ප්‍රයෝජනය අවධාරණය කරන ලදී.

එච්.අයි.වී. නිවාරණ හා අවබෝධය ගොඩනගන ප්‍රයත්නයන්හි ක්‍රියාකාරී ව සිටින සමලිංගික පුරුෂයෙක් වන කාවිංග විවෘත පුරුෂ සමලිංගික හා එච්.අයි.වී. සමග ජීවත්වන ක්‍රියාකාරිකයෙක් වශයෙන් සමාජ මාධ්‍යයන් හි ඔහුගේ පෙනීසිටීම, පුරුෂ සමලිංගික හිතකාමී සායන සහ වෙනත් සේවාවන් පවත්නා ස්ථාන, එච්.අයි.වී. හා ඒ හා සම්බන්ධ ගැටලු පිළිබඳව පෞද්ගලික පණිවිඩ බොහොමයක් පෙළඹවන ආකාරය, පිළිබඳව සඳහන් කළේය.

මේ ආකාරයටම, ස්ත්‍රී-පුරුෂ සංක්‍රාන්ති ජනතාව මුහුණදෙන ගැටලු ක්ෂේත්‍රයේ ක්‍රියාකාරීව කටයුතු කරන සංක්‍රාන්ති පුරුෂයෙක් වන මන්ජු, බහුවිධ මුහුණුපොත් ගිණුම් හරහා ඔහු ලබා තිබූ දෘශ්‍යතාවයේ ප්‍රතිඵලයක් වශයෙන් හෝර්මෝන චිකිත්සාව හෝ ගැටලුවට සංවේදී වෛද්‍යවරුන් සම්බන්ධ කරගන්නා ආකාරය පිළිබඳව තොරතුරු අවශ්‍ය වන පුද්ගලයින්, පෞද්ගලිකව ඔහුගේ මුහුණු පොත හරහා ඔහු හා සම්බන්ධ වූ ආකාරය විස්තර කළේය.

යොමුගත කණ්ඩායම් සාකච්ඡාවට සහභාගීවූ සමලිංගික පුරුෂයින් වන රාජේෂ්, ලූක් හා ක්‍රිෂ්ණා LGBTQ ශ්‍රී ලාංකිකයින්ට ඔවුන්ගේ කණ්ඩායම් හා සංවිධාන විසින් සංවිධානය කරනු ලබන වැඩසටහන් පිළිබඳව දැනුම් දීමටත් එම ජනතාව වෙත ළඟාවීමටත් සමාජ මාධ්‍ය භාවිතා කළ විවිධ ආකාරයන් පිළිබඳව සඳහන් කළෝය.

මුහුණුපොත "සමූහ" ආකාරයෙන් ප්‍රජා සාකච්ඡා සඳහා වේදිකාවක් ලබා දේ. මෙහි ඇති ප්‍රධාන ප්‍රතිලාභය වන්නේ සමූහය වෙත ලබා දෙන රහස්‍යභාවයේ මට්ටමයිඃ "විවෘත" සමූහයන්හි පලකිරීම් (පෝස්ට්) හා සාකච්ඡා වෙනත් අයගේ පුවත්-පෝෂකවල විකාශනය

කරන නමුදු"සංවෘත" සමූහ වඩාත් සීමාසහිතව පෝස්ටු හා සාකච්ඡා සාමාජිකයින්ට පමණක් දෘශ්‍යතාවය ඇතිව විකාශනය කරනු ලැබේ. සමූහය සෙවුම් කරන ඕනෑම කෙනෙකුට සමූහය මෙන්ම එහි සාමාජිකත්වය දෘශ්‍යමාන වේ. අනෙක් අතට "රහස්" සමූහ, සම්පූර්ණයෙන්ම සැඟවී තිබෙන අතර ඒවායේ සාකච්ඡාවන් එහි සාමාජිකයින්ට පමණක් දෘශ්‍ය වේ. රහස් කණ්ඩායම් සොයාගත නොහැකි අතර සමූහයේ පරිපාලකයින්ට පමණක් නව සාමාජිකයින් එක් කළ හැකිය. (අනෙක් අතට, විවෘත හා සංවෘත සමූහ අනෙක් ඕනෑම කෙනෙකුට සම්බන්ධවීමට හෝ සම්බන්ධවීමට ඉල්ලීම් කිරීමට ඉඩලබා දේ). විවිධ සාකච්ඡාවන්වලදී ශ්‍රාවක ජනයා පාලනය කිරීම, මෙන්ම ප්‍රජාවේ පසුබට සාමාජිකයින් වාරණයකට ලක්නොකර විවිධ සිද්ධීන් හා වැඩසටහන් පිළිබඳව සංවාදයන්ට සම්බන්ධ වීමට උනන්දු කිරීම වැනි උපායමාර්ගික ලෙස පවත්නා අන්තර්ජාල අවකාශය භාවිතා කිරීමට ඉඩ ලබාදෙන මෙම ලක්ෂණ ශ්‍රී ලාංකික LGBTQ ප්‍රජාවට ඉතා වැදගත් වේ. කෙසේවෙතත්, මේ සම්බන්ධ ප්‍රධාන ගැටලුවක් වන්නේ, LGBTQ ශ්‍රී ලාංකිකයින්ගේ සන්දර්භයේදී රහස් කණ්ඩායම් වඩාත්ම ප්‍රයෝජනවත් වන අතර එම වර්ගයේ සමූහයන්, සමූහයේ පරිපාලකයින්ට සැලකිය යුතු අන්දමේ මධ්‍යස්ථකරණය කිරීමේ බලයක් නව සාමාජිකයින් තෝරා ගැනීමට, සිටින සාමාජිකයින් තහනම් කිරීමට මෙන්ම පලකිරීම් මකා දැමීම සම්බන්ධව ලබා දේ. මෙම කෘත්‍යයන් අත්‍යවශ්‍ය වුවද ශ්‍රී ලංකාවේ LGBTQ ව්‍යාපාරයේ අංකුර ස්වභාවය සලකා බලන විට, අනර්ථකාරී විය හැකි, අත්තනෝමතික තීරණ වෙත මගපෙන්වීමට හැකියාව තිබේ. අනෙක් ගැටලුව වන්නේ, බොහොමයක් මුහුණුපොත් සමූහ ඉංග්‍රීසි භාෂාවෙන් සාකච්ඡා පැවැත්වීමට මහෝපකාරී වේ. නමුත් සිංහල හෝ දමිළ භාෂාවලින් සාකච්ඡා පැවැත්වීමට සාකච්ඡාවේ යෙදෙන්නන් වශයෙන් අතිරේක පියවරයන් ගැනීම අවශ්‍ය වේ. මේ නිසා සමූහයන් තුළ සිදුවන බොහොමයක් සාකච්ඡාවන්ගේ සහභාගීත්වයට හා සැමදෙනාම අන්තර්ග්‍රහණය කිරීම යන කාරණාවලට යම් බලපෑමක් සිදුවිය හැකිය.

යොමුගත කණ්ඩායම් සාකච්ඡාව අතරතුරදී, ප්‍රජාව සංවිධානය කිරීමේ ප්‍රයත්නයන්වල අන්තර්ජාලය භාවිතා කිරීම පැතිරීමෙන් ශ්‍රී ලංකාවේ LGBTQ ව්‍යාපාරයට දැඩි බලපෑමක් සිදුවීමේ හැකියාව සම්බන්ධව බරපතල විවාදයක් මතුවිය.

LGBTQ ක්‍රියාකාරිත්වයේ අන්තර්ජාල සහභාගීත්වය මතුපිටට පමණක් සීමාවූ නිරතවීමක් සඳහා අනුබල දෙනබව ඉදිරිපත් කරන ලද යෝජනාවේ බරපතල ගැටලුව විය. සංක්‍රාන්ති ස්ත්‍රියක් වන මිත්‍යා මෙම තර්කය පහත ආකාරයෙන් රාමුගත කළාය: "අන්තර්ජාලය නිසාවෙන් ප්‍රජාව සංවිධානය කිරීමේ අවපාතයක් පවතී. බහුතරයක් සමාජ මාධ්‍ය තුළ වීරයෝ වෙති. ඔවුහු සමාජ මාධ්‍ය තුළදී හඬ නැගීමට හෝ ලිංගික සබඳතා පැවැත්වීමට නම් ඉදිරියට යති, නමුත් ඔවුහු හඬ නැගීමට එළියට නොඑති. සමාජ මාධ්‍යයන්ගේ ආගමනය යනු ජනතාව තවදුරටත් එකට එක් නොවන බවයි. හැමෝම තමන්ගේ සුවපහසු කලාපවල සිට බාහිරින් කතා කරයි. මෙය මැදිහත්වීමට බලපායි, චිත්තවේගීමය සම්බන්ධතාවය අතුරුදන් වී ගොස් ඇත. තමන්ගේ සුවපහසු කලාපවල සිට තම තමන්ගේ අවශ්‍යතාවයන් විසඳා ගනී. තමතමන්ගේ සමාජ මාධ්‍ය පැතිකඩ හරහා ඕනෑම ගැටලුවක් පිළිබඳව කතා කරයි. නමුත් ඔවුහු එළියට පැමිණ මැදිහත්වීමක් නොකරති; කිහිපදෙනෙක් පමණක් අවදානමක් ගෙන, ඔවුන්ගේ හඬ අවදිකර, සංවිධානය කිරීමට යම් උත්සාහයක් දරා වෙනසක් ඇති කිරීමට ප්‍රයත්න දරති. නමුත් යම් අසාර්ථකවීමක් වුවහොත්, ඔවුහු තනිවෙති. අනෙක් අය තම තමන්ගේ සමාජ මාධ්‍ය පැතිකඩ තුළට වී සිටිති."

"මිනිසුන්ගේ කාර්යය බහුල ජීවිතයේ අවශ්‍යතාවයන් හේතුකොට ගෙන ඔව්හු ප්‍රජාව සමග කරන අන්තර්ක්‍රියා ප්‍රමාණවත් මට්ටමේ අන්තර්සබඳතාවයක් ලෙස සලකා සමාජ මාධ්‍ය ජාලා අන්තර්ක්‍රියාවන්ගෙන් බේරුම් කරන නිසාවෙන්, ප්‍රජා වැඩසටහන්වල සහභාගිත්වය අඩුවෙමින් පවතී. මෙය ව්‍යාපාරයට බලපායි, ව්‍යාපාරයට නිශ්චිත ඉලක්ක පවතී, නිදහස ලබාගැනීමේ අරගලයක්; සැමදෙනාම නිවසට වී මුහුණුපොතේ පලකිරීම් කරමින් සිටිනවිට මෙය ඉටුකර ගැනීමට නොහැකිය. අපට එක් වැඩසටහනක 10 හෝ 15 කට වඩා සිටින ඡායාරූපයක්වත් පෙන්වීමට නොහැකි නම්, අපගේ ඉල්ලීම්වල ශක්තිය කොහේද? නමුත්, ඒ අතරම, මුහුණට මුහුණලා ඔබට කතා කිරීමට නොහැකි දේවල්ද තිබේ: පෞද්ගලික දේවල්, රහස් දේවල්, හා තනි පුද්ගල ගැටලු. ඒවා සඳහා, මුහුණුපොත පරමාදර්ශී අවකාශයක් වේ. සංක්‍රාන්ති ස්ත්‍රී-පුරුෂ ප්‍රජාව තුළදී පවා, මෙය සිදුවනවා. ඔවුන් හෝමෝන චිකිත්සාව ගැන විමසීමට, රැවුල වවන ආකාරය විමසීමට, කුමන වෛද්‍යවරයා මුණ ගැසීමටදැයි ඇසීමට අපට ළං වේ. එපමණයි: එයින් පසු ඔවුහු අතුරුදහන් වෙති. ඔවුන් නැවත

ඔබ සොයා නොඑයි. ඔවුන් අපව ඔවුන්ගේ අවශ්‍යතාවයන් සඳහා භාවිතා කරයි. නමුත් ඔවුන් ප්‍රජාවගේ අවශ්‍යතාවයන්ට දක්වන උදාසීනභාවය ඔවුන්ටත් අනෙක් සෑමදෙනාටමත් බලපාන ආකාරය ඔවුනට තේරෙන්නෙ නෑ," යි මන්ජු ප්‍රකාශ කළේය.

දේශාන්, සමාජ මාධ්‍යයන් LGBTQ ප්‍රජාව වෙනුවෙන් පෙනී සිටින සංවිධානවල අදාලතාවය යටපත් කර ඇති ආකාරය පිළිබඳව හරවත් දෘෂ්ටියක් ලබාදුනි. "සමාජ මාධ්‍ය තනි පුද්ගල පරිශීලකයින් සඳහා සුදුසු වේ. ක්ෂණික ලිංගික හමු දක්වා සියලු තනි පුද්ගල අවශ්‍යතාවයන් මුහුණුපොත හරහා ලෙහෙසියෙන් සපයා ගත හැකිවේ. නමුත් ඔබ ව්‍යාපාරය ගැන කතා කරන්නේ නම්, ප්‍රජාවගේ අභිරුචිය හා ප්‍රතිලාභ අතර ගැටුමක් පවතී. අනූව දශකයේදී, අදට වඩා පුරුෂ සමලිංගික සංවිධාන සඳහා සාමාජිකත්වයක් තිබුණි. ප්‍රජා වාතාවරණය අදට වඩා බෙහෙවින් භයානකව පැවති යුගයකදී පවා වැඩසටහන්වලට වඩාත් වැඩි සහභාගීත්වයක් තිබුණි. මෙයට හේතුව වුනේ, අපට එකිනෙකා මුණ ගැසීමට තිබුණ අවස්ථාවන් කිහිපයෙන් එකක් සමාජ එකතුවීම් හා අනෙකුත් වැඩසටහන් වීමයි. දැන්, සංවිධානවල සාමාජිකත්වය හා වැඩසටහන්වල සහභාගීත්වය සීග්‍රයෙන් අඩු වී තිබේ. ප්‍රජාවට එකිනෙකා සෘජුවම අන්තර්ජාලය හරහා ව්‍යාජ පැතිකඩ ආදිය හරහා මුණ ගැසීමට හැකි හෙයින් ඔවුනට සංවිධාන තවදුරටත් අවශ්‍ය නොවේ. නමුත් ගැටලුව වන්නේ පෞද්ගලිකව මිතුරුදම් ඇති කරගැනීම ප්‍රජාවක් ගොඩනොනගන එකයි, ඒවාගේම ප්‍රජාවක් ගොඩනැගීම සෑමදෙනාගේම අයිතිවාසිකම් ආරක්ෂා කරගැනීම සඳහා වැදගත්. නමුත්, ජනතාවට මේ සම්බන්ධයෙන් අවබෝධයක් නැහැ, ඒ ඔවුන්ගේ තනි පුද්ගල අවශ්‍යතාවයන් සපිරෙන නිසා."

කෙසේ වුවද සමලිංගික පුරුෂයෙක් වන දුමින්ද විකල්ප මතයක් දැරුවේය. ඔහු දැරූ අදහස වූයේ, "අතීතය සමග සැසඳීම නිෂ්ඵල ය; අපට අතීතය ගැන විස්සෝප වීමේ උගුලට හසුවී සිටිය නොහැක; යථාර්ථය නම් අන්තර්ජාලය පැමිණ පරිසරය වෙනස් කර ඇත. වර්තමානයේ තිබෙන ව්‍යාපාරයට අවශ්‍ය ලෙසට අන්තර්ජාලය භාවිතා කරන ආකාරය අප හඳුනාගැනීම අවශ්‍යයි." ඒ හා සමානවම, සමලිංගික පුරුෂයෙක් වන ක්‍රිෂ්ණා, "ව්‍යාපාරය තුළ සමාජ මාධ්‍යයන්ට කළ හැකි කාර්යයභාරය පිළිබඳව අප අසුබවාදී විය යුතු නොවේ; සරලවම, කාර්යයභාරය විවිධාංගීකරණය කළ යුතු බව පැවසීම පමණක් ප්‍රමාණවත් ය. උදාහරණයක් වශයෙන්, අප මෑතකදී පවත්වන ලද සිනමා එකමුතුවට පනස්දෙනෙක් පමණ

සහභාගී වුණා. එයින් තිස් දෙනෙක් අලුතින් පැමිණි අය. ඒ අතර සමාජ මාධ්‍ය හරහා වසර ගණනාවක් තිස්සේ දැන හඳුනාගෙන නමුත් කවමදාවත් මුණ නොගැසී සිටි අය සිනමා රාත්‍රියේදී ප්‍රථම වතාවට මුණ ගැසුණා. සමාජ මාධ්‍ය (සහ අන්තර්ජාලය) අපට ප්‍රයෝජනවත් මෙවලම් ලබා දේ. ජනතාව රැස් කිරීමට හා ව්‍යාපාරය ශක්තිමත් කිරීමට ඒවා භාවිතා වේ. යෙදවීම සංවිධානවලටත් ප්‍රජා නායකයින්ටත් අයිති කාර්යයක් වේ. අප සමාජ මාධ්‍ය තුළ හා භෞතික ලෝකය තුළ කරන දේ අතර සමබරතාවයක් තිබිය යුතුය. එය හුදු සමානාත්මතාවය සඳහා 'අතථ්‍ය' හෝ 'අන්තර්ජාලමය' අරගලයක් නම් එහි ප්‍රතිඵල නොලැබේවි. අරගලය භෞතික ලෝකයට රැගෙන ඒම අත්‍යවශ්‍යයි. නමත් එයින් අදහස් කරන්නේ නැහැ අන්තර්ජාල අවකාශයට කාර්යයභාරයක් නොමැතිය යන්න." යනුවෙන් ප්‍රකාශ කළේය.

## සුරක්ෂිතභාවයඃ අන්තර්ගතයේ සුරක්ෂිතභාවය

අන්තර්ජාලය මත බෙදාගන්නා ලද හා ගබඩා කරන ලද අන්තර්ගතය සඳහා ඇති සුරක්ෂිතභාවයේ මදකම අන්තර්ජාලය භාවිතයට සහ එය භුක්ති විඳීමට පවතින ප්‍රධාන අවහිරයක් වේ. කොන්කිරීමට හා වෙනස්කොට සැලකීමට ඇති අවදානම් බව නිසාවෙන් ම විවිධ සමාජ හා ලිංගික අනන්‍යතාවයන් සහිත ශ්‍රී ලාංකිකයෝ මෙම අනාරක්ෂාවෙන් දරුණු ලෙස පීඩා විඳිති.

ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාවේදී, එවැනි අත්දැකීම් ගණනාවක් අනාවරණය විය. තම සහකරු සමග ආසියා ශාන්තිකර කලාපයේ LGBTQ යෞවනයින් සම්බන්ධයෙන් වීඩියෝවක් නිපදවීමේ නිරත වූ සමලිංගික පුරුෂයෙක් වන දේශාන්, ඔවුන්ගේ පෞද්ගලික ඡායාරූප "ඔබට අවශ්‍යද ඔබගේ දරුවන්ටත් මේ වගේ වනවාට?" වැනි ශීර්ෂ පාඨ යොදා වැඩබලන අගමැතිවරයාට පහරදෙමින් දේශපාලන පිටුවල පලකළ ආකාරය මෙනෙහි කළේය. "ඔවුන් අපගේ පින්තූර දේශපාලනිකව පාවිච්චි කළා. ඒවා මුහුණු පොත පුරාම පැතිරිලා ගියා. එමනිසා මගේ සමීපතම මිතුරන් හැර අනෙක් හැම දෙනාම මගේ පැතිකඩෙන් ඉවත් කිරීමට සිදු වුණා. අදටත් මම, මගේ සහකරුගේ හා මගේ පින්තූරයක් පැතිකඩ පින්තූරය වශයෙන් යොදාගන්නේ නැහැ. එය අනවශ්‍ය ප්‍රශ්න ආකර්ෂණය කරන නිසා. පෞද්ගලිකව එය අපට ගැටලුවක් නොවේ. එය අපේ පවුලට, අපගේ බෑණාවරුන්ට හා ලේලිවරුන්ට බලපානවා. එයාලගේ අනාගතයට බලපාන්න පුළුවන්. විශේෂයෙන්ම ඔවුන්ගේ විවාහක

ජීවිතයට. ඉතිං මම පරීක්ෂාකාරී විය යුතුයි." තවත් සමලිංගික පුරුෂයෙක් වන ලූක් සමාන අත්දැකීමක් මතකයට නැගීය. "වතාවක්, කෙනෙක් කාර්යාලයේ පළමුවන දවසේ මගේ හා මගේ සගයන් සාම්ප්‍රදායිකව කිරි උතුරන පින්තූරයක් සමාජ මාධ්‍යවල සමලිංගිකයින් දෙදෙනෙක් කිරි ඉතිරීම යන ශීර්ෂ පාඨයද සහිතව පුළුල් විදියට බෙදා හැර තිබුණා. අපි සමලිංගික පුරුෂයින් වන හෙයින් සංස්කෘතිය විනාශ කරන අතරම සංස්කෘතික වීමට උත්සාහ කරන බව ඔවුහු ප්‍රකාශ කළහ. සංක්‍රාන්ති ස්ත්‍රියක් වන මිත්‍යා, ඇයගේ ඉන්ස්ටග්‍රෑම් පලකිරීම් අරගෙන ඇයව අවමානයට ලක් කිරීමට ගත් උත්සාහයක් මතකයට නැගුවාය: යම් කෙනෙක් මගේ ඉන්ස්ටග්‍රෑම් ඡායාරූපවල තිර දර්ශන ඛණ්ඩ ගෙන මම කාමෝද්දීපන තරුවක් ලෙස නම් කර නැවත පලකරන බවට තර්ජනය කළා. මම ඒවා ඒ වනවිටත් ඉන්ස්ටග්‍රෑම්හි පලකර තිබුණේ සැමදෙනාට ම දැකිය හැකි වන නිසා. ඔවුන්ට එසේ කරන ලෙස පැවසුවා. ඔවුන් මට තර්ජනය කර මගෙන් කප්පම් ගැනීමට උත්සාහ කළා. නමුත් අවසානයේදී එය නතර වුණා. අපි බිය වුනොත් ඔවුන් තව තවත් අපව පීඩනයට පත් කරන්න උත්සාහ කරයි."

මෙම සිද්ධීන්ගේ සමලිංගික භීතියේ/සංක්‍රාන්ති ලිංගික භීතියේ දෘෂ්ටිය පැහැදිලි වන අතර ඇතැම් අවස්ථාවන්වලදී එවැනි සිදුවීම් ශ්‍රී ලංකාවේ LGBTQ ප්‍රජාව තුළින්ම ආරම්භ වේ. නිදසුනක් වශයෙන්, රාජේෂ් පහත සිද්ධිය විස්තර කළේය: "මම වරක් විරුද්ධ ලිංගිකයින්ගේ ඇඳුම් පැළඳුම් ඇඳගෙන යන උත්සවයකට සහභාගි වී ඡායාරූපයක් ගෙන මුහුණුපොතෙහි දැමුවෙමි. මගේ පින්තූර අන්තර්ජාලයේ දුටු විවිධ පුද්ගලයින්ගෙන් මට දුරකථන ඇමතුම් රාශියක් ලැබුණා. ඉතිං මම ක්ෂණිකව [මගේ මිතුරෙක් වන ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියෙකුට] කතාකර සිදු වූ දේ විස්තර කළා. ඔහු මට පැලියගොඩ පොලිස් ස්ථානයේ පැමිණිල්ලක් දමන ලෙස අවවාද කළා. නමුත් ඊළඟට එය කළේ කව්ද යන්න මම දන්නේ නැහැ. නමුත් එය මගේම ප්‍රජාවගේ කෙනෙක්ගේ වැඩක් බව මම දැන සිටියා. අපි පොලීසියට ගියයොත් ඔවුන්ට ප්‍රශ්නයක් වේවි. එමනිසා මම එසේ නොකිරීමට තීරණය කළා."

සමලිංගික පුරුෂයෙක් වන මයන්ත, ඔහුගේ දුරකථනය වයිබර් (Viber) සමූහයකට (සමලිංගික පුරුෂ හා ද්වි ලිංගික) නොදන්නා පුද්ගලයෙක් විසින් ඔහුගේ අනු දැනුම නොමැතිව එක් කළ ආකාරය සිහියට නැගුවේය. "පසුව යම් කෙනෙක් මගේ කලින් සිටි පිරිමි

යහළුවාට මම පෞද්ගලිකව දී තිබූ පින්තූරයක් මට එවා, ඒ මම ද යැයි ඇසුවා. මේ මම සම්පූර්ණයෙන් ම නොදන්නා කෙනෙක්. මේ අහඹු පුද්ගලයාට ඒ පින්තූරය ලැබුන ආකාරය ගැන මට කිසිම අදහසක් නැහැ. එය මට මගේ වෘත්තියට තර්ජනයක් වුණා. මොකද මම මාධ්‍ය ක්ෂේත්‍රයේ සේවය කරන කෙනෙක් වන නිසා."

දේශාන්ට අනුව, පෞද්ගලිකත්වය එසේ උල්ලංඝනය කිරීම ප්‍රජාවේ සමාජිකයින් පමණක් නොව ශ්‍රී ලංකාවේ LGBTQ පුද්ගලයින්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් කටයුතු කරන සංවිධාන පවා එසේ කරන බව කියැවේ: "සමහර ආයතන ඔවුන් විසින් ප්‍රජාවේ සාමාජිකයින් සමග සංවිධානය කරන වැඩසටහන්වල ඡායාරූප අපගේ අනුමැතිය නොමැතිව පල කරනවා. එය මට පෞද්ගලිකව සිදු වුණා." එවැනි ආයතනයක් ඔහු සමග අත්සන් කරන ලද නොහෙලි කිරීමේ ගිවිසුම ඔහු සහභාගී වූ වීඩියෝ සම්මුඛ සාකච්ඡාවක් යූට්‍යුබ් (YouTube) හි පල කිරීම මගින් උල්ලංඝනය කළ ආකාරය හෙලි කළේය.

## සුරක්ෂිතභාවය: උපකරණවල සුරක්ෂිතභාවය

අන්තර්ජාලය තුළ බෙදාගන්නා අන්තර්ගතයට අමතරව, පුද්ගලයන්ට සෘණාත්මක අත්දැකීම් සහ/හෝ උපකරණවල ගබඩා කර තිබෙන අන්තර්ගතය සම්බන්ධයෙන් සෘණාත්මක අත්දැකීම් පිළිබඳ ව බිය තිබේ (එනම්, වෙන කෙනෙක් සමග අන්තර්ගතය බෙදාගෙන නොමැති නමුත් පෞද්ගලිකව පරිහරණය කරනු ලබන අවස්ථාවන්වලදී ඇතිවිය හැකි අවදානම්).

යොමුගත කණ්ඩායම් සාකච්ඡවේදී තොරතුරු ගබඩා කිරීම සඳහා ඉලෙක්ට්‍රොනික උපකරණ භාවිතා කිරීමේ අවදානම පිළිබඳව මිත්‍යා වැදගත් තොරතුරු අවධාරණය කළාය. "අපි අපගේ මුරපද ජංගම දුරකථන සුවිශේෂකරණ මෘදුකාංගවල ආරක්ෂා කරන්නෙමු. අපි අතින් දුරකථනය නැති වුවහොත්, එය ලබා ගන්නාහට අප දුරකථනය සමග කරන ලද සියලු දේට ප්‍රවේශය තිබේ. අප ජංගම දුරකථන සුවිශේෂකරණ මෘදුකාංගවලින් එය භාවිතා කර අවසානයේදී ඉවත් නොවේ. එවැනි ජංගම දුරකථන සුවිශේෂකරණ මෘදුකාංග කීයක් අප භාවිතා කරන්නේද? ඒ සියලුම දෙයින් භාවිතය අවසානයේදී එකින් එක දිනපතා ඉවත්වීම අපහසු වේ. මට මගේ දුරකථනයේ ස්පර්ශ තිරය මත රටා අගුලක් තිබේ. නමුත් එය ආලේපයක් මෙන් තිරය මත දිස්වන හෙයින් බිඳින්න ඉතා පහසුයි."

ශ්‍රී ලංකාවේ ජංගම දුරකථන අලුත්වැඩියාකරුවන් සිය ගනුදෙනුකරුවන්ගේ ජංගම දුරකථනවල ලෙන්ගතු මෙන්ම රහස්‍ය අන්තර්ගතයන් ලබාගෙන අන්තර්ජාලයේ බෙදාහරින ප්‍රවනතාවයක් ඇති වී තිබේ. එවැනි සිදුවීම්වලින් ඇතිකරන ලද භීතිය LGBTQ ප්‍රජාව පුරාද පැතිරී පවතී. නිදර්ශනයක් වශයෙන්, යොමුගත කණ්ඩායම් සාකච්ඡාවේ දී දේශාන් ඔහුගේ කැඩුන ටැබ් එක අලුත්වැඩියා කිරීමේ භීතිකාව පැහැදිලි කළේය: "මැතකදී කැඩුන ටැබ් එකක් මට තියෙනවා. නමුත් මට එය අලුත්වැඩියා කිරීමට දිය නොහැකියි. මන්ද යත්, ඒ තුළ මගේ සහකරු සමග ගිවිසුම් උත්සවයේදී ගත් සියලුම ඡායාරූප අන්තර්ගත වෙනවා. මම එය අලුත්වැඩියා කිරීමට දුනහොත් එම පින්තූර මහජනයා අතරට යාවී යයි මට බියක් තිබේ."

උපාංගවල අනාරක්ෂිතභාවය අත්තනෝමතික පොලිස් කටයුතු වලටද සම්බන්ධ වේ. වානිජ ලිංගික සේවයේ යෙදෙන සංක්‍රාන්ති ස්ත්‍රියක් වන සයුරි, ඇය මාර්ගය අසල සිටගෙන සිටින විටදී පොලීසිය ඇයගේ දුරකථනය පරීක්ෂා කළ බව විස්තර කළාය. "පොලිස් ජීප් රථය මා ඉදිරිපිට නතර කර මගේ දුරකථනය පරීක්ෂා කිරීමට අවශ්‍ය බව පැවසුවා. මම වෙන මොනවද කරන්නෙ? මම ඔවුන්ට මගේ දුරකථනයේ ගැලරිය පමණක් පරීක්ෂා කළ හැකි බව ප්‍රකාශ කළා. ගැලරිය තුළ නග්න පින්තූර තිබුණා. ඒත් ඔවුන් කිසිවක් නොකියා සැමදෙයම පරීක්ෂා කර දුරකථනය නැවත මා අතට දී රථය ඉවතට පදවාගෙන ගියා."

උපාංග හා සම්බන්ධ තවත් ගැටලුවක් වන්නේ උපාංගය තිබෙන ස්ථානයයි. "ප්‍රවේශ" රාමුකිරීම යටතේ සාකච්ඡා කරන පරිදි, පෞද්ගලිකව තමන්ට අයිති නොවන උපාංගයන් භාවිතා කිරීමට විවිධ හේතු පුද්ගලයින්ට බල කරනු ලැබේ. එවැනි අවස්ථාවන්වලදී, LGBTQ ශ්‍රී ලාංකිකයින් ඔවුන්ගේ රහස්‍යභාවය සම්බන්ධයෙන් විශේෂයෙන්ම අවදානම් සහිත කණ්ඩායමක් බවට පත්වේ. මිත්‍යා විස්තර කළ පරිදි, "කාර්යාලයේ පරිඝනකය භාවිතා කරමින් අප මුහුණුපොත භාවිතා කළහොත් අප එහි නොමැති අවස්ථාවලදී ඕනෑම කෙනෙකුට අපගේ ගිණුමේ රහස්‍ය තොරතුරු වෙනස් කිරීමේ හැකියාව පවතී. අප අපගේ අනන්‍යතාවය රහසිගත ලෙස පවත්වා ගැනීමට උත්සාහ කරන්නේ නම්, මෙය බරපතල ප්‍රශ්නයක් වේ; අපගේ ආසනය වෙත එන ඕනෑම කෙනෙකුට අප කරන දේ දැකිය හැකියි. මම පෙම් හමු වෙබ් අඩවියක් විවෘත කර තිබුණොත් ඔවුන් එයද දකිනු ඇත."

අන්තර්ජාල පහසුකම් ලබාගත හැකි අවන්හල් (Internet cafe) සම්බන්ධයෙන් සමාන ගැටලුවක් රාජේෂ් පැවසීය: "වතාවක් අන්තර්ජාල පහසුකම් ලබාගත හැකි අවන්හලකදී, පරිඝනකය භාවිතා කරමින් සිටි මගේ මිතුරා එය අවසන් කර පිටව ගිය වහාම අවන්හල් හිමියා පැමිණ විමසුම් ඉතිහාසය පරීක්ෂාකර බැලීය. මම ඔහු දෙස බැලූ විට, මගේ මිතුරා සැමවිටම එකම දේ දෙස බලන බව පැවසීය. මම ඔහුගෙන් වෙන කෙනෙකුගේ විමසුම් ඉතිහාසය දෙස බැලීමට ඔහුට ඇති ප්‍රශ්නය කුමක්දැයි ඇසුවෙමි. එවිට ඔහු, සමහරවිට පොලීසිය පැමිණ විමසුම් ඉතිහාසය පරීක්ෂාකර ඔහුගෙන් ප්‍රශ්න කරන බව පැවසීය. එමනිසා, ඔහු ඉතිහාසය දෙස බලා අනවශ්‍ය දේවල් පවතීනම් මකාදමන බව කීවේය. මම එම අවන්හල වෙත යාම එම අත්දැකීමෙන් පසුව නවතා දැමුවෙමි."

රජයේ විශ්ව විද්‍යාලයක අධ්‍යයන තනතුරක් දරණ සමලිංගික පුරුෂයෙක් වන ක්‍රිෂ්ණා, ඔහු ඔහුගේම උපාංගවල අන්තර්ජාල සන්නිවේදනයන්, විශ්ව විද්‍යාලයීය ජාලයට සම්බන්ධ කර තිබෙන විටදී වාරණය කරන ආකාරය විස්තර කළේය. "අප අන්තර්ජාලය කාර්යාලයේ බෙදාගන්නා ලද ජාලයක් තුළින් ප්‍රවේශ කරන්නේ නම්, අනෙක් අය අපගේ සංවාද දැකීමේ අවස්ථාව තිබේ. එමනිසා, මම මගේ කාර්යාලයීය ජාලය හරහා සමහර දේවල්, විශේෂයෙන්ම ඒවා මගේ LGBTQ අනන්‍යතාවයන් හා සම්බන්ධ ක්‍රියාකාරීත්වය හා සම්බන්ධ නම්, නොපවසා සිටීම තෝරාගන්නෙමි. ඔබ කවදාවත් ම දැන ගන්නෙ නෑ ජාලයේ පරිපාලක කව්රුන්ද යන වග. නමුත් ඔබ දන්නවා ඔවුන් අන්තර්ගතය අධීක්ෂණය කරන බව. එමනිසා මම මගේ උපාංග ඔවුන්ගේ ජාලය මතදී භාවිතා කරන්නේ නම් විචක්ෂණශීලී වන්නෙමි."

## සුරක්ෂිතභාවය: පීඩාකාරී අන්තර්ජාල අත්දැකීම්

පැහැදිලිව පෙනෙන පරිදි, අන්තර්ජාල අවකාශය විශේෂයෙන් ම සමාජ මාධ්‍ය වේදිකාවන්, ලිංගිකත්වයට හා සමාජභාවී සුළුතරයින්හට සුවිශේෂී ලෙස සතුරු විය හැකිය. LGBTQ ශ්‍රී ලාංකිකයින් විසින් අන්තර්ජාලය පූර්ණ භාවිතයෙන් හා තෘප්තිමත්භාවයෙන් යුතුව භාවිතා කිරීම මෙම එදිරිවාදිකම් විසින් මැඩ පවත්වනු ලැබේ; මෙය බොහොමයක් LGBTQ ශ්‍රී ලාංකිකයින්ට ස්වයං වාරණයකට යාම හෝ ඔවුන්ට අන්තර්ජාල වේදිකාවන්ගේ දිනපතා භාවිතය සඳහා අන්වර්ථ නාමයක් සහිත පැතිකඩ භාවිතා කිරීමට බලකරනු ලැබේ. යොමුගත කණ්ඩායම් සාකච්ඡාවේදී ආරක්ෂාව පිළිබඳ

ඉහත සාකච්ඡාව පදනම් කරගෙන, ප්‍රශ්නාවලිය තුළ පීඩාකාරී අන්තර්ජාල අත්දැකීම් ගණනාවක් ලැයිස්තුගත කර ප්‍රතිචාරකයින්ට ඔවුන් පෞද්ගලිකව තමන් විසින්ම හෝ ඔවුන් පෞද්ගලිකව දන්නා වෙනත් කෙනෙක් අත්දැක ඇති දේ සටහන් කිරීමට පවසන ලදී. (ලැයිස්තුගත අත්දැකීම් සම්පූර්ණ ලැයිස්තුවක් නොවන බවත් එක්තරා ආකාරයට යොමුගත කණ්ඩායම් සාකච්ඡාවේදී හා සාහිත්‍ය විමර්ශනයේදී මතු වූ ගැටලුවල නියෝජනයක් බව සැලකිය යුතුවේ). ප්‍රතිඵල පහත සඳහන් පරිදි වේ:

| ඔබ හෝ ඔබ දන්නා වෙන කෙනෙක් පෞද්ගලිකව පහත දැක්වෙන ඕනෑම අත්දැකීමක් ලබා තිබෙන්නේද? කරුණාකර අදාල සියල්ල තෝරන්න. | | |
|---|---|---|
| අන්තර්ජාල හිංසනය (හිරිහැර කිරීම, නාම-කැඳවීම, නින්දා පරිභව කිරීම ආදිය) | 49 | 58% |
| ඔබගේ හෝ වෙනත් අයෙකුගේ ලිංගික දිශානතිය/සමාජභාවී අනන්‍යතාවය හෙලිවන ආකාරයේ පින්තූර අන්තර්ජාලය තුළ පල කිරීම හෝ අනුමැතියෙන් තොරව තෙවන පාර්ශවයක් සමග බෙදා ගැනීම. | 37 | 44% |
| ලිංගික දිශානතිය හෝ සමාජභාවී අනන්‍යතාවය අනුමැතියෙන් තොරව අන්තර්ජාලය තුළ ප්‍රසිද්ධියට පත් කිරීම. | 35 | 41% |
| ඉහත ඕනෑම දෙයක් කිරීම සඳහා වාචික තර්ජනය | 35 | 41% |
| ඔබගේ හෝ වෙනත් අයෙකුගේ ලිංගික දිශානතිය/සමාජභාවී අනන්‍යතාවය හෙලිවන ආකාරයේ වීඩියෝ පට අන්තර්ජාලය තුළ පල කිරීම හෝ අනුමැතියෙන් තොරව තෙවන පාර්ශවයක් සමග බෙදා ගැනීම. | 27 | 32% |
| භෞතික ලෝකයෙහි ප්‍රචණ්ඩත්වයේ අත්දැකීම් | 17 | 20% |
| මම ඉහත කිසිවක් අත්විඳ නොමැත. | 24 | 28% |
| පුද්ගලයකුගේ ජංගම දුරකථනය, ලැප්ටොප් පරිගණකය, අන්තර්ජාල ගිණුම් ආදිය නීති බලධාරීන් විසින් පරීක්ෂා කිරීම. | 11 | 13% |
| ඉහත කිසිවක් අත්දුටු කිසිවෙක් ගැන මා දන්නේ නැත. | 4 | 5% |

වගුව 8: අහිතකර අන්තර්ජාල අත්දැකීම්

සමීක්ෂණයේ සඳහන් කර තිබූ කිසිම ආකාරයක අන්තර්ජාලය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය අත්දුටු කිසිම කෙනෙක් ගැන අසා දැන නොසිටි එක් සහභාගීවන්නෙක් පමණක් සිටි අතර 24 ක් ඔවුන් කිසි දිනක කිසිම ආකාරයක අන්තර්ජාල ප්‍රචණ්ඩත්වය අත්විඳ නොමැති බව පැවසුවෝය. "අන්තර්ජාල හිංසනය" ප්‍රතිචාරදැක්වූවන් විසින් අත්දකින ලද හෝ සාක්ෂි දරන ලද නිරන්තරයෙන් ම සිදුවූ ප්‍රචණ්ඩ ක්‍රියා වූ අතර කෙනෙකුගේ ලිංගික දිශානතිය හෝ සමාජභාවී අනන්‍යතාවය පින්තූර භාවිතයෙන් හෙළිදරව් කිරීම දෙවනුවට වැඩියෙන් අත්දැක තිබුණි. සහභාගීවූවන්ගෙන් 20%ක් ඔවුන්ගේ ලිංගික දිශානතිය හෝ සමාජභාවී අනන්‍යතාවයට සම්බන්ධ අන්තර්ජාල අන්තර්ගතය පදනම් කරගෙන භෞතික ලෝකය තුළ ප්‍රචණ්ඩත්වය අත්දැක හෝ එවැනි දේට සාක්ෂි දරති. 41% තමන්ගේ අනුමැතියෙන් තොරව ප්‍රසිද්ධියට පත්කිරීම අත්දුටු හෝ එවැනි අත්දැකීමක් ලත් වෙනත් පුද්ගලයකු පිළිබඳව දැනසිටි අතර 13% නීති බලධාරීන් විසින් ඔවුනගේ ඩිජිටල් උපාංග පරීක්ෂා කිරීම පෞද්ගලිකව අත්දැක හෝ එවැනි අත්දැකීමක් ඇති වෙනත් අය ගැන දැන සිටියහ.

| ඔබ ඉහත හඳුනාගත් අත්දැකීම්වලට වඩාත්ම බලපෑම් කරන ලද අන්තර්ජාල වේදිකාවන් මොනවාද? | | |
|---|---|---|
| මුහුණුපොත (Face book) | 67 | 79% |
| LGBTQ ජනතාව සඳහා සුවිශේෂී කොට නිර්මාණය කරන ලද පෙම් හමු සුවිශේෂ කාර්යය මෘදුකාංග (Dating Apps) | 15 | 18% |
| මුහුණුපොතෙහි මැසෙන්ජර් (FB Messenger) | 14 | 16% |
| වට්ස්ඇප් (Whatsapp) | 11 | 13% |
| LGBTQ සමූහ | 7 | 8% |
| LGBTQ තේමාව රැගත් බ්ලොග් (blogs) | 5 | 6% |
| වයිබර් (Viber) | 4 | 5% |
| විද්‍යුත් තැපැල (Email) | 4 | 5% |
| සාකච්ඡා සංසදයන් | 4 | 5% |
| මෙම ප්‍රශ්නය මට අදාල නොවේ | 9 | 11% |
| ඉන්ස්ටග්‍රෑම් (Instagram) | 3 | 4% |

| | | |
|---|---|---|
| ටින්ඩර් වැනි සාමාන්‍ය පෙම් හමු සුවිශේෂ කාර්යය මෘදුකාංග | 3 | 4% |
| ඉමෝ (Imo) | 2 | 2% |
| ට්විටර් (Twitter) | 1 | 1% |
| ස්නැප්චැට් (Snapchat) | 1 | 1% |

වගුව 9: හඳුනා ගත් අත්දැකීම් සමග සම්බන්ධ වන අන්තර්ජාල වේදිකා

මෙම ප්‍රතිචාර අතර හඳුනාගන්නා ලද අත්දැකීම්වලින් වඩාත් බලපෑමක් සිදුවුන වේදිකාව වශයෙන් සහභාගීවූවන්ගෙන් 83%ක් හඳුනාගත්තේ මුහුණුපොත ය. (ඇත්ත වශයෙන්ම, මුහුණුපොත භාවිතය සඳහා ශ්‍රී ලංකාව තුළ මිලියන 3.5 කට අධික හා වර්ධනය වෙමින් පවතින පරිශීලකයින් ගණනක් සමග ඉහළ ව්‍යාප්තියක් තිබේ.) සහභාගීවූ සියලුම දෙනා (100%) නිරන්තරයෙන් මුහුණු පොතද වට්ස්ඇප් දෙවනුවට ද (82.1%) භාවිතා කරන බව පැවසීය. දත්තවලට අනුව, LGBTQ ජනතාව සුවිශේෂී කොට නිර්මාණය කරන ලද පෙම් හමු සුවිශේෂ කාර්යය මෘදුකාංග දෙවනුව වඩාත් බලපෑම ලත් වේදිකාවන් වේ. කෙසේ වුවද 20% ක් වන වඩාත්ම බලපෑමට ලක්වූ හා දෙවනුව බලපෑමට ලක්වූ වේදිකා අතර සංඛ්‍යාතයේ පරතරය සැලකිල්ලට ගැනීම වැදගත් වේ.

| සිදුවීම සම්බන්ධයෙන් වගකිව යුතු පුද්ගලයා හෝ පුද්ගලයින් ගැන සිතමින්, බලපෑමට ලක්වූ පුද්ගලයාට ඔවුන් සම්බන්ධ වූයේ කෙසේද? | | |
|---|---|---|
| අමුත්තෙක්/නොදන්නා කෙනෙක් | 31 | 36% |
| මිතුරන් | 29 | 29% |
| ලිංගික සබඳතාවයක් සහිත කෙනෙක් | 15 | 18% |
| පුද්ගලයාගේ හෝ පුද්ගලයන්ගේ සැබෑ අනන්‍යතාවය මම නොදනිමි | 18 | 21% |
| හඳුනන කෙනෙක් | 15 | 18% |
| රොමාන්තික සබඳතාවයක් සහිත කෙනෙක් | 12 | 14% |
| මෙම ප්‍රශ්නය මට අදාල නොවේ | 15 | 18% |
| මගේම පවුලේ සාමාජිකයා | 5 | 6% |
| ඥාතියා | 3 | 4% |

වගුව 10: අත්දැකීම් ලත් පුද්ගලයින්ට ඔවුන්ගේ ඇති සම්බන්ධතාවය

සහභාගීවන්නන්ගෙන් 36% ක්ම තමන් "නොදන්නා කෙනෙක්" වගකිවයුතු බව පැවසූ අතර 29% ක් "මිතුරන්" වගකිවයුතු බව පැවසීය. තිදෙනෙක් ඥාතියකු විසින් කරන ලද පීඩාකාරී අන්තර්ජාල අත්දැකීම්වලට මුහුණ දී හෝ එවැනි අත්දැකීම්වලට මුහුණ දුන් අය ගැන දැනුවත් වේ. මෙම ප්‍රශ්නය තමාට අදාල නොවන බව 11 දෙනෙක් විසින් ප්‍රකාශ කරන ලදී. ලිංගික සහකරුවන් වගකිවයුතු බව 18% ක් ප්‍රකාශ කළ අතර ශෘංගාරාත්මක සබඳතාවයක් සහිත කෙනෙක් ප්‍රචණ්ඩත්වය සඳහා වගකිවයුතු බව 16% ක් ප්‍රකාශ කර තිබේ.

| ඔබ හෝ ඒ පුද්ගලයා අත්දැකීම්වලට ප්‍රතිචාර දැක්වූයේ කෙසේද? (අදාල සියල්ල තෝරන්න) | | |
|---|---|---|
| මිතුරුකමින් ඉවත් කිරීම හෝ පුද්ගලයා අවහිර කිරීම | 38 | 45% |
| එම වේදිකාව මත පැතිකඩ ඉවත් කිරීම/අක්‍රීය කිරීම | 27 | 32% |
| එම වගකිවයුතු පුද්ගලයා පිළිබඳව අදාළ වේදිකාවට වාර්තා කිරීම | 25 | 29% |
| ප්‍රතිචාර දැක්වූයේ නැත | 19 | 22% |
| පෞද්ගලිකව හෝ අදහස් දක්වන කොටසේ එම පුද්ගලයාට මුහුණ දීම | 21 | 25% |
| එම වේදිකාව මත වෙනත් පැතිකඩක් නිර්මාණය කිරීමට බලකිරීම | 8 | 9% |
| වැරදිකරන්නන් හා ඔවුන්ගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් පලකිරීමක් ප්‍රසිද්ධියට පත් කිරීම | 11 | 13% |
| මෙම ප්‍රශ්නය මට අදාල නොවේ | 12 | 14% |
| නීති බලධාරීත්වයට වාර්තා කිරීම | 4 | 5% |
| භෞතික ලෝකයේදී සිද්ධියට අදාල පුද්ගලයින් සමග පෞද්ගලිකව මුහුණ දීම | 2 | 2% |

වගුව 11: අත්දැකීම්වලට ඇති ප්‍රතිචාර

මිතුරුකමින් ඉවත් කිරීම හා අවහිර කිරීම, පීඩාකාරී අන්තර්ජාල අත්දැකීම්වලට ගොදුරුවූවන් විසින් ගන්නා ලද වඩාත්ම පොදු ක්‍රියාමාර්ගය (45%) වූ අතර ගිණුම මකා දැමීම හෝ අක්‍රිය කිරීම එයට පසුව වැඩිදෙනෙක් කරන ලද ක්‍රියාව (32%) වේ. අදාළ වේදිකාවේ පරිපාලකට වාර්තා කිරීම තෙවනුව පීඩාකාරී අන්තර්ජාල

අත්දැකීම්වලට එරෙහිව ගන්නා ලද වඩාත් පොදු ක්‍රියාමාර්ගය වූ අතර එය 29% විය. මෙය, සමාජ මාධ්‍ය වේදිකාවන් සම්බන්ධව වාර්තා කිරීමට පවත්නා මෙවලම් පිළිබඳ දැනුම අවමවීම ගැන පවතින දර්ශකයක් විය හැකිය. නීති බලධාරීන්ට වාර්තා කිරීම බොහෝමයක් එම ක්‍රියාවන්ට ගොදුරුවූවන්ගේ වරණය නොවූ බව මෙම දත්ත පෙන්වා දේ. ඒ අනුව, තිදෙනෙක් පමණක් වාර්තා කර හෝ එවැනි අත්දැකීම් නීති බලධාරීන්ට වාර්තා කළ වෙනත් අයගැන දැනුවත් සිටි අතර සිත්ගන්නා සුළුලෙස, 22% ක් කිසිම ආකාරයකින් ප්‍රතිචාර නොදැක් වූ බව ප්‍රකාශකොට තිබුණි.

| ඔබ/ඔවුහු සතුටුදායක විසඳුමක් ලැබුවේද? | | |
|---|---|---|
| නැත | 51 | 60% |
| ඔව් | 24 | 28% |
| මම ප්‍රතිඵලය දන්නේ නැත | 15 | 18% |
| ප්‍රතිචාර දැක්වූයේ නැත | 7 | 8% |
| මෙම ප්‍රශ්නය මට අදාල නොවේ | 12 | 14% |

වගුව 12: අත්දැකීම්වලට ඇති විසඳුම්

සහභාගීවූවන්ගෙන් බහුතරයක් සතුටුදායක විසඳුමක් නොලැබුන බව පැවසූ අතර 24 දෙනෙක් එසේ ලැබුන බව පැවසීය. මෙය වැදගත් සොයාගැනීමක් වුවත්, සමාජ මාධ්‍ය වේදිකාවන්වල ප්‍රජා ප්‍රමිතිය පිළිබඳව පවතින හිඩැස් නිසාවෙන් පුදුමයක් ද නොවේ.

## සුරක්ෂිතභාවය: අන්තර්ජාල සුරක්ෂිතභාවය පිළිබඳ සාක්ෂරතාවය

පෞද්ගලිකත්වය හා මුරකිරීම පිළිබඳ ගැටලු පිරී පවතින අන්තර්ජාල දර්ශන පථයක් තුළ, එවැනි අවදානම්වලින් මිදී සිටීමට පුද්ගලයින්ට ඔවුන් විසින්ම ගත හැකි ක්‍රියාමාර්ගවලට වැදගත් කාර්යයභාරයක් තිබේ. කෙසේ වුවත්, පවත්නා අවදානම් තත්ත්වයන් හා ඒවාට එරෙහිව තිබෙන ශිල්පක්‍රම පිළිබඳව එවැනි පරිශීලකයින්ට ප්‍රමාණවත් තරමේ අධ්‍යාපනයක් ලබාදීමෙන් හා දැනුවත් කිරීමෙන් පමණයි එය කළහැකි වන්නේ. ඇත්ත වශයෙන්ම, ප්‍රකාශනයේ නිදහස පිළිබඳ විශේෂ වාර්තාකරු "වංචාව, අන්තර්ජාලයට පෞද්ගලික තොරතුරු අනාවරණය කිරීමෙන් ඇතිවිය හැකි ඵලවිපාක, අයුතු මැදිහත්වීම්වලින් දත්ත ආරක්ෂා කර ගැනීම සඳහා දත්ත සංකේතවලට හැරවීමේ හෝ

මග හැරීමේ තාක්ෂණයන්ගේ භාවිතාවද අන්තර්ගතව, අන්තර්ජාල සුරක්ෂිතභාවය සහ ආරක්ෂාව පිළිබඳව පුද්ගලයින්ට අධ්‍යාපනය ලබාදීමේ වැදගත්කම" අවධාරණය කළේය.[62]

මෙම අවබෝධයේ වැදගත් හිඩැස් සමීක්ෂණයේදී මෙන්ම යොමුගත කණ්ඩායම් සාකච්ඡාවේදී අනාවරණය විය. යොමුගත කණ්ඩායම් සාකච්ඡාවේදී ක්‍රිෂ්ණා "අප අන්තර්ජාලය තුළ කුමක් කරත් එය කොහේහරි පටිගත වේ. සමහරෙක් ඔවුන්ගේ ලැප්ටොප් පරිගණකවල තිබෙන කැමරා ආවරණය (පැලැස්තරයක් අලවා) කරති. එයට හේතුව එම කැමරා දුරස්ථ පාලකයක් මගින් වෙන අයෙක් විසින් ක්‍රියාත්මක කිරීමට හැකියාව ඇති හෙයිනි. සමහරවිට ගූගල් ගිණුම් සඳහා දුරකථන අංක ගිණුම සැබෑදැයි පරීක්ෂා කර බැලීම සඳහා අවශ්‍යවේ. නමුත් ඔබට අංකය නොදී එම පියවර මගහැරිය හැකිය. නමුත් මෙම පියවර මගහැරිය හැකි බව නොදන්නා අය එය අත්‍යවශ්‍ය බව සිතමින් ඔවුන්ගේ දුරකථන අංකය ලබාදේ" යයි සඳහන් කළේය.

වාණිජ ලිංගික සේවකයෙක් හා සමලිංගික පුරුෂයෙක් වන සුමිත් වීඩියෝ ඇමතුම් භාවිතය සඳහා ඔහුගේ හේතුන් විස්තර කළේය. "සහකරුවන් සොයා ගැනීම සඳහා වීඩියෝ ඇමතුම් හරි වැදගත් වේ" යි සුමිත් ප්‍රකාශ කළේය. "එය ඉතා පහසුයි. සේවාලාභියා මුණගැසීමට පෙර ඉමෝ වැනි වීඩියෝ සඳහා භාවිතා කරන සුවිශේෂ කාර්යය මෘදුකාංග භාවිතාකර මට මාව ඉදිරිපත්කර කතා කළ හැකියි. වීඩියෝ ඇමතුම හරහා මගේ පෙනුම දැක තෘප්තිමත් නම් පමණක් මාව කායිකව මුණගැසීමට සේවාලාභියාට පැමිණිය හැකියි." වීඩියෝ ඇමතුම් ද වැදගත් යැයි ඇසූ පැනය, ඔහු, ඒවා පින්තූරයක් යැවීමට වඩා සුරක්ෂිත බව පැවසීය. පින්තූර බාගත කර සේවාලාභියෙක් වියහැකි පුද්ගලයාගේ දුරකථනයේ ගබඩාකරගත හැකිවේ යැයි පැවසීය. මේනිසා ඔහු බලකර ප්‍රකාශ කර සිටියේ ඔවුන්ගේ පහසුව සඳහා වීඩියෝ ඇමතුම්වලට වඩාත් කැමති බවත්, ආරම්භක හමුව සඳහා ආරාධනය යවන අවස්ථාවේදී ඡායාරූපද භාවිතා කරන බවයි.

පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම සඳහා අන්තර්ජාල සන්දර්භය තුළදී භාවිතා කරන පොදු මෙවලම් ගැන සමීක්ෂණයට සහභාගීවූවන් තුළ පවතින අවබෝධය හරහා අන්තර්ජාල සුරක්ෂිතභාවය පිළිබඳ සාක්ෂරතාවයේ රටාවන් ප්‍රදර්ශනය විය.

62 *La Rue, F. (2011).* ඉහත සඳහන් කරන ලද කෘතිය. පිටුව 47.

| ඔබගේ අන්තර්ජාල ආරක්ෂාව වර්ධනය කිරීම සඳහා ඔබ පහත සඳහන් මෙවලම් සහ ක්‍රම භාවිතා කරන්නේද? | | |
|---|---|---|
| ඔබගේ විද්‍යුත් තැපැල හෝ වෙනත් අන්තර්ජාල ගිණුම් සඳහා ශක්තිමත් මුරපද භාවිතා කිරීම | 69 | 81% |
| දත්ත සංකේතවලට හැරවීමේ සේවාවන් සපයන වේදිකාවන් පමණක් භාවිතා කිරීම (යවන්නා සහ ලබන්නා හැර වෙනත් පුද්ගලයකුට බැලිය නොහැකි) | 15 | 18% |
| වෛරස් විරෝධී මෘදුකාංග භාවිතා කිරීම | 49 | 58% |
| ඔබගේ මෙහෙයුම් පද්ධතිය නවතම ආරක්ෂක අණ්ඩ (patch) හා යාවත්කාලීනයන්ගෙන් (updates) යාවත්කාලීන කිරීම | 30 | 35% |
| අන්තර්ජාල මූලලේඛ වෙස්මාරුකරන්නන්/අවහිර කරන්නන් භාවිතා කිරීම | 5 | 9% |
| වාරණ විරෝධී මෘදුකාංග භාවිතා කිරීම | 1 | 1% |
| පෞද්ගලික සයිබර් ජාලයක් භාවිතා කිරීම (VPN) | 1 | 5% |
| මම, මෙම මෙවලම්වලින් කිහිපයක් ගැන දැන සිටියද ඒවා භාවිතා කරන ආකාරය නොදන්නෙමි. | 12 | 14% |

වගුව 13: අන්තර්ජාල අවකාශය තුළ ඇති ආරක්ෂණය වැඩි කිරීම සඳහා භාවිතා කළ හැකි ක්‍රම

වෙනත් එවැනි දර්ශකයක් නම් පෙම් හමු හා ක්ෂණික ලිංගික හමු වේදිකාවන්වල පින්තූර බෙදාගැනීම වටා පවතින පුරුදු විය හැකිය.

| පෙම් හමු හා ක්ෂණික ලිංගික හමු වේදිකාවන් (Tinder වැනි) සම්බන්ධයෙන් අවධානය යොමුකරමින් ඔබට අදාල සියලුම ප්‍රකාශ තෝරන්න | | |
|---|---|---|
| මම මගේ මුහුණ ප්‍රසිද්ධියේ බෙදා ගන්නෙමි | 39 | 46% |
| මම මගේ මුහුණ පෞද්ගලිකවම පමණක් බෙදා ගන්නෙමි | 23 | 27% |
| මම එවැනි වේදිකාවක් කවදාවත්ම භාවිතා කර නොමැත | 20 | 24% |
| මම කවදාවත්ම මගේ මුහුණ බෙදා නොගන්නෙමි | 3 | 4% |

වගුව 14:"පෙම්-හමු" සහ "ක්ෂණික ලිංගික හමු" වේදිකා පිළිබඳ ක්‍රියාකාරකම

| පෙම් හමු හා ක්ෂණික ලිංගික හමු වේදිකාවන් (Tinder වැනි) සම්බන්ධයෙන් අවධානය යොමුකරමින් ඔබට අදාල සියලුම ප්‍රකාශ තෝරන්න | | |
|---|---|---|
| මම ප්‍රසිද්ධයේ නග්න නොවන පින්තූර බෙදාගන්නා අතර පෞද්ගලිකව නග්න පින්තූර බෙදා ගන්නෙමි | 28 | 33% |
| මම නිරුවත් නොවන පින්තූර පමණක් ප්‍රසිද්ධයේ හා පෞද්ගලිකව බෙදා ගන්නෙමි | 25 | 29% |
| මම එවැනි වේදිකාවක් කවදාවත්ම භාවිතා කර නොමැත | 22 | 26% |
| මම නග්න පින්තූර පමණක් ප්‍රසිද්ධයේ හා පෞද්ගලිකව බෙදා ගන්නෙමි | 6 | 7% |
| මම කිසිම පින්තූරයක් එවැනි වේදිකාවන්වල බෙදා නොගන්නෙමි | 4 | 5% |

වගුව 15:"පෙම්-හමු" සහ "ක්ෂණික ලිංගික හමු" වේදිකා පිළිබඳ ක්‍රියාකාරකම

ඔවුන් බෙදා ගන්නා ඡායාරූපවලට අමතරව, පෙම් හමු සුවිශේෂ කාර්යය මෘදුකාංගවලින් බැහැරව පිටත ලෝකයේදී ප්‍රථම වතාවට කායිකව මුණගැසෙන ස්ථානය හා මුණ ගැසෙන ආකාරයද ඔවුන්ගේ සුරක්ෂිතභාවය සඳහා ඉතා වැදගත් වේ. LGBTQ ශ්‍රී ලාංකිකයින්ට සමාජගත වීමට පවතින පොදු ස්ථානවල අඩුකම මේවනවිටත් අවධාරණයට ලක් කර තිබේ. එවැනි සාධාරණ අවකාශයන්ගේ හිඟකම නිසාවෙන් ප්‍රථම වතාවට සාපේක්ෂව අමුත්තෙක් වන පුද්ගලයෙක් සෘජුවම පෞද්ගලික අවකාශයක මුණ ගැසීමට තේරීමෙන්, LGBTQ ශ්‍රී ලාංකිකයින්ගේ කායික සුරක්ෂිතභාවය සහ ජීවිත අනතුරේ හෙළීමේ හැකියාව තිබෙන බව පහත සඳහන් වගුව අඟවයි.

| ඔබට වඩාත් සුදුසු ප්‍රකාශය යොදා හිස් තැන පුරවන්න. ප්‍රථම වතාවට එවැනි වේදිකාවක් හරහා මට අලුතින් කෙනෙක් මුණ ගැසුනහොත් "--------------" | | |
|---|---|---|
| මම නිතරම ඔවුන් පොදු ස්ථානයකදී (ප්‍රධාන මාර්ගයක්, ආපනශාලාවක්, උද්‍යානයක්) මුණ ගැසෙන්නෙමි | 22 | 26% |
| සමහරවිට මම ඔවුන් පොදු ස්ථානයක මුණ ගැසෙමි, සමහරවිට මම ඔවුන් සෘජුවම මගේ ස්ථානයේ, ඔවුන්ගේ ස්ථානයේ හෝ මිතුරකුගේ ස්ථානයේ මුණ ගැසෙන්නෙමි | 17 | 20% |
| මම එවැනි වේදිකාවක් කවදාවත්ම භාවිතා කර නොමැත | 22 | 26% |
| මම ඔවුන් මුණගැසීමට පෙර, නිතරම වීඩියෝ ඇමතුමක් ගෙන ඔවුන්ගේ මුහුණ දකින්නෙමි. | 12 | 14% |
| මම එවැනි වේදිකාවන්වල ජනතාව පෞද්ගලිකව මුණ නොගැසෙන්නෙමි | 12 | 14% |
| මම නිතරම සෘජුවම ඔවුන්ට ආරාධනා කරන්නෙමි හෝ නිතරම ඔවුන්ගේ ස්ථානයට යන්නෙමි, හෝ අපි යහළුවකුගේ ස්ථානයේ සෘජුවම මුණ ගැසෙමු | 7 | 8% |
| අපි සමහරවිට හෝටල් හෝ කුලියට ගත් කාමරයකදී මුණ ගැසෙන්නෙමු | 5 | 6% |
| මම ඔවුන්ව නිතරම මම දන්නා කෙනෙක් සමග මුණ ගැසෙන්නෙමි. | 2 | 2% |

වගුව 16:"පෙම්-හමු" වේදිකාවක් හරහා කෙනෙකු මුණ ගැසීම

අන්තර්ජාල සුරක්ෂිතභාවය පිළිබඳ ශ්‍රී ලාංකික LGBTQ ප්‍රජාවගේ අවශ්‍යතාවයන් සලකා විෂය පිළිබඳව ප්‍රජාව තුළ ඉලක්කගත මැදිහත්වීම් කිරීම අත්‍යවශ්‍ය බව පෙනේ. ඇත්ත වශයෙන්ම, සමීක්ෂණයට ප්‍රතිචාරදැක්වූවන්ගෙන් 22% (19)ක් යම් ආකාරවූ "ඩිජිටල් සුරක්ෂිතභාවය පිළිබඳව පාඨමාලාවන්, සම්මන්ත්‍රණ හෝ වැඩමුළුවලට" සහභාගීවී තිබෙන බව ඇඟවූවත්, 78% (66) එසේ නොමැති බව ඇඟවීය.

## ප්‍රවේශය: සේවාවන් ලබාගැනීම

අන්තර්ජාල අයිතිවාසිකම් සම්බන්ධයෙන් වන ප්‍රධානතම ගැටලුව වන්නේ අන්තර්ජාල ප්‍රවේශයේ ගුණාත්මකභාවය, එම වියදම දැරීමේ හැකියාව හා මිලදී ගැනීමේ හැකියාව යි. මෙම තේමාවට මානයන් කිහිපයක් ඇති අතර ප්‍රවේශය සඳහා ඇති භාෂාමය, ආර්ථිකමය හා තාක්ෂණිකමය සීමාවන් වශයෙන් සඳහන් කළ හැකිය. ඇත්තවශයෙන්ම මෙම මානයන් එකිනෙක අතිඡේදනය මෙන්ම අන්තර්ඡේදනය ද වේ.

එවැනි ප්‍රවේශය පිළිබඳව ගැටලු කිහිපයක් යොමුගත කණ්ඩායම් සාකච්ඡාවේ දී හඳුනාගත් අතර, ඒ අතරින් වඩාත්ම වැදගත් වන්නේ සමහර ලිපිලේඛනමය අවශ්‍යතාවයන් මගින් නව පුළුල් කලාපයක් ආවරණය කරන අන්තර්ජාල සම්බන්ධතාවයන් (broadband) හෝ නව ජංගම දුරකථන සම්බන්ධතාවයන් මිලදී ගැනීමේදී වක්‍ර ආකරයෙන් LGBTQ ශ්‍රී ලාංකිකයින් වෙනස්කොට සලකා තිබෙන ආකාරය වේ. 2009 දී, ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සියලුම නව සබදතාවයන් පාරිභෝගිකයන්ගේ ජාතික හැඳුනුම්පතේ අංකය හා සම්බන්ධ කිරීමට අවශ්‍ය නියෝග නිකුත් කරන ලදී.[63] ඒ අනුව, සංක්‍රාන්ති ස්ත්‍රියක් වන සයුරි, අන්තර්ජාල සේවා සපයන ආයතනයක නියෝජිතයෙක් ඇයට සිම් (SIM) කාඩ් පතක් විකිණීම, ඇයගේ ජාතික හැඳුනුම් පතෙහි ඇයට දෙනලද සමාජභාවය සඳහන් කර ඇති නිසා, ප්‍රතික්ෂේප කළ ආකාරය මතක් කළාය: "නියෝජිත ජාතික හැඳුනුම් පත දෙස බලා, 'මේ ඔබ නොවේ යයි ප්‍රකාශ කළා. මම 'නැහැ, ඒ මම යැයි ප්‍රකාශ කළා. නමුත්, ඔහු දිගටම මම නොවන බව උදක්ම කියා සිටියා. මට එතන ගැටුමක් ඇති කර ගැනීමට අවශ්‍ය වුනේ නැහැ. මොකද කඩය තිබුණේ පාර අයිනේ. හුගක් මිනිසුන් වටේ සිටියා. මම ස්ථිර ලෙසම ඒ මම බව කියා සිටියා නම්, මිනිසුන් මට හිනාවීමට ඉඩ තිබුණි. එමනිසා, මම එතනින් පිටව ගියා. එතැන් පටන්, මට මගේ මිතුරකුගේ අතිරේක සිම් කාඩ්පත භාවිතා කරන්නට සිදුවුණා. නමුත් එම සිම් කාඩ්පත ඔහුගේ නමින් ලියාපදිංචි කර තිබෙන්නක්. මම සේවාවන් ලබාගැනීමට අවශ්‍ය නම් මට ඔහු කායිකව මා ළඟ සිටීම අවශ්‍යයි, නැතහොත් ඔහුගෙ න් ලිපියක් අවශ්‍යයි. මේ හැමටම වඩා, ඔහු මැදපෙරදිග රැකියාවක් සඳහා කඩිනමින් පිටත් ව යාමට නියමිතයි. මම දන්නේ නැහැ,

63 (2013, 3 July). Dialog Connect: A Case Study. *GSMA*. www.gsma.com/identity/dialog-connect-a-case-study

ඔහු ගිය පසු මා කුමක් කළ යුතුදැයි. සමහරවිට, මම වීදියේ සිටින වෙළඳාම්කරුවෙක් වෙනුවට, ප්‍රධාන සේවා මධ්‍යස්ථානයට යන්නේ නම්, මට මේ ප්‍රශ්නය නොවෙන්නට තිබුණි."

සංක්‍රාන්ති පුරුෂයෙක් වන මන්ජු සමාන අත්දැකීමක් සිහියට නැගුවේ ය. ඔහුට වසර දහයක් තිස්සේ සිම් කාඩ්පතක් හිමිව තිබුණි. ඒ, ඔහුගේ කායික සංක්‍රාන්තිය සිදුවීමට පෙර ඔහු විසින් මිලදී ගත්තකි. සිම් කාඩ්පතේ සියලුම ලියවිලිවල ඔහුගේ පෙර අනන්‍යතාවය පිළිඹිබු විය. එමනිසා, ඔහුට ඔහුගේ නමද සහිතව පශ්චාත්-සංක්‍රාන්ති විස්තර සහිතව එය යාවත්කාලීන කිරීමට අවශ්‍ය විය. ඔහු පාරිභෝගික සේවා මධ්‍යස්ථානයකට ගොස් සිම් කාඩ්පත ඔහුගේ නිවුන් සහෝදරියගේ නම හා ජාතික හැඳුනුම්පත් අංකය යටතේ පවතින බවටත් ඇය දැනට විදේශගතව සිටින බවටත් බොරුවක් පැවසීය. ඔහුගේ සහෝදරිය එය මිලදී ගත්ත ද එය නිතරම භාවිතා කළේ ඔහු බවත් පවසා අයිතිය ඔහුට "මාරුකර" දෙන ලෙසට ඉල්ලීමක් කළේය. පාරිභෝගික සේවා නියෝජිත සහෝදරියගේ අත්සන සහිත ලිපියක් සමග පැමිණෙන ලෙස ඉල්ලා තිබුණි. එය කිරීමට පොරොන්දු වූ නමුත්, අවසානයේදී ඔහු එය නොකළේය. කෙසේවෙතත් ටිකකලකට පසුව සම්බන්ධතාවය ඔහුගේ වර්තමාන තොරතුරුවලට යාවත්කාලීන කර තිබෙන බව ඔහුට පෙනුණි. පාරිභෝගික සේවා නියෝජිත නිල ලිපියක් ඉල්ලුවද පසුව අදාල වෙනස්කම් කරන්නට ඇති බවට ඔහු විශ්වාස කරයි.

ජාතික හැඳුනුම් පතක අවශ්‍යතාවයට අමතරව, පසු-ගෙවුම් සම්බන්ධතාවයන් මිලදී ගැනීමට අදහස් කරන පාරිභෝගිකයින්ටද, බිල්පත යැවීමට සාක්ෂියක් වශයෙන් මෑතක සිට සේවා බිල්පතක් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය ඇති වී තිබේ. මෙහිදී, සාමාන්‍ය අවශ්‍යතාවය වන්නේ සේවා බිල්පතෙහි ලිපිනය ජාතික හැඳුනුම් පතෙහි පිළිඹිබු වීමයි. කෙසේ වුවද ජාතික හැඳුනුම් පතෙහි ලිපිනය පරණ නම් (ජාතික හැඳුනුම්පත පුරවැසියන්ට වයස අවුරුදු 16 දී නිකුත් කරනු ලැබේ) පාරිභෝගිකයා සරලව සම්බන්ධතාවය සඳහා කරන අයදුම්පතෙහි ලිපිනය හා සේවා බිල්පතෙහි ලිපිනය සමාන ලෙස සඳහන් කරයි.[64] පුද්ගලයකු කුලී නිවසක වාසය කරන්නේ නම්, කුලී නිවසෙහි සේවා බිල්පත්වල නිවාස හිමියාගේ අනන්‍යතාවය පෙන්වන හෙයින් නිවාස හිමියාගේ ලිපියක් සහිතව සේවා බිල්පතක් ඇමිණීම අවශ්‍ය වේ. සමලිංගික පුරුෂයෙක් වන

64 මෙම තොරතුරු ශ්‍රී ලංකාවේ ප්‍රකට අන්තර්ජාල සේවා සපයන ආයතනවල පාරිභෝගික සේවා ක්ෂණික ඇමතුම් අංක අමතා ගත් තොරතුරු හා පදනම් වේ.

දේශාන්, මෙම නීති ලිංගික සුළුතරයට බලපාන ආකාරය විස්තර කළේය. "බොහොමයක් සමලිංගික පුරුෂයින්, විශේෂයෙන්ම මැදි වයසේ හා වයසට ගිය සමලිංගික පුරුෂයින්, ඔවුන්ගේ පවුල්වලින් ඈත් ව කුලී නිවෙස්වල ජීවත් වේ. බොහොමයක් සේවා සපයන්නෝ, ඔබ වයි-ෆයි හෝ ස්ථාවර සම්බන්ධතාවයක් ලබාගැනීමට උත්සාහ කරන විටදී, නිවසේහිමිකරුගේ නමින් මිලදී ගැනීම අවශ්‍යතාවයක් ලෙස දක්වති. බොහොමයක් සමලිංගික පුරුෂයින්ට ජීවත්වීම සඳහා තමන්ගේම ස්ථිර ස්ථානයක් නොමැත. මට මගේ මව හා ඇයගේ නිවසේ ලිපිනය හරහා එවැනි සේවා ගැනීමට සිදුවුණි යයි" ඔහු ප්‍රකාශ කළේය.

## ***ප්‍රවේශය: උපාංගවල අයිතිය***

'උපාංගවල සුරක්ෂිතභාවය' මාතෘකාව යටතේ වූ පෙර අංශයෙහි සඳහන් කර ඇති පරිදි ප්‍රවේශය සම්බන්ධයෙන් ඇති තවත් ගැටලුවක් වන්නේ සේවා ස්ථානවලට හා ආපනශාලා හිමිකරුවන්ට වැනි වෙනත් පුද්ගලයින්ට හිමි ජාල සහ/හෝ උපාංග හරහා අන්තර්ජාලයට ප්‍රවේශවීමේ දී උද්ගත වන තත්ත්වයන් වේ. තමන්ගේ ම උපාංග හා ජාලයන්ට අමතරව පුද්ගලයින් තමන්ට අයිති නොවන උපාංග හා ජාලාවන් භාවිතා කරන අතර, සමහරුන්හට අන්තර්ජාල ප්‍රවේශය පවතින්නේ වෙනත් කෙනෙකුට හිමි පහසුකම් හරහා ම පමණක් වේ. විශේෂයෙන්ම, කෙනෙකුගේ ලිංගිකත්වය සමාජයේ කොන්කර තිබෙන අවස්ථාවෙහිදී, කෙනෙකුගේ ලිංගිකත්වය හා සම්බන්ධ වන අන්තර්ජාල පරිභෝජනයේ සංවේදී ස්වභාවය සලකා බලනවිට, උපාංගවලට සහ ජාලයන්ට හිමිකාරත්වයක් නොමැති වීම මගින් අලුතෙන් පුද්ගලයින් මුණ ගැසීමේ, සම්බන්ධතාවයන් පවත්වා ගැනීමේ හා ඔවුන්ගේ ලිංගික දිශානතිය හා සමාජභාවී අනන්‍යතාවය හා සම්බන්ධ වන විවිධ සාකච්ඡා හා සංවාදයන්හි නිරතවීමේ හැකියාව අන්තර්ගත වන ඔවුනගේ අන්තර්ජාල මානව අයිතිවාසිකම් භුක්ති විඳීමට ඇති හැකියාවට, සෘජුවම බාධා ඇති වේ.

## ***ප්‍රවේශය: භාෂාව***

අන්තර්ජාල අන්තර්ගතයට ඇති ප්‍රවේශයට බලපාන තවත් සීමාකරන සාධකයක් වන්නේ භාෂාවයි. පෙර සඳහන් කර ඇති පරිදි, බොහොමයක් තොරතුරු මූලාශ්‍ර ඉංග්‍රීසි භාෂාව කියවන ශ්‍රාවක ජනයාට ලබා දේ. තවද බොහෝමයක් උපාංග, ඒවාගේ

“යෙදවුම්” කෘත්‍යයන් පදනම් කරගෙන ඉංග්‍රීසි භාෂාවෙන් පෙරතබා නිර්මාණය කර ඇත.

මිලදී ගැනීමෙන් පසු කරනු ලබන සංශෝධන මගින් සිංහල හෝ දමිළ භාෂාවන් ඇතුල් කර උපාංගවල කෘත්‍යය පුළුල් කළහැකි වුවද, මෙම සංශෝධන විෂය පරාසයෙන් සීමාවන අතර ඉංග්‍රීසි භාෂාවෙන් ම පවතින කෘත්‍යයන් අහිමි කරනු ලැබේ. ශ්‍රී ලංකාව ඉහළ සාක්ෂරතා මට්ටමක් සාමාන්‍ය ජනගහණය අතර පෙන්නුම් කළද එවැනි දර්ශකවල ඉංග්‍රීසි සාක්ෂරතාවය පිළිඹිබු නොවේ. තවද පුද්ගලයින්ට තොරතුරුවලට ප්‍රවේශය මෙන්ම තමන් කැමති භාෂාවකින් සන්නිවේදනයේ යෙදීමට ද අයිතියක් ඇත.

## ***ප්‍රවේශයඃ සේවාවන්ගේ ගුණාත්මකභාවය***

අවසාන වශයෙන්, දත්ත වේගය හා සේවයේ ගුණාත්මකභාවය අන්තර්ජාල ප්‍රවේශයේ වැදගත් අංශයක් වේ.[65] ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාවේදී මංජු, “ඔබ පිටුවකට පිවිසීමට උත්සාහ දරන විටදී ඔබගේ පෙර-ගෙවුම් බැර අවසන් වන අතර වෙබ් පිටුව ප්‍රවේශනය නොවී පවතින තරමටම සමහරවිට දත්ත මන්දගාමීයි, වියදම් සහගතයි. ඔබට ඔබගේ ගිණුම නැවත ප්‍රවේශනය කිරීමට උත්සාහ කළ හැකිය. සමහරවිට බැර නැවත අවසන්වේ. පූර්ණ විශේෂාංග සහිත ස්මාර්ට් ජංගම දුරකථනයක් වෙනුවට අඩු-විශේෂාංග සහිත දුරකථනයක් භාවිතා කරන්නේ නම් මෙය විශේෂයෙන් ම දැකිය හැකියි” යැයි ප්‍රකාශ කළේය. ඇත්තවශයෙන්ම, මෙවැනි බාධක තවත් සංකීර්ණවී ඇත්තේ 2016 නොවැම්බර්[66] මාසයේ සිට ශ්‍රී ලංකාව තුළ දත්ත පරිභෝජනය මත බදු වැඩි කිරීමයි. මෙම අධ්‍යයනය සඳහා සම්මුඛ සාකච්ඡා පැවැත් වූ අන්තර්ජාල සේවා සපයන ආයතනයක ජ්‍යෙෂ්ට නීති නිලධාරියකුට අනුව මෙය අමු දත්ත පරිශීලක අනුපාතයෙන් 35%-49% අතර ප්‍රමාණයක් වේ. ඇත්ත වශයෙන්ම, උක්ත සම්මුඛ සාකච්ඡාවට අනුව, ඇතැම් අන්තර්ජාල සේවා සපයන්නන් පාරිභෝගිකයින්ගේ නිශ්චිත දත්ත පරිභෝජන කඩඉම්වලදී සම්බන්ධතාවයේ වේගය අඩු කිරීම මගින් බදු බර වැඩි කිරීමට සම්බන්ධ වන ලෙස දත්ත පරිභෝජනය සීමා කිරීම සඳහා විවිධ උපක්‍රම යොදා ගනී.

65 La Rue, F. (2011). ඉහත සඳහන් කරන ලද කෘතිය. පිටුව 62.
66 (2016, 11 November). Sri Lanka budget 2017: tax and revenue proposals. Lanka Business Online. www.lankabusinessonline.com/sri-lanka-budget-2017-tax-and-revenue-proposals

හතරවන **කොටස**

# නීතිය හා ප්‍රතිපත්තිය

LGBTQ ශ්‍රී ලාංකිකයින් අන්තර්ජාල අවකාශය තුළ දී සලකා බැලීමට ලක් කරනවිටදී මානව අයිතීන්ගෙන් බොහොමයක් ඔවුනට අදාල වේ. පෙර අංශයේදී සාකච්ඡා කරනලද ගැටලු භාවිතය, සුරක්ෂිතභාවය සහ ප්‍රවේශය සමග සම්බන්ධව රාමුගත කරන ලදී. "නීතිය හා ප්‍රතිපත්ති" සම්බන්ධව, අපි මෙහිදී ප්‍රධාන වශයෙන්ම එම ගැටලු සහ ප්‍රකාශනයේ නිදහස, තොරතුරු දැන ගැනීමේ අයිතිය, සංගමයේ නිදහස හා පුද්ගලිකත්වයේ අයිතිය යන මානව අයිතීන් සමග තිබෙන සම්බන්ධතාවය දෙස බලන්නනෙමු.

අන්තර්ජාලය භාවිතා කිරීම හරහා LGBTQ ශ්‍රී ලාංකිකයෝ *තොරතුරු දැන ගැනීමේ අයිතිය* භුක්ති විඳිති. අන්තර්ජාලය හරහා ඔවුන්ගේ පෞද්ගලික වර්ධනය, අන්තර්ජාලය හරහා සෞඛ්‍යය හා සුවතාවය වැනි වැදගත් තොරතුරුවලට ප්‍රවේශය ලැබෙන අතර මෙවා තොරතුරු ප්‍රවෘත්ති, කලාව, සෞඛ්‍යය, නීතිය වැනි දේ වේ. ඒ සමගම, මාධ්‍ය සාක්ෂරතාවය, නිල/රජයේ සම්පත්වල හඳුනා ගැනීමක් නොමැතිකම මෙන්ම භාෂාමය, තාක්ෂණිකමය, මූල්‍යමය සීමාවන් ද සාකච්ඡා කරනු ලැබේ.

අන්තර්ජාලය ඔස්සේ LGBTQ ශ්‍රී ලාංකිකයෝ *ප්‍රකාශනයේ නිදහස* භුක්ති විඳිති. ඔවුහු, දැනුවත් කිරීම, ලිංගිකත්වය පිළිබඳව දේශීය කතිකාවන්හි නියුතුවීම, ඒකකෘතීන් බිඳදැමීම, ඔවුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටීම හා සරල පැවැත්ම උදෙසා අන්තර්ජාලය භාවිතාවේ යොදවති. ඔවුහු ඒවාගේම, මුහුණට මුහුණ

හා සමූහ සංවාදයන්හි යෙදීම, අදහස් බෙදා ගැනීම හා සමීප ප්‍රකාශන සඳහාද මෙය භාවිතා කරති.

LGBTQ ශ්‍රී ලාංකිකයෝ අන්තර්ජාලය හරහා *සංගමයේ නිදහස* භුක්ති විඳිති. LGBTQ ප්‍රජාව අතර නව සබඳතා ගොඩනගා ගැනීම මෙන්ම පැරණි හා නව සබඳතාවන් පවත්වාගෙන යාම සඳහා අන්තර්ජාලය සාධනීය ලෙස දායක වී තිබේ. මේවා භාවාත්මක, ශෘංගාරාත්මක, සැහැල්ලු ලිංගික, ක්‍රියාවෙන් කාමුක නොවූ, සුහදශීලී, මිතුරු වැනි සබඳතා විය හැකිය. අධිවාචන ප්‍රයත්නයන් සඳහා වඩාත් වැදගත්විය හැකි ප්‍රජා සාමාජිකයින්ගේ ජාලයන් නිර්මාණය කිරීම සඳහා අන්තර්ජාලය පහසුකරණය කර තිබේ.

විවිධ සමාජ හා ලිංගික අනන්‍යතාවයන් සහිත ශ්‍රී ලාංකිකයින්ගේ *පුද්ලිකත්වයට ඇති අයිතියට* ද අන්තර්ජාලය බලපෑම් කරයි. නිර්නාමිකත්ව හා ව්‍යාජ පැතිකඩ ශ්‍රී ලංකාවේ වෙසෙන බොහෝ LGBTQ ජනතාවගේ ජීවිතවල විශේෂ අංගය වේ. ඒ අතරම, නීති විරෝධී බලාත්ප්‍රවේශයෙන් හා රාජ්‍යයේ මුරකිරීමේ කාර්යයෙන් ඒවායේ අන්තර්ගතය හා උපාංග සුරක්ෂිතකර ගැනීම විවිධ සමාජ හා ලිංගික අනන්‍යතාවයන් සහිත ශ්‍රී ලාංකිකයින්ට ඇති ගැටලුවක් වේ.

මෙම අයිතිවාසිකම් සාමාන්‍යයෙන් "සිවිල් හා දේශපාලනික"[67] අයිතිවාසිකම් වශයෙන් සලකනු ලැබේ. මෙම අධ්‍යයනයේ සාකච්ඡා කරනු ලබන ගැටලු හා සම්බන්ධ සමාජ ආර්ථික අයිතිවාසිකම් නොසලකා සිටිය යුතු බව ඉන් ගම්‍ය නොවේ. ඇත්ත වශයෙන්ම, සෞඛ්‍යයට ඇති අයිතිය, අධ්‍යාපනයට ඇති අයිතිය, විද්‍යාවට සහ සංස්කෘතිය වැනි දේට ඇති අයිතිය LGBTQ ශ්‍රී ලාංකිකයින්ගේ අන්තර්ජාල අයිතිය පිළිබඳ කරන සාමාන්‍ය සාකච්ඡාවකට විවාදාත්මක ලෙස අදාල වේ. කෙසේවෙතත්, අනතර්ජාතික මානව අයිතීන් යාන්ත්‍රණය තුළ පවා සිවිල් හා දේශපාලනික අයිතීන් යන දෘෂ්ටිකෝණයෙන් අන්තර්ජාල අයිතීන් කේන්ද්‍ර කිරීමේ සාමාන්‍ය ප්‍රවනතාවයක් වනවා මෙන්ම සමාජආර්ථික අයිතිවාසිකම් සඳහා ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි[68] දී තිබෙන සීමා සහිත පිළිගැනීම පදනම් කරගෙන මෙම අධ්‍යයනයද එම ප්‍රවේශයම අනුගමනය කරනු ඇත.

67 නිදසුනක් ලෙස, මෙම සියලු දෙයම සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියේ සඳහන් වේ.

68 සාමාන්‍යයෙන් බලන්න, Gunatilleke, G.D. (2010). Judicial Activism Revisited: Reflecting on the Role of Judges in enforcing Economic, Social and Cultural Rights. 1 Junior Bar Law Review 21, 28-30.

නීතිය යටතේ සමලිංගිකත්වය ශ්‍රී ලංකාවෙහි සාපරාධී වරදක් ලෙස පුළුල්ව විශ්වාස කරනු ලැබේ. එහි නිරවද්‍යභාවය පසෙකින් තබා, මෙම විශ්වාසය, LGBTQ ශ්‍රී ලාංකිකයින් ඔවුන්ගේ අන්තර්ජාල භාවිතය නිසාවෙන්, නීතියට හා සමාජයට යන දෙකටම අවදානම් සහිත බවට පරිවර්තනය කරන රටෙහි අපරාධ නීතිය, විදුලි සංදේශ නියාමන රාමුව හා අන්තර්ජාල පාලනය අතර සුවිශේෂී සම්බන්ධකයක් නිර්මාණය කරයි.

## *ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි මානව අයිතිවාසිකම් රාමුව*

**3 වන හා 4 වන වගන්ති**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන වගන්තිය, "ශ්‍රී ලංකා ජනරජයේ පරමාධිපත්‍යය ජනතාව කෙරෙහි පිහිටා ඇත්තේ ය. පරමාධිපත්‍යය අත්හල නොහැක්කේ ය. පරමාධිපත්‍යයට පාලන බලතල, *මූලික අයිතිවාසිකම්* සහ ඡන්ද බලය ද ඇතුළත් වන්නේ ය" යි ප්‍රකාශ කරයි. (අවධාරණය එක් කරන ලදී). මෙම ප්‍රතිපාදනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අංගයක් වන අතර එය සංශෝධනය කළ නොහැකි වේ. පාර්ලිමේන්තුවේ 2/3 ක බහුතරයක අවශ්‍යතාවය හා ජනමත විචාරණයක දී සරල බහුතරයක් ඇතිව සුවිශේෂී ලෙස සීමාකර තිබෙන ක්‍රියාපටිපාටීන් වෙනස්කර සම්මතකර ගන්නේ නැතිව එයට පටහැනි වන නීති පාර්ලිමේන්තුවේදී සම්මත කළ නොහැකි වේ. මේ ආකාරයට, මූලික අයිතිවාසිකම් ගැටලු බහුතරයේ (සරල) දුෂ්ටකම ඉක්මවන බවත්, පුළුල් දේශපාලන එකඟතාවයකින් තොරව මූලික අයිතිවාසිකම්වල සාරය සහතික කිරීම කළ නොහැකි බවත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පැහැදිලිවම තහවුරු කරයි.

4 වන වගන්තියට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රකාශිත මූලික අයිතිවාසිකම්වලට අදාලව ධනාත්මක වගකීම් (පියවර ගැනීම, දේවල් කිරීම) හා ඍණාත්මක වගකීම් (එනම්, යම් දේවල් නොකිරීම) යන කාරණා දෙකම "සියලු පාලන ආයතන" හරහා නිරීක්ෂණය කිරීම අවශ්‍ය වේ.[69] මෙම ප්‍රතිපාදනයේ වැදගත්කම නම් පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් සහතික කිරීම සඳහා ආණ්ඩුවේ සියලුම ඉන්ද්‍රියන් ක්‍රියාකාරීව

69 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4(ඈ) වගන්තිය.

ක්‍රියා කිරීමයි. ඇත්තවශයෙන්ම, රජයේ ප්‍රමාදදෝෂ මෙන්ම රජයේ ක්‍රියාකාරීත්වයන් ද මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරන බව ධනාත්මක වගකීම් සම්බන්ධව හඳුනාගත හැකිබව තර්ක කළහැකිවේ. කෙසේවෙතත්, 4 වන වගන්තියේ (ඈ) මෙම අංශය සම්බන්ධව දේශීය නීති රාමුව තුළ අවධානය යොමු වී නැති තරම් වේ.

**10-14 වන වගන්ති**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි හඳුනාගත් සුවිශේෂී මූලික අයිතිවාසිකම් අතරින්, සිතීමේ නිදහස සහ හෘදය සාක්ෂියේ නිදහස,[70] ප්‍රකාශනයේ[71] සහ සංගමයේ[72] නිදහස වර්තමාන සාකච්ඡාවට විශේෂයෙන්ම අදාල වේ. 2015 මැයි මාසයේදී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව "තොරතුරු වෙත ප්‍රවේශවීමේ අයිතිවාසිකම"[73] හඳුනාගැනීමට හා ප්‍රකාශ කිරීමට සංශෝධනය කරන ලදී.

කෙසේවුවද පුද්ගලිකත්වයට ඇති අයිතිය[74] හෝ නිදහසට ඇති පුළුල් අයිතිය[75] (මේ කාරණා දෙකම ලොව සෙසු ප්‍රදේශවල ලිංගිකත්ව අයිතිවාසිකම් දෝෂමුක්ත කිරීම සඳහා උපයෝගී කරගෙන තිබේ) ශ්‍රී ලංකාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ පැහැදිලිව සඳහන් කර නොමැත. නීති බලධාරීන්ගේ අත්තනෝමතික සෝදිසි කිරීම් හා අල්ලා ගැනීම්වලට එරෙහිව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පැහැදිලි කිසිම ආරක්ෂාවක් අන්තර්ගත කර ද නොමැත.

අයිතිවාසිකමක් අධිකරණමය වශයෙන් බලාත්මක කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි ඒ ස්වරූපයේම පැහැදිලි සඳහනක් සැමවිටම අවශ්‍ය නොවේ. නිදර්ශනයක් වශයෙන්, සන්ධිස්ථානයක් සටහන් කළ විනිශ්චයකදී,[76]

70 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 වගන්තිය.

71 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(අ) වගන්තිය.

72 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(ඇ) වගන්තිය.

73 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14අ වගන්තිය.

74 Toonen v. Australia. Communication No 488/1992. HRC., 31 March 1994); Dudgeon v. the United Kingdom. App. No. 7525/76. ECtHR.,22 October 1981); National Coalition for Gay and Lesbian Equality and Another v. Minister of Justice and Others [1998]. ZACC 15. (9 October 1998)

75 Lawrence v. Texas 539 U.S. 558 (2003) in the United States; Naz Foundation v. Delhi and Others [2009] 4 L.R.C. 838 in India.

76 Sriyani Silva v. Iddamalgoda (2003) 2 S.L.R. 63.

ශ්‍රේෂ්ඨාධිකරණය වතාවක් ජීවත්වීමේ අයිතිය 13(4) වගන්තිය වන "නීතියෙන් නියම කරනු ලැබූ කාර්යය පටිපාටියට අනුකූලව නිසි අධිකරණයක් විසින් කරනු ලැබූ ආඥාවක්

අනුව මිස, කිසිම තැනැත්තකු මරණීය දණ්ඩනයට යටත් කිරීම හෝ කිසිම තැනැත්තකු බන්ධනාගාරගත කිරීම හෝ නොකළ යුත්තේ ය" යටතේ පැහැදිලි වන බව ප්‍රකාශ කළේය. ඒ අතරම, සියලුම දෙනාට "නීතිය ඉදිරියේ රැකවරණය" හා "නීතියේ රැකවරණය සර්ව සාධාරණ වීම" සහතික කරන 12(1) වගන්තිය සාමාන්‍යයෙන් විෂය පථය අනුව පුළුල්[77] ලෙස සලකන අතර එය අසාධාරණබව හා අත්තනෝමතිකබව වැනි සංකල්පවලට එරෙහි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි "ව්‍යංගාර්ථ" අයිතීන් හඳුනාගැනීම සඳහා උපකාරී වී තිබේ[78].

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, "වර්ගය, ආගම, භාෂාව, කුලය" වැනි වෙනත් වර්ග සඳහන් කර තිබුණත්, "සමාජභාවී අනන්‍යතාවය" හෝ "ලිංගික දිශානතිය" යන වර්ගයන් දෙකින් එකක්වත් වෙනස්කොට සැලකීමෙන් ආරක්ෂාවන බව පැහැදිලිව සඳහන් කර නොමැත. කෙසේවෙතත්, 2014 වසරේ ඔක්තෝබර් මාසයේදී, ශ්‍රී ලංකා රජය ජිනීවා මානව අයිතිවාසිකම් කමිටුව ඉදිරියේදී "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(2) වගන්තිය කිසිඳු පුරවැසියෙක් ලිංගිකත්වය පදනම් කරගෙන වෙනස්කොට සැලකීමට භාජනය නොවිය යුතුය යන්න තහවුරු කරන බවත්, මෙම සන්දර්භය තුළ ලිංගික දිශානතිය පදනම් කරගෙන පුද්ගලයකු වෙනස්කොට සලකන නීති ව්‍යවස්ථාමය නොවන බවත්"[79] යන ස්ථාවරය ගත්තේ ය. මෙම ස්ථාවරය මානව අයිතිවාසිකම් කමිටුවේ නීති පද්ධතියට සුදුසු වුවත්,[80] එහි දේශීය නීතිමය ස්ථාවරය සැක සංකාවක පවතී. පළමුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථනිරූපණය කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයට පමණක්

77 Udayanganie, U.A.T. (2013, October) Expanding the Scope of Judicial Review using Constitutional Interpretation in Sri Lanka: A Comparative Study of the Development of Judicial Review in UK. GSTF International Journal of Law and Social Sciences (JLSS) Vol.3 No.1, 51-54

78 උදාහරණයක් ලෙස බලන්න, Visal Bhashitha Kaviratne et al. v. Commissioner-General of Examinations et al. (The Z-Score Case) S.C. (F.R.) Application No. 29/2012.

79 (2014, 7 October).සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම පිළිබඳ ශ්‍රී ලංකාවේ පස්වන වාර්තාව සලකා බැලීම (2014 ඔක්තෝබර් 7) (අදාල කොටසේ පිටපත). https://www.youtube.com/watch?v=iHcREEWl6G8&feature=youtu.be&t=6232

80 බලන්න, Toonen v. Australia Communication No 488/1992 (HRC, 31 March 1994)

බලය හිමිවේ;[81] දෙවනුව, ශ්‍රී ලංකා රජය පසුව දේශීය සංසඳවලදී පැහැදිලිවම සිය ස්ථාවරයට ප්‍රතිවිරුද්ධ ලෙස කටයුතු කර ඇත.[82]

### 15 වන වගන්තිය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15 වන වගන්තිය හරහා යම් යම් මූලික අයිතීන් සඳහා සාධාරණ සීමාවන් පැනවීමට ඉඩලබා දේ. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මෙම වගන්තියේ සාමාන්‍ය ප්‍රතිපත්තිය මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ 29(2) වගන්තිය[83] සමග තිබෙන අනුනාදය සමග සටහන් කර තිබේ. මෙය රජයට අයිතිවාසිකමක් සීමා කිරීමේ අවසරය තක්සේරු කිරීම සඳහා තෙයාකාර වන සියුම් පරීක්ෂණයක් සපයයි. අවසරය ලබා ගැනීම පිණිස, මානව අයිතිවාසිකම් ඕනෑම සීමා කිරීමක්,

(අ) නීතිය මගින් නියම කළ යුතු ය,
(ආ) නීත්‍යානුකූල රාජ්‍යයේ උනන්දුව මත සැලසුම් සහගතව ඉදිරියට යායුතු ය, සහ
(ඇ) ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක අවශ්‍යතාවයක් විය යුතු ය.[84]

උසාවිය 15 වන වගන්තිය අර්ථ නිරූපණය කිරීමේදී තෙයාකාර වන සියුම් පරීක්ෂණයක ප්‍රවේශයක් අනුගමනය කර තිබේ. නීතිපතිවරයා සහ ජෝෂප් පෙරේරා අතර නඩුවේදී,[85] "ආරෝපණය කරන ලද සීමාව [...] හා [ඒ] මගින් ඉෂ්ට කරගැනීමට උත්සාහ කරන වස්තුව අතර ආසන්න හෝ තාර්කික සම්බන්ධයක් තිබේද යන්න... උසාවියට ප්‍රශ්න කිරීමට සුදුසු" බව ශ්‍රේෂ්ඨාධිකරණයේ පූර්ණ විනිසුරු මඬුල්ලක් විසින් තීරණය කරන ලදී.[86]

81 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 125 (1) වගන්තිය, "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීම පිළිබඳ යම් ප්‍රශ්නයක් විභාගකොට තීරණය කිරීම සඳහා තනි හා අනන්‍ය අධිකරණ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට ඇත්තේ ය."

82 Samarakoon, S. (2017, 26 January). Homosexuality | "Threw out" – Can the President control a person's sexual orientation?.Vikalpa.www.vikalpa.org/?p=29311

83 මානව අයිතිවාසිකම් විශ්ව ප්‍රකාශනයේ 29(2) වගන්තිය: "පුද්ගලයාගේ අයිතිවාසිකම් හා ස්වාධීනතාවයන් ක්‍රියාත්මක වීමේදී සීමාවන් තිබිය යුත්තේ හුදෙක් අනන්‍යයන්ගේ අයිතිවාසිකම් හා ස්වාධීනතා ආරක්ෂාවීම පිණිසත්, ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක මහජන සාමය හා පොදු සුභසිද්ධිය ආරක්ෂා වීම පිණිසත් පැනවෙන නීති පද්ධතියක් මගින් පමණි."

84 Sunila Abeysekera v. Ariya Rubasinghe (2000) 1 SLR 314.

85 *Joseph Pererav. A.G. (1987) 1 S.L.R. 199.*

86 එම, පිටු. 216-17. අවධාරණය එක් කරන ලදී. සංස්කරණය කරන ලදී. උපුටාගන්නා ලද කොටස හදිසි නීති රෙගුලාසි හා සම්බන්ධ වුවද, වර්තමාන ඉදිරිපත් කිරීම සාමාන්‍ය නීතිය ආවරණය කිරීම එහි අර්ථ ව්‍යාප්තිය සාධාරණීකරණය කරනු ඇත.

බොහෝ කලකට පසුව, සුනිලා අබේසේකර සහ ආරිය රුබසිංහ අතර නඩුවේ දී[87], "ස්වකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඒක පාර්ශවීමට"[88] විරුද්ධව නීතිමය උපදෙස් සපයමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ මානව අයිතීන් සීමාකිරීම් තක්සේරු කිරීම සඳහා සුදුසු මිණුම් දණ්ඩක් ලෙස අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතියෙහි තෙයාකාර වන සියුම් පරීක්ෂණය උසාවිය පැහැදිලිව යොදා ගන්නා ලදී.[89]

සියලුම අයිතිවාසිකම් සීමා කිරීම් (ප්‍රකාශිත හදිසි අවස්ථා තත්ත්වයකදී බලාත්මක කරනදේට අමතරව) නීති පද්ධතිය හරහා පමණක් සෑමවිටම ක්‍රියාත්මක කිරීම යන්න පදනම් රේඛාව ලෙස ගෙන "නීතියෙන් නියම කරන ලදී" යන්න තහවුරු කරනු ලැබේ. කෙසේවෙතත්, අවශ්‍යතාවය සීමා පනවන නීතිය මත යම් ගුණාත්මක නිර්ණායක නියම කරයි. නිදසුනක් වශයෙන්, මානව අයිතිවාසිකම් පිළිබඳ යුරෝපීය උසාවිය "නීතියෙන් නියම කරන ලදී" යන්න යටතේ මානව අයිතියක සීමා කිරීම "නිත්‍ය" ගුණාංග දෙකක් සපුරා ගත යුතු යැයි යන මතය දැරීය. "ප්‍රථමයෙන්, නීතියට ප්‍රමාණවත් පරිදි ප්‍රවේශ වියහැකි විය යුතුයඃ අදාල නඩුවට සුදුසු නීතිමය නියමයන් එම වාතාවරණය යටතේ ප්‍රමාණවත් බවට හැඟවීමක් ලබා ගැනීමට පුරවැසියන්ට හැකියාවක් තිබිය යුතුයි. දෙවනුව, ඔහුගේ හැසිරීම නියාමනය කිරීමට පුරවැසියන්ට හැකි කරවන ආකාරයෙන් එය ප්‍රමාණවත් නිරවද්‍යතාවයෙන් යුතුව සකස් කර නැති නම් ධර්මතාවයක් 'නීතිය' වශයෙන් සලකනු නොලැබේඃ යම්කිසි ක්‍රියාවක් හා සම්බන්ධ වියහැකි [නීතිමය] ප්‍රතිවිපාක වාතාවරණයන් යටතේ සාධාරණ වන ප්‍රමාණයකට කල්ඇතිව දැනගැනීමට

87 Sunila Abeysekera v. Ariya Rubasinghe(2000) 1 SLR 314.

88 එම., පිටුව. 351.

89 එම., පිටු, 356-85.

අවශ්‍ය නම් සුදුසු උපදෙස් සහිතව - ඔහුට හැකිවිය යුතුයි."[90] එක්සත් ජනපදයේ ශ්‍රේෂ්ඨාධිකරණය නියමිත ක්‍රියාපටිපාටිය රැගත් වාක්‍යාංශය (Due Process Clause) යටතේ 'නොපැහැදිලිතාවය මත ශූන්‍යකරණය කිරීමේ දර්ශනය' (void-for-vagueness doctrine) යනුවෙන් හඳුන්වන සමාන

ප්‍රවේශයක් අනුගමනය කරයි. "සාමාන්‍යයෙන් ප්‍රකාශ කරන විටදී, නොපැහැදිලිතාවය මත ශූන්‍යකරණය කිරීමේ දර්ශනයට අත්තනෝමතික හා වෙනස්කොට සලකන බලාත්මක කිරීම අධෛර්යයට පත් කරන ආකාරයෙන් තහනම් කරන ලද හැසිරීම කුමක්ද සාමාන්‍ය ජනතාවට අවබෝධ වන ලෙස ප්‍රමාණවත් නිශ්චිතභාවයෙන් යුක්තව දණ්ඩ නීති සංග්‍රහයේ ආඥාපනතක් සාපරාධී වරද නිර්වචනය කිරීම අවශ්‍ය වේ."[91]

තෙයාකාර වන සියුම් පරීක්ෂණයේ අනෙක් අංග දෙක සමානුපාතිකත්වය පිළිබඳ මූලධර්මය තහවුරු කරයි. මෙමගින් රජයට, පුද්ගලයන් මත පටවනු ලබන බර සහිත අයිතිවාසිකම් සීමාකිරීම් හරහා අනුගමනය කරන ඕනෑම නීත්‍යානුකූල පරමාර්ථ සමතුලනය කිරීමට අවශ්‍ය වේ. සමානුපාතිකත්ව පරීක්ෂණය ලෙස හඳුන්වනු ලබන මෙම ප්‍රවේශය යටතේ, ඕනෑම සීමාවක එවැනි අංග රජය සලකා බැලිය යුතු වේ: ක්‍රියාමාර්ගය සාධාරණීකරණය කිරීමට ප්‍රමාණවත් තරමේ හා අදාල හේතු සාධකවල තිබීම; අවම ආක්‍රමණශීලී තත්ත්වයක් සහිත ක්‍රියාමාර්ග, අපයෝජනයට එරෙහිව ප්‍රමාණවත් තරමින් ආරක්ෂක ක්‍රමෝපායන් අන්තර්ගත කිරීම වැනි දේ අන්තර්ගත වේ. තෙයාකාර වන සියුම් පරීක්ෂණයේ

90 Sunday Times v. The United Kingdom (No. 1) App. No. 6538/74 (ECtHR, 26 April 1979), අවධාරණය එක් කරන ලදී. කෙසේවෙතත්, යුරෝපීය මානව හිමිකම් කොමිසම, "මෙම ප්‍රතිවිපාක නියත වශයෙන්ම නිශ්චිතව කල් ඇතිව දැකීම අවශ්‍ය නොවේ: අත්දැකීම්වලින් පෙනී යන්නේ එය එසේ නොවන බවයි. නැවතත්, නිශ්චිතභාවය වඩාත් සුදුසු වුවත්, එහි භාවිතය අධික අනම්‍යශීලීබවක් ඇති කළ හැකි අතර නීතියට වෙනස්වන වාතාවරණය අනුව හැඩ ගැසීමට හැකි විය යුතු වේ. නැවතත්, නිශ්චිතභාවය වඩාත් සුදුසු වුවත්, එහි භාවිතය අධික අනම්‍යශීලී බවක් ඇති කළ හැකි අතර නීතියට වෙනස්වන වාතාවරණය අනුව හැඩ ගැසීමට හැකි විය යුතු වේ. ඒ අනුව, බොහෝ නීති අනිවාර්යයෙන් ම අපහැදිලි වන ලෙස හා ඒවායේ අර්ථ නිරූපණය සහ භාවිතාව ප්‍රායෝගිකත්වය පිළිබඳව ප්‍රශ්න ගෙන එනු ලබන ලෙස අඩු වැඩි වශයෙන් ප්‍රකාශ කරනු ලැබේ." යි ප්‍රකාශ කළේය (එම) ඒවාගේ ම බලන්න. Ontario Film and Video Appreciation Society v. Ontario Board of Censors (1983) 31 O.R. (2d) 583 (Ont. H.C.), පිටුව. 592: "නීතිය නොපැහැදිලි, නිර්වචනය කළ නොහැකි හා සම්පූර්ණයෙන්ම අභිමතානුසාරී නොවිය හැකි බව පිළිගනු ලැබේ; එය තේරුම්ගත හැකි මෙන්ම දැනගත හැකි විය යුතුයි. අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස මත ඇති කරනු ලබන සීමාවන් නිලධාරියකුගේ අතට පමණක් දැරිය නොහැකිය; එවැනි සීමාවන් යම් නිරවද්‍යතාවයකින් යුතුව ප්‍රකාශ කළ යුතුය හෝ ඒවා නීතිය ලෙස සැලකිය නොහැකිය."

91 Kolender v. Lawson 461 U.S. 352, 357 (1983).

ඕනෑම අංගයක් තෘප්ත කිරීමට අසමත් වුවහොත් මානව අයිතිවාසිකම් නීතිය යටතේ එයට අවසර දෙනු නොලැබේ.

මේ අනුව, මෙම ප්‍රතිපාදනයේ වැදගත්කම නම් පුද්ගලයෙකුගේ හැසිරීම්, වදන් ආදිය මූලික අයිතිවාසිකම් මගින් ආරක්ෂා කරන අවස්ථාවන්වලදී පවා රජයට ඒවා අපරාධ නීතිය, සිවිල් නීතිය හෝ පරිපාලනමය ක්‍රියාවන් හරහා පවා සීමා කළ හැකි වීමයි. කෙසේවුවද නීත්‍යානුකූල ලෙස සලකනු ලැබීමට එවැනි සීමාවන් ඉහත සඳහන් කරන ලද නිර්ණායක තුන තෘප්ත කිරීම අවශ්‍ය වේ.

**16 වන වගන්තිය**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මානව අයිතිවාසිකම් රාමුවේ පවතින ප්‍රධාන සීමාව වන්නේ, 16 සහ 80(3) වගන්ති හරහා හිමිකම් කඩකිරීමේ නීති සම්පාදනය "නෛතික අවලංගු කිරීම" අවහිර කිරීමයි. එනම්, මූලික අයිතිවාසිකම්වලට පටහැනියැයි හඳුනා ගන්නා නීති "ඉවත් කිරීම" උසාවිවලට ඉඩදෙනු නොලැබේ.

කෙසේවෙතත්, ශ්‍රේෂ්ඨාධිකරණය මෙම සීමාවට සැලකිය යුතු අන්දමේ බලපෑමක් කර ඇත. උදාහරණයක් වශයෙන්, ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන ව්‍යවස්ථාවට අනුකූල නොවන බව ප්‍රකාශ කළ විටදී, එය අවලංගු කිරීමකින් තොරව එය බලාත්මක කිරීම ප්‍රතික්ෂේප කරන ලදී.[92] අහම්බෙන්මෙන්, එම නඩුව තුළ අභියෝගයට ලක් කරන ව්‍යවස්ථාපිත විධිවිධානය වන්නේ විවිධ සමාජ හා ලිංගික අනන්‍යතාවයන් සහිත ශ්‍රී ලාංකිකයින් අදාල වන දණ්ඩ නීති සංග්‍රහයේ 1995 දී සංශෝධිත විධිවිධානයේම කොටසක් වේ: වගන්ති 365 සහ 365A.

92 2008 ඔක්තෝබර් 15 වන දින තීරණය කරන ලද 2008 අංක 03 දරණ ශ්‍රේෂ්ඨාධිකරණයේ යොමු අංකය, වගන්තිවලට අනුගාමී සටහන් 102 සාකච්ඡා කර තිබෙන සිද්ධීන් බලන්න.

## ස්ථාවර නීති රාමුව

දණ්ඩ නීති සංග්‍රහයේ 365 හා 365A වගන්ති, LGBTQ ශ්‍රී ලාංකිකයින්ගේ මානව අයිතීන් සෘජුවම උල්ලංඝනය කරන නීති රැගත් පිරමීඩයේ ඉහළින්ම තිබේ. "ස්වභාව ධර්මයේ අනුපිළිවෙලට එරෙහිව සිදුකරන කායික සංසර්ගය" සහ "දැඩි අශිෂ්ට ක්‍රියාවන්" පිළිවෙලින් සාපරාධී වරදක්කොට සැලකීම යන විධිවිධාන අතිශයින්ම නොපැහැදිලි වන අතර ඔවුන්ගේ වයස, ඔවුන්ගේ සමාජභාවය හෝ ඔවුන් අතර එකඟතාවයක් පැවතුනේද යන කාරණා නොතකා බොහොමයක් ලිංගික ක්‍රියාවන් ග්‍රහණය කරගන්නා බව පෙනේ. 365A වගන්තිය, ක්‍රියාවක් කිරීමට පැවරීම පමණක් නොව මිලදී ගැනීම සහ එවැන්නක් කිරීම සඳහා උත්සාහ කිරීම යන කාරණාවන් ද අන්තර්ගතව විශේෂයෙන් ම පුළුල් වේ. සාපරාධී ලෙස සමහර ලිංගික ක්‍රියා අනුමත කිරීම මගින්, පුද්ගලයින් ඔවුන්ගේ අනන්‍යතාවය ප්‍රකාශ කරන ආකාරය, ඔවුන් ඔවුන්ම ලිංගිකව ප්‍රකාශ කරන ආකාරය සහ ඔවුන් සමීප සබඳතා පවත්වා ගන්නේ කා සමගද යන්න ගැන විධිවිධාන සෘජුවම මැදිහත්වීම් කරයි.

ඒවා අනෙක් නීතිවලටද අනිසි බලපෑම් එල්ල කරයි. මෙය 1999 දී ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය 365A වගන්තිය යටතේ "දැඩි අශිෂ්ට ක්‍රියාවන්" ජනමාධ්‍යවේදීන් සඳහා වන ආචාර ධර්ම සංග්‍රහයේ 9 වන ව්‍යවස්ථාව යටතේ "පරපීඩාකාමීත්වය" අත්තනෝමතික ලෙස ඒකාබද්ධ කළ විටදී දැක ගැනීමට හැකි විය.[93] එම ක්‍රියාවට ගොදුරු වූ තැනැත්තා ස්ත්‍රියක් නම් අනිවාර්යය අවම දඬුවම ලිහිල් කරනු ලැබීමෙන් ද, එම ක්‍රියාවට ගොදුරු වූ තැනැත්තා පුරුෂයෙක් නම් දැඩි දඬුවම බලාත්මක කිරීමෙන් ද දණ්ඩ නීති සංග්‍රහය කැමැත්ත ලබා නොදුන්, සාහසික ලිංගික වැරදිවල නිරත වූ වැරදිකරුවන්ට එම ක්‍රියාවට ගොදුරු වූ තැනැත්තාගේ ලිංගත්වය පදනම් කරගෙන වෙනස් ලෙස සලකනු ලැබේ.[94] මෙහිදී, උසාවිය නැවතත් 365 සහ 365A වගන්ති සම්බන්ධයෙන් වෙනස් වන සැලකීම් සාධාරණීයකරණය කරමින් නොපැහැදිලි සමුද්දේශ සටහන් යෙදවීය. එහිදී නැවත වතාවක්, විධිවිධාන පිළිබඳව තීරණය ගන්නා ආයතනයේ අර්ථ නිරූපණය අත්තනෝමතික වූ අතර නීතිමය ද

93 බලන්න ඉහත වගන්තිවලට අනුගාමී සටහන් 25 සිට 28 දක්වා.

94 2013 මාර්තු 12 වන දින තීරණය කරන ලද 2013 අංක 17 දරණ ශ්‍රේෂ්ඨාධිකරණයට කරන ලද අභියාචනාව, 2014 ජූලි 16 වන දින තීරණය කරන ලද 2010 අංක 150 දරණ අභියාචනාධිකරණ යොමු අංකය

නොවීය.[95] ළමා අපයෝජන නීතිය බලාත්මක කිරීමේදී පවතින දඬුවම් පැනවීමේ විෂමතාවයන් ගැහැණු ළමුන් හා පිරිමි ළමුන් යන දෙකාණ්ඩයම වෙනස් කොට සලකයි.

365 හා 365A වගන්තිවලට අමතරව, ශ්‍රී ලංකාවේ ලිංගිකත්වයට සහ ලිංගික ප්‍රකාශනයට බලපාන අනෙකුත් නීති වන්නේ, අශ්ලීලත්වය, අසභ්‍ය භාෂාව සහ ප්‍රසිද්ධ රැගුම්පාලන නීති වේ. මෙම නීතිවල ප්‍රධානතම ලක්ෂණය වන්නේ, වරදේ විෂය පථය අර්ථ දැක්වීම නොකිරීම නොඑසේ නම්, එසේ කරනවිට, වරද පුළුල් හා හිස් භාෂාවකින් ප්‍රකාශ කිරීම වේ. 1927 අශ්ලීල ප්‍රකාශන ආඥාපනත, නිෂ්පාදනය, අයිතියේ තබා ගැනීම, ආනයනය හා අපනයනය, කරගෙන යාම, ව්‍යාපාරයක නිරතවීම හෝ අශ්ලීල ප්‍රකාශන තිබෙන බවට ප්‍රචාරණය කිරීම වරදක් බවට පත් කරයි. කෙසේවුවත්, මෙම පනත "අශ්ලීලත්වය" නිර්වචනය නොකරයි. 1958 අංක 41 දරණ අසභ්‍ය ප්‍රකාශන පනත ඕනෑම කතුවරයකුට, ප්‍රකාශකයකුට, මුද්‍රණකරුවකුට හෝ බෙදාහරින්නකුට ඕනෑම අසභ්‍ය ප්‍රකාශනයක් රචනා කිරීම, නිෂ්පාදනය, මුද්‍රණය, විකිණීම, බෙදාහැරීම හෝ ප්‍රදර්ශනය වරදක් බවට පත් කරයි. ඕනෑම ආගමක් ඇදහීමේදී අනුගමනය කිරීමට භාවිතා කරන ඕනෑම පුද්ගලයකු, පින්තූරයක්, සංකේතයක්, උපාංගයක් හෝ ශුද්ධ වූ ලෙස සලකන ඕනෑම දෙයක් සමච්චලයට භාජනය කරන ඕනෑම ආගමක, ආගමික විශ්වාසයක හෝ එවැනි නියෝජනයක අනුගාමිකයින් විසින් ඕනෑම ආගම් කතෘවරයකුට, දෙවියකුට, ශාන්තුවරයකුට හෝ ගරු සැලකිලි ලබන පුද්ගලයකුට අපහාසයක් අන්තර්ගත වන ඕනෑම පුවත්පතක්, පොතක්, පින්තූරයක්, චිත්‍රපටයක් හෝ වෙනත් දෘශ්‍ය නියෝජනයක් අසභ්‍ය ප්‍රකාශනයක් ලෙස නිර්වචනය කරනු ලැබේ.[96] නමුත්, නැවතත්, අසභ්‍යතාවය අර්ථ ගන්වා නොමැත.

මෙම නීතිවලින් එකක්වත් අන්තර්ජාලය පදනම් කරගෙන බලාත්මක කර නොතිබුණත් (පොදුවේ හෝ ඇතැම් අවස්ථාවන්වලදී) "ඒවායේ පැවැත්ම ම චකිතයන් ඇති කරනු ලැබේ."[97] අනෙක් කාරණාද

95 "365 සහ 365A වගන්ති, 'බරපතල ලිංගික අපයෝජනය සහ අස්වාභාවික වැරදි සංශෝධන සහිතව ඇතුලත් කිරීම සඳහා ප්‍රමාණවත් තරමින් පුළුල් [කර තිබේ]''. එවැනි මානසික ආබාධයන් නිසාවෙන් හටගන්නා වැරදි නිසාවෙන් ප්‍රධාන වශයෙන් සමාජය ආරක්ෂා කිරීමට අපරාධයේ බරපතල ස්වභාවය සැලකිල්ලට ගෙන කිසිම නඩුවක් සඳහා මේ උසාවියට කිසිඳු ආකාර වූ ලිහිල්භාවයක් පෙන්විය නොහැකි වේ." (2013 මාර්තු 12 වන දින තීරණය කරන ලද 2013 අංක 17 දරණ ශ්‍රේෂ්ඨාධිකරණයට කරන ලද අභියාචනාව, ඉහත 102 සටහන බලන්න).

96 සාමාන්‍යයෙන් බලන්න, (2011, November). Freedom of Expression on the Internet in Sri Lanka. Colombo: Centre for Policy Alternatives, 25-26. www.cpalanka.org/freedom-of-expression-on-the-internet-in-sri-lanka/

97 එම.

ඇතුළත් ව මානව අයිතිවාසිකම් සීමා කරන නීති ප්‍රවේශවියහැකි මෙන්ම කල්තබා දැනගත හැකි විය යුතු වේ. එවිට, නීතියේ බලපෑමට ලක්වූවන්ට එම නීතිමය බැඳීම්වල ප්‍රමාණය දැනගත හැකි වේ. කෙසේවෙතත්, ඉහත සාකච්ඡා කරන ලද නොපැහැදිලි නීතිමය විධිවිධානයන්ගේ ජාලය සම්බන්ධව ගතහොත්, බොහොමයක් LGBTQ ශ්‍රී ලාංකිකයින් "සමලිංගිකත්වය" තහනම් කිරීමේ නිශ්චිත විෂය පථය ගැන නොදැන සිටී. එපමණක් නොව, අන්තර්ජාලය සම්බන්ධයෙන් නීතිවල වියහැකි භාවිතාවේ නොපැහැදිලි බවක් ද පවතීඃ සඳහන් කරන ලද සියලුම විධිවිධාන "යෙදෙනවා", "මිලදී ගන්නවා", වැනි වදන් සඳහන් කර තිබුණි. අන්තර්ජාලය අවකාශය තුළ සිදුවන හමුවීම් හා ප්‍රකාශනයන් සඳහා මෙම භාෂාව භාවිතා කරනු ලබන්නේ කෙසේද යන්න නොපැහැදිලි වේ.

නොපැහැදිලිතාවය, වරණාත්මක ආකාරයට නීතිය බලාත්මක කිරීමටත් අපහරණය කිරීමටත් හැකි කරවන ආකාරයෙන් නීතිය බලාත්මක කරන නිලධාරීන්ට පුළුල් අභිමතානුසාරී බලයක් ලබා දේ. පෙර සඳහන් කළ පරිදි, සුවිශේෂී වූ සීමාවක් අපහරණය කිරීමට එරෙහිව ප්‍රමාණවත් වන ආකාරයේ ආරක්ෂාවක් පැවතීම තෙයාකාර වන සියුම් පරීක්ෂණය යටතේ අවශ්‍යතාවයක් වේ. පැහැදිලිතාවය හා විධිවිධානාත්මක ආරක්ෂාව එකට ගත් විට, පුරවැසියන්, ඔවුන්ගේ නීතිමය බැඳීම් ගැන දැනගන්නා අතරම එම නීතිමය බැඳීම් සියලුම පුරවැසියන්ට සාධාරණව හා සමානාත්මතාවයෙන් යුක්තව බලාත්මක කරන බව තහවුරු කරනු ලැබේ. කෙසේවුවත් අපයෝජනයට එරෙහිව කිසිඳු ආරක්ෂාවක් නොමැති විධිවිධානාත්මක රාමුවක් යටතේ ක්‍රියාත්මක වන සැක සහිත නීති එම නීතිවල ඇති නොපැහැදිලිතාවයේ පීඩාකාරී බලපෑම් සමග සම්මිශ්‍රණය වේ. LGBTQ ශ්‍රී ලාංකිකයින් ඔවුන්ගේ බැඳීම්වල ප්‍රමාණය නොදන්නවා පමණක් නොව ඔවුහු නිරන්තරයෙන් පූර්ව දැනුම් දීමකින් තොරවූ හෝ අධිකරණමය අධීක්ෂණයකින් තොර වූ නීත්‍යානුකූල සුපරීක්ෂාකාරීත්වයේ තර්ජනයට යටත් වෙති.

## විධිවිධානාත්මක නීති රාමුව

විශේෂයෙන්ම ඩිජිටල් යුගයේදී පුද්ගලිකත්වයට ඇති අයිතිය සම්බන්ධයෙන් පුද්ගලයන්ගේ අන්තර්ජාල ක්‍රියාකාරකම් පිළිබඳව විමර්ශනයන්හි හා මුරකිරීමේ යෙදීමට රාජ්‍යයට ඇති බලයන් අන්තර්ජාල අයිතිවාසිකම්වල වැදගත් අංශයක් වේ. රාජ්‍ය බලයේ මෙම අංශය පාලනය කිරීමට ඒකාබද්ධ වූ නීති නොමැත. අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ සයිබර් අපරාධ අංශයේ නිලධාරියෙක් මෙන්ම ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් යනාදී වශයෙන් වූ සම්මුඛ සාකච්ඡා පැවැත් වූ ප්‍රධාන තොරතුරු සපයන්නන් විසින් 2007 අංක 24 දරණ පරිගණක අපරාධ පනත සහ අපරාධ නඩු විධාන සංග්‍රහය යන නීති අන්තර්ජාල අපරාධ විමර්ශනයේදී පොලීසියේ විධිවිධාන බලය පාලනය කරන නීති ලෙස සඳහන් කරන ලදී. ඔවුන් දෙදෙනාම, පරිගණක අපරාධ පනත මගින් අන්තර්ජාලය තුළ සිදුවන අපරාධ විමර්ශනය කිරීම සඳහා අවශ්‍ය බලය ලබා දී ඇති බවත් එය සයිබර් අපරාධ සම්මුතියට (ශ්‍රී ලංකාව රාජ්‍ය පාර්ශවයක් වන) අනුකූල වන බවත් ප්‍රකාශ කර ඇත.

1889 දී ශ්‍රී ලංකාවේ මුලින් ම පනවන ලද අපරාධ නඩු විධාන සංග්‍රහය අපරාධකාරී කටයුතුවලට අදාල වන සාමාන්‍ය පටිපාටිය සපයයි. සංග්‍රහය විවිධාකාර වූ විමර්ශන බලතල සපයන අතර "ලේඛන සහ වෙනත් දේවල්" සෙවීම සඳහා වන විධිවිධාන වර්තමාන සාකච්ඡාවට වඩාත් අදාල වේ: පළමුවෙන්ම, 66(1) වගන්තිය යටතේ, යම් අදාල උසාවියක් ඕනෑම පුද්ගලයකුට "අපරාධ නඩු විධාන සංග්‍රහය යටතේ යම් නඩු කටයුත්තක කාර්යය සඳහා යම් ලේඛනයක් හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කිරීම අවශ්‍ය යයි හෝ යෝග්‍ය යයි" සලකන විටදී ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. දෙවනුව, 67(1) වගන්තිය යටතේ, ඕනෑම උසාවියකට අවශ්‍ය නම්, තැපැල් සහ විදුලිසංදේශ දෙපාර්තමේන්තුවෙන් "යම් පොතක්, ලිපියක්, තැපැල් පතක්, විදුලි පණිවිඩයක් හෝ වෙනත් ලේඛනයක්" "අපරාධ නඩු විධාන සංග්‍රහය යටතේ යම් විමර්ශනයක් හෝ නඩු කටයුත්තක්" සඳහා ඔවුන්ගේ භාරකාරත්වයට ලබා දීමට විධානය කළ හැකි වේ.

මෙම පසුව සඳහන් කරන ලද බලය උසාවියේ පූර්ණ අධිකරණමය බලයට සීමා නොවේ: 67(2) වගන්තිය යටතේ නීතිපතිවරයාට හෝ අධිකාරී ශ්‍රේණියේ පොලිස් නිලධාරියා/ඉන් ඉහළ ඕනෑම පොලිස්

නිලධාරියෙකුට විදුලි සංදේශ බලධාරීන්ගෙන්" "ලේඛන" ඒ ආකාරයෙන් ලබා දීම අවශ්‍ය විය හැකි වේ. 66 සහ 67 වගන්ති විදහා දක්වන ආකාරයට උසාවියට හෝ වෙනත් විමර්ශන නිලධාරියෙකුට අදාල ආයතනවලින් විමර්ශනය කිරීමේ අරමුණ සඳහා ලේඛනගත කිරීම් හෙළි කිරීම අවශ්‍ය විය හැකිය. මෙම පියවරවලට අනුකූල නොවූයේ නම් පමණක් උසාවියක් මගින් සාක්ෂි ලේඛන සොයා ගැනීම හෝ අත් අඩංගුවට ගැනීම සඳහා සෙවුම් වරෙන්තුවක් නිකුත් කරනු ලබයි.

2007 අංක 24 දරණ පරිගණක අපරාධ පනත අනවසරෙන් ඇතුළුවීම සම්බන්ධ අපරාධ, පරිගණකය වෛරස් මගින් ආසාදනය කිරීම, අවසර නොලත් දත්ත අන්තර්-නිරෝධායනය (unauthorized interception of data) ආදිය වැනි සුවිශේෂී වැරදි රැසක යෝජනා ක්‍රමයක් ලබා දේ. පනතේ 2 වන වගන්තිය එය පනතේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් පමණක් භාවිතා වන බව සඳහන් කර ඇත. ඉන්පසුව ඇති විධිවිධාන විමර්ශනාත්මක බලය විශේෂකොට දක්වයි. "ඕනෑම සේවා සපයන්නෙක් සතුව පවතින ග්‍රාහක තොරතුරු හා හුවමාරුවන දත්ත ඇතුලත්ව ඕනෑම තොරතුරක් ලබා ගැනීම"[98] හා "ග්‍රාහක තොරතුරු හා හුවමාරුවන දත්ත ඇතුලත්ව සන්නිවේදන ක්‍රියාවලියේ ඕනෑම අවධියකදී කම්බි හරහා කෙරෙන හෝ විද්‍යුත් සන්නිවේදනය අන්තර්-නිරෝධනය කිරීම"[99] ට ඇති හැකියාව වැනි බලයන් එබඳු බලතලවලට ප්‍රධාන උදාහරණ වේ. මහේස්ත්‍රාත්වරයකුගේ වරෙන්තුවක් යටතේ එවැනි තොරතුරු විමර්ශකයකුට ප්‍රවේශ කළහැකි වීම සාමාන්‍ය නීතිය වුවත්, නිදසුනක් වශයෙන්, "පවත්වනු ලැබීමට අවශ්‍ය විමර්ශනයේ හදිසිභාවය" හෝ "විමර්ශනය සම්බන්ධයෙන් රහස්‍යභාවය ආරක්ෂා කරගැනීමේ අවශ්‍යතාව"[100] ඇති බව විමර්ශකයෙක් විශ්වාස කරන්නේ නම් මෙම අවශ්‍යතාවය ඒකපාර්ශ්වීයව මගහැරවිය හැකිය (මෙහි මින් මතු 'බරපතලකම ලිහිල් කරන අවස්ථාවන්' ලෙස සඳහන් කරනු ලැබේ). 21(1) වගන්තිය "මේ පනත යටතේ විමර්ශන ක්‍රියාවලියක දී යම් පොලිස් නිලධාරියෙකුට නීතියෙන් විධිවිධාන සලස්වා ඇති ආකාරයට ඕනෑම තොරතුරක් ඕනෑම ස්ථානයකට ප්‍රවේශ වී අත්අඩංගුවට ගැනීමේ, සෝදිසි කිරීමේ හෝ තොරතුරු තහනමට ගැනීමේ බලතල" ලබා දේ. සුදුසුකම් ලැබෙන අවශ්‍යතාවය වන්නේ එවැනි පොලිස් නිලධාරියකු පොලිස්පතිවරයා

98 පරිගණක අපරාධ පනත 18(1)(i) වගන්තිය.

99 පරිගණක අපරාධ පනත 18(1)(ii) වගන්තිය.

100 පරිගණක අපරාධ පනත 18(2)(A) වගන්තිය.

විසින් "තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් සහ කුසලතාවක් දරන බවට සහ එහෙයින් එවැනි කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය ප්‍රවීනත්වය ලබා ඇති බවට"[101] සහතික කිරීම වේ. 24(1) වගන්තියට අනුව විමර්ශනයේ යෙදී සිටින සියලුම නිලධාරීන් විමර්ශන අතරතුරදී දැනගන්නා "සියලු තොරතුරු අතිශයින්ම රහසිගතව පවත්වා ගැනීම"[102] අවශ්‍ය වේ.

පුද්ගලිකත්වයට ඇති අයිතියට ගරු කිරීම පිණිස, රාජ්‍යයේ සියලුම සුපරීක්ෂාකාරීත්වයේ බලය අපරාධ නඩු විධිවිධාන සංග්‍රහය හෝ පරිගණක අපරාධ පනත යටතේ අවම නිර්ණායක තෘප්තකර තිබිය යුතු වේ. එවැනි එක් නිර්ණායකයක් වන්නේ තනි පුද්ගල මානව අයිතිවාසිකම් සීමා කිරීමේදී රජය සමානුපාතික වීම යි. කෙසේවෙතත්, අපරාධ නඩු විධිවිධාන සංග්‍රහය හෝ පරිගණක අපරාධ පනත යන ද්විත්වයටම විමර්ශනය සඳහා අරමුණු කරගත් අවශ්‍ය කරනු ලබන තොරතුරු පමණක් සොයනු ලැබේ. සොයනු ලබන පුද්ගලයා වරදකට සැක කරනු ලබන පුද්ගලයෙක්ද විමර්ශනය සඳහා විකල්ප ක්‍රම භාවිතය, සුපරීක්ෂාකාරී ක්‍රියාමාර්ගයේ විෂය පථය හා විමර්ශනයට අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩි තොරතුරු ප්‍රමාණයකට ප්‍රවේශය ලබා ගැනීම වැනි දේ ගැන සලකා බැලීම ව්‍යවස්ථානුකූලව ප්‍රකාශිතව අවශ්‍ය නොවේ.

මුරකිරීම් ක්‍රියාමාර්ගයන් හා සම්බන්ධ වන ඕනෑම නඩු තීරණවලට අධිකරණමය අතපසුවීම් තිබිය හැකි බව වෙනත් නිර්ණායකයක් වේ. ඉහත දක්වා ඇති පරිදි, අපරාධ නඩු විධිවිධාන සංග්‍රහය යටතේ, එළිදරව් කිරීමට නියෝගයක් නිකුත් කිරීමේ දී අධිකරණමය අතපසුවීම් සිදුවීමේ නියෝග "පුද්ගලයකුට" පමණක් යොමු කරන විටදී පමණක් අනිවාර්යය වේ. නීතිපතිවරයාට හෝ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියකුට අධිකරණමය අතපසුවීමකින් තොරව තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුවට ඔවුන් භාරයේ පවතින ලේඛන සෘජුවම බාරදීමට නියෝගයක් නිකුත් කළ හැකිය. ඕනෑම සිද්ධියකදී අදාළ පුද්ගලයා හෝ දෙපාර්තමේන්තුව උසාවියක් හෝ පොලිස් නිලධාරියෙක් හෝ නීතිපතිවරයා විසින් නිකුත් කරන ලද මූලික නියෝගයට අනුකූලවීම ප්‍රතික්ෂේප කළහොත් පමණක් සෝදිසි කිරීම හෝ අල්ලා ගැනීමට බලකිරීම සඳහා "වරෙන්තුව" ක් අවශ්‍ය වේ. උසාවිය නියෝගයක් නිකුත් කරන අවස්ථාවකදී පවා, අපරාධ නඩු විධිවිධාන පනත උසාවිවලට විමර්ශනයක අරමුණ සඳහා මිණුම්

101 පරිගණක අපරාධ පනත 21(2) වගන්තිය.
102 පරිගණක අපරාධ පනත 18(2)(C) වගන්තිය.

දඩුවේ ඇති අවශ්‍යතාවය ඇගයීම අනිවාර්යය කරයි. පුළුල්ව සලකා බලනවිට, එම පියවරයන්ගේ බලපෑමට ලක්වූ පුද්ගලයන්ගේ මානව අයිතිවාසිකම් අන්තර්ගත කිරීමේ නීතිය යටතේ පැහැදිලිවම අවශ්‍ය නොවේ. ඊට වෙනස්ව, බරපතලකම ලිහිල් කරන අවස්ථාවන් සඳහා හේතු ඉදිරිපත් කිරීම මගින් "පුද්ගලයින්" වශයෙන් සලකන විටදී පවා පරිගණක අපරාධ පනත යටතේ, විමර්ශකයෙකුට අධිකරණමය අතපසුවීම් සම්පූර්ණයෙන්ම මගහැරිය හැකිය. තවද, පරිගණක අපරාධ පනත තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුව සඳහන් නොකළද එය පැහැදිලිවම "සේවා සපයන්නන්" හඳුනා ගනු ලැබේ. මෙය අපරාධ නඩු විධිවිධාන සංග්‍රහය යටතට වඩා ඍජුවම, අන්තර්ජාල සේවා සපයන්නන්ට නියෝග එලිදරව් කිරීම සඳහා අධිකරණමය අතපසුවීමක් හෝ දෙපාර්තමේන්තු මැදිහත්වීමක් නොමැතිව බරපතලකම ලිහිල් කරන අවස්ථාවන් ඇති නම්, එසේ කිරීමට පොලිස් නිලධාරීන්ට පුළුල් බලයක් ලබා දේ. එවැනි අවස්ථාවන්හිදී අධිකරණමය ප්‍රතිකර්ම සඳහා ඇති එකම මාර්ගයට බරපතලකම ලිහිල් කරන අවස්ථාවන් පිළිබඳව පොලිස් නිලධාරීන් විසින් සිදු කරනු ලබන ඇගයීම අභියෝගයක් වන බව පෙනේ.

අන්තර්ජාල අතරමැදියන් හා සම්බන්ධ වන ගැටලු ආමන්ත්‍රණය කරන හෙයින්, පරිගණක අපරාධ පනත යටතේ "සේවා සපයන්නන්" හඳුනා ගැනීම තීරණාත්මක සංවර්ධනයකි. අපරාධ නඩු විධිවිධාන සංග්‍රහය යටතේ, අන්තර්ජාල සේවා සපයන්නන් "පුද්ගලයා" යන සාමාන්‍ය පාරිභාෂික වදන යටතට ගෙන සලකා බැලිය හැකි අතර එහිදී ඔවුන්ගෙන් "ලේඛන" ඉදිරිපත් කිරීම උසාවියකට පමණක් අවසර ලබා දී තිබේ; නීතිපතිවරයා හෝ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීවරයකුට මෙම අර්ථකථනය යටතේ අන්තර්ජාල සේවා සපයන්නන් හෙලිකිරීමට ඍජුවම නියෝග දෙනු නොලැබේ.

අනෙක් අතට, අන්තර්ජාල සේවා සපයන්නකුගේ ග්‍රාහක දත්ත "තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ" "භාරකාරත්වයේ" පවතින "ලේඛන" ලෙස සලකා බැලිය හැකි වේ. එවැනි අවස්ථාවන්වලදී, නීතිපතිවරයාට හෝ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියකුට විදුලි සංදේශන නියාමන කොමිෂන් සභාවෙන් අධිකරණමය අතපසුවීමකින් තොරව අන්තර්ජාල සේවා සපයන්නකු විසින් ලේඛන ඉදිරිපත් කිරීමට බලකිරීමට පුළුවනි.

මෙම ප්‍රවේශයන් දෙකින් කුමක් හෝ යටතේ, අන්තර්ජාල සේවා සපයන්නකුට පොලීසිය විසින් සෝදිසි කිරීමට හෝ අල්ලා

ගැනීමට වරෙන්තුවක් ඉදිරිපත් කරන ලෙසට අවධාරණය කරමින් එවැනි ඉල්ලීමකට අනුකූල වීම ප්‍රතික්ෂේප කළ හැකිය. අන්තර්ජාල සේවා සපයන්නකුට නීතිය බලාධාරීත්වයේ යොදවන නිලධාරීන්ට ඉල්ලන ලද තොරතුරු වැඩිදුර අධිකරණමය සමාලෝචනයක් අවධාරණය කිරීමෙන් තොරව සහයෝගය දැක්වීම ද තෝරාගත හැකිවේ. අපරාධ නඩු විධිවිධාන සංග්‍රහය යටතේ සිදු කරන ලද නියෝගයකින් පීඩාවට පත් පාරිභෝගිකයින් අදාල අන්තර්ජාල සේවා සපයන්නා විසින් දැනුවත් කිරීම වළක්වා නොමැත. නමුත් එවැනි දැනුවත් කිරීමක් අනිවාර්යය ද නොවේ. පරිගණක අපරාධ පනත යටතේ, බරපතලකම ලිහිල් කරන අවස්ථාවන් ඉදිරිපත් කිරීම මගින් පොලීසිය ඒකපාර්ශ්වික ලෙස අධිකරණමය අතපසුවීම් ප්‍රතික්ෂේප කරන අවස්ථාවන්වලදී අන්තර්ජාල සේවා සපයන්නන් ඍජුවම පොලිසියේ බලය යටතේ වන අතර එමගින් හෙළිදරව් කිරීම් කිරීම සඳහා පොලිසියේ අණට අනුකූලවීමට බැඳී සිටිනවා පමණක් නොව සිදුවෙමින් පවතින පරීක්ෂණවල රහස්‍යභාවය රැකීමටද බැඳී සිටී. පරිගණක අපරාධ පනතේ 24(3) වගන්තිය විසින් විමර්ශනයේ අරමුණ උදෙසා නීතිය යටතේ ඔවුන් කරනු ලබන ඕනෑම හෙළිදරව් කිරීමකට සේවා සපයන්නන් වගකීමෙන් නිදහස් කරනු ලැබේ.

සංසන්දනාත්මකව බලනවිට, පරිගණක අපරාධ පනත පොලීසියට අපරාධ නඩු විධිවිධාන සංග්‍රහයට වඩා විමර්ශනයන්හිදී ඉතාමත් පුළුල් විමර්ශන බලතල ලබා දේ. සමහරවිට මෙම හේතුව නිසාවෙන්, නිශ්චිත බලතල හිමිවන්නේ එම පනත යටතේ අර්ථ දක්වා ඇති වැරදිවලට පමණකි. කෙසේවෙතත්, අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ සහ ජාතික ළමා ආරක්ෂණ අධිකාරියේ නිලධාරීන් සමග කරන ලද සම්මුඛ සාකච්ඡාවලට අනුව, පරිගණක අපරාධ පනත ලෙස අපරාධ නීතියේ විශේෂ ක්ෂේත්‍රයක් සඳහා විශේෂ විමර්ශනාත්මක රාමුවක් ස්ථාපිත කිරීමට වඩා අපරාධ නඩු විධිවිධාන සංග්‍රහය යටතේ හඳුනා ගන්නා බලයන්ගෙන් පරිගණක අපරාධ පනත යටතේ හඳුනා ගන්නා බලය අදෘශ්‍යමාන වන බව පෙනේ. සම්මුඛ සාකච්ඡා අතරතුරදී, ඔවුන් දෙදෙනාගෙන් එක් අයෙකුටවත් අපරාධ නඩු විධිවිධාන සංග්‍රහයේ 66 හා 67 වගන්ති හා පරිගණක අපරාධ පනතේ 18 වන වගන්තිවලට අදාල අන්තර්ගතය සිහියට නැගීමට නොහැකි විය.

## විදුලි සංදේශ නියාමන රාමුව

විවිධ ආඥාපනත් "තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුව" පාලනය කරන ආකාරය සම්බන්ධව සියුම් වෙනස්කම් තිබුණද සම්මුඛ සාකච්ඡාවට සහභාගී වූවන්ට මෙන්ම සම්මුඛ සාකච්ඡාවට සහභාගී වූ අන්තර්ජාල සේවා සපයන්නකුගේ ජ්‍යෙෂ්ඨ නිතී නිලධාරියාටද අන්තර්ජාල සේවා සපයන්නන් සම්බන්ධයෙන් භාවිතාවේ පවතින විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නියාමන බලයෙහි විෂය පථය පැහැදිලිව හඳුනා ගැනීමට නොහැකි විය. අපරාධ නඩු විධිවිධාන සංග්‍රහයේ සඳහන් වන 1896 ප්‍රථමයෙන් පිහිට වූ "තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුව" ඒ ආකාරයෙන් ම 1980 දී එහි කේන්ද්‍රීය අංශ වන තැපැල් සහ විදුලිසංදේශ යනුවෙන් වෙන් කරන තෙක් දක්වා ක්‍රියාත්මක විය. 1991 දී, විදුලි සංදේශ දෙපාර්තමේන්තුව "ශ්‍රී ලංකා ටෙලිකොම් නම් වූ රජය විසින් හිමිකාරිත්වය දරන රජයේ සංස්ථාවක් බවට තවදුරටත් පරිවර්තනය කරන ලදී".[103] ඒ අතරම "නියාමන සේවය කිරීම විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල් කර්යාලයක් පිහිටු වන ලදී".[104] 1996 දී, අධ්‍යක්ෂ ජනරාල්ගේ කාර්යාලය ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව නමින් ප්‍රතිව්‍යුහගත කරන ලදී.

සම්මුඛ සාකච්ඡාවට සහභාගී වූවන් මෙන්ම සම්මුඛ සාකච්ඡාවට සහභාගී වූ අන්තර්ජාල සේවා සපයන්නකුගේ ජ්‍යෙෂ්ඨ නිතී නිලධාරියා විසින් අන්තර්ජාල සේවා සපයන්නාට ලබා දෙන නියෝග යකින් හෝ විදුලි සංදේශ කොමිෂන් සභාව හරහා අන්තර්ජාල සේවා සපයන්නාට ලබා දෙන නියෝගයකින් සෘජුවම ග්‍රාහක දත්ත ලබා ගත හැකි බව පෙන්වා දෙන ලදී. මෙහිදී අනුගමනය කරනු ලබන ප්‍රවේශය ඒ ඒ සිද්ධියේ වාතාවරණය අනුව සිදු වන අතර එම ප්‍රවේශය තෝරා ගැනීමට මගපෙන්වීම සඳහා පැහැදිලි රාමුවක් නොමැත.

සම්මුඛ සාකච්ඡාවලට සහභාගී වූ කිසිඳු කෙනෙකුට මෙම බලයන් භාවිතා කරන නීතිමය ප්‍රතිපාදන සුවිශේෂිකොට දැක්වීමට නොහැකි විය. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව පිහිටුවන 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත එහි 5 වගන්තියේ කොමිසමේ බලයන් හා කාර්යයභාරය විස්තර කරයි. පනතේ 5(f) වන වගන්තිය "රටේ ආරක්ෂාව, මහජන සාමය හා

103 Gunawardane & Wattegama, ඉහත සඳහන් කරන ලද කෘතිය. පිටුව. 6.

104 එම.

ජාතික ආරක්ෂාව වෙනුවෙන් ශ්‍රී ලංකා රජය විසින් වරින් වර ලබා දිය හැකි සාමාන්‍ය හෝ විශේෂිත මාර්ගෝපදේශවලට අනුකූල වීම එවැනි පියවර ගැනීමට" කොමිසමට ඉඩ ලබා දේ. ඒවාගේම, 5(x) වගන්තිය "කොමිෂන් සභාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට හෝ මෙම පනත් යටතේ බලය හෝ රාජකාරී ඉටුකිරීම හෝ මුදාහැරීමට අහඹු විය හැකි හෝ අනුගතවිය හැකි ක්‍රියාවන්, ... සියල්ල කිරීමට" කොමිසමට බලය පවරනු ලැබේ. කොමිසම, 7(b) වගන්තිය යටතේ, ඕනෑම "පුද්ගලයකුට" "එම පුද්ගලයාගේ භාරයේ හෝ පාලනය යටතේ පවතින කොමිසමේ බලය, කෘත්‍යයන් හෝ රාජකාරී මුදාහැරීම, ක්‍රියාවේ යෙදවීම, කිරීමේ අරමුණ සඳහා ඕනෑම ලේඛනයක් කොමිසමට ඉදිරිපත් කිරීමට" අවශ්‍ය වේ. මෙම ප්‍රතිපාදන වලින් කිසිවක් (මෙම පනතේ අනෙක් කිසිම ප්‍රතිපාදනයක්) අන්තර්ජාල සේවා සපයන්නකුගේ ග්‍රාහක දත්ත විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හරහා සිදු කළ හැකි බව සුවිශේෂී ලෙස දක්වා නොමැත. කෙසේවෙතත් සම්මුඛ සාකච්ඡා අතරතුරදී එවැනි පුරුද්දක ඇති පැවැත්ම පැහැදිලිව ම ප්‍රකාශ කරන ලදී.

විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යයක් වන්නේ අන්තර්ජාල සේවා සපයන්නන්ට ක්‍රියාත්මක වීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම වේ. එබැවින්, බොහොමයක් අන්තර්ජාල සේවා සපයන්නන්ගේ නීතිමය පරිසරයේ ස්ථාවරත්වය විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සමග පවතින සබඳතාවය මත රඳා පවතී. සම්මුඛ සාකච්ඡාවට සහභාගී වූ අන්තර්ජාල සේවා සපයන්නකුගේ ජ්‍යෙෂ්ඨ නීති නිලධාරියෙක් මෙම ක්ෂේත්‍රය තුළ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට "පුළුල් අභිමතානුසාරී බලයන්" ඇති බව පිළිගත්තේ ය.

ග්‍රාහක දත්ත හෙළිදරව් කිරීමට ඇති නියෝගවලට අභියෝග කිරීමට ඒ ඒ සිද්ධියට සුදුසු වන ආකාරයේ නීතිමය ක්‍රියාවලියක් අවශ්‍ය වේ. අන්තර්ජාල සේවා සපයන්නන් මෙම ක්‍රියාවලිය, විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ දැඩි තරඟකාරී විදුලි සංදේශ සේවා වෙළඳ පරිසරය තුළ නොරිස්සුම් සහගත ලෙස සලකනු ලැබේ. මෙම කාරණය, පාරිභෝගිකයින්ට ඔවුන් භාජනය වී තිබෙන සුපරීක්ෂාකාරීත්ව ක්‍රියාමාර්ග පිළිබඳව දැනුවත් කිරීමේ නීතිමය අවශ්‍යතාවයක් නොමැති වීමත් සමග එක් වූ විට, අන්තර්ජාල සේවා සපයන්නන් එම ඉල්ලීම්වලට සරලවම අනුකූලතාවය දක්වන බව තහවුරු කරයි.

## ආරක්ෂණය සඳහා ධනාත්මක ප්‍රතිසංස්කරණවල ඇති අවශ්‍යතාවය

ඉහත දක්වා ඇති පරිදි, ශ්‍රී ලංකාව තුළ, සුපරීක්ෂාකාරීත්වය සඳහා වන විධිවිධානාත්මක සහ නියාමන රාමුවෙහි පවතින දුර්වලතාවයන්ගේ බොහොමයක් පැති පදනම් කරගෙන බලනවිට, අන්තර්ජාල අවකාශය අත්තනෝමතික ප්‍රතිපත්ති සම්පාදනයේ පැහැදිලි අවදානමට ලක්වේ. මෙම දුර්වලතාවයන් බොහොමයක් ශ්‍රී ලාංකිකයින්ගේ අන්තර්ජාල අයිතිවාසිකම්වලට බලපෑමක් වේ. කෙසේවෙතත් දණ්ඩ නීති සංග්‍රහයේ 365 හා 365A වගන්ති (එම නීතිවල අත්තනෝමතික අර්ථ නිරූපණ) වෙනත් නීති හා ආයතන සමග විවිධ පැතිවලින් LGBTQ ශ්‍රී ලාංකිකයින් ඔවුන්ගේ සමාජ-දේශපාලනික ජීවිතය අවදානම් සහිත තත්ත්වයට පත් කිරීමට අන්තර්ක්‍රියා කරනු ලැබේ. අන්තර්ජාලය එවැනි එක් පැත්තක් බව ඔප්පුවේ. විශේෂයෙන්ම අශ්ලීලත්වය හා අසභ්‍ය ප්‍රකාශන නීති වැනි ලිංගිකත්වය හා ලිංගික ප්‍රකාශනය පිළිබඳව විවිධ නොපැහැදිලි නීති රාශියක් පැවතීම මෙම අවදානම් සහගත බව සංකීර්ණත්වයට පමුණුවනු ලැබේ. ධනාත්මක ලෙස බලාත්මක කර නොමැති මෙම නීතී නොවැදගත් සේ පැවතීම මගින් තම අයිතිවාසිකම් ක්‍රියාවේ යෙදවීමට කැමැත්තෙන් සිටින LGBTQ ශ්‍රී ලාංකිකයින්ගේ සිත් තුළට අස්ථාවරභාවයක් හා බියක් කෙමෙන් ඇතුල් කරන අතර බොහොමයක් අන්තර්ජාල සන්දර්භයන්හි ස්වයං-වාරණයට සහ සහභාගී නොවී සිටීමට යොමු කරනු ලැබේ.

කෙසේවෙතත්, ශ්‍රී ලංකාවේ නීතිමය රාමුව පිළිබඳව පවතින විවේචන දැනට පවතින මානව අයිතිවාසිකම් උල්ලංඝනය කරන නීති පිළිබඳ සාකච්ඡාවකින් අවසන් නොවේ. මෙහිදී, මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා නොපවතින නීති පිළිබඳවද සටහනක් තැබීම වැදගත් වේ. අන්තර්ජාලය ස්වයං-ප්‍රකාශනය, තොරතුරුවලට ප්‍රවේශය හා සබඳතා ගොඩනැගීම සඳහා විශිෂ්ඨ වේදිකාවක් සැපයුවද එම භාවිතාවන් පරිශීලකයින්ට වේදිකාව තුළ සහභාගීවීමට හා යෙදීමට ඇති නිදහස මත තීරණය වේ. උක්ත අංශවල සඳහන් කර ඇති නීති වැනි අනවශ්‍ය ලෙස මානව අයිතිවාසිකම් සීමා කරන නීති ඉවත් කිරීම නිසැකවම අවශ්‍ය වේ. නමුත්, LGBTQ ශ්‍රී ලාංකිකයින් වැනි කොන්කරන ලද කණ්ඩායම්වල සහාගිත්වය හා ඔවුන්ගේ මැදිහත්වීම පහසුකරණය සඳහා නව නීති හා ප්‍රතිපත්ති ප්‍රසිද්ධ කිරීම අවශ්‍ය වේ.

නිදසුනක් වශයෙන්, අන්තර්ජාල සාකච්ඡාවන්ට විවෘතව සහභාගී වීමට ඇති වැදගත් බාධකයක් වන්නේ LGBTQ පුද්ගලයකුට එල්ලවිය හැකි වෛරී කථනය හා අපයෝජනයට ලක් වේ ය බිය වේ. එවැනි අවස්ථාවන්වලදී, සමාජභාවී අනන්‍යතාවය හෝ ලිංගික අනන්‍යතාවය පදනම් කරගෙන වෛරී කථනය ධනාත්මක ලෙස හඳුනාගන්නා සහ එවැනි වෛරී කථනයක් වඩාත් බරපතල අවස්ථාවන්ට එරෙහිව නඩු පැවරීමට භාවිතා කරන නීතීන් මගින් අන්තර්ජාල අවකාශයන් තුළ LGBTQ ශ්‍රී ලාංකිකයින්ගේ සහභාගිත්වය සහ යෙදීම වඩාත් ධෛර්යමත් කරන මෙන්ම එවැනි සිද්ධීන් වාර්තා කළ හැකි නීතියෙන් පිට යාමට හෝ අසාධාරණයට ඉඩක් නොමැති ප්‍රතිපත්තියක් සලකුණු කරාවි. අනෙක් අතට, විවිධ ප්‍රජාවන්ට එරෙහිව වෛරී කථනය පිළිබඳව සවිස්තරාත්මක නීතිවල හිඟකම මෙන්ම සමලිංගිකත්වය "සාපරාධී අපරාධයක් කරන" නීති අඛණ්ඩව පැවතීම, LGBTQ ශ්‍රී ලාංකිකයින් තුළ අපයෝජනය හා වෛරී කථනය පිළිබඳව බියක් ක්‍රමක්‍රමයෙන් සිතට ඇතුලු කිරීම පමණක් නොව ඒවා අපයෝජකයාගේ වදන් සහ ක්‍රියාවන් නීත්‍යානුකූල කිරීමටද දායක වේ.

අන්තර්ජාල අවකාශයෙහි සහභාගීවීමට ඇති තවත් බාධාවක් වන්නේ LGBTQ ශ්‍රී ලාංකිකයින් විසින් බෙදා ගන්නා හා ගබඩා කරන අන්තර්ගතයට අවශ්‍ය තරමේ ආරක්ෂාවක් නොමැති වීමයි. උදාහරණයක් වශයෙන්, ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකුට අනුව පෞද්ගලික අන්තර්ගතයන් අනවසරයෙන් බෙදාහැරීම ප්‍රමාණවත් තරමින් ආමන්ත්‍රණය කරන නීතිවල ඌනතාවය වැදගත් හිඩැසක් වේ. ජාතික ළමා ආරක්ෂක අධිකාරියට අනුව, නවයොවුන්වියේ පසුවන ගැහැණු ළමුන් ඔවුන්ගේ විවිධාකාර නග්න පින්තූර ඔවුන්ගේ "පෙම්වතුන්" සමග බෙදා ගන්නා සහ එම පින්තූර එම පෙම්වතුන් විසින් විශ්වාසය කඩ කරමින් ඔවුන්ගේ මිතුරන් අතරේ බෙදා ගන්නා හෝ විවිධ අසභ්‍ය වෙබ් අඩවිවලට පවා ඉදිරිපත් කරන සන්දර්භයක දී මෙම සංසිද්ධිය දකිනු ලැබේ.[105] මෙම අධ්‍යයනය සඳහා සම්මුඛ සාකච්ඡා පැවැත්වූ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරී විසින් කනස්සල්ලෙන් යුතුව කියා සිටියේ විසඳුම් ලබාගත හැකි එකම මාර්ගය නම් එවැනි සිද්ධීන්වල "අශ්ලීලත්ව" අංශය ගැන සම්පූර්ණයෙන් අවධානය යොමු කරන නමුත් අපයෝජනය,

105 මෙම සංසිද්ධිය පිළිබඳ දළ අදහසක් ලබා ගැනීම සඳහා බලන්න.
Billimoria, H. (2017, 27 January). Investigating Sri Lanka's nude culture. openDemocracy 50/50 available at: www.opendemocracy.net/5050/hans-billimoria/investigating-sri-lanka-s-nude-culture

සූරාකෑම හෝ වින්දිතයින් අත්විඳින ලද විශ්වාසය පළුදු කිරීම යන අංශය ගැන අවධානය යොමු නොකරන අශ්ලීල ප්‍රකාශන පනත (ඉහත සාකච්ඡා කරන ලද) බවයි. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය එම නීතිය සමීප රූප සම්බන්ධව සම්මුති විරහිතව බෙදාහැරීම හා විශ්වාසය පළුදු කිරීම ඉලක්ක කරගෙන ප්‍රතිසංස්කරණය කිරීමට ක්‍රියාකර ඇති අතර, අධිකාරිය එහි ළමා ආරක්ෂණය පිළිබඳව වන ව්‍යවස්ථාපිත බලතල අනුව සැලකිය යුතු ලෙස සීමා කර ඇත. විශේෂයෙන්ම මෙම අධ්‍යයනයේ සොයා ගැනීම්වලට අනුව, අදාල ප්‍රතිසංස්කරණ ළමුන්ගේ සන්දර්භයට පමණක් සීමා නොකර පුළුල් ලෙස හා සමානවම තෙවන පාර්ශවයක් විසින් නිර්මාණය කරන ලද සමීප අන්තර්ගතයන්[106] බෙදා හරින හෝ හෙළිදරව් කරන සියලුම පුද්ගලයින්ට ද භාවිතා කළ යුතු වේ.

106 NCPA. (2015, 18 June). Task Force to combat the growing threat to children. NCPA. www.news.lk/news/political-current-affairs/item/8260-task-force-appointed-to-combat-threat-to-children-via-social-media-sites

# දෙවන කාණ්ඩය

## සාම්ප්‍රදායික නොවන තාක්ෂණිකත්වය: සමලිංගික ස්ත්‍රීන් හා ඔවුන්ගේ අන්තර්ජාල අවකාශ භාවිතය

ආචාර්ය ශර්මාල් විජේවර්ධන සහ සුභා විජේසිරිවර්ධන

## හැඳින්වීම

අධ්‍යයනයෙහි මෙම කොටසෙහි පරමාර්ථය වන්නේ සමලිංගික ස්ත්‍රීන් අන්තර්ජාල අවකාශයෙහි නිමග්න වන ආකාරය සම්බන්ධයෙන් ‘සංගෘහිත’ වාර්තාවක් ඉදිරිපත් කිරීම වේ. මේ සඳහා වෙනමම අංශයක් වෙන් කිරීමේ තාර්කික පදනම දත්තවලින් ම මතුවිය. පංති හා වාර්ගික වැනි ස්වරූප පැවතිය ද සමලිංගික ස්ත්‍රීන්ගේ අන්තර්ජාල නිමග්නවීම සුවිශේෂී ආකාරයට සමාජභාවී හා ලිංගිකකරණයට භාජනය කරන ලද අත්දැකීම් වශයෙන් සැලකීමේ අවශ්‍යතාවය පෙන්වනු ලැබේ. අන්තර්ජාල අවකාශය සඳහා ඔවුනගේ ප්‍රවේශය, පුරුෂාධිපත්‍යයික හා විෂමලිංගික සමාජ පද්ධතියකින් ශබ්ද නඟා ආමන්ත්‍රණය කර සාකච්ඡා කරන අවබෝධය හරහා අනාවරණය කරගනු ලැබීය. මෙම අවබෝධය එයටම සුවිශේෂී වූ විශ්ලේෂණයක් කිරීම සඳහා අපව යොමු කරවනු ලැබීය.

අධ්‍යයනයේ පුළුල් රාමුවක් වශයෙන්, භාවිතය, ආරක්ෂණය හා ප්‍රවේශය යන රාමුගත කිරීම් තුනක් යටතේ සමලිංගික ස්ත්‍රීන්ගේ ප්‍රතිචාරයන් සාකච්ඡාවට බඳුන් කරනු ලැබේ. එයට අතිරේකව, මෙම විශ්ලේෂණය දත්ත මගින් උපදවන ලද බොහොමයක් ස්ත්‍රීන් මුරකිරීම යටතේ රඳවා තිබෙන බව අවධාරණය කරන යමක් උලුප්පා පෙන්වනු ලබයි. වෙනම රාමුගත කිරීමක් නොවේ නම්,

මෙය ආරක්ෂණය හා භාවිතය පිළිබඳව සාකච්ඡා කරන අවස්ථාවේ දී බොහොමයක් සහභාගිවූවන් කතා කරන ලද ප්‍රමුඛ හරස් කැපුමක් විදහා දක්වන තේමාවක් වූ අතරම එය එම රාමුගත කිරීම් දෙක අතර සියුම් වෙනස හුවා දැක්වීය.

මුරකිරීම, පාලනය කිරීමේ ඓතිහාසික මෙවලමක් වේ. එය ස්ත්‍රීන් විසින් සුවිශේෂි ලෙස අත්දකිනු ලැබේ. අන්තර්ජාල ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපෘතියේ ආචාර්යය අන්ජා කොවාක්ස් මෙසේ ලියයි.

'ඇත්ත වශයෙන්ම, ස්ත්‍රිය මුරකිරීමට ලක් කිරීම අනෙක් සෑම සමාජයකම මෙන්ම අපගේ සමාජයේ දීර්ඝ කාලයක සිට පැවත එන පුරුද්දක් වේ. එමෙන්ම සියලුම ආගම්, පංති හා කුලවලට අයත් ස්ත්‍රීන්ට ඔවුන්ට එය විවිධ ලෙස බලපෑවද හුරුපුරුදු අත්දැකීමක් වේ. සියවස් ගණනාවක් තිස්සේ මුරකිරීමට භාජනය වන තවමත් සමාජ ධර්මතාවයන්ගෙන් බැහැර වන අයවලුන්ට සිදුවන දේ පිළිබඳව තොරතුරු රැසක් ස්ත්‍රීන්ගේ අත්දැකීම් හරහා සපයා තිබේ. වර්තමානයේදී ස්ත්‍රීන් ඉලක්ක කරගෙන අන්තර්ජාලය තුළ සිදු වන අපයෝජනය මෙයට ඉතා හොඳින් උදාහරණ සපය යි.'

ස්ත්‍රීන්ට මෙන්ම ඉතා වැඩි වශයෙන් සමලිංගික ස්ත්‍රීන්ට මුරකිරීම විශේෂ වැදගත්කමක් ඇති නිසාවෙන් ද හා අපගේ ප්‍රතිචාරයින් සමග ඇතිවූ සංවාද මෙය තහවුරු කළ බැවින් ද 'මුරකිරීම' සැලකිල්ලට ගත යුතු එමෙන් ම හරස් කැපුමක් විදහා දක්වන තේමාවක් වශයෙන් විමර්ශනය කිරීමට අපි උත්සුක වීමු.

## *'සමලිංගික ස්ත්‍රීන් යන වදන භාවිතය සහ සම්බන්ධව'*

සමාජභාවය සහ ලිංගිකත්වය යන ද්විත්වයම ඔවුන්ගේ ආඛ්‍යානයන්ට වැදගත්වන බව සඳහන් කිරීමට අවශ්‍ය බැවින් මෙම පර්යේෂණ පත්‍රිකාව පුරාවටම අපි 'සමලිංගික ස්ත්‍රීන්' යන වදන භාවිතා කරන්නෙමු; 'සමලිංගික ස්ත්‍රීන්' හෝ 'ස්ත්‍රීන්' යන අනන්‍යතාවයන් ධර්මතාවයන් ලෙස සලකනතාක් අප නියෝගකාරී නොවේ. පුළුල් වශයෙන් අපි එම වදන්වල ප්‍රමාණවත් නොවන බව පිළිගනිමින් හා හුදු ආසන්නයක් යන්න අවබෝධ කර ගනිමින් ස්ත්‍රීන්ට ආශා කරන සහ ආදරය කරන ස්ත්‍රී සහභාගීවන්නන් කණ්ඩායමක් හැඳින්වීම සඳහා භාවිතා කරන්නෙමු.

## ක්‍රමවේදය

1. සමලිංගික ස්ත්‍රීන් 6 දෙනෙක් එකට එක් කරන ලද යොමුගත කණ්ඩායම් සාකච්ඡාවක්
2. සමලිංගික ස්ත්‍රීන්ගෙන් අන්තර්ජාල සමීක්ෂණයට ප්‍රතිචාර 16ක් (සිංහල හා ඉංග්‍රීසි)
3. සමලිංගික ස්ත්‍රීන්ගෙන් එක් වරකට එක් අයෙක් සමග පමණක් පවත්වන ලද සම්මුඛ සාකච්ඡා 3ක්
4. ශ්‍රී ලංකාවේ සමලිංගික ස්ත්‍රීන්, ද්විලිංගික හා සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින්ට එරෙහිව අන්තර්ජාල අවකාශය තුළ සිදුවන ප්‍රචණ්ඩත්වය හා මුරකිරීම පිළිබඳව සමාජභාවී හා ලිංගිකකරණය හා සම්බන්ධ පර්යාලෝකයන් සහිත අතිරේක පර්යේෂණ (උපුටා ගැනීම් දක්වා ඇත)

### *භාවිතය*

සමලිංගික ස්ත්‍රීන් යොමුගත කණ්ඩායම් සාකච්ඡාව හා එක් වතාවකට එක් අයෙක් සමග පමණක් පවත්වනු ලබන සම්මුඛ සාකච්ඡාවන්ට දක්වන ලද ප්‍රතිචාරවලට අනුව ඔවුන්ගේ අන්තර්ජාල අවකාශයේ ප්‍රධාන භාවිතා ත්‍රිත්වයක් හඳුනාගත හැකි වේ: "තොරතුරු ලබා ගන්නා මෙවලමක්", "සමාජ ජාලකරණ මෙවලමක්", සහ ස්ත්‍රීවාදී සහ LGBTQ පුද්ගලයින්ගේ ගැටලුද (ගයානි) ඇතුලත්ව සමාජ සාධාරණ ගැටලු ආමන්ත්‍රණය කිරීමට භාවිතා කරන "උද්දේශන මෙවලමක්" වශයෙනි. මෙම කටයුතුවල නිමග්නවීම් දෙස බලනවිට බහුතරයකට මුහුණු පොත වැනි සමාජ මාධ්‍ය වේදිකාවන්ට සම්බන්ධ වී සිටි අතර කිහිපදෙනෙක් විසින් පමණක් ට්විටර් (Twitter), ඉන්ටර්ග්‍රෑම් (Instargram) හා ස්නැප්චැට් (Snapchat) වැනි වේදිකාවන් සම්බන්ධයෙන් ඔවුන්ගේ අත්දැකීම් ගෙන හැර දැක්වන ලදී. වැඩිවශයෙන් සඳහන් නොකළ ද එනමුත් වැදගත් වන භාවිතාවන් අතර බෙදා ගැනීම, යමෙකුගේ සේවා ප්‍රවර්ධනය, අන්තර්ජාතික වෘත්තිකමය ප්‍රජාවන් අනුගමනය කිරීම වැනි වැඩ හා සම්බන්ධ කර්තව්‍යයන් විය.

LGBTQ හා සම්බන්ධ පුවත් ද ඇතුලත් ව වර්තමාන තොරතුරු සොයා බැලීමටත් ඒ පිළිබඳව යාවත්කාලීනව සිටීමටත්, ප්‍රමුඛ ලෙස මුහුණුපොත භාවිතා කිරීම හරහා, ප්‍රතිචාරකයින් ගණනාවක්ම

අන්තර්ජාල අවකාශය භාවිතා කරන බව LGBTQ පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා අන්තර්ජාල අවකාශය විවිධ ආකාරයෙන් භාවිතා කරනු ලැබේ. උදාහරණයක් වශයෙන්, සමහරෙක් විදේශීය LGBTQ හා සබැඳි පුවත් සඟරාවලට දායක වන අතර දේශීය LGBTQ වෙනුවෙන් කටයුතු කරන සංවිධාන විසින් කරනු ලබන අන්තර්ජාල පලකිරීම් හරහා ඔවුන්ගේ සේවාවන් පිළිබඳව අඛණ්ඩව දැනුවත් වෙති. ගයානි වැනි අනෙක් අය පුවත් සහ තොරතුරු සඳහා අන්තර්ජාල සම්පත් භාවිතය ඉතා විචාරවත් ලෙස කරති. ඇය පහත සඳහන් පරිදි ප්‍රකාශ කළා ය.

එය (මුහුණුපොත) මගේ මූලික ම තොරතුරු මූලාශ්‍රය කියල මම හිතනවා. පුවත් පෝෂක මට ඉතා වැදගත් [...] මම ඉතා මූලෝපායිකව සංවිධාන, වෙබ් අඩවි හා කණ්ඩායම්වලට දායක වී සිටිනවා. එමගින් දේවල් සිදුවන එසැණින් එහි පලවී තිබෙනවා. මම මුහුණුපොතට, පුවත් පෝෂකවලට නිරන්තරයෙන් පිවිසෙනවා. ඒ "භෝජන සංග්‍රහයක් පවත්වන්නේ කවුරුන්ද" යන්න විමසීමට නොවේ. නමුත්, තොරතුරු මෙවලමක් වශයෙන් තොරතුරු නිරන්තරයෙන් පරිභෝජනය කරන ස්ථාන වන බීබීසී, ජාතික භූගෝලීය වෙබ් අවකාශය (National Geographic), හෝ නිව්යෝකර් (New Yorker), ඉකොනොමිස්ට් (Economist) වැනි අවකාශවල සිදු වන දේ දැන ගැනීමට ය. මට හැමදේම එකම වෙලාවක දී සිදුවේ. එය අතිවිශිෂ්ට උපකරණයක්. මන්ද යත්, මෙම තොරතුරු ලබා ගැනීම සඳහා මට වෙන වෙනම එම වෙබ් අඩවිවලට පිවිසීමට අවශ්‍ය නොවේ. ඒවා එක තැනක තිබෙනවා. මට සක්‍රියව දායකවීමට යමක් තිබේ නම්, මම මුහුණුපොත මත තොරතුරු එම පලකිරීම්වල සම්බන්ධතාවයන් නිතරම අනුග මනය කිරීමටත් පසුව තවදුරටත් විමසීමට හැකිවන ආකාරයටත් සංවිධානය කර තිබෙනවා. මේ අනුව, තොරතුරු, දේශපාලනය, විදෙස් තොරතුරු, දර්ශනය, කලාව, සංස්කෘතිය, නෘත්‍ය වැනි දේ සම්බන්ධයෙන් දැනට සිදු වන දේ වේ. එම නිසා එය මගේ සමාජ ජාලකරණ මෙවලමකට වඩා ප්‍රාථමික තොරතුරු මූලාශ්‍රය යි.

ගයානිගේ ප්‍රතිචාරය මගින් අන්තර්ජාල අවකාශය, තොරතුරු සෙවීමට, ජාලකරණය සහ උද්දේශනය යන භාවිතාවන් තුනම එකට තොණ්ඩුවක් ආකාරයකින් බැඳී පහසුකරණය කරන ආකාරය ඇඟවීය. "ඔබ සමාජ ක්‍රියාකරුවන් සමග මිතුරු දමක සිටී නම්, විවාහ සමානාත්මතාවය, වෙනස්කොට සැලකීම වැනි දේ සම්බන්ධයෙන් මූලිකවම මුහුණුපොත හරහා දැන ගැනීම. එමෙන්ම ඔවුන්ගේ

ව්‍යාපාරයන්ට සහාය දීම මෙන්ම ඒවා පිළිබඳ ව මුහුණුපොතේ ලිවීම කළ හැකිවේ"යි ගයානි පැවසුවාය. නිලලත් හා බලධාරීත්වයක් සහිත පුවත් අඩවි මගින් පල කරන ලද අන්තර්ගතයක් වශයෙන් අන්තර්ජාල පුවත්, නොදකින ලදී. සාමාන්‍යයෙන් LGBTQ පිළිබඳ මාතෘකා සම්බන්ධයෙන් අවධානය යොමු නොකරන සාමාන්‍ය ජනතාව අතර පවතින තොරතුරු හා අදහස් හුවමාරුවෙන් ඉගෙන ගැනීමට හැකියාව ලැබීම, පුවත් අන්තර්ජාලය හරහා ලබා ගැනීමේ එක් අංගයක් වශයෙන් හඳුනා ගන්නා ලදී. ශ්‍රී ලාංකික මුහුණුපොත් සමූහයන් සම්බන්ධයෙන් අදහස් දක්වමින් මාලි මෙසේ පැවසුවා ය.

> එහි ඇති වටිනාකම වන්නේ, LGBTQ පුද්ගලයින් හා විෂමලිංගික යන ජනකොටස් එකම සමූහයකට එක්ව සාකච්ඡාවේ යෙදීම යි. මෙය සැබෑ ලෝකයේ දී මුහුණට මුහුණලා සාමාන්‍යයෙන් සිදු නොවන දෙයක් යයි මම සිතනවා. නමුත්, අප මුහුණුපොතෙහි ගැටලු බෙදාගන්නා හෙයින් උද්ඝෝෂණවලට ගොස් එහි සිටගෙන සිටිනවාට වඩා ජනතාව ඔවුන් සිතන දේ ගැන කතා කිරීමට මුල පුරයි. ඒ අනුව අපට මෙම සාකච්ඡාව ගොඩනැගෙන ආකාරයත් තොරතුරු හුවමාරුවන ආකාරයත් දැක ගත හැකි යි.

## "පවුලේ මුරකිරීම" සහ "ප්‍රසිද්ධ මුරකිරීම"

පුවත්වලට ප්‍රවේශ කිරීම, පරිභෝජනය කිරීම, හා නිෂ්පාදනය කිරීම සහ LGBTQ හා වෙනත් ගැටලු පිළිබඳව උද්දේශනයේ යෙදීම මගින් අන්තර්ජාලය හරහා සමලිංගික ස්ත්‍රීන් කාරකත්වයට පත්වීම දර්ශනයක් ලෙස මෙමගින් විස්තර කරන්නේ නම් ගයානි සහ අනෙක් අය ක්ෂණිකවම එයට සුදුසුකම් දරණ අතර එම ආඛ්‍යානයම විසඳුමක් සොයන ගැටලුවක් බවට පත් කෙරේ. "ස්වයං ප්‍රකාශනය" සඳහා (ගයානි), ආරම්භයක් ගැනීමට හා ගතික ලෙස නියුතුවීමට ඇති අවකාශයට, මුරකිරීම පිළිබඳ වූ ඔවුන්ගේ සවිඥාණකභාවය විසින් බාධා එල්ල කරන අතර එය අවිනිශ්චිත බවට ද පත් කරන බව ඔවුන් විසින් සටහන් කරන ලදී. "ප්‍රසිද්ධ මුරකිරීම" හා "පවුලේ මුරකිරීම" අතර සහමන්ත්‍රණය කිරීමට සිදුවීම පිළිබඳ ව ඔවුහු කරදරයට පත්ව සිටින බව බොහෝ පිරිස් ප්‍රකාශ කළහ. (ශාමි). මුරකිරීම පිළිබඳ මෙම ද්විත්ව අවබෝධයේ දී, "පවුලේ මුරකිරීම" යන්න පවුලේ සමාජිකයින් විසින් අන්තර්ජාලය තුළදී දැඩි

පරීක්ෂාවට ලක් කිරීම ලෙස පුළුල්ව අවබෝධ විය. අවශ්‍යයෙන් ම, "ඔබ බෙදා ගන්නා දෙය, ඔබගේ සිතිවිලි" සම්බන්ධයෙන් "මේ නැත්දේ? මේ ලෝකෙ කව්ද මේක දකින්නෙ? යන කණස්සල්ල" එයින් අදහස් කෙරේ (ගයානි). "ප්‍රසිද්ධ මුරකිරීම" යන්න "අප ලියන දෙය කියවන අතරතුර අපට නොදැනෙන ආකාරයෙන් විවිධ මාධ්‍යයන් හරහා රජය හෝ වෙනත් පුද්ගලයින් අපව පරීක්ෂාවට ලක් කිරීම" (රේඛා) ලෙස අවබෝධ විය.

තොරතුරු මෙවලමක් වශයෙන් (සමහර අවස්ථාවන්වලදී උද්දේශනය කිරීම සඳහා) සැමදෙනාටම එක හා සමාන බලපෑමක් එල්ල නොවූව ද මෙම දෙයාකාර වූ මුරකිරීම් සමලිංගික ස්ත්‍රීන් විසින් අන්තර්ජාල අවකාශය භාවිතා කරනු ලබන ආකාරයට බලපානු ලැබේ. නිදසුනක් වශයෙන්, සමහරෙක් අන්තර්ජාලය තුළ සිදුවන ප්‍රසිද්ධ මුරකිරීමට වඩාත් බිය සහ චකිතය පල කර ඔවුහු පවුලේ මුරකිරීමේ බලපෑමට ලක්වීම ප්‍රතික්ෂේප කළ නමුත් අනෙක් පිරිස් මෙම දෙවර්ගයේ ම මුරකිරීමට භාජනය වී ඇති බවට සිත් කලබල වී සිටියහ. තම පවුලේ උදවියට "තමන්ගේ සමලිංගිකත්වය හෙළිදරව් වී සිටී" හෝ පවුලේ පාලනයට යටත්වීමට අකමැත්තක් දක්වන අය පවුලේ මුරකිරීම ප්‍රතික්ෂේප කළ ද ප්‍රසිද්ධ මුරකිරීම පිළිබඳව සැලකිලිමත් වූහ.

මෙම අදහස් මගින් අවධාරණය කරනු ලබනුයේ සමලිංගික ස්ත්‍රීන්ගේ පවුල් විසින් ඔවුන්ගේ අන්තර්ජාල කටයුතු පාලනය කිරීම සහ මුර කිරීම අවධානය යොමු කළ යුතු ගැටලුවක් බවයි. පරිසනක පද්ධතීන් හරහා සම්බන්ධ නොවූ තථ්‍ය අවකාශය කේන්ද්‍රකරගත් වෙනත් පූර්ව අධ්‍යයනයකින් තහවුරු කර ඇති පරිදි, නොයෙක්විට ස්ත්‍රීන්ගේ පෞද්ගලික ස්වාධීනත්වය හඳුනා නොගන්නා නිසාම පමණක් නොව සමාජභාවය හා ලිංගිකත්වය යන කාරණා ස්ත්‍රීන්ගේ උචිත චර්යාව මත පවුලේ ගෞරවය හා කීර්තිනාමය රැඳී පවතින බවට සංජානනය කර තිබෙන නිසාවෙන් ද සමහර සමලිංගික ස්ත්‍රීන් හට පවුල් ඒකකය තුළ ස්වාධීනත්වය රඳවා තබා ගැනීම ප්‍රශ්නයක් විය හැකි ය. මෙහි ප්‍රතිරාවයන්, අන්තර්ජාල අවකාශය පිළිබඳ ව සමලිංගික ස්ත්‍රීන්ගේ අඛ්‍යානයන්හි විද්‍යාමාන වේ. එවැනි ආඛ්‍යාතන දෙකක්, පවුලේ හෝ ස්ත්‍රියගේ කීර්තිය හා ප්‍රතිරූපය යන දෙකින් එකකටවත් අවමානයට පත් නොකරන ආකාරයට සමලිංගික ස්ත්‍රීන්ගේ අන්තර්ජාල කටයුතු මෙහෙයවීමට හා මුරකිරීමට ගන්නා ලද පවුලේ උත්සාහයන් අවධාරණය කර ඇත.

> ටී-ෂර්ට් එකක් ඇඳගෙන, මම සමලිංගිකයෙක් යයි පවසමින් ආඩම්බරයෙන් ඔබ මොබ යාමට මට අවශ්‍යතාවයක් නැහැ. නමුත්, මම බෙදාගන්න දේ, හා සිතන දේ ගැන හුඟක් සංවරව හා හික්මීමෙන් යුක්තව කටයුතු කරන්න සිද්ධ වෙනවා. අතීතයේ දී එය මට ඉතා පීඩාකාරී දෙයක් වුණා... ඉස්සර මම පිරිමියෙකු මෙන් ඇඳුම් ඇඳගෙන සිටි යම් යම් කාල වකවානු තිබුණා. හරිම අත්භූතජනක මායාකාරී දෙයක් වගේ. මම ඒ පින්තූරය මගේ පැතිකඩ ඡායාරූපය විදිහට පාවිච්චි කළා. මගේ නැන්දා කෙනෙක් මගේ මවට දුරකථනයෙන් අමතා "ඔයාගේ දුවට කුමක් හෝ සිදුවී තිබෙන හැඩයි. එයා අමුතු ගූඪ පුද්ගලයෙක් වෙලා" යි පවසා තිබුණා. එවිට මගේ මව මා අමතා "ඔයාගේ පැතිකඩ ඡායාරූපය වෙනස් කළ යුතු ය"යි පැවසුවා ය, යනුවෙන් කලා ප්‍රකාශ කළාය.

කලා "ඒක හැමදෙනාගේ ම කාර්යයක් බවට පත් වනවා"යි ප්‍රකාශ කරමින් සමාජභාවීගතකරන ලද හා ලිංගිකකරණය කරන ලද අන්තර්ජාල ස්වයං ප්‍රකාශනය හා සම්බන්ධව ඇය කටයුතු කළ ආකාරයට බලපෑම් කිරීමට ඇයගේ පවුලේ පූර්වානුමානිත පරමාධිකාරය (presumed prerogative) පිළිබඳ ව ඇයගේ අප්‍රසාදය ප්‍රකාශ කළා ය. එපමණක් නොව, මෙය අන්තර්ජාල අවකාශයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සහ ලිංගිකභාවය පදනම් කරගත් ධර්මතාවයන් ඇය ලවා පිළිපැද්දවීමට ගන්නා ලද මෙන්ම ඇය කව්ද යන්න නිර්වචනය කිරීමට හා ඇය අපේක්ෂා කරන පරිදි ඇයව ප්‍රකාශ කිරීමට තිබෙන අයිතිය අහිමි කිරීමක් වශයෙන් ඇය අවබෝධ කරගෙන සිටින්නී ය. තවත් සහභාගීවන්නෙක් ඇයගේ අන්තර්ජාල අන්තර්ක්‍රියාවන් වෙනස් කිරීමට ඇයගේ පවුල මැදිහත් වූ ඒ හා සමාන සිද්ධියක් ගෙන හැර පෑවා ය.

> මගේ පවුලේ උදවියට මගේ සමලිංගිකත්වය පිළිබඳ ව දැනුවත් කිරීමට පෙර, එක් වතාවක දී, මම ඒ ගැන ඔවුනට පැවසූ විට ඔවුන් නොසතුටු වුනා. මගේ මව ඇත්තට ම 'සමලිංගික' (gay) හා මගේ නම ගූගල් කළ විට ඒ හා සම්බන්ධ පලකිරීම් බොහොමයක් දැක ඇය භ්‍රාන්තියට පත් වූවා. එහි මම සංවිධානයක් වෙනුවෙන් ස්වේච්ඡාවෙන් කරන ලද දේ, සියලුම ලිපි ලේඛන මෙන් ම මා විසින් ලියන ලද දේවල් තිබුණා. ඉතිං මට

ගුගල් සමග ලිඛිත සන්නිවේදනයක නිරත වී ඒ හැම දෙයක් ම ඉවත් කර ගැනීම වැනි විකාර දේවල් සිදු කිරීමට සිදු වුණා. ඒක තමයි මම ඒ හැම දෙයක් ම ඉවත් කරන තුරු තිබුණ නාටකය.

යළිඳු, මෙම සහභාගිවන්නාට අනුව, ඇයගේ LGBTQ පුද්ගලයින්ගේ ගැටලු සම්බන්ධව විෂයානුබද්ධ ලෙස නිරතවීමේ ඉතිහාසය ඇයගේ ක්‍රියාකාරීත්වය සහ අධ්‍යයන කටයුතු එවැනි දෙයක් අන්තර්ජාලය තුළ ගම්‍යමාන වේය යන ඇයගේ පවුල තුළ පවතින 'භ්‍රාන්තිය' නිසාවෙන් ම සංඛ්‍යාංක (ඩිජිටල්) මකා දැමීමට ඇයට බල කරන ලදී.

මෙම ස්ත්‍රීහු අවබෝධ කර ගෙන ඇති පරිදි, පවුලේ මුරකිරීම යනු ඔවුන්ව විනයානුකූල කිරීමේ, ඔවුන්ගේ අන්තර්ජාල දෘශ්‍යතාවය හා ප්‍රකාශනය ලුහුඬු කිරීමේ ක්‍රමවේදයන් වේ. ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ ආශාව වන කිසිම කෙනෙක් ඔවුන්ගේ 'අපූර්ව හෝ අමුතු' සලකුණු නොදැකීමට හැකිවීම යන්න ඔවුන් පිරිසිදු කිරීමේ හා ඔවුන්ගේ අන්තර්ජාල කටයුතුවලට සනීපාරක්ෂාව සැපයීමේ පැහැදිලි තාක්ෂණික ගැටලුවක්ම පමණක් නොවේ. පවුලේ මුරකිරීම, නිරන්තරයෙන් ම, සිද්ධි හරහාම පමණක් සිදු නොවී ය. 'ප්‍රසිද්ධියේ' හා දෘශ්‍යමාන වන ආකාරයට 'අපූර්ව හෝ අමුතුවීම, LGBTQ පිළිබඳ ව උද්දේශන ක්‍රියාවලියේ හා අධ්‍යයන කටයුතුවල නිරතවීම ආදිය වැනි ඔවුන්ගේ අන්තර්ජාල කටයුතුවල නිමග්නවීම් ස්වකීය පවුලේ සාමාජිකයින් විසින් අනුමත නොකරන බවට අවබෝධයක් පැවතීම වැනි මුරකිරීම පිළිබඳව වඩාත් සාමාන්‍යකරණයට ලක් කරන ලද සවිඥාණකභාවයක් හරහා ද සිදුවන බව පැහැදිලි විය.

මෙය සෑම ස්ත්‍රියකගේ ම අත්දැකීම නොවන බව වාර්තා කිරීම වැදගත් ය. රේබා වැනි ඇතැම්හු "මම වැඩිහිටියෙක්, මගේ දෙමාපියන් මගේ කටයුතුවලට ඇඟිලි නොගැසිය යුතු යි" යැයි ප්‍රකාශ කරමින්, පවුල අන්තර්ජාල අවකාශයට පිවිසීම වළක්වනවා ය යන අදහස ප්‍රතික්ෂේප කරති. පුෂ්පා වැනි අනෙක් අයට එසේ නොහැඟුණි. මන්ද යත්, ඔවුහු ඔවුන්ගේ පවුලේ දැනුවත්භාවය හා විශ්වාසය පිළිබඳ ව විශ්වාසයකින් පසුවිය: "මගේ පවුලේ මා ගැන දන්නා කිහිප දෙනයි සිටින්නේ. ඔවුන් මම සමලිංගික ස්ත්‍රියක් බව නොදන්නා අතරම මගේ වර්තමාන ස්වරූපය පිළිගන්නවා. ඔවුන් සැම දෙනාම මගේ මුහුණුපොතෙහි ඉන්නවා. ඔවුන් මට ආදරය

කරන නිසා මට හිතෙන්නේ නැහැ, ඔවුන් මාව මුරකරනවා ය කියා. මේ කාරණය නිසාවෙන් මගේ පවුල තුළ ඔවුන් මා ගැන සිතන ආකාරය ගැන මම දන්නවා." තුසිතා වැනි අනෙක් අය, තම කාරකත්වය තියුණු සහ ස්ථිර ලෙස ප්‍රකාශ කර සිටි අතර පවුල විසින් වළක්වාලනු ලැබීම යන කාරණය හඳුනාගැනීම ප්‍රතික්ෂේප කර ඇත. "මම මගේ පවුලේ සාමාජිකයින් මගේ මුහුණුපොතට එක්කර ඇත්තෙමි. ඔවුන්ට ඒ සම්බන්ධයෙන් ගැටලුවක් ඇත්නම් එය ඔවුන්ගේ ප්‍රශ්නයක්. මගේ නොවේ. ඔවුන්ට මාව ඉවත් කරන්න අවශ්‍ය නම් එසේ කළ හැකියි. මම හිතනවා, මට ගෙදරින් ප්‍රශ්නයක් නොවන නිසාවෙන්... මම හිතනවා හැම කෙනෙකුටම ඔවුන් සිතන්න අවශ්‍ය දේ සිතීමට ඉඩ දෙන්න, එය මට ගැටලුවක් නොවේ. ඒ කාලෙත් මම ඒ වගේ, දැනුත් ඒ වගේ. මගේ යහළුවන් හෝ මගේ පවුලේ සාමාජිකයින් මුහුණුපොතෙහි සිටින නිසාවෙන් ම මට ප්‍රකාශ කරන්න අවශ්‍ය වූ විට මම සීමාවන් පනවා ගන්නේ නැහැ."

කලා ප්‍රකාශ කළ ආකාරයට, මුහුණ දී ඇති ගැටලු "ඔබගේ අව්‍යාජභාවය... ඔබ කවුරුන්ද යන කාරණා සම්බන්ධයෙන් ඔබ කොතරම් විවෘත ද" යන පැනයට වඩා දෙයක් නොවන හෙයින් සමහර සහභාගීවූවන්ට පවුලේ මුරකිරීම යනු කෙනෙකුට තමා වීමෙන් "වැළකී සිටින" තරමට ම "පීඩාකාරී" ලෙස බල කරන දෙයක් ලෙස හැඟුණ බව සඳහන් කිරීම වැදගත් වේ. පවුලේ මුරකිරීම, මෙම ධාරිතාවයට බාධා කිරීමක් වශයෙන් දකින ලදී. කලා, ඇයගේ පවුලේ ඉල්ලීමට අන්තර්ජාල කටයුතුවල නියැලීම වෙනස් කිරීමට සිදුවීමෙන් පසු ඇයට බලපෑ ආකාරය සටහන් කළේ මෙසේ ය.

> ඉන්පසු එහි දැමිය යුත්තේ කුමක් ද යන්න පිළිබඳ ව මම ඉතා පරීක්ෂාකාරී වුනා. එය මට විනෝදජනක වුනා. මට එය එක්තරා ආකාරයක ස්වයං ප්‍රකාශනයක් වුනා. එය දරුණුයි. එය නිරන්තර තුලනයක්, ඒක මානසික මට්ටමේ දෙයක්. ඔබ හැම වෙලේම මෙවැනි තේරීම් කරනවා. අනෙක් අතට, එක් අර්ථයකින්, බොහෝමයක් දෙනෙක් මුහුණුපොතේ යම් දෙයක් පලකරන සෑම අවස්ථාවක ම ඔවුන් කරන්නේ මොනවාද යන්න වැනි ක්ෂුද්‍ර මට්ටමෙන් නොසිතන නිසාවෙන් ඔබට එය කිරීමට සිදුවීම සමලිංගික පුද්ගලයෙක් වශයෙන් අවාසනාවක් ලෙසයි මම සිතන්නේ.

ඒවාගේ ම කිෂාණි ඇයගේ පවුල විසින් ඇය වෙනත් ස්ත්‍රියක් සමග පවත්වන සබඳතාවය මුහුණුපොත හරහා සොයා ගැනීම සම්බන්ධයෙන් සැලකිලිමත් වූවා ය. "මම ඒ ගැන කණගාටු වනවා, මොකද ඒ ආකාරයට නොවෙයි මට එයාලට ඒ ගැන සොයා ගැනීමට අවශ්‍ය වූයේ" යි ඇය ප්‍රකාශ කළා ය. "විශේෂයෙන් ම මුහුණුපොත ගතහොත්, මගේ අනුබලය ඕනෑම මොහොතක තිබෙනවා වගේ දැනෙන්නෙ නැහැ. මම මුහුණුපොතේ දී තමයි වඩාත් පරීක්ෂාකාරී වන්නේ."

## *පවුලේ මුරකිරීම: "විනෝදජනක" / "අව්‍යාජ"*

විමර්ශනය කිරීමට අවශ්‍ය වන අන්තර්ජාලය තුළ සිදුවන පවුලේ මුරකිරීම යම්තාක් දුරකට අවබෝධ කර ගැනීම සඳහා වැදගත් ගැඹුරක් මෙම අදහස් මගින් ඉදිරිපත් කරනු ලැබේ. එම මුරකිරීම නියෝජනය කිරීමට ප්‍රයත්න දරමින් යට දක්වන ලද උපුටනයේ සිටි සහභාගී වූවන් වැනි ප්‍රතිචාරකයෝ, අන්තර්ජාල අවකාශය කෙනෙකුගේ සමාජභාවී සහ ලිංගිකත්වය හා සම්බන්ධ ප්‍රකාශනයන්ගේ සෙල්ලක්කාර, උපහාසාත්මක හා අවස්ථානුරූප වන රඟමඬළක් ලෙසටත්, පවුල උනන්දුවෙන් අන්තර්ජාලය තුළ ප්‍රකාශ කරනු ලබන සැමදෙයකට ම මුහුණත වටිනාකම (ඍජු අර්ථය) පමණක් පිළිගන්නා, නමුත්, "සෙල්ලක්කාරකම" හා "විනෝදජනකබව" අන්තර්ජාල අන්තර්ක්‍රියාවන්ගේ තීරණාත්මක අගයන් වන බව මග හැර ගන්නා නිසාවෙන් එම ශක්‍යතාවයට බාධාවන් එල්ලකරන විනයධරයන් ලෙසටත් ගොඩනැංවීමට යොමු වූහ.

මෙම අවබෝධය පිටුපස සංකීර්ණ උපකල්පන කට්ටලයක් පවතී. එක් අතකට එය පවුලේ මුරකිරීම, එම පවුලේ සමාජ මාධ්‍ය සාක්ෂරතාවයේ හිඟකම හා සම්බන්ධ වේ ය යන නිරීක්ෂණය හා සබැඳේ. සමහරවිට, විශේෂයෙන්ම, වයෝවෘද්ධ සාමාජිකයින් "සමකාර්යය" (analog) පරපුරෙන් පැවත එන නිසාවෙන් ඔවුහු අන්තර්ජාල අවකාශයේ සමාජභාවී හා ලිංගිකත්වය හඟවන සංඛ්‍යාංක (ඩිජිටල්) සංඥාපනයන්ගේ (හඟවන දේ) ක්‍රියාකාරිත්වය වරදවා වටහා ගනී. එමෙන් ම විරුද්ධ ලිංගිකයින්ගේ වස්ත්‍ර පැළඳීම සමාජභාවයේ දැඩි ප්‍රකාශනයකට වඩා එය *"මට විනෝදජනක දෙයක්, එක් ආකාරයක ස්වයං ප්‍රකාශනයක්"* වන බවත් ග්‍රහණය කර ගැනීම අපහසුවීම යන කාරණය තරමක් තමන්ගේ උසස්බව හෝ ලොකුකම පෙන්නුම් කරන ආකල්ප විදහා දක්වන (condescending) කාරණයක් ලෙසට අදහසක් වේ. වෙනත් වදන්වලින් පවසන්නේ

නම්, අන්තර්ජාල අවකාශය යනු කාර්යසාධනීයත්වයේ අවකාශය යන අදහස ඔවුනට තේරුම් නොයේ--ඔබට ලැබෙන්නේ ඔබ දකින දේ නොව, සංවිධිත සංස්කරණයක් පමණි. එනම්, තමන්ම ප්‍රකාශ කිරීමට දරණ උත්සාහයක නිෂ්පාදනයක් වේ. මේ සමගම අන්තර්ඡේදනය (intersecting) වන තවත් තමන්ගේ උසස්බව හෝ ලොකුකම පෙන්නුම් කරන ආකල්ප විදහා දක්වන අදහසක් වන්නේ වයෝවෘද්ධ වැඩිහිටියෝ (ඕපාදූප සොයන නැන්දා) කාර්යසාධනීයත්වය හා අපූර්ව හෝ අසම්මත (queer) දේශපාලනය පිළිබඳ ව සියල්ල දත්තෝ නොවන බව ය.

මෙම උපකල්පන, පවුලේ මුරකිරීම ගොඩනැගීමේ දී, සමාජභාවය, ලිංගිකත්වය, පරම්පරා දේශපාලනය සහ සමාජ මධ්‍ය කාර්යසාධනීයත්වය සම්බන්ධයෙන් වන උපකල්පන අන්තර්ඡේදනය වන ආකාරය අවධාරණය කරයි. කලාගේ අවබෝධයේ දී 'අව්‍යාජ' වන හා කාර්යසාධනීය සමීපස්ථානය වන අසංයුක්තභාවයේ වැදගත් කාරණක් වන බවට එය ඒවාගේම අවධාරණය කරයි. කලාගේ මව සහ නැන්දණියක විසින් එය ඇයගේ 'සත්‍ය' අනන්‍යතාවය යයි වැරදි ලෙස වටහා ගත්, පිරිමියෙකු මෙන් ඇඳුම් ඇඳගෙන 'විනෝදජනක' වීම, ජනතාව සමාජ මාධ්‍ය තුළ සමාජභාවය 'කරන'' ආකාරය වැඩිහිටි පරපුරේ අදක්ෂ කියවීමක් ලෙසට ඇය දකින දෙය අභිමුවෙහි සමාජභාවී කාර්යසාධනීයත්වයේ මූලික අංගයන් තහවුරු කිරීමට ඇති ඇයගේ ආශාව ගෙනහැර පායි. කෙසේවෙතත්, මෙය 'ඔබ කව්ද... ඔබගේ අව්‍යාජත්වය' යන්නට පවුලේ මුරකිරීම මැදිහත් වන වඩාත් සාරාත්මවාදී ප්‍රකාශයකට අනුරූප නොවන සිත් අදගන්නා සුළු දෙයක් වේ.

## පවුලේ මුරකිරීම: වෙනස්කම් සහ මාරුවීම්

කාලයත් සමග පවුලේ මුරකිරීමේ වෙනස්වීම් හා මාරුවීම් සිදුවීම, ඒ පිළිබඳව පැවති සංජානනයේ තවත් තීරණාත්මක අවබෝධයක් විය. පවුලේ මුරකිරීමට බරපතල ලෙස භාජනය නොවූ අය එය සැමවිටම එසේ නොවන බවත් විවිධ හේතු කාරණා නිසාවෙන් එම මුරකිරීම කාලයත් සමග විපරිණාමය වී තිබෙන බවත් නිරීක්ෂණය කරනු ලැබේ. මෙම වෙනස්වීමට හේතුපාදක වූ කාරණා අතර ඔවුන්ගේ පවුල්වලට "සමලිංගිකත්වය අනාවරණය වීම" හා එම පවුල් විසින් ක්‍රමක්‍රමයෙන් ඔවුන්ගේ ලිංගික දිශානතිය යම් ආකාරයකට පිළිගන්නා තත්ත්වයකට පත්වීම; වයෝවෘද්ධවීම, වැනි කාරණා විය.

ප්‍රම ාණය ඉක්මවා තම පවුලේ මුරකිරීම ගැන වෙහෙස නොවන ඒවාගේ ම තම පවුලට තම 'සමලිංගිකත්වය අනාවරණය වූ' ලාරා "වසර කිහිපයකට පෙර, මගේ දිවියේ ඒ කාලයේදී මම එච්චර නිවුන පුද්ගලයෙක් නොවේ. මගේ සමලිංගිකත්වය අනාවරණය වෙලා තිබුණෙ නැහැ. මම ඉන් අදහස් කරන්නෙ, එය අනාවරණය වෙලා තිබුණෙ සමීපතම යහළුවන්ට පමණයි. මට මතකයි මගෙ යහළුවෙක් මුහුණුපොතේ එයාගෙ අදහස පල කළා (ඒකෙන් කිව්වෙ මම ස්ත්‍රී සමලිංගිකයෙක් බව). නමුත් මගේ අතින් එය නැතිවුණා! මුහුණුපොත කියන්නෙ හැමදෙනාට ම දකින්න පුළුවන් වේදිකාවක්, මගේ ගෙදර අයටත් ඒවාගේ ම ඒවා දකින්න පුළුවන්" යනුවෙන් සිහියට නැගුවාය.

ශාමිට ඇය හා සම්බන්ධ ඕනෑම LGBTQ හා සම්බන්ධ පලකිරීමක් මකා දමන මෙන්, ඇය ගූගල් ආයතනයෙන් ඉල්ලා සිටින තරමට ම බලපෑමක් (සමහරවිට අමතක කරනු ලැබීමට ඇති අයිතිය ක්‍රියාත්මක කිරීමට සමානව) ඇයගේ මවගේ පීඩනය ඇය වෙත වූවත් එතැන් පටන් ඇයගේ වාතාවරණය වෙනස් වී තිබුණි. "පවුලේ මුරකිරීමට වඩා මගේ බිය දැන් වැඩිපුර ම තිබෙන්නේ ප්‍රසිද්ධ මුරකිරීම සම්බන්ධව යි. මගේ මේ බිය අපූර්ව හෝ අමුතු වන යමක් අන්තර්ජාල අවකාශය තුළ බෙදා ගැනීම... හෝ... එවැනි යම් පල කිරීමක් නිර්මාණය කිරීම වැනි දේ සඳහා වේ. මගේ වැඩකටයුතුවලට සම්බන්ධ වන නිසා ප්‍රසිද්ධ මුරකිරීම වඩාත් භයානක යි. ඒ අතරම මට මේ මොහොතේ දී මගේ සමලිංගිකත්ව ස්වභාවය සඟවාගෙන සිටීමට අවශ්‍යතාවයක් නැහැ. මගේ පවුලට මගේ සමලිංගිකත්ව ස්වභාවය අනාවරණය වෙලා තිබෙන්නෙ. ඒ නිසා මට එය කොහෙත් ම ප්‍රශ්නයක් නොවේ" යයි ඇය ප්‍රකාශ කළා ය.

සමලිංගික ස්ත්‍රීන් ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් සමග ඔවුන්ගේ අන්තර්ජාල අන්තර්ක්‍රියාවන් මෙහෙයවන ආකාරය අනුව පවුලේ මුරකිරීම පිළිබඳව පුද්ගලානුබද්ධව ලත් අත්දැකීම් හා සංජානනයන් කාලයත් සමග වෙනස් වේ. මාලි, ලාරා, හා කිෂාණි ඔවුන් නිරීක්ෂණය කිරීමට පවුලට පරමාධිකාරයක් (prerogative) නොලැබෙන ආකාරයට, මුහුණුපොතෙහි පූර්වමිතිගත සමාහාරයන් (repertoire) භාවිතා කර පණිවිඩ යැවීම තෝරා ගන්නා ලද, එමෙන් ම තම පවුල මුරකිරීමේ වස්තු විෂය බවට පත්කර අවාසිය වාසියට හරවාගත් සමලිංගික ස්ත්‍රීන් නියෝජනය කරන කිහිපදෙනෙක් වේ. මෙයට, පවුලේ සාමාජිකයින්, තෝරාගත්

පරිදි එක් කිරීම හෝ නොකිරීම; පවුලේ සාමාජිකයින් එක් කළ ද ඔවුහු සීමිත පැතිකඩ ද පවත්වා ගැනීම; තම පවුලේ "දෙවන පරපුරː ඥාති සහෝදර සහෝදරියන්, මගේ මාමාගේ පුතා, මගේ මාමාගේ දුව" (මාලි) එක්කර ගැනීම; සමලිංගික භීතිකාව විදහා දක්වන පලකිරීම් කරන පවුලේ සාමාජිකයින් නොසලකා හැර සිටීම; වැනි දේ අන්තර්ගත වේ. "තාවකාලික හෝ අනියම් සමලිංගික භීතිකාව ලෙස හඳුන්වන දෙය ඔවුන්ගේ පෝෂකවල තිබෙන බව මම දුටුවා" යන්න මාලි හඳුනාගත් විට ඇය කෝපයට පත් වූවාය. මුලින් ම ඇය "පවුලේ මුරකිරීම යනු පවුල අතේදුරින් තබා ගැනීම" යන්න යයි තීරණය කළා ය. කෙසේවෙතත්, ඇයගේ පවුලේ සාමාජිකයින්ගේ පලකිරීම්වලට "තීව්‍ර" ආකාරයෙන් කැමතිවීම මගින් පවුලේ මුරකිරීම ඇයගෙන් ඔවුන් වෙතට මාරු කළ හැකි බවත්, ඔවුන්ට ඔවුන්ව නිරීක්ෂණය කරනු ලබන බවට හඟවනු ලැබීමටත් ආක්‍රමණශීලී 'කදිම' ආකාරයෙන් කළ හැකි බවත් ඇය අහම්බෙන් මෙන් හඳුනා ගත්තා ය. මෙම වෙනස්වීම නිසාවෙන්, එම ගැටලුව නිර්මාණය කරන ලද පවුලේ සාමාජිකයින් "එවැනි අදහස් පල කිරීම නතර කළ" අතර "මුහුණුපොත මත මිනිසුන්ට කාලයත් සමග වෙනස් විය හැකි බව" හඳුනා ගත හැකි විය.

ඔවුහු ස්වීයත්වයට පත්වන තත්ත්වයන් හා සම්බන්ධ වන බලපෑම්කාරී වෙනස්කම්වල වැදගත්කම මෙම සාකච්ඡාවේ දී අවතක්සේරු නොකළ යුතු කරුණක් වේ. "මිතුරෙකුට හෝ යම් දෙයක් සම්බන්ධව යම් අසාධාරණයක් සිදුවන විට, මම ඒ සම්බන්ධයෙන් හඬක් නැගීමට ඉදිරිපත් වුනා. ඒ මන්ද යත්, ඒ සම්බන්ධයෙන් වන ශ්‍රාවක පිරිසක් මුහුණුපොත මත සිටින නිසා"යි ගයානි සිහිපත් කළා ය. "මුහුණුපොතේ තිබෙන ගැටලුව වන්නේ එහි ඔබගේ නැන්දාවරු, මාමාවරු, අසල්වැසියන් හා සැමදෙනෙක් ම සිටිනවා, එතකොට ඔබට හ්ම් ගාන එක තමයි කරන්න වෙන්නෙ" යනුවෙන් ඇයගේ මූලික වටහා ගැනීම සිහිගැන්වීම මගින් එහි ඇති යෝග්‍යතාවය පෙන්නුම් කළා ය. එනමුදු, ආපසු හැරී බලනවිට, පහසුවෙන් තැති ගැන්මට හෝ වළක්වාලනු ලබන තත්ත්වයට පත් නොවන වියපත් ස්ත්‍රීන් බවට පත්වීමේ හැඟීම මගින් ඇය මුල් කාලයේ දී මුහුණදුන් පවුලේ මුරකිරීමේ පීඩනයෙන් බැහැරව ගොස් ඇති බව දැන් ඇයට හැඟේ. ඇය ස්වීයත්වයට පත්වීමේ ක්‍රියාවලිය විස්තර කරමින් මෙසේ පැවසුවා ය.

මගේ තරුණ කාලයේ දී, මගේ නැන්දලා හා මාමලා මුහුණුපොතෙහි සිටි නිසා, LGBTQ හා සම්බන්ධ කරුණු ගැන කතා කිරීමට බිය වූවා. මගේ සමලිංගිකත්වය අනාවරණය කරනු ලැබීමට අවශ්‍ය නොවූ නිසාවෙන් LGBTQ අභිමානය දනවන ධජය (gay pride flag) හෝ මගේ පැතිකඩ ඡායාරූපය හෝ වෙනයම් දෙයක් සම්බන්ධයෙන් මුහුණුපොතෙහි කැමැත්ත දැක්වීමට මට අවශ්‍ය වුනේ නැහැ. ඒක ප්‍රශ්නයක් වුනා. නමුත්, දැන්, මට ඒවා මොන කෙහෙල්මලක් ද වගේ දෙයක්. ඉතිං, කාලයත් සමග එම අත්දැකීම් පරිණාමය වීම සිත්ගන්නාසුලු දෙයක්. මම දැන් මගේ ජීවිත කාලයෙන් අවුරුදු 30ක් ගත කරල තියෙන්නෙ. මම මුහුණුපොතේ කතා කරන්න බය ටිකක් අඩුයි. මම තවදුරටත් සීමා කරන ලද ලයිස්තු ගැන (මම අදහස් පල කරන විටදී) කරදර වෙන්නෙ නැහැ.

## ප්‍රසිද්ධ මුරකිරීම

ප්‍රසිද්ධ මුරකිරීම පිළිබඳව වන ආඛ්‍යානයන්, තොරතුරු සෙවීම, ජාලගතවීම හා උද්දේශනය සඳහා සමලිංගික ස්ත්‍රීන්ගේ අන්තර්ජාල අවකාශ භාවිතය පිළිබඳව බොහොමයක් දෙනෙක් විසින් ප්‍රකාශ කරන ලද දේ හා සම්බන්ධ විය. බොහොමයක් දෙනා ඔවුන්ගේ වෘත්තික ජීවිතයට බලපෑමක් එල්ලවිය හැකි ආකාරය පිළිබඳව හඬක් නැඟූහ. නැවතවරක්, සහභාගීවූවන්ගෙන් බහුතරයක් සේවා ස්ථානයට සම්බන්ධ වූ සගයන් හා වෙනත් අයගේ විභව මුරකිරීම හේතුකොට ගෙන ඉතා ප්‍රවේශමෙන් භාවිතයේ නියුතු විය යුතු වෙබ් අඩවියක් වශයෙන් මුහුණුපොත උපුටා දැක්වූහ. සේවා ස්ථානයේ මුරකිරීමේ වස්තුවිෂය බවට පත් විය හැකි මෙන් ම දරුණු ප්‍රතිවිපාකවලට හේතුභූත විය හැකි යම් දෙයක් පල කරන සෑම විටම පාහේ යෝග්‍ය ආකාරයට ඔවුන්ගේ ශ්‍රාවකයින් තෝරාබේරාගත හැකි වේ ද යන්න පිළිබඳ ව කෙදිනකවත් විශ්වාසයක් නොතිබීම (හෝ සුක්ෂිත කර ගත හැකි වීම) පොදු කණස්සල්ලක් විය.

"ඔබ නිරත වී සිටින කාර්යය අනුව ඔබගේ ශ්‍රාවක ප්‍රජාව තෝරා බේරා ගන්නේ කෙසේද? මම පල කරන අන්තර්ගතය සහ දැන හඳුනා ගන්නා මිනිසුන් මෙන්ම... මේ රටෙහි නීතිමය හා සමාජ පසුබිම

සම්බන්ධව... මට මගේ වෘත්තියේ දී මම උද්යෝගීමත් පුද්ගලයෙක්, මට දේවල් දැඩිව දැනෙනවා යි සිතනවා. එයින් අදහස් කරන්නෙ නැහැ මම ඒවා ප්‍රකාශ කරනවා කියලා. නමුත් මම බෙදා ගන්නා දේවල් ගැන මම වැඩියෙන් හිතන්නෙ නැහැ. නමුත්, ඒවා මගේ ජීවත් කරවන ලද අත්දැකීම්වලට, යථාර්ථයට පරිවර්තනය කරන ආකාරය සම්බන්ධව සැලකිය යුතු ලෙස මගේ සිතට එනවා."

යනුවෙන් රජ්ටි ප්‍රකාශ කළා ය. ඒවාගේම මාලි,

"මම, මා සමග සේවය කරන අය මුහුණුපොතට එකතු කර තියෙනවා. ඔවුන් එහි සිටිනවාද නැද්ද යන්න මම නිරන්තරයෙන් සිතන දෙයක් නොවේ. නමුත්, එය මගේ සිතේ යටම කොටසෙහි තිබෙන දෙයක්. මන්ද යත්, ඔබගේ සේවා ස්ථානයේ සිටින අය ඔබ ගැන කොතෙක් දුරට දැන සිටිය යුතුදැ යි ඔබ සිතන නිසාවෙන්. මෙය හැම වෙලාවෙම සිතන්න ඕන දෙයක්" යැයි ප්‍රකාශ කළා ය.

මෙම ප්‍රතිචාරයන් සිත්ගන්නාසුළු දෘෂ්ටියක් ගෙනහැර දැක්වීය. ප්‍රධාන වශයෙන් ම, ප්‍රසිද්ධ මුරකිරීම පිළිබඳ ගැටලු ද්වේශසහගත පාර්ශවකරුවන්ගේ හෝ අධිපතිවාදී රාජ්‍යයන්ගේ කාරණාවක් ම නොවූ බව මෙන්ම රහස්‍යභාවය සැකසුම් සකස් කිරීම මගින් කෙනෙක් ආරක්ෂා වන ආකාරයට දැන ගැනීම වැනි ඕනෑම තාක්ෂණික ගැටලු ඉතා හොඳින් ඉක්මවා ගිය බව සමලිංගික ස්ත්‍රීහු දුටුවෝ ය. ඔවුහු සමාජ මාධ්‍යයන්ගේ දේශපාලනය හා ස්වභාවය ගැන වඩාත් පුළුල් අර්ථයෙන් යුතුව මේ සම්බන්ධව කතා කළහ. "මුහුණුපොත යනු මුරකිරීමේ මාධ්‍යයක්" මිස, නොමග ගිය ක්‍රියාකරුවන් කිහිපදෙනෙකු විසින් අනෙක් අය කරන දේ විමසිල්ලෙන් නිරීක්ෂණය කිරීම මගින් ගැටලු නිර්මාණය කරන මධ්‍යස්ථ වේදිකාවක් නොවන බවට ඔවුහු සවිඥාණික වී සිටියහ: "ඔබ පැවසූ පරිදි, මම අදහස් කරන්නේ, එය අදහස් ප්‍රකාශ කිරීමක් වුවද, එය දේශපාලනමය පලකිරීමක් වුවද, ඔබව විනිශ්චය කරනු ලැබේ, නිරන්තර මුරකිරීමක් තිබේ. (ගයානි).

සහභාගිවන්නන් මෙම අවබෝධය සහමන්ත්‍රණය කරන ක්‍රම රාශියක් තිබේ. ඕනෑම පලකිරීමක් කරන සෑමවිටක දී ම, ඒවායේ ශ්‍රාවකයින් කවුරුන්ද යන කාරණය ගැන සිතීමට සිදුවන හෙයින් මුරකිරීමෙන් සුරක්ෂිතභාවය තහවුරු කිරීමට තාක්ෂණික ප්‍රවේශයක් ගැනීම

ඉතාමත් වෙහෙසකර කාර්යයක් බව බොහොමයක් සමලිංගික ස්ත්‍රීහු ඇඟවූහ. ලැප්ටොප් පරිඝනක මත රහස්‍යභාවය සැකසුම් නිරන්තරයෙන් වෙනස්කිරීමේ තාක්ෂණික විසඳුම ඉතා පහසුවුවත් ස්මාර්ට් දුරකථනවල ඒ ආකාරයට නිරන්තරයෙන් සැකසුම් වෙනස් කිරීම වඩාත් අවුල් සහගත වූ නිසාවෙන්, මෙය සෑම කෙනෙකුටම සුහදායී විසඳුමක් නොවී ය. ඒවාගේ ම, අධ්‍යයනයට පාත්‍ර වූ බොහොමයක් සමලිංගික ස්ත්‍රීන්ට එක්කෝ ලැප්ටොප් පරිඝනකයක හිමිකාරිත්වය නොතිබුණ හෝ එසේ හිමිකාරිත්වය තිබූ ස්ත්‍රීහු එය භාවිතා නොකළ හ. නිදසුනක් ලෙස ලාරා, ඇයගේ ස්මාර්ට් දුරකථනයේ රහස්‍යභාවය සැකසුම් නිරන්තරයෙන් ම පහසුවෙන් වෙනස්කළ නොහැකි බව වටහා ගත් පසු වෙනස් ම ආකාරයේ ප්‍රවේශයක් ගැනීමට තීරණය කළා ය. ඇය එහිදී, ඇයට කිරීමට හැකියාව නොමැති යයි හැඟුණවිට දී සමහර පුද්ගලයින් සීමිත පැතිකඩකට සම්බන්ධ කළා ය.

තුසිතාට වලක්වාලීම විකල්පයක් නොවී ය. රහස්‍යභාවය පිළිබඳ අදහස් පිළිනොගැනීමේ හා මුරකිරීම, සියලුම මුහුණුපොත් පරිශීලකයින් විසින් ඒ වනවිටත් අත්සන් තබා තිබෙන ගිවිසුමේ අන්තර්ගෘහිත කොටසක් බව පිළිගැනීමේ ආකල්පයෙන් යුතුව ඇය, ඇයගේ මුහුණුපොතේ පිටුවෙහි LGBTQ හා සම්බන්ධ සඟරාවලින් උපුටාගන්නා ලද තොරතුරු මෙන්ම ඇයගේ පෞද්ගලික තොරතුරු (ඇයගේ දුරකථන අංකය ද සහිතව) "පලකිරීමට බිය නොවන්නී ය." නමුත්, ඇයගේ මෙම පිළිගැනීම දෛවෝපගත දෙයක් නොවේ. ඊට වෙනස්ම ආකාරයට, පරිශීලකයා නිරන්තරයෙන් මුරකිරීම සමග සහමන්ත්‍රණයේ යෙදීම මුහුණුපොත භාවිතා කරන ක්‍රමවලින් කොටසක් වන හෙයින් යම් කොනෙකුට මුහුණුපොත භාවිතා කිරීමට අවශ්‍ය නම්, මුරකිරීම විසින් බියගන්වනු ලැබීම යථාර්ථවාදී විකල්පයක් නොවන බව ඇයට හැඟුණි. "ඔබ බියෙන් නම්, ඇයි ඔබ මුහුණුපොතෙහි සිටින්නේ" යි ඇය ඇසුවා ය.

අනෙක් අය තුළ වඩාත් විපිලිසරභාවී ප්‍රතිචාරයක් විය. සහභාගී වූවන්ගෙන් ගණනාවක් ම ඔවුන් විසින් මුහුණුපොතෙහි පලකිරීම් කරන ආකාරය සම්බන්ධයෙන් රැකවල් දමා තිබෙන බවත්, ප්‍රසිද්ධ මුරකිරීම පිළිබඳ කාරණාවන් නිසාවෙන් LGBTQ ගැටලු පිළිබඳ ව එතරම් ක්‍රියාකාරී නොවූ බවත් ප්‍රකාශ කරන ලදී. ලාරා සහ හර්ෂි වැනි සමහරෙක්, එසේ කිරීමට කරදර වනු නොහැකි වූ බව ප්‍රකාශ කරන්නට යෙදුණි. "ඒ මට විවෘතවීමට අවශ්‍යතාවයක් නොමැති නිසා නොවේ. එනමුත්, මට ඒ වෙනුවෙන් ශක්තියක් නැහැ.

මුහුණුපොත මත වඩාත් විවෘතවීමෙන් වැළකී සිටීමට මම උත්සාහ කරනවා." යි හර්ෂි ප්‍රකාශ කළා ය. හිරන්ති, ඇයගේ පෞද්ගලික වාතාවරණයේ සිදු වූ වෙනස්කම් නිසාවෙන්, LGBTQ තොරතුරු පලකිරීමට එදාට වඩා අඩු නිදහසක් පවතින බව මතකයට නැඟුවා ය.

"මම ප්‍රසිද්ධ චරිතයක් බවට පත් ව තිබෙන නිසා, මම මුල් කාලයේ මෙන් අනාවරණය වන්නේ නැහැ. ඉතිං මම කියවපු ලිපියක්, හෝ යම් දෙයක් බෙදා ගැනීම වැනි හුගාක් අසම්මත ලිංගිකත්ව හෝ LGBTQ සම්බන්ධ පලකිරීම් මම කරන්නේ නැහැ. පලකරන දේ හා මම අදහස් පලකරන දේ සම්බන්ධයෙන් මම ඉතා ප්‍රවේශම් වනවා. ඒ ආකාරයට තමයි, මම මේ මොහොතේ රවටමින් සිටින්නේ.ඉතිං මට ඒකත් නිකම් එකතු කරන්න හිතුණා" යි ඇය නිරීක්ෂණය කළා ය. ඇය සමග එකඟවෙමින් රේබා ප්‍රකාශ කළේ,

මමත් රාජ්‍ය සේවයේ නියුතු කෙනෙක්. අපගේ ආයතනයට මුහුණුපොතෙහි පිටුවක් තිබෙනවා. නමුත් මාව ඒකට එකතු කරනු ලබනවට මම කැමති නැහැ. මොකද එය ඍජුව ම මගේ වෘත්තියට බලපාන නිසා. මම අන්තර්ජාලය භාවිතා කරනකොට මේ වගේ ගැටලුවලට මුහුණ දෙනවා. ඉතිං මම අවශ්‍ය වුනත් LGBTQ සහ සම්බන්ධ කිසිම දෙයක් මම බෙදාගන්නේ නැහැ. ඒ අර්ථයෙන් මම ස්වාධීන නැහැ. ඒවාගේ ම මට එවැනි ආකාර වූ ගැටලු තිබෙනවා. මේ වාගේ ගැටලු නිරාකරණය වනවා නම් හොඳයි. එතකොට එය අපට ගැටලුවක් නොවේ. මම තොරතුරු බෙදා ගන්න කැමතියි." යන්න ය. ඒ අතරම රේබා ඇයගේ දුරකථන අංකය මුහුණුපොතේ පැතිකඩෙහි සඳහන් කර තිබෙන්නී ය.

අන්තර්ජාල අවකාශය භාවිතා කිරීමේ දී සමලිංගික ස්ත්‍රීන් ප්‍රසිද්ධ මුරකිරීම අත් දකින ආකාරයේ ඇති මෙම පරිණාමයේ කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ, ඔවුහු එයට ඔවුන් විසින්ම විෂයානුබද්ධ ලෙස හුරුවන ආකාරය හා විචක්ෂණ ලෙස නිරාකරණය කරන ආකාරය යි. අධ්‍යාපන ආයතනයක උපදේශකවරියක් වන රජ්ජි, ආරම්භයේ දී ඇයගේ සගයන් හා වෙනත් අය, ඇය පලකරන දේ දකීවී යයි කණස්සලු වූවා ය.

මගේ ආයතනයේ බොහෝ අය දිගු කලක් තිස්සේ මාව මුහුණුපොතෙහි එක්කර තිබුණා... ටික කලකට පසු, ඒ කියන්නේ, ඒ ගොල්ලෝ දන්නවා මම පලකරන දේ. ඒ නිසා එය මට පුංචි ගැටලුසහගත දෙයක්. දීර්ඝ කාලයක් තිස්සේ, මෙම කාරණය නිසාවෙන් ඉතා දැඩි ලෙස මම මාවම වාරණය කර ගත්තා. නමුත්, දැන් මගේ ආයතනය ඇතුලෙහි මගේ ප්‍රවේශය වන්නේ විවෘත මනසකින් විසීම හා විවේචනාත්මක වන ආකාරය යි. එය මුහුණුපොතෙහි දී හැසිරවිය නොහැකියි වගේ නම්, ඔබ දන්නා පරිදි 'දැඩි' ආකාරයේ ආකල්පයක් විද්‍යාමාන කරනවා,

යනුවෙන් ඇය ප්‍රකාශ කළා ය.

## සමාජ ජාලගතවීම හා පෙම් හමුවීම්

අන්තර්ජාල අවකාශයේ ඇති අනෙකුත් ද්විත්ව භාවිතාවන් වන්නේ මිතුරන් ඇති කර ගැනීම සහ මිතුරුදම් පවත්වා ගැනීම යි. පුෂ්පා වැනි සමහරෙක්, "තම යහළුවන් හරහා පැමිණෙන LGBTQ මිතුරන් වැනි මිතුරන් සොයා ගැනීම සඳහා මුහුණුපොත භාවිතා කරති. ඒ මන්ද යත්, මගේ යහළුවන් ලැයිස්තුවේ සිටින බොහොමයක් යහළුවන් සමලිංගික යහළුවන් වන හෙයිණි." ලාරා වැනි අනෙක් අය, මුහුණුපොතෙහි දී, යහළුවන් ක්‍රියාකාරීව නොසොයන අතර ඒ වනවිටත් ඔවුන් දන්නා අය සමග "මිතුරුදම්" ඇති කර ගන්නා බව ප්‍රකාශ විය. මුහුණුපොත ලොව නන්දෙස පැතිර පවත්නා LGBTQ හා සම්බන්ධ "ජාලයක්" පවත්වා ගැනීම සඳහා භාවිතා කරනු ලැබේ. "අන්තර්ජාතික මට්ටමින් ජනතාවගේ ජාලයක් පවත්වා ගැනීම මුහුණුපොත හරහා හැකි කරවනු ලැබ තිබේ. මක් නිසාද යත්, මම රටවල් කිහිපයක ම වාසය කර තිබෙනවා. ඒ අනුව මට එම රටවල්වල මිතුරන් සිටිනවා" යි ගයානි ප්‍රකාශ කළා ය.

## පෙම් හමුවීම්

පෙම් හමුවීම් ඇති කර ගැනීමේ අරමුණ සඳහා ස්ත්‍රීන් විසින් අන්තර්ජාල අවකාශය භාවිතාවේ යෙදු වූයේ ද යන්න හඳුනා ගැනීම සඳහා අධ්‍යයනය සියුම් ලෙස විමර්ශනයේ යෙදුණි. ස්ත්‍රීන්ට ඔවුන්ගේ කවයන් තුළ ඇති හැසිරීම සම්බන්ධයෙන් ඇති අවබෝධය ගෙන බලන කල, යොමුගත කණ්ඩායම් සාකච්ඡාවෙන්

(සහ අන්තර්ජාල සමීක්ෂණයෙන් තහවුරු කරන ලද) මතු වූ සාමාන්‍ය මතය වූයේ සාමාන්‍යයෙන් අන්තර්ජාල පෙම් හමුවීම්, වඩාත් සුවිශේෂී ආකාරයෙන් ගතහොත් එවැනි පෙම් හමුවීම් සඳහා සුවිශේෂී කාර්යය මෘදුකාංග භාවිතය, සමලිංගික ස්ත්‍රීන් අතර බහුල වශයෙන් සිදු නොවූ බවයි. මෙය, විවිධ වයස් කාණ්ඩයන්ට අයත් සමූහයන් හරහා ද තහවුරු විය. සහභාගීවූවන් දෙදෙනෙකු හැර, අනෙක් අයට, ටින්ඩර් (Tinder) හෝ එවැනි වෙනත් පෙම් හමුවීම් පහසුකරණය කරන සුවිශේෂ කාර්යය මෘදුකාංග භාවිතා කර නොතිබූ බව ප්‍රකාශ විය.

අධ්‍යයනයට සහභාගී වූ ස්ත්‍රීන් අතරින් කිහිපදෙනෙක් උලුප්පා පෙන්වන ලද කාරණා වලින් එකක් වූයේ ඔවුන් වෙනත් ස්ත්‍රියක් සමග "කැපවුණු සබඳතාවයක" (තුසිතා) සිටින බවයි. මෙයින් හඟවණු ලබන්නේ ඔවුන් දිගින් දිගට ම පෙම් හමුවීම් නොසොයන බව ය. කෙසේවෙතත් අඩුම තරමින් සියලුම ස්ත්‍රීන්ට සහකරුවෙක් නොසිටි බැවින් මෙය එකම කාරණය ද නොවුණි. පෙම් හමුවීම් සඳහා භාවිතා කරනු ලබන සුවිශේෂී කාර්යය මෘදුකාංග භාවිතය පිළිබඳව පවතින ආකල්ප එහි එක් අංගයක් ලෙස හඟවනු ලැබී ය. පෙම් හමුවීම් සඳහා භාවිතා කරන සුවිශේෂී කාර්යය මෘදුකාංග පරිශීලනය නොකෙරුව ද සමලිංගික ස්ත්‍රීන් අනිවාර්යයෙන් ම ඒවා දෙස ජුගුප්සාජනක ලෙස බලන බවත් එම මෘදුකාංග භාවිතා කරන ස්ත්‍රීන් පහත්කොට සලකනු ලබන බවට පෙන්වීමට සාධක නොමැති බව තහවුරු කර පෙන්වීමට මාලිට අවශ්‍ය වූවා ය. පෙම් හමු සුවිශේෂීකරණ මෘදුකාංග සුවපහසු ලෙස භාවිතා කරන, එමෙන් ම, ඒවායින් තෘප්තිමත්භාවයක් ලබන සමලිංගික ස්ත්‍රීන් පිළිබඳ සිද්ධීන් ප්‍රමාණයක් උපුටා දක්වමින් ඇය, මෙම මෘදුකාංග ස්ත්‍රීන්ට පෙම් හමුවීම් සඳහා වෙනත් ස්ත්‍රීන් සොයා ගැනීමට අවශ්‍ය අවකාශය සලසා දෙන්නේ ය යන මතය දැරුවා ය. මෙය දේශපාලන හෝ සුරක්ෂිතභාවය හා සම්බන්ධ ගැටලුවලින් සම්පූර්ණයෙන් ම මිදී නොපැවතුන ද විශේෂයෙන් ම, ව්‍යුහාත්මක කාරණා මගින් ස්ත්‍රීන්හට තථ්‍ය ලොව තුළ එකිනෙකා මුණ ගැසීම සඳහා ඇති අවකාශය සීමාසහිත කර ඇති අවස්ථාවේ දී, ඇය එවැනි අවකාශයක වටිනාකමක් නොමැති යයි ප්‍රකාශ නොකළා ය. මේ අනුව "අප එය භාවිතා නොකරන නමුත්, එය හොඳ දෙයක්" ලෙස ඇය ප්‍රකාශ කළා ය. රත්නා "මම පෙම් හමුවීම් පහසුකරණය කරන වෙබ් අඩවි භාවිතා කරන්නේ නැහැ. නමුත් මම ඒවාට ගොස්, විමසීම් කර ඒවා පරීක්ෂා කර තිබෙනවා"යි පවසමින් පෙම් හමු

සුවිශේෂීකරණ මෘදුකාංග එක් අතකට ස්ත්‍රීන්ට පෙම් හමුවීම් සඳහා වෙනත් ස්ත්‍රීන් සොයා ගැනීමට ප්‍රයෝජනවත් වන බවට සිතිවිලිබර වූවා ය. අනෙක් අතට, මෙම ස්ත්‍රීන් කිහිපදෙනාගේ අදහස් මගින් පෙන්වනු ලබන්නේ, පෙම් හමුවීම් සුවිශේෂීකරණ මෘදුකාංග ගැන ඔවුහු නොදැන සිටින බවත්, ඒ සම්බන්ධයෙන් කුතුහලයක් නොදක්වනවා යන කාරණාවන් දෙක වේ; බොහොමයක් දෙනෙකුට ස්ත්‍රීන් සඳහාම වන අන්තර්ජාතික පෙම් හමු සුවිශේෂීකරණ මෘදුකාංග පවතින බවට අවබෝධයක් පැවති බව නොපෙනුණි; මෙවැනි මෘදුකාංග දේශීයව භාවිතා කළ හැකි ද යන කාරණය සම්බන්ධයෙන් ද අවිනිශ්චිතභාවයක් පැවතුණි.

පෙම් හමු සුවිශේෂීකරණ මෘදුකාංග සඳහා අධ්‍යයනයේ සිටි ස්ත්‍රීන්ගෙන් බොහොමයක් දෙනෙකුගෙන් වැඩි අවධාරණයක් නොලැබුණි. නමුත්, භාවාත්මක හා ලිංගික සබඳතාවයන් ගොඩනගා ගැනීම සඳහා ඔවුන් අන්තර්ජාල අවකාශය භාවිතා නොකළ බව මින් අදහස් නොකෙරේ. ඇතැම් දෙනා පෙම් හමු පැවැත්වීමටත් සබඳතාවයන් ගොඩනගා ගැනීමටත් අන්තර්ජාල අවකාශය බෙහෙවින් භාවිතා කළ බව ප්‍රකාශ කරයි. තම සහකරු සමග දුරස්ථ සම්බන්ධතාවයක යෙදී සිටින ස්ත්‍රියකට ස්කයිප් (Skype), ජීචැට් (Gchat), සහ (Facetime) ෆෙස්ටයිම් යන මෘදුකාංග එම සබඳතාවය පවත්වා ගැනීම සඳහා අතිශයින් ම වැදගත් වේ. අපගේ සම්මුඛ සාකච්ඡාවලට සහභාගී වූ පුද්ගලයින් දෙදෙනෙක් - යුවලක් - පෙම් හමු සුවිශේෂීකරණ මෘදුකාංග හෝ වෙබ් අඩවි හරහා නොවූව ද ඔවුන් කියා සිටියේ ඔවුන්ගේ හමුව සහ සබඳතාවය ආරම්භ වීම අන්තර්ජාලය හරහා සිදු වූ බවයි. ඔවුන් මද කාලයක් අන්තර්ජාලය තුළ වෘත්තිකමය වශයෙන් එකිනෙකා අනුගමනය කළ අතර පසුව මුහුණුපොත වැනි වේදිකාවන් හරහා අල්ලාප සල්ලාපයේ යෙදීම ආරම්භ කර ඇත.

## කීර්තිය

ඔබ පලකරන සහ බෙදාගන්නා දේ පදනම් කරගෙන සහ ඔබ ප්‍රසිද්ධියේ අන්තර්ජාලය හරහා බෙදාගන්නා දේශපාලනය වැනි දේ තුළින් ඔබ පිළිබඳව වන අන් අයගේ තක්සේරුව සම්බන්ධව යම් චකිතයක් නිර්මාණය වේ. සුවිශේෂී පලකිරීම් ඔවුන් සම්බන්ධව අන් අයට 'ප්‍රකාශ'කරනු ලබන හෝ නොලබන දේ පිළිබඳව ඇගයීමේ දී සමහර සහභාගීවූවන් එක්තරා ආකාරයක ප්‍රවේශකාරී හා පෙරදැක්මක් සහිත පිළිවෙතක් ප්‍රායෝගිකත්වයට යොදා ඇති

බව පෙනේ. සමහරෙක්ට, අප ඉහත සාකච්ඡා කරන ලද දෙයින් වෙනස්වන දෙයක් ගම්‍යමාන වුව ද මෙසේ කීර්තිනාමය ආරක්ෂා කර ගැනීම ම මුරකිරීම පිළිබඳ හැඟීමකට පරිවර්ථනය වේ.

මාලි, ඇයගේ සමාජ මාධ්‍ය කවයන් වෙත අවධානය යොමු කරමින් "ජනතාව මුහුණුපොතෙහි දී ඉතාමත් ස්වයං-සවිඥාණික" වන බව පැවසුවා ය. එමෙන් ම, ඇය ප්‍රකාශ කරනු ලබන දෙය ඇයගේ දේශපාලනය දකිනු ලබන හා ඇගයීමට භාජනය වන ආකාරයට බලපෑමක් විය හැකි බව ඇය අවබෝධ කරගෙන සිටින අතර ඕනෑම දෙයක් පලකරන විට දී ඇය නිරතුරුවම ඒ ගැන කල්පනාකාරී වන ආකාරයේ ප්‍රවේශයක් ගත් බව කියා සිටී.

> "මම සමලිංගික, ද්විලිංගික හා සංක්‍රාන්ති සමාජභාවය හා සම්බන්ධ ගැටලු මුහුණුපොතෙහි බෙදාගන්නා විට දී, අපි බෙදා ගන්නා දේ දෙස බලා සිටින අය සිටින බව මම දන්නවා... අපට සමපදස්ථ කණ්ඩායමක් සිටින අතර ඔවුන් බොහෝවිට දැකීමට උත්සාහ කරන්නේ හෝ ඔවුන් පවසන්නේ 'අහ්, ඔබ මෙය බෙදා ගත්ත ද? පලක් නැහැ, මෙය ව්‍යාජ ප්‍රවෘත්තියක්' හෝ මේ පුවත 'අර අන්තවාදී පැත්තෙ ඉන්න කට්ටිය ලියන එකක්' හෝ මේ තොරතුරු මේ පැත්තේ දේශපාලනයට අනුව නිවැරදි වුවත් අනෙක් පැත්තේ දේශපාලනයෙන් එය වැරදි ප්‍රවෘත්තියක්, යනාදී වශයෙන් බව ඇය ප්‍රකාශ කළා ය.

"අප යම් දෙයක් බෙදා ගැනීමට පෙර මේ දේවල් සම්බන්ධයෙන් අඩුම තරමේ තුන් හතර වතාවක්වත් සිතා බැලිය යුතු යි. ඒ මන්ද යත් ප්‍රථමයෙන් ම අප මිනිසුන් අපගේ දේශපාලනය ගැන සිතිය හැකි දේ ගැන සිතිය යුතු අතර ඊළඟට තමයි, මුහුණුපොත මත ක්‍රියාත්මක විය යුත්තේ. මේ බව මම දන්නවා." යන්න මෙවැනි ආකාර වූ මුරකිරීමට ඇතුලත් වේ. මෙන්න මේ කාරණය නිසා තමයි, මම හැමදෙයක් ම ඉතා ප්‍රවේශමෙන් බෙදාගන්නෙ. ඒ මක් නිසාද යත්, ඔබ යම් දෙයක් බෙදා ගන්නා විට දී මිනිසුන් ඔබ ගැන සිතන දේ වෙනස් වේ" යි මාලි විස්තර කළා ය.

මෙවැනි ආකාර වූ මුරකිරීමට පාදක වන උපකල්පන වලින් එකක් වන්නේ, සමාජ මාධ්‍ය පැතිකඩ යනු කෙනෙකුගේ 'යථාර්ථ' ස්වරූපයේ සහ කෙනෙකුගේ 'යථාර්ථ දේශපාලනයේ සෘජු පිළිබිඹුවකි. "මිනිස්සු හැමවෙලේ ම 'මේ පුද්ගලයා මොකෙක්ද?'

වගේ තමයි බලන්නෙ. යම් දෙයක් කියන හැමවිටම පලකරන්නෙ වෙන දෙයක්. බළලෙකුගේ පින්තූරයක් තිබෙනවාද? එහෙනම් ඔබ බළලුන්ට කැමති කෙනෙක් වෙනවා!" යි ප්‍රකාශ කරමින් කලා මෙවැනි තාක්ෂණික හා කොන්දේසි විරහිත සංකල්පනාවන් ගොඩනැගීමේ උත්සාහයන් මතභේදයට ලක් කළා ය.

කෙනෙකුගේ කීර්තිනාමය හා සම්බන්ධ චකිතයන් හෝ කෙනෙකුව දකිනු හෝ ප්‍රත්‍යක්ෂ කරගනු ලබන ආකාරය හෝ මෙම අවකාශයන් තුළ දී කෙනෙකු තමාව දකිනාකාරය, කෙනෙකුගේ 'සුරක්ෂිතභාවය' හා සබැඳී තිබෙන බව පෙනේ. එක් සහභාගීවන්නෙක් එවන් ආකාර වූ සට්ටනයක නිරත වී ජය ගැනීමට නොහැකි කෙනෙක් වශයෙන් ඇය විසින් ම ඇයව හඳුනාගෙන තිබෙන නිසාවෙනුත් සට්ටනයක නිරතවීම මගින් ඇයට අනාරක්ෂිත හැඟීම් ඇති කරවන නිසාවෙනුත් සට්ටනයක් ඇති විය හැකි දිසාවෙන් හිතාමතාම ඉවත් ව සිටින්නී ය.

"සංවාදයක නිරතවීමටත්, බුද්ධිමත් ආකාරයට එය ආරක්ෂා කිරීමටත් හෝ සාකච්ඡා කරන කාරණය පැහැදිලි ව ඉදිරිපත් කිරීමට නිසැක විශ්වාසයක් තිබෙන මෙවලම් ඇත්ත වශයෙන් ම මා සතුව නොමැති නිසාවෙනුත්, මම සහභාගී වන්නේ නැහැ. නමුත්, කෙනෙකුගේ අදහස් කියවීම - නිකම්ම එය කියවීම ම පමණක් එය හිංසනයක්. ඒකම ප්‍රමාණවත්. ඒක තමයි මට පුළුවන් (සිනහවෙමින්)." (කිෂාණි)

## ***සුරක්ෂිතභාවය***

අපි කතාබහ කළ සමලිංගික ස්ත්‍රීන්ගෙන් බොහොමයක් දෙනෙක් සාම්ප්‍රදායික තාක්ෂණික අර්ථයෙන් අන්තර්ජාල 'සුරක්ෂිතභාවයට' ප්‍රවේශ නොවූ බව පැහැදිලි විය. අන්තර්ජාලයේ නියුතුවීම හා සම්බන්ධ ව පවතින අවදානම පිළිබඳව බිය හා චකිතයන් පවතී. එනමුත්, තාක්ෂණික අංශය ඇතුලත් වන නමුත් එයටම පමණක් සීමා නොවූ ඔවුන්ගේ ප්‍රවේශයෙහි ඇති දූරදර්ශීභාවයේ වටිනාකම වඩාත් ම අවධාරණය කරනු ලබන බව අප මෙහිදී ඉස්මතු කර පෙන්වමු. ආරක්ෂාකාරී පිළිවෙතක් සහිත හෝ ගොදුරක් බවට පත් කරනු ලැබීමේ හා භීතිය යන හැඟීම්වලින් පොළඹවන ලද තාක්ෂණික පියවරයන් දිරිමත් කරනු ලබන අනෙකුත් ප්‍රවේශයන්ට වඩා, කෙනෙකුගේ අන්තර්ජාල නියුතුවීම් තුළ දූරදර්ශීවීම පිළිබඳ වඩාත් සමෝධානික අවබෝධයක් පැවතීම සමලිංගික ස්ත්‍රීන්

වෙනුවෙන් පවතින වඩාත් සවිබල ගැන්වීමේ පර්යාලෝකයක් වශයෙන් දකින ලදී.

බොහොමයක් ප්‍රතිචාරකයින්, විශේෂයෙන් ම, අන්තර්ගතය පෞද්ගලිකව බෙදා ගැනීම හෝ පෞද්ගලික සමූහ අල්ලාප සල්ලාපයන් පැවැත්වීම වැනි, විවිධාකාර වූ අරමුණු සඳහා සමාජ මාධ්‍ය වේදිකාවන් මෙන්ම විවිධ සුවිශේෂිකරණ මෘදුකාංග භාවිතා කිරීමේ දී සවිඥාණකව ම දූරදර්ශී වී සිටි බවද පැහැදිලි විය. ඔවුහු, මුහුණුපොත වැනි වේදිකාවන්ගේ රහස්‍යතාවය හා සම්බන්ධ වන ගැටලු පිළිබඳ ව දැන සිටියහ. නිදසුනක් ලෙස පුෂ්පා, ඇයගේ සමලිංගික යෙහෙළියන්, සාපේක්ෂව 'අනාරක්ෂිත' බව දැන සිටි නමුත් එවැනි ජාලගතවීමක් සඳහා පහසුකරණය කළ මුහුණුපොත වැනි අවකාශයන් හරහා එකිනෙකා සමග සම්බන්ධවීම ආරම්භ කළ ආකාරය අවධාරණය කළා ය. විශ්වාසය ගොඩනැගුණු පසු තථ්‍ය අවකාශය තුළ දී රැස්වීමක් පවත්වා, ඔවුනට සංවාදය වඩාත් පාලනය කිරීමේ හැකියාවක් ඇති බව තේරුම්ගත්, වයිබර් (Viber) වැනි, වඩාත් පුද්ගලික මෙන්ම 'ආරක්ෂිත' වෙනත් අන්තර්ජාල අවකාශයකට සංක්‍රමණය කරමින්, ඔවුහු සිතාමතා ම ඔවුන්ගේ මුහුණුපොත් සමූහය අතහැර ගියෝ ය. මෙය, බොහොමයක් සහභාගීවූවන් නිර්මාණශීලී ලෙස බහුවිධ අන්තර්ජාල වේදිකා ඔවුන්ගේ විවිධ අරමුණු සඳහා බලසම්පන්න ලෙස මෙහෙය වූ ආකාරය පෙන්වන එක් නිදසුනක් පමණි.

එක් සහභාගීවූවකු හැර අනෙකුත් සමලිංගික ස්ත්‍රීන්ගෙන් එක් අයෙකුවත්, අන්තර්ජාල සමීක්ෂණයේ සඳහන් කර තිබූ ආකාරයට, සංඛ්‍යාංක (ඩිජිටල්) සුරක්ෂිතභාවය පිළිබඳ ව පුහුණුවකට සහභාගී නොවී තිබීම ගැන සටහන් කිරීම වැදගත් වේ. අන්තර්ජාල සුරක්ෂිතභාවය සහ රහස්‍යභාවය පිළිබඳ ඔවුන්ගේ දැනුම සුවිශේෂී ලෙස ඔවුන්ගේ පුද්ගලික මෙන් ම සාමූහික අත්දැකීම්වලින් ආරම්භය ලබා තිබෙන බව උපකල්පනය කිරීම ආරක්ෂාකාරී වේ. නිදසුනක් වශයෙන් පුෂ්පා පහත සඳහන් පරිදි කියා සිටියේ,

> "මුහුණුපොතෙහි හෝ අන්තර්ජාලයේ සැරිසරන එවැනි සමලිංගික ස්ත්‍රීන් සම්බන්ධව ගතහොත් යම් ආකාරයක ගැටලුවක් පවතින්නේ නම්, ඒ කියන්නෙ අපට එවැනි ගැටලුවක් පිළිබඳව දැන ගැනීමට ලැබුණොත් ඔවුන් විසින් කළ යුතු දේ පිළිබඳ ව

අපි ඔවුනට පවසනවා. බොහෝ අවස්ථාවලදී මම මිනිසුන්ට ඔවුන්ගේ රහස්‍යතාවය සැකසුම් වෙනස් කිරීමට පවසා තිබෙනවා. මුහුණුපොතට යන නමුත් තවමත් තමන්ගේ රහස්‍යතාවය සැකසුම් වෙනස් කිරීමට නොදන්නා හුඟක් අය ගැන මම දන්නවා. ඒ වගේ අයට පියවරින් පියවර පැහැදිලි කරන පරිසනක තිරය මත දිස්වන දර්ශණ ඛණ්ඩ ගෙන ඒවා ඔවුන්ට යවා ඒ අනුව රහස්‍යතාවය සැකසුම් වෙනස් කිරීමට මම පවසා තිබෙනවා. ඉතිං, මා සමග සිටින යෙහෙළියන් පිරිසක් ඔවුන්ගේ රහස්‍යතා සැකසුම් ඒ ආකාරයට සකස් කර ඇති අතර, මා එවැනි කිසිඳු ගැටලුවකට මුහුණ දී නොතිබුණත් මගේ යෙහෙළියන් මුහුණ දෙන ප්‍රශ්න ගැන මම දැනුවත් ව සිටිනවා. මේ නිසාවෙන් රහස්‍යතා සැකසුම් වෙනස් කරන ආකාරය පිළිබඳව මම ඔවුනට අවවාද දී තිබෙනවා. මම ඔවුන්ට, ඔවුන් මුහුණුපොතේ දී පිළිගත යුතු අය මෙන් ම පිළිනොගත යුතු අය හා ඔවුන් කළ යුතු දේ ආදිය පිළිබඳව දැනුම් දී තිබෙනවා.

## *උපායමාර්ගයන්*

මෙම ස්ත්‍රීන්ගෙන් බොහොම දෙනෙක් අන්තර්ජාලය තුළ ආරක්ෂාකාරී ලෙස රැඳී සිටීම සඳහා ඔවුන්ගේ 'දූරදර්ශීභාවය' සරල හා ඉතා 'ප්‍රායෝගික' ප්‍රවේශයන් මෙන්ම උපායමාර්ග ගොඩනගා ගැනීම සඳහා යොදවා තිබෙන ආකාරයක් අපි නිරීක්ෂණය කළෙමු. එම උපායමාර්ගයන්ගෙන් සමහරක් පහත සඳහන් කර ඇත.

- සීමිත පැතිකඩ මත පවුලේ සාමාජිකයින් එක් කර තිබීම.
- වැඩිහිටි ඥාතීන් නොවන 'දෙවන පරපුරේ' ඥාතීන් පමණක් (එනම් ඔවුන්ගේ සමවයස් කණ්ඩායම) එක් කිරීම.
- පොදු මිතුරු මිතුරියක් නම් පමණක් හෝ පොදු මිතුරු මිතුරියන් අතර සබඳතාවයක් පවතින්නේ නම් පමණක් එක් කිරීම.
- පවුලේ සාමාජිකයින්/ඥාතීන් කොහෙත්ම එක් නොකිරීම.
- ලිංගිකත්වය පිළිබඳ සංවාදයන්හිදී එම සංවාදයන්හි

නියුතුවීමෙහි/අදහස් පලකිරීමෙහි නොයෙදී සිටීම.

- ලිංගිකත්වය පිළිබඳ අන්තර්ගතය පලකිරීමේ නොයෙදී සිටීම.
- පවුලේ සාමාජිකයින් හෝ ඥාතීන් විසින් පලකරන ලද පලකිරීම්වලට, ඔවුන්ගේ අදහස්වලට විරුද්ධත්වය ප්‍රකාශකරන (උදාහරණ වශයෙන් ආගමික පලකිරීම්) ආකාරයට නියුතුවීමෙන්/අදහස් ප්‍රකාශ කිරීමෙහි නොයෙදී සිටීම.
- සැබැවින් ම අදහස් ප්‍රකාශකිරීම වෙනුවට කෙනෙකුට ප්‍රකාශ කිරීමට අවශ්‍යව ඇති දේ පිළිබිඹු කරන අනෙක් අයගේ දේශපාලන අන්තර්ගතයට/පලකිරීම්වලට කැමැත්ත දැක්වීම.
- පලකිරීම් හරහා උපුටා ගැනීමෙන් හෝ පොළඹවාලනු ලැබීමෙන් වැළකී සිටීම පිණිස ඒවා කෙටියෙන් හරය පමණක් සහිතව සංක්ෂිප්තව තැබීම.
- මතභේදයට තුඩු දෙන අදහස් අභිමුඛ වී නොගැනීම. නමුත්, අදහස් ප්‍රකාශ කරන්නාට වඩා තම සමපදස්ථ කණ්ඩායමට පැහැදිලි ව කියවීමට හැකිවන ලෙස කාරණය අවධාරණය කරන වක්‍ර කතිකාවක් භාවිතාවේ යෙදවීම.
- සාමූහික ක්‍රියාකාරකමක් ක්‍රියාවෙහි යෙදවීම - අන්තර්ජාලය තුළ සැක කටයුතු පුද්ගලයින් වෙසේ නම් අනෙක් මිතුරු මිතුරියන් ද ඔහු හෝ ඇය ගැන 'අනතුරු හැඟවීම'
- 'රහස්‍යතා සැකසුම්' වැනි දේ සම්බන්ධයෙන් එකිනෙකාට අදාල හෝඩුවාවන් ලබා දීම.
- අනෙකුත් සමලිංගික ස්ත්‍රීන්ව හඳුනාගත හැකි අන්තර්ගතය පලකිරීම මගින් ඔවුන්ව අන්තරායට භාජනය නොකරන විනිශ්චයන් කිරීම.

# නිගමනය

අප සාකච්ඡා පවත්වනු ලැබූ සමලිංගික ස්ත්‍රීන්ගෙන් බොහොමයක්, එසේ නොමැති නම් ඒ සියලු දෙනාම, ස්ත්‍රීන්/විවිධ ලිංගික දිශානතීන් හා ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතා සහිත ස්ත්‍රීන් අන්තර්ජාල කටයුතුවලට ප්‍රවේශ වන ආකාරය පිළිබඳව පවතින ඒකාකෘති වූ ආඛ්‍යාන හා විශ්වාසයන්ට පටහැනිව යන ඔවුන්ගේ අන්තර්ජාල සුරක්ෂිතභාවය සම්බන්ධ පර්යාලෝකයන් හි එල්බ ගෙන සිටින බව අපට සොයා ගැනීමට හැකි විය.

ඔවුහු වැඩි දෙනා ඔවුන්ගේ අන්තර්ජාල නියුතුවීම්වලට දැඩිලෙස සීමා කිරීම් කරනු ලැබූ බව පිළිගත්හ. මෙම සීමා කිරීම් සුවිශේෂි ලෙස ගත්කළ සමාජභාවී මෙන්ම ලිංගිකකරණය කරන ලද අත්දැකීම් වේ. ප්‍රතිචාරකයින්ගෙන් සමහරක් අන්තර්ජාලය තුළ අයිතිවාසිකම් පදනම් කරගත් මාතෘකා වෙනුවෙන් පෙනී නොසිටියා හෝ නිරන්තරයෙන් ලිංගිකත්වය හා ලිංගික අයිතීන් හා සෘජුව ම සම්බන්ධ වන අන්තර්ගතය පිළිබඳව පැහැදිලි ලෙස බෙදා ගැනීම හෝ අදහස් පල කිරීම් නොකර සිටී. සමහරවිට, සමලිංගික භීතිකාව දනවන අවමානාත්මක ග්‍රාම්‍ය ව්‍යවහාරයන්ට (homophobic trolling) මුහුණදීමට ඇති චකිතය මෙන්ම එවැනි මෙවලම් මෙසේ භාවිතාවෙහි නොයෙදූ නිසාවෙන් ඔවුහු හුදෙක් අන්තර්ජාලය ඔස්සේ මෙවැනි සංවාද සමග සම්බන්ධ වී නොසිටියහ.

කෙසේවෙතත් මෙම බාධාවන්, පෞද්ගලික, චිත්තවේගීමය සහ ව්‍යුහාත්මක මට්ටමෙහි දී ඔවුන් අන්තර්ජාලය තුළ කටයුතු කරන ආකාරය හැඩගස්වන ලද අතර, බොහෝදෙනෙක් ඔවුන්ගේ අත්දැකීම් විවිධ පැතිකඩ ඔස්සේ තෝරා බේරා වෙන්කර දැක්වීමට මහත් පරිශ්‍රමයක් දැරුවෝ ය. මේ නිසාවෙන්, අපට මෙහිදී අරගලයේ හා පීඩනයේ සජාතීය හා ඒකීයමය චිත්‍රයක් හුදෙක්ම නොලැබුණි. මේවා ඔවුන් මත පටවා තිබූ බාධාවන් වෙත බලය ගලාගෙන ගිය අසමාන ආකාරය ගෙනහැර පෑමේ දී මෙන්ම ඔවුන්ට එම අන්තරාවකාශයන් අතරින් ඔවුන්ගේ අන්තර්ජාල අවකාශයේ භාවිතාව මෙහෙයවීමට, අවුල් කිරීමට, සහමන්ත්‍රණය කිරීමට හා කළමනාකරණය කිරීමට හැකිවූ ආකාරය අනාවරණය කිරීමේ දී විශේෂයෙන් ම සමර්ථ වී ඇත.

හොඳින් දැනුවත්වීමේ වැදගත්කම; බාධාවන් හා සුපරීක්ෂාකාරිත්වය පිළිබඳ ව ප්‍රායෝගිකවීම; බියට යටපත් නොවීම; ගොදුරක් බවට පත්වීම හා ආරක්ෂාකාරී වනවාට වඩා මුරකිරීම පිළිබඳ ව විචක්ෂණශීලීවීම; අධි-අවධාරණය කිරීමකින් තොරව තිබිය යුතු විටදී විමසිලිමත් වීම; බාධාවන් පිළිබඳ ඔවුන්ගේ සවිඥාණිකභාවය ද (විශේෂයෙන් ම සුපරීක්ෂාකාරීත්වය) කාලයත් සමගම වෙනස් වන බවත් සදාකාලික නොවන බවත් තෙරුම් ගැනීම; සමාජ මාධ්‍ය තුළ මුරකිරීම හැකි කරවන ව්‍යුහාත්මක සාධක තිබෙන බව වටහා ගැනීම ද ඇතුළත් ව මුරකිරීම පිළිබඳව පරිපූර්ණ අදහසක් දැරීම වැනි දේ පිළිබඳ ව ඔවුහු අවධානය යොමු කළෝය.

අප පෙර සඳහන් කර ඇති පරිදි මෙම කණ්ඩායමට අයත්වූවන්ගෙන් කිසිඳු කෙනෙක් සංඛ්‍යාංක ආරක්ෂණ පුහුණු කිරීමවල කිසිඳු අත්දැකීමක් ලබා නොතිබීම මෙන්ම ඔවුන්ගේ දැනුම ජීවත්ව ලත් අත්දැකීම් හා අනෙක් අයගේ ඉගෙනුම්වලින් ලත් වඩාත් ආත්මගත ස්ථානයකින් පැවත එන බව පෙනීම සටහන් කිරීමට වැදගත් කරුණකි.

සාම්ප්‍රදායික සංඛ්‍යාංක ආරක්ෂණ පුහුණුවීම් පිළිබඳව හා එවැනි පුහුණුවීම් සිදුකරන ආකාරය පරීක්ෂා කර බැලුවහොත් ඒවා විශාල වශයෙන් සුරක්ෂිතභාවය සම්බන්ධව දැඩි 'තාක්ෂණික' ප්‍රවේශයක් අනුගමනය කරනු ලැබේ. සංඛ්‍යාංක ආරක්ෂණ පුහුණුවීම්වල ප්‍රවනතාවය වෙනස් වී ඇත. ඇත්ත වශයෙන්ම, පුහුණුකරුවෝ 'පරිපූර්ණ' හෝ 'ඒකාබද්ධ' පුහුණු පුරුදු වැඩිවශයෙන් අනුගමනය කරති. 'ආරක්ෂණයේ සංඛ්‍යාංක', භෞතිකමය, හා මනෝ-සමාජයීය අංගයන් හා සංකලනය කිරීම 'පරිපූර්ණ' හෝ 'ඒකාබද්ධ' ආරක්ෂණය' වශයෙන් හඳුන්වනු ලැබේ. නමුත්, මේවා නව පුරුදු වේ. මෑතක් වන තුරුම, සංඛ්‍යාංක ආරක්ෂණ පුහුණුකරුවන් අතර පැවති ආකල්පය වූයේ විසඳුම සම්පූර්ණයෙන් ම තාක්ෂණික වන බව යි.

සාම්ප්‍රදායික සංඛ්‍යාංක ආරක්ෂණ පුහුණුවීම්වලට නියමානුකූල ලෙස 'ස්ථාපනය හා මෙවලම් භාවිතය පිළිබඳ ව ප්‍රායෝගික පුහුණුව අන්තර්ගත වේ'. මානව අයිතිවාසිකම් ආරක්ෂකයින් සඳහා ලබාදෙන ලද සංඛ්‍යාංක ආරක්ෂණ පුහුණුව පිළිබඳව කරන ලද විවේචනාත්මක පර්යේෂණයක් (මෙම පර්යේෂණ පත්‍රිකාවේ උපුටා දක්වා ඇති), සාම්ප්‍රදායික සංඛ්‍යාංක ආරක්ෂණ පුහුණුවීම් ක්‍රියාත්මක කරනු ලැබූ ආකාරයත් එම පුහුණුවීම්වල

ඌන-සාමාර්ථයන් පිටුපස පවතින සංජානිත හේතුන් කිහිපයක් පිළිබඳ ව සොයාගැනීම් කිහිපයක් කරන ලදී.

"අධ්‍යයනයන් දෙකෙහි ම අති මහත් වූ, එසේ ම පොදු සොයා ගැනීම වන්නේ, සංඛ්‍යාංක ආරක්ෂාව, ප්‍රජාව තුළ දී පවත්නා ජාලයන් හා සහයෝගී ව්‍යුහයන් තුළ දී ඉගැන්විය යුතු බවයි" යන්න උපායික තාක්ෂණ සමූහයේ (Tactical Technology Collective) ස්ටෙෆනී හැන්කි (Stephanie Hanckey) ලියන්නීය. "අපගේ සමාලෝචනයේ දී එක් වතාවකදී පමණක් සිදුවන හමුවක් හෝ තනි-පුද්ගලයෙක් පදනම් කරගෙන උගන්වනු ලැබූ සංඛ්‍යාංක ආරක්ෂණය කලාතුරකින් ක්‍රියා කරන බව පර්යේෂණ පෙන්වා දෙන්නේ ය. බහුවිධ මට්ටම්වලදී ප්‍රජා හෝ සාමූහික ඉගෙනුම අත්‍යවශ්‍ය අංගයක් වේ."

යම් ආකාරයකට ඇයගේ වදන් අපගේ ප්‍රධාන සොයා ගැනීම්වලින් එකක් සමග ප්‍රතිනාද දේ: අපගේ කතාබහට පාත්‍ර වූ සමලිංගික ස්ත්‍රීහු ස්වකීය අත්දැකීම්, හෝඩුවාවන්, දැනුම හා තමන්ගේම මෙන්ම එකිනෙකාගේ ආරක්ෂාව පිළිබඳව සාමූහික වගකීමක් පිළිබඳ සංවේදනයක් බෙදා ගැනීම හරහා 'සුරක්ෂිතභාවය' පිළිබඳව ඉගෙන ගත්හ.

උපායික තාක්ෂණ පර්යේෂණයේ දී සාම්ප්‍රදායික 'භය-පාදක කරගත්, මෙවලම් කේන්ද්‍රීය' ආකෘතිය පුහුණු ආකෘතියක් වශයෙන් කාලයත් සමග ආචාර ධර්මීය නොවන මෙන්ම ඵලදායී නොවන බව ප්‍රත්‍යක්ෂ වී ඇති හෙයින් බොහොමයක් කවයන් තුළ දැනටමත් ප්‍රති-සංකල්පනය කරනු ලබමින් තිබේ.

මීට අමතරව, මෙම සාම්ප්‍රදායික 'භය-පාදක කරගත්, මෙවලම් කේන්ද්‍රීය' සංඛ්‍යාංක ආරක්ෂණ පුහුණුවීම් ආකෘතිය, එහි තාක්ෂණ සහ සංඛ්‍යාංක ආරක්ෂණ ප්‍රවේශයේ දී සමාජභාවය පිළිබඳව වැටහීමක් නොමැති ස්වභාවයෙන් ම පුරුෂ කේන්ද්‍රීය වන බවට අදහසක් ඉදිරිපත් කිරීමට අපි කැමැත්තෙමු. එම තාක්ෂණ හා සංඛ්‍යාංක ආරක්ෂණ ප්‍රවේශය නොයෙක්විට සංඛ්‍යාංක (digital) අවකාශයන්හි සහ තාක්ෂණික මෙවලම්වල සැරිසැරීමේ හා කළමනාකරණය කිරීමේ විවිධ පුද්ගලයන් සතු දැනුම හා ජීවත්ව ලත් අත්දැකීම් පරාසයන් නොයෙක් විට අතහැර දමා ඇත.

මෙවැනි අධ්‍යයනයන් තුළින් ඉස්මතුවන සොයා ගැනීම් ප්‍රතිවිරුද්ධ සිතුවමක් මවනු ලැබේ. එනම්, මෙම අධ්‍යයනයේ සිටින සමලිංගික

ස්ත්‍රීන් වැනි ඊනියා 'ආන්තීකරණයට භාජනය වූ' පුද්ගලයෝ ඔවුන්ගේ හා ඔවුන්ගේ ප්‍රජාව තුළ සිටින අනෙකුත් අයගේ ආරක්ෂණය ගැන ප්‍රායෝගිකව හා නිර්මාණාත්මකව සිතමින්, දිනපතා බහුවිධ ආකාරයෙන් අන්තර්ජාල මෙවලම් හා අන්තර්ජාලය භාවිතා කරති. ඔවුන්ගේ එදිනෙදා ජීවිතයේ සිදුවන වෙනස්කම් මෙන්ම අන්තර්ජාල ඇබ්බැහිවීම් හා පුරුදු ද සමග චමත්කාරජනක ලෙස ගැලපෙන ආකාරයට මෙම උපායමාර්ග නිරන්තරයෙන් පරිණාමය වන බව පැහැදිලි වේ.

සමලිංගික ස්ත්‍රීහු අන්තර්ජාලය භාවිතා කරන සුවිශේෂී සහ ඔවුන්ගේ දෛනික ජීවන යථාර්ථයන් ආමන්ත්‍රණය නොකරන සංඛ්‍යාංක ආරක්ෂණ උපායමාර්ගයන් හෝ ආඛ්‍යානයන් ඔවුන්ට අදාල නොවන බව සිතනු ඇත. තවද, බොහොමයක් ස්ත්‍රීන්ට ආරක්ෂණය සඳහා වන තාක්ෂණික ප්‍රවේශය, ස්ත්‍රීන්ගේ සමාජභාවී සහ ලිංගිකකරණයට ලක් වූ මුරකිරීමේ පුළුල් ගැටලු ප්‍රමාණවත් පරිදි ආමන්ත්‍රණය කර නොමැත.

අපට ප්‍රතිචාර දැක් වූ කණ්ඩායම තුළ රහස්‍යභාවය හා සුරක්ෂිතභාවය පිළිබඳ ගැටලු පැහැදිලිව ම පැවතුණි. නමුත්, ඔවුන්ගේ ආධාරයට පැවති තාක්ෂණය මත පමණක් ම නොව ස්වයං-උගත්-උපක්‍රමයන් ගණනාවක් මත ඔවුන් සාමාන්‍යයෙන් විශ්වාසය තැබූ බව අපි සොයා ගත්තෙමු. මෙම අධ්‍යයනයට සම්බන්ධ වුන ස්ත්‍රීන් වැනි අයගේ අත්දැකීම් සහ දැනුම, තාක්ෂණයෙන් නිර්මාණය කරනු ලබන ආකාරය හා කළමනාකරණය කරනු ලබන ආකාරය; සංඛ්‍යාංක ආරක්ෂණ සංකල්පගත කර තිබෙන ආකාරය හා සංඛ්‍යාංක ආරක්ෂණ පුහුණුවීම් නිර්මාණය කරනු ලබන හා ක්‍රියාත්මක කරනු ලබන ආකාරය; අවසාන වශයෙන් සංඛ්‍යාංක ආරක්ෂණය, රහස්‍යභාවය හා ස්වාධීනත්වය යන කාරණා සම්බන්ධව ප්‍රතිපත්ති සකස් කිරීම යන කාරණාවන් අනාවරණය කරයි.

# නිර්දේශ

## *ශ්‍රී ලංකා රජයට*

1. දණ්ඩ නීති සංග්‍රහයේ 365 සහ 365A වගන්ති අවලංගු කිරීම.

2. දණ්ඩ නීති සංග්‍රහයේ 399 වන වගන්තියෙහි "අනෙකෙකුසේ පෙනී සිට රැවටීම" යන විෂය පථයෙන් සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින් නිශ්චිතව ඉවත් වන ලෙස ප්‍රතිසංස්කරණය කිරීම.

3. අශ්ලීල හා අසභ්‍ය නීතිවල අන්තර්ගත වැරදි සහ අන්තර්ජාල අවකාශයට ඒවායේ ඇති යෝග්‍යතාවය පැහැදිලි කිරීම.

4. සමහර අවස්ථාවන්වලදී අන්තර්ජාල කථනය හා අන්තර්ජාල පුද්ගලිකත්වයට බලපාන සියලුම නීති පූර්ණ අහෝසි කිරීම අවශ්‍ය වුවත් ඒවා "ප්‍රජාතන්ත්‍රවාදී සමාජයකට අවශ්‍ය බව" තහවුරු කිරීම.

5. එක් එක් සිද්ධිවලදී මුරකිරීමේ ක්‍රියාමාර්ග අධීක්ෂණය කිරීම සඳහා කොමිසමට පවරන බලය ඉවත් වන ලෙස විදුලි සංදේශ නියාමන පනත (1996 දී සංශෝධිත) සංශෝධනය කිරීම. අන්තර්ජාල සේවා සපයන්නකුගේ මුරකිරීමේ ඉල්ලීම් සමග අනුකූලතාවය පිළිබඳ වන ඕනෑම සාමාන්‍ය ඇගයීමක් විනිවිදභාවය ඇතිවන ආකාරයට පොදු විෂය පථය තුළ කිරීමට නියම කිරීම.

6. අන්තර්ජාල සේවා සපයන්නන් මුරකිරීමේ ක්‍රියාමාර්ග සමග අනුකූලතාවය දක්වන ආකාරය අධීක්ෂණය කිරීම සඳහා අධිකරණමය හෝ අර්ධ-අධිකරණමය ස්වභාවයේ වෙනම ආයතනයක් පිහිටුවීම. එවැනි ආයතනයක් මානව අයිතිවාසිකම් සහ නීතිය බලාත්මක කිරීම පිළිබඳව ප්‍රමාණවත් විශේෂඥ දැනුමකින් හෙබි පුද්ගයන්ගෙන් සමන්විත වීම සහ එහි සාමාජිකයින් ස්වාධීනව පත් කිරීම හා ඔවුන්ගේ සේවා කාලයේ සුරක්ෂිත බව තහවුරු කිරීම. එබඳු ආයතනයක් විසින් අනුමත කරන ඕනෑම පියවරක් සම්බන්ධයෙන් අධිකරණමය සමාලෝචන ලබා ගැනීමේ හැකියාව තහවුරු කිරීම. එම ආයතනයේ කාර්යයසාධනය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කාලානුරූපී සමාලෝචනවලට භාජනය කිරීම.

7. සියලුම අන්තර්ජාල මුරකිරීමේ ක්‍රියාමාර්ග ඉහත සඳහන් කරන ලද ආයතනය වැනි ස්වාධීන ආයතනයක අනුමැතියට භාජනය කිරීම තහවුරු කිරීම; විමර්ශන නිලධාරියෙකුට අන්තර්ජාල මුරකිරීමේ ක්‍රියාමාර්ග ආරම්භ කිරීමට හෝ නියෝග කිරීමට ඒකපාර්ශ්වීය බලධාරිත්වයක් කුමන අවස්ථාවකදීවත් ලබා නොදිය යුතුවේ. කඩිනම් ක්‍රියාත්මකවීමක් අවශ්‍ය බරපතල වාතාවරණයක් සඳහා ව්‍යතිරේක තිබේනම්, එවන් ක්‍රියාමාර්ග යක් අනුගමනය කළ පසු අධිකරණයේ හෝ ඒ හා සමාන ස්වාධීන අනුමැතියක් අඩුම තරමින් එම ක්‍රියාව පළමුව ක්‍රියාත්මක වී පැය 48-72 ක් අතර කාලයක් තුළ අනිවාර්යය බව තහවුරු කිරීම.

8. වෙනත් ආකාරයකින් ක්‍රියාමාර්ගය මගින් අනුගමනය කරනු ලබන යුක්ති සහගත අරමුණුවලට අනර්ථකාරී වන හෝ ඒවා අකාර්යක්ෂම බව පෙන්වා දී හා අඩු බාධාකාරී විකල්ප සලකා බැලීමෙන් අනතුරුව අතමැදිකරුවන් (අන්තර්ජාල සේවා සපයන්නන් වැනි) හරහා කරනු ලබන මුරකිරීමේ ක්‍රියාමාර්ග අවශ්‍ය වුවහොත් පමණක් කිරීමට ඉඩදීම තහවුරු කිරීම.

9. අන්තර්ජාල සේවා සපයන්නන් විසින් සාමාන්‍ය නීතිය ලෙස මුරකිරීමේ ක්‍රියාමර්ගයන්ගේ පරිශීලකයන් දැනුවත් කිරීම අවශ්‍ය කරන නීති සම්පාදනය කිරීම; මෙම සාමාන්‍ය නීතියට සඳහා ව්‍යතිරේක භාවිතා කරන්නේ නම්, ව්‍යතිරේකයේ භාවිතය ස්වාධීන ආයතනයක් මගින් අවශ්‍යතාවය මත පදනම්ව අනුමත කරනු ලැබීමත්, ව්‍යතිරේකයන්ගේ යෝග්‍යතාවය වරින්වර සමාලෝචනය කරනු ලැබීමත් තහවුරු කිරීම. ව්‍යතිරේකයන් කුමන අවස්ථාවකදීවත් ආන්තිකව හෝ අනියත ආකාරයට භාවිතා කරනු නොලැබිය යුතු වේ.

10. අන්තර්ජාල මුරකිරීමේ හා නියාමනය හා සම්බන්ධ වන සියලුම නීති සයිබර් අපරාධ සම්මුතියට හා අයිතිවාසිකම් පිළිබඳ වන අන්තර්ජාතික පනතට පූර්ණ අනුකූලතාවය තහවුරු කිරීම.

## නීතිය බලාත්මක කරන ආයතන

11. පුද්ගලයින් ඔවුන්ගේ අනන්‍යතාවය (වර්ගය, ආගම, සමාජභාවී අනන්‍යතාවය, ලිංගික දිශානතිය, ජාතික සම්භවය වැනි) පදනම් කරගෙන අනවරත සහ/හෝ විශේෂයෙන්ම බරපතල

හිංසනයට දඬුවම කරන නීති ඇතුලත්ව අන්තර්ජාල අවකාශයේ සුරක්ෂිතභාවය හා අන්තර්ගතභාවය සහතික කරන නීති සම්පාදනය කිරීම. එම නීතිවල තහනම් කරන ලද කථන වර්ග ප්‍රමාණවත් පරිදි නිර්වචනය කිරීම සහ චේතනාභිරෝපණය වරදෙහි අත්‍යවශ්‍ය අංගයක් ලෙස සැපයීම තහවුරු කිරීම. වැරදිකරුවන්ට පනවනු ලබන දඬුවම් සමානුපාතික වීම හා මහජන සාමය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඉටුකිරීම හා අන්තර්ජාල අවකාශය තුළ අනෙක් අයගේ අයිතිවාසිකම්වලට ගරු කිරීම තහවුරු කිරීම.

12. පෞද්ගලික, පුද්ගලයන් අතර බෙදාගන්නා ලද අන්තර්ගතය අනවසරයෙන් හෙලිකිරීම සහ/හෝ ප්‍රකාශනය කිරීම අපරාධයක් සේ සලකන නීති සම්පාදනය කිරීම. එවැනි නීති අපයෝජනයේ, හිංසනයේ හා සූරාකෑමේ වැනි ක්‍රියාවන්ට සම්බන්ධ වූ අංගයන් සහ පුද්ගලිකත්වය උල්ලංඝනය කිරීම වැනි ක්‍රියාවන්ට සම්බන්ධ වූ අංගයන් සාපරාධී වරදක් කිරීම හා එවැනි නීති එවැනි වැරදි කේන්ද්‍ර කිරීම තහවුරු කිරීම. එවැනි සිද්ධීන්වල අවධානය "අශ්ලීලත්වය" සහ "අසභ්‍යතාවය" යන සංකල්පවලින් බැහැර කිරීම.

13. ශ්‍රී ලංකාවේ විවිධ ලිංගිකත්වයන් හා සමාජභාවී අනන්‍යතාවයන් සහිත ජනතාව මුහුණ දෙන අන්තර්ජාල හිංසනය පූර්ණ රහස්‍යභාවයෙන් යුතුව වාර්තා කරන හා ඒවාට ප්‍රතිචාර දක්වන පවතින ප්‍රතිකර්ම සපයන ආයතන (SLCERT වැනි) ශක්තිමත් කිරීම. වින්දිතයින්ගේ වාර්තා ලැබෙන ආකාරය සහ එවැනි වාර්තාවන්වලට ප්‍රතිචාර වශයෙන් ගන්නාලද ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ප්‍රතිකර්ම සොයන වින්දිතයින් විසින් එවැනි ආයතන වගකීමෙන් බැඳ තබා ගැනීම තහවුරු කිරීම.

14. ලිංගික දිශානතිය සහ සමාජභාවී අනන්‍යතාවය පදනම් කරගත් වෙනස්කොට නොසැලකීම සහතික කරන හා රහස්‍යභාවය ආරක්ෂා කරන මාර්ගෝපදේශන මාලාවක් අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ සයිබර් අපරාධ අංශය සඳහා සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

15. විවිධ ලිංගික දිශානතීන් හා සමාජභාවී අනන්‍යතාවයන් සහිත ජනතාවට එරෙහි අන්තර්ජාල තර්ජන හෝ හිංසන සම්බන්ධ වූ පැමිණිලි විමර්ශනය කිරීම සහ නීතියේ පරිසමාප්ත

ප්‍රමාණයෙන් අපරාධකරුවන් වගකීමෙන් බැඳ තබා ගන්නා ආකාරයෙන් සාධාරණ හා අපක්ෂපාතී විමර්ශන කිරීම තහවුරු කිරීම.

16. ලිංගික දිශානතිය හා සමාජභාවී අනන්‍යතාවය පදනම් කරගෙන වෙනස්කොට නොසැලකීමට ඇති අයිතියට සියලුම නීතිය බලාත්මක කරන නිලධාරීන් ගරු කිරීම තහවුරු කිරීමට ක්‍රියාමාර්ග ගැනීම.

## අන්තර්ජාල සේවා සපයන්නන්

17. විශේෂයෙන්ම සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින් සේවාවන් ලබා ගනිද්දී සහ පීඩාකාරී නීතිමය විධිවිධාන වලින් ලිංගිකත්වය හා සමාජභාවී සුලුතරය පීඩනයට පත් කරනු ලබන ස්ථානවලදී ලිංගික දිශානතිය හා සමාජභාවී අනන්‍යතාවය පදනම් කරගෙන වෙනස්කොට නොසැලකන මාර්ගෝපදේශන මාලාවන් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

18. අන්තර්ජාල සේවා සපයන්නන්ගේ සමස්ත වෙළඳ සලකුණක් යොදාගෙන අලෙවිකරණයේ යෙදෙන උපායමාර්ගයන් (එසේද වුවත් තනි පුද්ගල පාරිභෝගිකයන්ගේ පුද්ගලිකත්ව අයිතීන්ට ගරු කරන ආකාරයෙන්) සමග නියාමන අනුකූලතාවය සම්බන්ධ කිරීම. මහජනතාව රජයේ විවිධ මුරකිරීමේ බලයන් හා ක්‍රියාමාර්ග පිළිබඳව දැනුම් දෙනු ලැබීම තහවුරු කිරීම; රාජ්‍ය ආයතන අවශ්‍ය පටිපාටිමය අවශ්‍යතාවයන්ට අනුකූල වී තිබෙන හා අනුගමනය කර තිබෙන අවස්ථාවන්වලදී හැර අනෙක් සියලුම අවස්ථාවන්වලදී පාරිභෝගිකයාගේ අයිතිවාසිකම් ප්‍රමුඛතාගත කරන ප්‍රතිපත්ති අනුගමනය කිරීම.

## සිවිල් සමාජ සංවිධාන

19. විවිධ ලිංගිකත්ව හා සමාජභාවී අනන්‍යතාවයන් සහිත ජනතාවගේ අන්තර්ජාලය හා අන්තර්ජාලය හා සම්බන්ධ නොවූ අත්දැකීම් ලේඛනගත කිරීම සහ ශ්‍රී ලංකාවේ විවිධ ලිංගිකත්වයන් හා සමාජභාවී අනන්‍යතාවයන් සහිත ජනතාවගේ අයිතිවාසිකම් හා සම්බන්ධ වන ප්‍රතිපත්ති හා නීතිමය ප්‍රතිසංස්කරණ වෙනුවෙන් ශ්‍රී ලංකා රජය සමග අධිවාචනයේ යෙදීම.

20. අන්තර්ජාල හිංසනය සඳහා ප්‍රතිකර්ම සපයන රජයේ ආයතන සමග පවතින හවුල්කාරත්වය හා යොමු කිරීමේ පද්ධති ශක්තිමත් කිරීම.

21. අන්තර්ජාලය භාවිතය හා සම්බන්ධ පවතින නීති ප්‍රතිපත්ති හා සේවාවන් වටා වඩාත් ඵලදායී තොරතුරු, අධ්‍යාපනයක් හා සන්නිවේදනයක් සකස් කිරීම, එමගින් සහ ශ්‍රී ලංකාවේ විවිධ ලිංගිකත්වයන් හා සමාජභාවී අනන්‍යතාවයන් සහිත ජනතාවට ඔවුන්ගේ අයිතිවාසිකම් අන්තර්ජාලය තුළදී උල්ලංඝනය වන අවස්ථාවන් දැන ගත හැකි අතර අවශ්‍ය වූ විට ප්‍රතිකර්ම සෙවිය හැකි වේ.

22. ශ්‍රී ලංකාවේ විවිධ ලිංගිකත්වයන් හා සමාජභාවී අනන්‍යතාවයන් සහිත ජනතාව අතර සයිබර් සුරක්ෂිතභාවය පිළිබඳ දැනුම වර්ධනය කරන උපායමාර්ග සකස් කිරීම.

23. අන්තර්ගතභාවය තහවුරු කිරීම පිණිස සියලුම අන්තර්ජාල සන්නිවේදනයන්හිදී සහ මැදිහත්වීම්වලදී සාමාන්‍ය ත්‍රෛභාෂා ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම.

# ආශ්‍රිත ග්‍රන්ථ


1. Amnesty International. (2008). *Love, Hate and the Law: Decriminalizing Homosexuality*. London: Amnesty International Publications, 17. d21zrvtkxtd6ae.cloudfront.net/public/uploads/2016/11/12125724/Love-hate-and-the-low.-Decriminalizing-homosexuality.pdf

2. Bakamoono. How does accurate and comprehensive sexuality and relationship education help prevent HIV? *bakamoono.* www.bakamoono.lk/en/hiv/30/how-does-accurate-and-comprehensive-sexuality-education-help-prevent-hiv

3. Baudh, S. (2013). Decriminalisation of consensual same-sex sexual acts in the South Asian Commonwealth: Struggles in Context. In C. Lennox & M. Waites (Eds.), *Human Rights, Sexual Orientation and Gender Identity in The Commonwealth: Struggles for Decriminalisation and Change.* London: Institute of Commonwealth Studies, Human Rights Consortium.

4. Billimoria, H. (2017). Investigating Sri Lanka's nude culture. 27 January 2017, *Open Democracy 50/50* available at: www.opendemocracy.net/5050/hans-billimoria/investigating-sri-lanka-s-nude-culture

5. Corrêa, S. et al. (2011). Internet regulation and sexual politics in Brazil. In Jac sm Kee (Ed.), *Erotics: Sex, Rights and the Internet.* Johannesburg: APC, 27. www.apc.org/en/pubs/erotics-research

6. *Digital Security Trainers' Practices and Observations*, Carol Waters (Tactical Technology Collective) https://secresearch.tacticaltech.org/digital-security-trainers-practices-and-observations Downloaded on: 29 Sept 2017

7. Equal Ground et al. (2013). "There have been no convictions under 365 and 365A since Sri Lanka gained independence in 1948." December, 2013 *Human Rights Violations Against Lesbian, Gay, Bisexual, and Transgender (LGBT) People in Sri Lanka.* http://tbinternet.ohchr.org/Treaties/CCPR/Shared%20Documents/LKA/INT_CCPR_ICO_LKA_15986_E.pdf

8. Equal Ground. (2012). *Towards a Lesbians, Gays, Bisexuals, Transexuals and Transgendered (LGBT) Stigma and Discrimination Index for Sri Lanka*. Equal Ground. issuu.com/equalground/docs/the_lgbt_stigma_and_discrimination_

9. Equal Ground. (2012). *Towards a Lesbians, Gays, Bisexuals, Transexuals and Transgendered (LGBT) Stigma and Discrimination Index for Sri Lanka*. Op. cit.

10. Family Health Bureau, Ministry of Health Sri Lanka. (2013). *Annual Report on Family Health 2013*. Colombo. http://medicine.kln.ac.lk/depts/publichealth/Fixed_Learning/annual_report_2013.pdf

11. Groundviews. (2016). A Meaningful Right to Equality and Non-Discrimination: Recognising Sexual and Gender Identities. 28 March, 2016 *Groundviews.* groundviews.org/2016/03/28/a-meaningful-right-to-equality-and-non-discrimination-recognising-sexual-and-gender-identities/.

12. Groundviews. (2016). Submission on LGBTIQ Persons and Transitional Justice Mechanisms. *Groundviews. 25 August 201,* groundviews.org/2016/08/25/submission-on-lgbtiq-persons-and-transitional-justice-mechanisms/

13. GSMA (2013). Dialog Connect: A Case Study. 3 July 2013, *GSMA*. www.gsma.com/identity/dialog-connect-a-case-study.

14. Gunatilleke, G.D. (2010). Judicial Activism Revisited: Reflecting on the Role of Judges in enforcing Economic, Social and Cultural Rights. 1 Junior Bar Law Review 21, 28-30.

15. Gunawardane, N., & Wattegama, C. (2001). Internet in Sri Lanka: The First Five Years. in S. Ramanathan & J. Becker (Eds.), *Internet in Asia*. Singapore: Asian Media Information and Communication Centre

16. Human Rights Watch. (2016). *All Five Fingers are Not the Same: Discrimination on Grounds of Gender Identity and Sexual Orientation in Sri Lanka*. Human Rights Watch. www.hrw.org/report/2016/08/15/all-five-fingers-are-not-same/discrimination-grounds-gender-identity-and-sexual

17. La Rue, F. (2011). *Report of the Special Rapporteur on the promotion and protection of the right to freedom of opinion and expression*, United Nations, 10 August 2011, www.ohchr.org/Documents/Issues/Opinion/A.66.290.pdf

18. Lanka Business Online (2016). Sri Lanka budget 2017: tax and revenue proposals. 11 November 2016, *Lanka Business Online.* www.lankabusinessonline.com/sri-lanka-budget-2017-tax-and-revenue-proposals

19. News.lk. (2015, 18 June). Task Force to combat the growing threat to children, *National Child Protection Authority*. 18 June 2015, www.news.lk/news/political-current-affairs/item/8260-task-force-appointed-to-combat-threat-to-children-via-social-media-sites

20. Nichols, A. (2010). Dance Ponnaya, Dance! Police Abuses Against Transgender Sex Workers in Sri Lanka. *Sage*, 5(2), 195, 214. grassrooted.net/wp-content/uploads/2010/08/Nichols-Dance-Ponnaya-Dance.pdf

21. OutRight International, (2014). Sri Lanka Government says LGBT Rights are Constitutionally Protected. 20 October 2014, *OutRight Action International.* www.outrightinternational.org/content/sri-lanka-government-says-lgbt-rights-are-constitutionally-protected

22. Piyumi Fonseka, P. (2016). Occupy the Square against removal of couple. 06 March 2016 *Daily Mirror.* www.dailymirror.lk/106449/-Occupy-the-Square-against-removal-of-couple

23. PlanetOut. (2000). Sri Lankan's Media Complaint Backfires. 5 June 2000, *Glapn.* www.glapn.org/sodomylaws/world/sri_lanka/slnews006.htm

24. Queerrightslka. (2016). On the Constitutional Rights of LGBTQIA Individuals. 14 March 2016 *Queerightslka.* queerightslka.wordpress.com/2016/03/14/on-the-constitutional-rights-of-lgbtiqa-individuals/

25. Samarakoon, S. (2017). Homosexuality | "Threw out" – Can the President control a person's sexual orientation?. 26 January 2017, *Vikalpa*. www.vikalpa.org/?p=29311

26. Sarma, N. & Billimoria, H. (2013). *Strengthening the Role of Media Advocacy in Sri Lanka through a Critical Analysis of News Media Coverage.* Bangkok: UNDP, 13.

27. Thangarajah, P. (2013). *Strengthening of Legal Protection for LGBT in Sri Lanka: Road to Decriminalization*. Equal Ground. issuu.com/equalground/docs/situation_analysis

28. The Courier Mail (2010). Sri Lanka arrests kissing couples. 10 June 2010, *The Courier Mail.* www.couriermail.com.au/news/breaking-news/sri-lanka-arrests-kissing-couples/news-story/c6aec24aed22e6924834b02833d4469e

29. Toonen v. Australia. Communication No 488/1992. HRC., 31 March 1994); Dudgeon v. the United Kingdom. App. No. 7525/76. ECtHR.,22 October 1981); *National Coalition for Gay and Lesbian Equality and Another* v. *Minister of Justice and Others* [1998]. ZACC 15. (9 October 1998)

30. Treatybody Webcast (2014). Consideration of the Fifth Periodic Report of Sri Lanka on the Implementation of the Provisions of the International Covenant on Civil and Political Rights (Transcript of relevant part). www.youtube.com/watch?v=iHcREEWl6G8&feature=youtu.be&t=6232

31. Tubella, I. (2005). Television and Internet in the construction of Identity. In M. Castells and G. Cardoso, G (Eds.), *The Network Society From Knowledge to Policy*. Washington DC: Johns Hopkins Centre for Transatlantic Relations,.

32. Udayanganie, U.A.T. (2013) Expanding the Scope of Judicial Review using Constitutional Interpretation in Sri Lanka: A Comparative Study of the Development of Judicial Review in UK. GSTF International Journal of Law and Social Sciences (JLSS) Vol.3 No.1, 51-54

33. Vidanapathirana, J. et al. (2016). *No One Left Behind – Understanding Key populations: Achieving Triple Zeros by 2030.* Nugegoda: National STD/AIDS Control Programme & United Nations Population Fund. www.aidsdatahub.org/no-one-left-behind-understanding-key-populations-achieving-triple-zeros-2030-vidanapathirana-jh

34. Women and Media Collective, (2016). Submission on LGBTIQ persons and transitional justice mechanisms. 25 August 2016, *Groundviews.* groundviews.org/2016/08/25/submission-on-lgbtiq-persons-and-transitional-justice-mechanisms/

35. Women and Media Collective. (2015). Country Profile on Universal Access to Sexual and Reproductive Health: Sri Lanka. *Women and Media Collective.* 6 March 2015 womenandmedia.org/country-profile-on-universal-access-to-sexual-and-reproductive-health-sri-lanka/

36. WSG (2014) *Not Gonna Take It Lying Down,* March 2014,Women's Support Group https://www.scribd.com/document/214827257/Not-Gonna-Take-It-Lying-Down-English

# උප ග්‍රන්ථ

## ඇමිණුම අ:
## පාරිභාෂික වදන්පෙළ

**LGBTQI** - LGBTQ යනු පොදුවේ සමලිංගික ස්ත්‍රීන්, සමලිංගික පුරුෂයින්, ද්විලිංගික, සංක්‍රාන්ති සමජභාවී, තම ලිංගිකත්වය ප්‍රශ්න කරන හා අන්තර්ලිංගික ප්‍රජාව සඳහා භාවිතා කරන කෙටි යෙදුම වේ.

**සමලිංගික ස්ත්‍රිය** - මෙම වදන ස්ත්‍රියක් ලෙස හඳුනාගත් ජනතාව ශෘංගාරාත්මක, අනුරාගී සහ/හෝ භාවාත්මක ආකාරයට වෙනත් ස්ත්‍රියක් ලෙස හඳුනාගත් ජනතාව වෙත ආකර්ෂණය වීම විස්තර කිරීම සඳහා භාවිතා කරනු ලැබේ. ලෙස්බියන් (Lesbian) වදන ග්‍රීසියේ තිබෙන ලෙස්බෝස් (Lesbos) යන දූපතින් උපත ලබන අතර එමනිසා එය අනෙකුත් අප්‍රිකානු-අමෙරිකානු මෙන්ම යුරෝපීය නොවන ජනවාර්ගික කණ්ඩායම්වල අනන්‍යතාවයන් අත්‍යවශ්‍යයෙන් ම නියෝජනය නොකරන යුරෝපීය-කේන්ද්‍රී වර්ගීකරණයක් බවට සමහර අවස්ථාවන්වල දී සලකනු ලැබේ. මේ අනුව, අප්‍රිකානු-අමෙරිකානුවන් ද ඇතුළත්ව විවිධ ජනවාර්ගික සමූහයන්ගෙන් ස්ත්‍රියක් ලෙස හඳුනාගත් ජනතාව අතරින් කෙනෙක් 'සමලිංගික ස්ත්‍රිය' යන වචනය අනන්‍යතා ලේබලයක් ලෙස වැළඳගනී.

**සමලිංගික පුරුෂයා** - 1. සමහර සංස්කෘතීන් හි මෙම වදන ශෘංගාරාත්මකව, අනුරාගී සහ/හෝ භාවාත්මක අර්ථයෙන් පුරුෂයෙක් තවත් පුරුෂයෙකුට ආකර්ෂණයවීම නියෝජනය කිරීම සඳහා භාවිතා කරනු ලැබේ. "සමලිංගික චර්යාවේ" නිරතවන සියලුම පුරුෂයින් සමලිංගික ලෙස හඳුනා නොගන්නා හෙයින් මෙම ලේබලය ප්‍රවේශමෙන් භාවිතා කළ යුතු වේ. 2. LGBTQ ප්‍රජාව සමස්තයක් වශයෙන් හැඳින්වීමට හෝ විෂම

ලිංගික වශයෙන් හඳුනා නොගන්නා තනි පුද්ගලයෙක් හඳුනා ගැනීම සඳහා ද ඉංග්‍රීසි භාෂාවෙන් 'Gay' යන වදන භාවිතා කරයි.

**ද්විලිංගික** - භාවාත්මකව, ශාරීරිකව සහ/හෝ ලිංගිකව පුරුෂයෙකුට සහ ස්ත්‍රියකට ආකර්ෂණය වන පුද්ගලයෙක්. මෙම ආකර්ෂණය එක හා සමාන ලෙස ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම නොවන අතර එක් ලිංගයකට වඩා තවත් ලිංගයකට කැමැත්තක් තිබිය හැකි වේ.

**සංක්‍රාන්ති ලිංගික සමාජභාවය** - අපේක්ෂිත ව්‍යාවච්ඡේදක ලිංගභාවය පදනම් කරගත් ලිංගයකට වඩා වෙනත් ලිංගයක සාමාජිකයෙක් වශයෙන් වාසය කරන පුද්ගලයෙක් මෙයින් අදහස් කෙරේ. මොවුන්ගේ ලිංගික දිශානතිය වෙනස් වන අතර එය සමාජභාවී අනන්‍යතාවය පදනම් කරගෙන සිදු නොවේ.

**අපූර්ව හෝ අසම්මත අනන්‍යතාව** - 1. ඒකවෛවාහික හා විෂම ලිංගික බහුතරය පමණක් නොමැති ලිංගික මනාපයන්, දිශානතීන්, සහ පුරුදු වර්ධනය වන වාතාවරණය ඇතුළත් කර ගන්නා පුළුල් හා සාමූහික අර්ථයෙන් භාවිතා කරන වදනකි. අපූර්ව හෝ අසම්මත අනන්‍යතාවට සමලිංගික ස්ත්‍රීන්, සමලිංගික පුරුෂයින්, ද්විලිංගික පුද්ගලයින්, සංක්‍රාන්ති ජනතාව, අන්තර්ලිංගික පුද්ගලයින් අන්තර්ගත වේ. 2. විරෝධාත්මක අභිමානය පෙන්වන වදනක් වශයෙන් භාවිතා කරන, අවමානයට භාජන කරන ලද කණ්ඩායම්වල සාමාජිකයින් විසින් ශබ්දාර්ථමය වශයෙන් පෙරළා දමන ලද නමුත් තනිකරම අපහාසාත්මක වදනක් වශයෙන් කලින් භාවිතා කරන ලද, ශිෂ්ට භාවිතාවට ගන්නා ලද වදනක් වේ. 'අපූර්ව හෝ අසම්මත අනන්‍යතාවය' යනු ක්‍රියාවලියට යටත් වන වචනයකට උදාහරණයක් වේ. දශක ගණනාවක් තිස්සේ, 'අපූර්ව හෝ අසම්මත අනන්‍යතාව' සමලිංගික පුරුෂයින් හා ස්ත්‍රීන් හැඳින්වීම සඳහා නාමවිශේෂණයක් වශයෙන් භාවිතා කර ඇති නමුත් 1980 දශකයේ දී සමලිංගික පුරුෂ හා ස්ත්‍රී ක්‍රියාකාරීකයින් විසින් එම වදන ස්වයං-අනන්‍යතාකරණයේ වදනක් වශයෙන් භාවිතා කිරීම ආරම්භ කරන ලදී. අවසානයේ දී, සමලිංගික ස්ත්‍රීන්, සමලිංගික පුරුෂයින්, ද්විලිංගික පුද්ගලයින් හා සංක්‍රාන්ති සමාජභාවී ජනතාව අන්තර්ගත වන පුළුල් හා

සාමූහික අර්ථයෙන් භාවිතා කරන වදනක් ලෙස භාවිතා කිරීමට පටන් ගෙන ඇත. කෙසේ වෙතත්, මෙම වදනින් ආමන්ත්‍රණය කරනු ලබන පුද්ගලයින්ගෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් අපූර්ව හෝ අසම්මත අනන්‍යතාව' යන්න වෛරීසහගත අපහාසයක් ලෙසට අදටත් සලකනු ලබන අතර විෂමලිංගිකයින් විසින් එම වදනේ භාවිතය නොයෙක්විට සිත රිදවනසුළු ලෙස සලකනු ලැබේ. ඒ හා සමානවම, පිටස්තර පුද්ගලයින් විසින් භාවිතා කරනු ලබනවිටදී වෙනත් ශිෂ්ටත්වයට පෙරලන ලද වදන් කණ්ඩායම ඇතුළෙහි දී සාමාන්‍යයෙන් සිත් රිදනව සුළු වේ. එමනිසා, කණ්ඩායමේ සාමාජිකයෙක් නොවන අවස්ථාවන්වලදී එම වදන් භාවිතා කිරීම සම්බන්ධයෙන් අතිශයින් ම සැලකිලිමත් විය යුතු වේ.

**අන්තර්ලිංගික පුද්ගලයා** - වෛද්‍යවරයකුට යම් කෙනෙක්ගේ ලිංගභාවය පුරුෂයෙක් ද හෝ ස්ත්‍රියක් ද වශයෙන් වර්ගීකරණය කිරීමට අපහසුතාවයක් ඇති වූ අයෙක්. අපේක්ෂිත රටාවන් දෙකින් වෙනස් වන වරණදේහ, ප්‍රජනේන්ද්‍රියන්, හෝමෝන, අභ්‍යන්තර ලිංගික අවයව සහ/හෝ එකිනෙකාගෙන් වෙනස් වන ජනනේන්ද්‍රියන්වල එකතුවක් පවතින පුද්ගලයෙක්.

සමාජභාවී අනන්‍යතාවය - පුද්ගලයකු විසින් පුරුෂත්වය, ස්ත්‍රීත්වය හෝ වෙනත් සමාජභාවී වීම හැඟෙනු ලැබීම.

**ලිංගික දිශානතිය** - සමාන ලිංගය/ලිංගභාවය, වෙනත් ලිංගය/ලිංග භාවය, හෝ බහුවිධ ලිංගයන්/ලිංගභාවයන් සහිත පුද්ගලයන් සමග ආත්මීය ලිංගික සහ/හෝ භාවාත්මක සබඳතාවයන් සඳහා කැමැත්ත දැක්වීම.

**විෂම ලිංගිකවාදය** - එවැනි පූර්ව-විනිශ්චයන් ආරෝපණය කිරීම සඳහා ඇති බහුතර බලය හා බැඳුණ, විෂමලිංගික නොවා චර්යාවන් හෝ අනන්‍යතාවයන් ප්‍රදර්ශනය කරන පුද්ගලයින් හෝ කණ්ඩායම් වෙත දක්වන පූර්ව-විනිශ්චය. බලය තිබෙන කණ්ඩායමේ වාසිය වෙනුවෙන් සාමාන්‍යයෙන් භාවිතා කරනු ලැබේ. පුද්ගලයින්ගේ ලිංගික දිශානතිය නිසාවෙන් ඔවුන්ව අප්‍රධානසේ සලකනු ලබන - ආයතනගත බලයෙන් ආධාර ලබන - ඕනෑම ආකල්පයක්, ක්‍රියාවක්, හෝ පුරුද්දක්.

**විෂමලිංගික සම්මතය** - සෑම පුද්ගලයෙක් ම විෂමලිංගික යන බවට ආයතනවල හෝ පුද්ගලයින් තුළ ඇති උපකල්පනය, සහ විෂමලිංගිකත්වය සමලිංගිකත්වයට හෝ ද්විලිංගිකත්වයට වඩා උත්තරීතරයි යන උපකල්පනය.

**සමලිංගික භීතිකාව** - දැඩි ලිංගික භූමිකාවන් හා සම්බන්ධ ඒකාකෘතිවලට අනුකූල නොවන ඕනෑම චර්යාවක් හෝ විශ්වාසයක් හෝ සමලිංගිකත්වය, සමලිංගිකයින් වෙත දක්වන අවිචාරී බිය හෝ වෛරය. මෙම බිය නිසාවෙන් ලිංගවාදය මෙන්ම විෂමලිංගිකවාදය බලාත්මක කෙරේ.

**සංක්‍රාන්ති භීතිකාව** - සමාජභාවී ව්‍යාකූලත්වය සමග ගනුදෙනු කිරීමට ඇති නොහැකියාව සහ/හෝ සමාජභාවී විචලතාවයන් ඇති පුද්ගලයින් පිළිබඳව ඇති අවිචාරී බිය.

**තම ලිංගිකත්වය පිළිගැනීම** - මෙය කෙනෙක් තමන්ගේ ලිංගිකත්වය, සමාජභාවී අනන්‍යතාවය, හෝ අන්තර්ලිංගික පුද්ගලයෙක් වශයෙන් තම තත්ත්වය (ස්වකීය "ලිංගිකත්වය පිළිගැනීම") පිළිගැනීමේ ක්‍රියාවලිය හා සම්බන්ධ වේ. එමෙන්ම, කෙනෙක් තමන්ගේ ලිංගිකත්වය, සමාජභාවී අනන්‍යතාවය, හෝ අන්තර්ලිංගික තත්ත්වය අනෙකකු සමග බෙදාගැනීම ("තම ලිංගිකත්වය තම යහළුවෙකුට හෙළි කිරීම", ආදිය). පිටුව 3 මෙය සමලිංගික, ද්විලිංගික, සංක්‍රාන්ති සමජභාවී සහ අන්තර්ලිංගික පුද්ගලයින්ට අඛණ්ඩ, ජීවිත කාලය පුරා සිදුවන ක්‍රියාවලියක් විය හැකි ය.

# ඇමිණුම (අ):

## අන්තර්ජාලය තුළ ඔබේ අත්දැකීම් පිළිබඳ ප්‍රශ්නාවලියක්

<u>නිදහස්ව සහ අවංකව පිළිතුරු සපයන්න.</u>

ඔබ ලබා දෙන පිළිතුරු සම්පූර්ණයෙන් ම නිර්නාමිකව පවතිනු ඇත. එනම්, අප එකතු කර ගන්නා ප්‍රශ්නාවලි 100 අතරින් ඔබ විසින් පුරවන ලද ප්‍රශ්නාවලිය කුමක්දැයි කිසිවෙකුට දැනගන්නට ලැබෙන්නේ නැත. කරුණාකාර ප්‍රශ්නාවලියේ ඔබේ නම සඳහන් කරන්න එපා. ඔබේ නම, ලිපිනය හෝ ඔබේ අනන්‍යතාව පිළිබඳ කිසිදු තොරතුරක් අවශ්‍ය නැත. පර්යේෂණ කණ්ඩායම හැරුණු විට වෙනත් කිසිම පිටස්තර පුද්ගලයෙකු විසින් ඔබ විසින් සම්පූර්ණ කරන ලද ප්‍රශ්නාවලි දැකීම හෝ සාකච්ඡාවට ලක් කිරීමක් සිදු නොවේ.

**ප්‍රශ්නාවලිය**

1. කරුණාකර ඔබ අයත් වයස් කාණ්ඩය ලකුණු කරන්න.
   - ☐ වයසස අවුරුදු 12 ට පහළ
   - ☐ 18 - 24
   - ☐ 25 - 34
   - ☐ 35 - 44
   - ☐ 45 - 54
   - ☐ වයසස අවුරුදු 55 ට හෝ ඊට වැඩි

2. ඔබේ අධ්‍යාපන තත්ත්වය හැඳින්වීමට වඩාත්ම අදාළ වන පිළිතුර තෝරන්න.
   - ☐ දෙවන උපාධිය හෝ ඊට ඉහල උපාධියක් සමත් (Master's degree)
   - ☐ පළමු උපාධිය සමත්
   - ☐ උසස් පෙළ සමත්
   - ☐ සාමාන්‍ය පෙළ සමත්
   - ☐ ප්‍රාථමික අධ්‍යාපනය ලබා ඇත
   - ☐ ලිවීමට සහ කියවීමට හැකිය

3. ඔබගේ සමාජීය ස්ත්‍රී පුරුෂභාවී අනන්‍යතාවය හැඳින්වීමට වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.
   - ☐ පිරිමි
   - ☐ කාන්තා
   - ☐ සංක්‍රාන්ති - පිරිමියෙකුව සිට කාන්තාවක් බවට පත් වූ
   - ☐ සංක්‍රාන්ති - කාන්තාවක්ව සිට පිරිමියෙකු බවට පත් වූ
   - ☐ Third gender
   - ☐ සමාජීය ස්ත්‍රී පුරුෂභාවය හඳුනා නොගන්නා පුද්ගලයෙක්
   - ☐ වෙනත් (කරුණාකර පැහැදිලි කරන්න)

4. ඔබේ ලිංගික දිශානතිය සමග වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.
   - ☐ මා ආකර්ශනය වන්නේ විරුද්ධ ලිංගික පුද්ගලයන් කෙරෙහි පමණි
   - ☐ මා ආකර්ශනය වන්නේ සම ලිංගික පුද්ගලයන් කෙරෙහි පමණි
   - ☐ මා විරුද්ධ ලිංගික පුද්ගලයන් මෙන්ම සම ලිංගික පුද්ගලයන් කෙරෙහිද ආකර්ශනය වේ
   - ☐ මට පුද්ගලයාගේ ස්ත්‍රී පුරුෂභාවය අදාළ නොවේ
   - ☐ මා කිසිම පුද්ගලයකු වෙත ලිංගිකව ආකර්ශනය නොවේ
   - ☐ මට ඒ ගැන සැකයක් ඇත

5. ඔබට අදාළ වන සියලු ප්‍රකාශයන් ලකුණු කරන්න.
   - ☐ සම ලිංගික සහකරුවෙකු සමග කැපවූ සම්බන්ධතාවයක් ඇත
   - ☐ විෂම ලිංගික සහකරුවෙකු සමග කැපවූ සම්බන්ධතාවයක් ඇත
   - ☐ එක් ලිංගික සහකරුවෙකු සිටී
   - ☐ එක් ලිංගික සහකරුවෙකුට වඩා වැඩි ප්‍රමාණයක් සිටී
   - ☐ මට ලිංගික සහකරුවෙක් නොමැත
   - ☐ මම ලිංගික සහකරුවෙක්/ලිංගික සහකරුවන් මුණගැසීමට සොයමින් සිටිමි
   - ☐ මම නීත්‍යානුකූලව විවාහ වී සිටි
   - ☐ ලිංගිකව හැසිරීමෙන් වැළකී සිටීමට මම පොරොන්දු වී ඇත

*අන්තර්ජාල සඳහා ඇති ප්‍රවේශ*

6. ඔබ පෞද්ගලිකව අන්තර්ජාලය පරිහරණය කිරීම ආරම්භ කළේ කවදා ද? ඔබ හා අදාල වඩාත් උචිත පිළිතුර තෝරන්න.
   - ☐ අවුරුදු 20 කට පෙර
   - ☐ අවුරුදු 10 කට පෙර
   - ☐ අවුරුදු 5 කට පෙර
   - ☐ අවුරුදු 3 කට පෙර
   - ☐ අවුරුදු 3 කට අඩු කාල සීමාවකට පෙර

7. පුද්ගලික කටයුතු සඳහා සතියකට පැය කීයක් අන්තර්ජාලයට ප්‍රවේශවීමේ හැකියාව ඔබට තිබෙනවාද?
   - ☐ අසීමිත ලෙස පරිහරණය කිරීමේ පහසුකම් ඇත
   - ☐ සතියකට පැය 40 කට වඩා, නමුත් හැමවිටම නොවේ
   - ☐ සතියකට පැය 40 - 30 ත් අතර
   - ☐ සතියකට පැය 30 - 20 ත් අතර
   - ☐ සතියකට පැය 20 - 10 ත් අතර
   - ☐ සතියකට පැය 10 - 05 ත් අතර
   - ☐ පැය 05 කට අඩු කාලයක්

8. ඔබේ පුද්ගලික කටයුතු සඳහා ඔබ අන්තර්ජාලයට ප්‍රවිශ වන වාර ගණනට වඩාත් අදාල වන පිළිතුර තෝරන්න
   - ☐ සතියකට පැය 40 කට වඩා
   - ☐ සතියකට පැය 40 - 30 ත් අතර
   - ☐ සතියකට පැය 30 - 20 ත් අතර
   - ☐ සතියකට පැය 20 - 10 ත් අතර
   - ☐ සතියකට පැය 10 - 05 ත් අතර
   - ☐ සතියකට පැය 05 ට වඩා අඩු කාලයක්

9. පුද්ගලික කටයුතු සඳහා ඔබ අන්තර්ජාලයට ප්‍රවිශ වීම සඳහා භාවිතා කරන උපාංගය කුමක් ද? වැඩිම අදාලත්වයක් ඇති පිළිතුරු 3 තෝරන්න.
   - ☐ මගේ ම ලැප්ටොප් එක/ඩෙස්ටොප් එක
   - ☐ මගේ ම ටැබ්ලට් එක/ස්මාර්ට් දුරකථනය
   - ☐ වෙනත් කෙනෙකුගේ ලැප්ටොප් එක/ඩෙස්ටොප් එක (උදාහරණ පවුලේ සමාජිකයකුගේ, සහකරුගේ හෝ යහළුවෙකුගේ)
   - ☐ වෙනත් කෙනෙකුගේ ටැබ්ලට් එක/ස්මාර්ට් ජංගම දුරකථනය (උදාහරණ පවුලේ සමාජිකයකුගේ, සහකරුගේ හෝ යහළුවෙකුගේ)
   - ☐ කාර්යාලයේ ලැප්ටොප් එක/ඩෙස්ටොප් එක
   - ☐ කාර්යාලයේ ටැබ්ලට් එක/ස්මාර්ට් දුරකතනය
   - ☐ කාර්යාලයේ ඇති ස්මාර්ට් නොවන් වෙනත් ජංගම දුරකථනයකින්
   - ☐ ඉන්ටර්නෙට් කැෆේ එකකින්

10. පහත දැක්වෙන තේමා අතරින් ඔබ අන්තර්ජාලය හරහා තොරතුරු ලබා ගෙන ඇති තේමා මොනවාද?
    - ☐ ලොව වටා LGBT ප්‍රවෘත්ති
    - ☐ ශ්‍රී ලංකාවේ LGBT ප්‍රජාව පිළිබඳ නීතිමය සහ ප්‍රතිපත්තිමය තොරතුරු
    - ☐ ආරක්ෂිත ලිංගික හැසිරීම් වල යෙදෙන ආකාරය පිළිබඳව
    - ☐ ලිංගිකව සම්ප්‍රේෂණය වන ආසාදන
    - ☐ LGBT තේමාව සහිත කලා නිර්මාණ (චිත්‍රපට, ටෙලිනාට්‍ය)
    - ☐ රජය විසින් ලබාදෙන සාමාන්‍ය තොරතුරු (හැඳුනුම්පත ලබා ගන්නා ආකාරය, වාහන ලියාපදිංචි කිරීම වැනි)

11. ඔබ අන්තර්ජාලයෙන් ලබා ගන්නා තොරතුරු වල නිවැරදිභාවය සනාථකර ගැනීමට ගෙන ඇති පියවර මොනවාද? කරුණාකර පහත කොටුව තුළ පැහැදිලි කරන්න.

*අන්තර්ජාල භාවිතය*

12. ඔබ නිතර භාවිත කරන වෙබ් අඩවි මොනවාද?

සමාජ ජාලා

- ☐ ෆේස්බුක්
- ☐ ට්විටර්
- ☐ ඉන්ස්ටග්රෑම්

☐ අනෙකුත් - කරුණාකර සඳහන් කරන්න _______________
☐ සහරුවන් සොයා ගැනීමට ඇති ඇප්ස් (Dating Apps)
☐ ටින්ඩර් වැනි ආදරවන්තයින් සම්බන්ධ වන සමානා‍ය සමාජ ජාලා
☐ සම ලිංගික කාන්තාවන්ට, සම ලිංගික පිරිමින්ට, සංක්‍රාන්ති පුද්ගලයන්ට ආදී වශයෙන් විශේෂයෙන් වෙන් වූ ඇප්ස්

පණිවිඩ හුවමාරු කරගන්නා ඇප්ස්
☐ වට්ස් ඇප්
☐ වයිබර්
☐ ෆේස්බුක් මැසෙන්ජර්
☐ ඉමෝ
☐ ස්නැප් චැට්
☐ ඊ මේල්
☐ අනෙකුත් (කරුණාකර සඳහන් කරන්න)_________________

සංසඳ
☐ LGBT ප්‍රජාව තේමා කොට නිර්මාණය කරන ලද බ්ලොග්ස්
☐ සාකච්ජා සංසඳ
☐ LGBT කණ්ඩායම්
☐ අනෙකුත් (කරුණාකර සඳහන් කරන්න) ________________

*සමාජ මාධ්‍ය අඩවි*

13. ඔබට අදාළ සියලුම ප්‍රකාශන තෝරන්න ___________________

මම සමාජ මාධ්‍ය අඩවි භාවිතා කරන්නේ
☐ දැනට පවතින සම්බන්ධතා පවත්වා ගෙන යාමට
☐ අලුත් මිතුරන් මුණගැසීමට
☐ LGBT ප්‍රජාවේ නව මිතුරන් මුණගැසීමට
☐ ඒක සහකරු සබඳතා සඳහා සහකරුවන් සොයා ගැනීමට
☐ ලිංගිකව එක්වීමට සහකරුවන් මුණගැසීමට (වානිජමය නොවන)
☐ වානිජ ලිංගික කටයුතු සඳහා ගනුදෙනුකරුවන් මුණගැසීමට
☐ අනෙකුත් (කරුණාකර සඳහන් කරන්න) ________________

14. සමාජ මාධ්‍ය වෙබ් අඩවි වල ඔබේ ප්‍රොෆයිල් පිළිබඳ වඩාත්ම ගැලපෙන ප්‍රකාශය තෝරන්න.
☐ ලිංගික දිශානතිය හෝ අනන්‍යතාවය හා සම්බන්ධ හේතු නිසා එකම සමාජ මාධයක අඩවිය තුළ මට ප්‍රොෆයිල් එකක්ට වඩා ඇත
☐ එකම සමාජ මාධ්‍ය වෙබ් අඩවියක එක් ප්‍රොෆයිලයකට වඩා ඇත නමුත් ඒ මගේ ලිංගික දිශානතිය හෝ අනන්‍යතාවය හා සම්බන්ධ හේතු නිසා නොවේ
☐ මට එක් සමාජ මාධය අඩවියක් සඳහා ඇත්තේ එක් චරිත සටහනක් පමණි
☐ මට කිසිඳු සමාජ මාධ්‍ය ජාලයක් තුළ ප්‍රොෆයිලයක් නැත

15. සමාජ මාධ්‍ය වෙබ් අඩවි වල ප්‍රොෆයිල සම්බන්ධයෙන් වඩාත්ම ගැලපෙන පිළිතුර තෝරන්න.
   - ☐ එකම සමාජ මාධ්‍ය අඩවියක ඇති මාගේ සෑම ප්‍රොෆයිලයකම මාගේ සැබෑ නම සහ මුහුණ ඇතුළත් වේ
   - ☐ මගේ සැබෑ නම සහ මුහුණ පෙන්වන්නේ එකම සමාජ මාධ්‍ය අඩවියක ඇති එක් ප්‍රොෆයිලයක් හෝ ඉන් කිහිපයක් පමණි
   - ☐ මට ඇත්තේ එක් සමාජ මාධ්‍යක අඩවියක එක් ප්‍රොෆයිලයක් පමණි එහි මාගේ සැබෑ නම සහ මුහුණ ඇතුළත් වේ
   - ☐ මට ඇත්තේ එක් සමාජ මාධ්‍යක අඩවියක එක් ප්‍රොෆයිලයක් පමණි එහි මාගේ සැබෑ නම සහ මුහුණ ඇතුළත් නොවේ
   - ☐ මට කිසිදු සමාජ මාධ්‍ය ජාලයක් තුළ ප්‍රොෆයිල නැත

16. ඔබගේ නියම නම සහ/හෝ ඔබගේ ඡායාරූපය ඇතුළත් සමාජ මාධ්‍ය ප්‍රොෆයිලයෙහි පහත සඳහන් තොරතුරු අතරින් ඔබ පිළිබඳ ඇතුළත් කර ඇති සත්‍ය තොරතුරු මොනවාද? අදාළ සියල්ලම ලකුණු කරන්න.
   - ☐ නම
   - ☐ මුහුණු ඡායාරූපය
   - ☐ නිවසේ ලිපිනය
   - ☐ දුරකථන අංකය
   - ☐ ලිංගික දිශානතිය
   - ☐ සමාජීය ස්ත්‍රී පුරුෂභාවී අනන්‍යතාව
   - ☐ දේශපාලන මතය
   - ☐ ඔබ අයත් කණ්ඩායම්
   - ☐ මාගේ සැබෑ නම සහ මාගේ සැබෑ ඡායාරූප ඇතුළත් චරිත සටහන් මට නොමැත

17. ඔබගේ සබෑ නම සහ ඡායාරූපය ඇතුළත් වන ප්‍රොෆයිලය සම්බන්ධයෙන් ඔබට වඩාත්ම අදාල වන ප්‍රකාශය තෝරන්න.
   - ☐ LGBT ප්‍රජාව හා සම්බන්ධ තොරතුරු කාටත් පෙනෙන ආකාරට පළ කරමි (wall timeline)
   - ☐ LGBT ප්‍රජාව හා සම්බන්ධ තොරතුරු මගේ මිතුරන්ට පමණක් පෙනෙන සේ පල කරමි
   - ☐ LGBT හා සම්බන්ධ තොරතුරු ඇතැම් ඔන් ලයින් කණ්ඩායම් සමග හුවමාරු කර ගනිමි, නමුත් මාගේ ප්‍රොෆයිලයේ පල නොකරමි
   - ☐ LGBT ප්‍රජාව හා සම්බන්ධ තොරතුරු කිසිවිටකත් පළ නොකරමි
   - ☐ මගේ සැබෑ නම හෝ ඡායාරූපය සහිත ප්‍රොෆයිල් නොමැත
   - ☐ සමාජ ජාල වල මගේ ප්‍රොෆයිල නොමැත

18. ඔබගේ සැබෑ නම සහ/හෝ ඡායාරූපයක් ඇතුලත් සමාජ මාධ්‍ය ප්‍රොෆයිල්, පිළිබඳ වඩාත් අදාළ ප්‍රකාශනය තෝරාගන්න.
   - ☐ මම, මගේ සමාජ මාධ්‍ය සටහන් තුළ මගේ ලිංගික දිශානතිය සහ/හෝ සමාජීය ස්ත්‍රී පුරුෂභාවී අනන්‍යතාවය සහ

පෝස්ට්/කමෙන්ට්වල සහ ඒ හා අදාළ ඕනෑම තත්ත්වයක් පිළිබඳ මගේ අදහස් සටහන් කරමි

- ☐ ඇතැම් සීමිත අවස්ථාවලදී පමණක් මම මගේ සමාජ මාධ්‍ය තුළ මගේ ලිංගික දිශානතිය සහ/හෝ සමාජීය ස්ත්‍රී පුරුෂභාවී අනන්‍යතාවය සහ ඒ පිළිබඳ අදහස් සඳහන් කරමි
- ☐ මම කිසිවිටකත් මගේ සමාජ මාධ්‍ය සටහන් තුළ මගේ ලිංගික දිශානතිය සහ/හෝ සමාජීය ස්ත්‍රී පුරුෂභාවී අනන්‍යතාවය සහ ඒ සම්බන්ධ අදහස් ඉදිරිපත් නොකරමි
- ☐ මම, මා තුළ පුද්ගලිකව හඳුනාගත් ලිංගික දිශානතිය සහ/හෝ සමාජීය ස්ත්‍රී පුරුෂභාවී අනන්‍යතාවයට වඩා වෙනස් ලිංගික දිශානතියක් සහ/හෝ සමාජීය ස්ත්‍රී පුරුෂභාවී අනන්‍යතාවයක් මාගේ සමාජ මාධ්‍ය සටහන් සහ අදහස් තුළ පවත්වාගෙන යමි
- ☐ මගේ සැබෑ නම හෝ ඡායාරූපය සහිත ප්‍රොෆයිල නොමැත
- ☐ සමාජ ජාල වල මගේ ප්‍රොෆයිල නොමැත

19. ලිංගික දිශානතිය සහ/හෝ සමාජීය ස්ත්‍රී පුරුෂභාවී අනන්‍යතාවය සම්බන්ධ හේතුවක් නිසා ඔබේ සැබෑ නම සහ/ඡායාරූපය පෙන්වන්නේ නැති ප්‍රොෆයිල ඇත්නම් ඒ පිළිබඳ වඩාත් ගැලපෙන ප්‍රකාශය තෝරන්න.
    - ☐ මම, සමාජ මාධ්‍ය සටහන් තුළ මගේ ලිංගික දිශානතිය සහ/හෝ සමාජීය ස්ත්‍රී පුරුෂභාවී අනන්‍යතාවය සහ පෝස්ට්/කමෙන්ට් වල සහ ඒ හා අදාළ ඕනෑම තත්ත්වයක් පිළිබඳ මගේ අදහස් සටහන් කරමි
    - ☐ ඇතැම් සීමිත අවස්ථාවලදී පමණක් මම සමාජ මාධ්‍ය තුළ මගේ ලිංගික දිශානතිය සහ/හෝ සමාජීය ස්ත්‍රී පුරුෂභාවී අනන්‍යතාවය සහ ඒ පිළිබඳ අදහස් සඳහන් කර.
    - ☐ මම කිසිවිටකත් සමාජ මාධ්‍ය සටහන් තුළ මගේ ලිංගික දිශානතිය සහ/හෝ සමාජීය ස්ත්‍රී පුරුෂභාවී අනන්‍යතාවය සහ ඒ සම්බන්ධ අදහස් ඉදිරිපත් නොකරමි
    - ☐ මම, මා තුළ පුද්ගලිකව හඳුනාගත් ලිංගික දිශානතිය සහ/හෝ සමාජීය ස්ත්‍රී පුරුෂභාවී අනන්‍යතාවයට වඩා වෙනස් ලිංගික දිශානතියක් සහ/හෝ සමාජීය ස්ත්‍රී පුරුෂභාවී අනන්‍යතාවයක් මාගේ සමාජ මාධ්‍ය සටහන් සහ අදහස් තුළ පවත්වාගෙන යමි
    - ☐ මගේ සැබෑ නම හෝ ඡායාරූපය සහිත ප්‍රොෆයිල නොමැත
    - ☐ සමාජ ජාල වල මගේ ප්‍රොෆයිල නොමැත

20. ඔබේ සැබෑ නම සහ ඡායාරූපය ඇතුළත් නොවන ප්‍රොෆයිලයක් භාවිතා කරන්නේ ඇයි? ඔබට වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.
    - ☐ මගේ ලිංගික දිශානතිය නීති විරෝධී යැයි සැලකෙන නිසා
    - ☐ මගේ පවුලේ අය මගේ ලිංගික දිශානතිය හෝ සමාජීය ස්ත්‍රී පුරුෂභාවී අනන්‍යතාව හඳුනාගනිතැයි ඇති බිය නිසා
    - ☐ මගේ මිතුරන් මගේ ලිංගික දිශානතිය හෝ සමාජීය ස්ත්‍රී පුරුෂභාවී අනන්‍යතාව හඳුනාගනිතැයි ඇති බිය නිසා

- ☐ මම රැකියාව කරන ස්ථානයේ ප්‍රධානියා හෝ අනෙකුත් සහායකයින් මගේ ලිංගික දිශානතිය හෝ සමාජීය ස්ත්‍රී පුරුෂභාවී අනන්‍යතාව හඳුනාගනිතැයි ඇති බිය නිසා
- ☐ මම විවාහක නිසා
- ☐ ආගමික හේතුන් නිසා
- ☐ මම පූජ්‍ය පක්ෂයේ සමාජිකයෙක් නිසා
- ☐ අනෙකුත් (කරුණාකර සඳහන් කරන්න)______________
- ☐ මට, මගේ සැබෑ නම සහ ඡායාරූපය ඇතුළත් නොවන චරිත සටහනක් නොමැත

21. ඔබේ සැබෑ නම සහ ඡායාරූපය ඇතුළත් ප්‍රොෆයිල් ගත් විට පහත සඳහන් කරුණුවලට බියවී ඔබ එහි ඔබේ අදහස් හෝ සටහන් ඇතුළත් කිරීම සීමා කරනවා ද? ඔබට වඩාත් අදාළ ප්‍රකාශන 3 ක් තෝරන්න.
    - ☐ අනෙකුත් පුද්ගලයින් මගේ ලිංගික දිශානතිය හෝ සමාජීය ස්ත්‍රී පුරුෂභාවී අනන්‍යතාව දැනගනීයයි මට බියක් ඇත
    - ☐ අනෙක් පුද්ගලයින් කුමනාකාරයේ ප්‍රකාශයන් (කමෙන්ට්) දක්වයිදැයි මම බිය වෙමි
    - ☐ මගේ ලිංගික දිශානතිය හෝ සමාජීය ස්ත්‍රී පුරුෂභාවීය අනන්‍යතාව පෙන්වීමට කැමැත්තක් නැත
    - ☐ එවැනි මාතෘකා පිළිබඳ සටහන් තැබීම නීති විරෝධීදැයි යන්න මට සැකයක් ඇත
    - ☐ ඒ හේතු කොටගෙන භෞතික ලෝකය තුළ මට එරෙහිව හිරිහැර සිදුවේ දැයි මට බියක් ඇත
    - ☐ රජය මගේ ලිංගික දිශානතිය හෝ සමාජීය ස්ත්‍රී පුරුෂභාවී අනන්‍යතතාව සොයා දැනගනී යන්න මට බියක් ඇත
    - ☐ එය මගේ රැකියාවට බලපායි දැයි මට බියක් ඇත
    - ☐ කිසිවෙකුත් තමන්ගේ ලිංගික දිශානතිය හෝ සමාජීය ස්ත්‍රී පුරුෂභාවී අනන්‍යතාව පිළිබඳ සමාජ මාධ්‍ය අඩවි තුළින් කතා කළ යුතුයැයි මම සිතන්නේ නැත
    - ☐ අනෙකුත් (කරුණාකර සඳහන් කරන්න)______________

22. ඔබගේ ලිංගික දිශානතිය හෝ සමාජීය ස්ත්‍රී පුරුෂභාවී අනන්‍යතාව හේතු කොට ගෙන අන්තර්ජාලය තුළ විශේෂිත ප්‍රචණ්ඩකාරී අවස්ථාවන්ට හෝ ප්‍රචණ්ඩකාරී තර්ජනවලට ගෙදුරුවී ඇත් ද?
    - ☐ ඔව්
    - ☐ නැත

23. පහත දැක්වෙන ක්‍රියාවන් අතුරින් කිසිවත් ඔබට හෝ ඔබ ළඟින් ඇසුරු කරන පුද්ගලයෙකුට මුහුණ දීමට සිදු වී තිබේද? අදාළ සියලුම ප්‍රකාශ තෝරන්න.
    - ☐ ඔබගේ හෝ වෙනයම් පුද්ගලයකුගේ ලිංගික දිශානතිය හෝ සමාජීය ස්ත්‍රී පුරුෂභාවී අනන්‍යතාව හෙළිදරව් වන ආකාරයේ වීඩියෝ පට අන්තර්ජාලයට මුදා හැර හෝ ඔබගේ හෝ අදාළ පුද්ගලයාගේ

කැමැත්ත නොමැතිව එකී වීඩියෝපට තුන්වන පාර්ශවයක් සමඟ හුවමාරු කිරීම

- □ ඔබගේ හෝ වෙනයම් පුද්ගලයකුගේ ලිංගික දිශානතිය හෝ සමාජීය ස්ත්‍රී පුරුෂභාවී අනන්‍යතාව හෙළිදරව්වන ආකාරයේ පින්තූර අන්තර්ජාලයට මුදා හැර හෝ ඔබගේ හෝ අදාළ පුද්ගලයාගේ කැමැත්ත නොමැතිව එකී පින්තූර තුන්වන පාර්ශවයක් සමඟ හුවමාරු කිරීම
- □ අදාළ පුද්ගලයින්ගේ කැමැත්ත නොමැතිව ලිංගික දිශානතිය හෝ සමාජීය ස්ත්‍රී පුරුෂභාවී අනන්‍යතාව අන්තර්ජාලය තුළ ප්‍රසිද්ධ කිරීම.
- □ ඔබගේ හෝ ඔවුන්ගේ ලිංගික දිශානතිය හෝ සමාජීය ස්ත්‍රී පුරුෂභාවී අනන්‍යතාව පිළිබඳ අන්තර්ජාලයේ තබන ලද සටහන් පදනම් කරගෙන භෞතික ලෝකය තුළ හිංසනවලට මුහුණ දීම
- □ ඉහත සඳහන් කරන ලද ඕනෑම දෙයක් කිරීමට වාචිකව තර්ජනය කිරීම
- □ අන්තර්ජාලය හරහා කරන හිරිහැර (හිරිහැර කිරීම, අපහාස කිරීම, හෙළාදැකීම් සහ අනෙකුත්)
- □ දුරකතන අංක, ලැප්ටොප්, අන්තර්ජාල ගිණුම් හිමිකරුවන්ගේ අනුමැතිය නොමැතිව පොලීසිය විසින් පරීක්ෂා කිරීම
- □ ඉහත සඳහන් කිසිවක් මම අත්විඳ නැත
- □ ඉහත සඳහන් කාරණා අත්විඳ කිසිවෙකු මම හඳුනන්නේ නැත

24. ඉහත ඔබ හඳුනාගත් හිරිහැර හේතුවෙන් වඩාත්ම බලපෑමට ලක් වී ඇති සමාජ මාධ්‍ය වෙබ් අඩවි මොනවාද?

**සමාජ ජාලා**

- □ ෆේස්බුක්
- □ ට්විටර්
- □ ඉන්ස්ටග්‍රෑම්
- □ අනෙකුත් (කරුණාකර සඳහන් කරන්න)

**සහරුවන් සොයා ගැනීමට ඇති ඇප්ස් (Dating Apps)**

- □ ටින්ඩර් වැනි ආදරවන්තයින් සම්බන්ධවන සමාන්‍ය සමාජ ජාලා
- □ සම ලිංගික කාන්තාවන්ට, සම ලිංගික පිරිමින්ට, සංක්‍රාන්ති පුද්ගලයන්ට ආදී වශයෙන් විශේෂයෙන් වෙන් වූ ඇප්ස්

**පණිවිඩ හුවමාරු කරගන්නා ඇප්ස්**

- □ වට්ස්ඇප්
- □ වයිබර්
- □ ෆෙස්බුක් මැසෙන්ජර්
- □ ඉමෝ
- □ ස්නැප් චැට්
- □ ඊ මේල්
- □ අනෙකුත් (කරුණාකර සඳහන් කරන්න) ________________

**සංසඳ**

- ☐ GBT ප්‍රජාව තේමා කොට නිර්මාණය කරන ලද බ්ලොග්ස්
- ☐ සාකච්ඡා සංසඳ
- ☐ LGBT කණ්ඩායම්
- ☐ අනෙකුත් (කරුණාකර සඳහන් කරන්න)

25. එවැනි සිදුවීමට වගකිව යුතු පුද්ගලයා හෝ පුද්ගලයින් ගැන සලකා බලන විට ඔවුන්ට බලපෑමට ලක්වූ පුද්ගලයා සහ ඇති සම්බන්ධතාවය කුමක් ද? (ඔබ හෝ වෙනයම් පුද්ගලයෙක්).
    - ☐ මිතුරන්
    - ☐ පවුලේ සමීප සමාජිකයන්
    - ☐ නෑදෑයන්
    - ☐ රොමාන්තික සම්බන්ධතාවක් පවත්වන පුද්ගලයෙක්
    - ☐ ලිංගික සම්බන්ධතාවක් පවත්වන කෙනෙක්
    - ☐ දන්නා හඳුනන පුද්ගලයෙක්
    - ☐ නාඳුනන පුද්ගලයෙක්
    - ☐ පුද්ගලයා හෝ පුද්ගලයන්ගේ සැබෑ අනන්‍යතාවය මම නොදනිමි

26. ඔබ හෝ බලපෑමට ලක්වූ පුද්ගලයා අත්දැකීමට ප්‍රතිචාර දැක්වූයේ කෙසේ ද (ඔබට අදාළ සියලුම පිළිතුරු තෝරන්න).
    - ☐ අදාළ ප්‍රොෆයිල නිෂ්ක්‍රීය කිරීම හෝ මකා දැමීම
    - ☐ අකමැත්තෙන් වුවත් අලුත් ප්‍රොෆයිලයක් සකස් කිරීම
    - ☐ මිතුරු ලැයිස්තුවෙන් ඉවත් කිරීමෙන් හෝ සම්බන්ධතාව අවහිර කිරීමෙන්
    - ☐ පුද්ගලිකව හෝ කාටත් පෙනෙන පරිදි සමාජ මාධ්‍ය ජාල ප්‍රොෆයිලය තුළදීම එකී පුද්ගලයාට අභියෝග කිරීමෙන්
    - ☐ වරදකරුවා සහ ඔවුන්ගේ එම ක්‍රියාවන් ප්‍රසිද්ධියට පත් කරමින් පළිගැනීමේ සටහනක් තැබීමෙන්
    - ☐ අඩවිය හා සම්බන්ධ වගකිවයුතු පුද්ගලයාට වාර්තා කිරීමෙන්
    - ☐ නීතිය ක්‍රියාත්මක කරන්නන්ට ගැටළුව වාර්තා කිරීමෙන්
    - ☐ භෞතික ලෝකයේ දී අදාළ පුද්ගලයින් මුණගැසීමෙන්
    - ☐ මම ප්‍රතිචාර දැක්වූයේ නැත

27. ඔබ සතුටුදායක විසඳුමක් ලබා ගත්තා ද?
    - ☐ ඔව්
    - ☐ නැත
    - ☐ මම තවමත් ප්‍රතිඵල දන්නේ නැත

*සහකරුවන් සොයා ගැනීමට සහාය වන ඇප්ස්*

28. සහකරුවන් සොයා ගැනීමට සහාය වන ඇප්ස් (ටින්ඩර් සහ අනෙකුත්) තුළ ඔබගේ ක්‍රියාකාරිත්වට අදාළ සියලුම ප්‍රකාශ තෝරන්න.
    - ☐ එවැනි අඩවියක් තුළින් මුණගැසුණ පුද්ගලයකු සමග මම ප්‍රේම සම්බන්ධතාවක් පවත්වා ඇත
    - ☐ එවැනි අඩවි තුළින් ලිංගික සම්බන්ධතා පැවැත්වීමට මම සහකරුවන් සොයාගෙන ඇත
    - ☐ එවැනි අඩවි හරහා මම මිතුරන් සොයාගෙන ඇත
    - ☐ එවැනි අඩවි හරහා මම වානිජ ලිංගික කටයුතු සඳහා ගනුදෙනුකරුවන් සොයාගනිමි
    - ☐ එවැනි අඩවි හා මම කිසිවිටකත් සම්බන්ධ වී නැත
    - ☐ එවැනි අඩවි විසින් ප්‍රවර්ධනය/සන්නිවේදනය කරන වැඩසටහන්වලට දායකවී ඇත
    - ☐ එවැනි අඩවි තුළ සිටින මම දන්නා අය හෝ මම විසින් සංවිධානය කරන වැඩසටහන් මම ප්‍රවර්ධනය කරමි
    - ☐ එවැනි අඩවි ප්‍රයෝජනවත් නොවනබව මට වැටහුණ බැවින් මම එවායින් ඉවත් වුනෙමි
    - ☐ එවැනි අඩවියක් හා මා කිසි දිනෙක සම්බන්ධ වී නැත

29. එවැනි අඩවි තුළ ඔබ හුවමාරු කරගන්නා ආකාරයේ ඡායාරූප පිළිබඳ සිතන විට එයට වඩාත්ම ගැලපෙන ප්‍රකාශය තෝරන්න.
    - ☐ මගේ මුහුණේ ඡායාරූප ප්‍රසිද්ධියේ හුවමාරු කර ගනිමි
    - ☐ මගේ මුහුණේ ඡායාරූප හුවමාරු කර ගන්නේ පෞද්ගලිකව පමණි
    - ☐ මාගේ මුහුණේ ඡායාරූප කිසි විටෙකත් හුමාරු කරගන්නේ නැත
    - ☐ එවැනි අඩවියක් හා මා කිසිදිනෙක සම්බන්ධ වී නැත

30. එවැනි අඩවි තුළ ඔබ හුවමාරු කරගන්නා ආකාරයේ ඡායාරූප පිළිබඳ සිතන විට එයට වඩාත්ම ගැලපෙන ප්‍රකාශය තෝරන්න.
    - ☐ මම ප්‍රසිද්ධියේ හෝ පුද්ගලිකව හුවමාරු කරගන්නේ නිරුවත් නොවන ඡායාරූප පමණි
    - ☐ මම ප්‍රසිද්ධියේ නිරුවත් නොවන ඡායාරූප හුවමාරු කරගන්නා අතර පුද්ගලිකව නිරුවත් ඡායාරූප හුවමාරු කරගනිමි
    - ☐ මම ප්‍රසිද්ධියේ හෝ පුද්ගලිකව නිරුවත් ඡායාරූප හුවමාරු කරගනිමි
    - ☐ මම එවැනි අඩවි හරහා කිසිඳු පින්තූරයක් හුවමාරු කර නොගනිමි

31. ඔබට වඩාත් උචිත ලෙස ගැලපෙන ප්‍රකාශනය තෝරා හිස්තැන පුරවන්න. පළමු වතාවට මට එවැනි ජාලයකින් අලුත් අයකු මුණගැසුණ විට "______________".
    - ☐ ඔවුන් මුණගැසීමට පෙර මම නිතරම ඔවුන් සමග වීඩියෝ ඇමතුමකින් කතා කර ඔවුන්ගේ මුහුණ දැක බලා ගනී

- ☐ මම නිතරම ඔවුන් මුණගැසෙන්නේ ප්‍රසිද්ධ ස්ථානයකදීය (ප්‍රධාන පාර, අවන්හලකදී, උද්‍යානයකදී)
- ☐ මම ඔවුන්ට මගේ නිවසට ආරාධනා කරන අතර එසේත් නොමැතිනම් මම ඔවුන් සිටින ස්ථානයට හෝ මිතුරෙකුගේ නිවසේ දී මුණගැසේ
- ☐ සමහරවිට මම ඔවුන් ප්‍රසිද්ධ ස්ථානයකදී මුණගැසෙන අතර එසේ නොමැතිනම් මම ඔවුන් කෙලින්ම මාගේ නිවසේදී, ඔවුන්ගේ නිවසේ දි හෝ මිතුරෙකුගේ නිවසේ දී මුණගැසේ
- ☐ සමහරවිට අප කෙලින්ම හෝටලයකදී/කුලියටගත් කාමරයක දී මුණගැසේ
- ☐ සෑම විටම ඔවුන්ව මුණගැහෙන්නේ තවත් කෙනෙකු සමඟය
- ☐ මම එවැනි අඩවිවල පුද්ගලයින් පුද්ගලිකව මුණගැසෙන්නේ නැත

*ඩිජිටල් ආරක්ෂාව පිළිබඳව දැනසිටීම*

32. ඔබ නිතර භාවිතා කරන සමාජ මාධ්‍ය වෙබ් අඩවිවල ආරක්ෂක විධිවිධාන පිළිබඳ ඇති අළුත් තොරතුරු දැනගැනීම හෝ ඒවා කියවීම සිදු කරනවාද? (security and policy updates).
    - ☐ ඔව්
    - ☐ නැත
    - ☐ එසේ කරන්නේ කෙසේදැයි නොදනිමි

33. අන්තර්ජාලය තුළ ඔබේ ආරක්ෂාව ඉහළ නැංවීම සදහා පහත සඳහන් ක්‍රමවේද සහ මෙවලම් භාවිතා කරනවා ද?
    - ☐ ඔබගේ ඊ-මේල් සහ අනෙකුත් අන්තර්ජාල ගිණුම් සඳහා සවිමත් මුරපද (password) භාවිතා කිරීම
    - ☐ ගුප්ත කේතන සේවාවන් (encryption services) ලබාදෙන වෙබ් අඩවි පමණක් භාවිතා කිරීම
    - ☐ වෛරස් විරෝධී මෘදුකාංග භාවිතා කිරීම (anti virus software)
    - ☐ නවතම ආරක්ෂණ සංකේත සහ භාවිතයන් යොදාගනිමින් මෙහෙයුම් පද්ධතිය යාවත්කාලීන කිරීමේ ලිපිනය වෙනස් කිරීම හෝ අවහිර කිරීම
    - ☐ වාරණ විරෝධී මෘදුකාංග භාවිතා කිරීම (anti)censorship software) VPN භාවිතා කිරීම
    - ☐ මෙම මෙවලම්වලින් කීපයක් පිළිබඳ මම අසා ඇති නමුත් ඒවා භාවිතා කරන්නේ කෙසේද යන්න නොදනිමි
    - ☐ මෙම මෙවලම් ගැන මීට පෙර මම කිසිදිනක අසා නැත
    - ☐ වෙනත් ______________________________________________

34. ඔබ ඩිජිටල් ආරක්ෂව පිළිබඳ පුහුණු වැඩසටහන්වලට සහභාගී වී ඇත් ද?
    - ☐ ඔව්
    - ☐ නැත

35. අන්තර්ජාලය තුළ ඔබේ අත්දැකීම් භෞතික ලෝකයේ ඔබේ අත්දැකීම් සමඟ සසඳන විට පහත දැක්වෙන ප්‍රාකශයන්ට වඩාත් අදාල වන පිළිතුර තෝරන්න.

අන්තර්ජාලයට සම්බන්ධවීම තුළින් මට මගේ ලිංගිකත්වය සහ/හෝ සමාජීය ස්ත්‍රී පුරුෂභාවී අනන්‍යතාව ප්‍රකාශ කිරීමට සහ ඒ පිළිබඳ කරුණු සොයා බැලීමට වඩාත් නිදහස ලබා දේ.

- □ එකඟයි
- □ එකඟ නොවේ
- □ මේ පිළිබඳ මට අදහසක් නැත
- □ මේ පිළිබඳ නිශ්චිතව කිව නොහැක

අන්තර්ජාලය මට ශ්‍රී ලංකාවේ LGBT ප්‍රජාව සමඟ සම්බන්ධ වීමට වැඩි අවස්ථාවක් සලසා දේ.

- □ එකඟයි
- □ එකඟ නොවේ
- □ මේ පිළිබඳ මට අදහසක් නැත
- □ මේ පිළිබඳ නිශ්චිතව කිව නොහැක

අන්තර්ජාලය මට ලෝකයේ LGBT ප්‍රජාව සමඟ සම්බන්ධ වීමට වැඩි අවස්ථාවක් සලසා දේ.

- □ එකඟයි
- □ එකඟ නොවේ
- □ මේ පිළිබඳ මට අදහසක් නැත
- □ මේ පිළිබඳ නිශ්චිතව කිව නොහැක

ශ්‍රී ලංකාවේ LGBT ව්‍යාපාරය වෙනුවෙන් අනත්ර්ජාලය යොදා ගැනීම දැන් තිබෙන තත්ත්වයට වඩා වැඩි විය යුතුය.

- □ එකඟයි
- □ එකඟ නොවේ
- □ මේ පිළිබඳ මට අදහසක් නැත
- □ මේ පිළිබඳ නිශ්චිතව කිව නොහැක

ක්‍රියාකාරී වීමට අන්තර්ජාලය තුළින් විශාල ඉඩක් ලැබෙන නිසා භෞතික ලෝකයේ ක්‍රියාකාරිත්වයේ වැදගත්කම පහත වැඩී ඇත.

- □ එකඟයි
- □ එකඟ නොවේ
- □ මේ පිළිබඳ මට අදහසක් නැත
- □ මේ පිළිබඳ නිශ්චිතව කිව නොහැක

මෙම පර්යේෂණය ඇම්ප්ලිෆයිචේන්ජ් ආයතනයේ මූල්‍ය අනුග්‍රහය සහිතව ප්‍රගතිශීලී සන්නිවේදනයන් සඳහා වන සම්මේලනය විසින් දියත් කරන ලද "ඉන්දියාවේ, නේපාලයේ සහ ශ්‍රී ලංකාවේ ඉරෝටික්ස් (EROTICS) ජාලයන් ගොඩ නැන්වීම" යන ව්‍යාපෘතියේ අංගයක් වන අතර එය මෙම රටවල් තුනෙහි ක්‍රියාත්මක වන හවුල්කරුවන් වන ඉන්දියාවේ Point of View, නේපාලයේ ලූම් (LOOM) සහ ශ්‍රී ලංකාවේ කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය යන ආයතනවල ශක්තිමත් සන්ධානය පදනම් කර ගත්තක් වේ.

2016 වසරේ නොවැම්බර් මාසයේ සිට 2017 ජූලි මාසය අතර කාලසීමාවේ දී, ප්‍රගතිශීලී සන්නිවේදනයන් සඳහා වන සම්මේලනය, බහුවිධ ආකාරවූ රටවල් සම්බන්ධ වූ ශ්‍රී ලංකාවේ සහ නේපාලයේ අන්තර්ජාලය තුළ ලිංගිකත්වය හා සම්බන්ධ වන තොරතුරු හා සන්නිවේදනය, නීතිමය ප්‍රතිපත්තිය හා සමාජ-ආර්ථික පැතිකඩ සහ ඉන්දියානු නීතිය "සංඛ්‍යාංක (ඩිජිටල්) අසභ්‍යතාවය" ගොඩනන්වන ආකාරය ගවේෂණය කිරීම සඳහා දියත් කරන ලදී. මෙම ප්‍රකාශනය එම ව්‍යාපෘතියෙන් 2017 වසරේ දී ප්‍රගතිශීලී සන්නිවේදනයන් සඳහා වන සම්මේලනය විසින් ප්‍රකාශනය කරන ලද අවසාන පර්යේෂණ වාර්තාව වන "ඉරෝටික්ස් දකුණු ආසියාව, ගවේෂණාත්මක පර්යේෂණය: ලිංගභාවය, අයිතිවාසිකම් හා අන්තර්ජාලය" යන වාර්තාවේ කොටසක් වේ.

ඉරෝටික්ස් (EROTICS - Exploratory Research on Sexuality and ICTs - ලිංගිකත්වය හා තොරතුරු සන්නිවේදන තාක්ෂණයන්) යනු අන්තර්ජාල නිදහස උද්දේශනය කරන්නන්, ප්‍රතිපත්ති විශේෂඥයින් හා තාක්ෂණ විශේෂඥයින් ට ද අමතරව LGBTQ පුද්ගලයින්ගේ අයිතිවාසිකම්, ලිංගික සේවාවන්, ලිංගික අධ්‍යාපනය, ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය අයිතීන්, සහ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය වැනි ලිංගිකත්වය පිළිබඳ ගැටලු සම්බන්ධයෙන් කටයුතු කරන ක්‍රියාකාරකයින්ගේ, උගතුන්ගේ හා සංවිධානවල ගෝලීය ජාලයක් වේ. ජාලයේ අරමුණ වන්නේ ලිංගික අයිතීන් හා අන්තර්ජාල අයිතීන්, ලිංගික අයිතීන් වෙනුවෙන් පෙනී සිටින ක්‍රියාකරුවන්ට එරෙහි වන තාක්ෂණය හා සම්බන්ධ උල්ලංඝනය කිරීම් අවධාරණය කිරීම, මෙන්ම අන්තර්ජාල පාලනයේ, භාවිතාවේ හා නිර්මාණ සැලසුම් කිරීම සඳහා ඔවුන්ගේ ධාරිතාවය ගොඩනැන්වීම වෙනුවෙන් අන්තර්-ව්‍යාපාර සහයෝගය ගොඩනැගීමයි.

APC
ASSOCIATION FOR PROGRESSIVE COMMUNICATIONS

AMPLIFYCHANGE

Women and Media Collective
Established 1984

ISBN 978-955-1770-34-1

**කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය**
56/1, සරසවි මාවත, කාසල් වීදිය, කොළඹ 08, ශ්‍රී ලංකාව
දුරකථන අංකය: 94 11 2690201/5632045
ෆැක්ස්: 94 112690192
විද්‍යුත් ලිපිනය: wmcsrilanka@gmail.com
womenandmedia.org